320 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 320 - இல. 10
Volume 320 - No. 10

2025 අගෝස්තු 07වන බ්‍රහස්පතින්දා
2025 ஓகஸ்ட் 07, வியாழக்கிழமை
Thursday, 07th August, 2025

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සඳහා නව සභාපතිවරයකු තෝරා ගැනීම [තීරුව 1643]

**ජාතික විගණන කාර්යාලයේ අයවැය ඇස්තමේන්තුව - 2026** [තීරුව 1643]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1644]

**මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1645]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1646]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1648-1696]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ආනයනික විද්‍යුත් වාහන මත පනවන බදු [තීරුව 1697]
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ මතුව ඇති ගැටලු [තීරුව 1699]

**2020/2021 කාලය තුළ සිදු කරන ලද අවිධිමත් උපාධිධාරී පත්වීම්:**
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 1702]

**දමිළ දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම:**
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1706]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම** [තීරුව 1708]

**ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1713]

**විනිමය පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරුව 1714]

**කල්තැබීමේ යෝජනාව:**
රටේ වත්මන් ආර්ථික තත්ත්වය [තීරු 1716–1832]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவுக்கான புதிய தவிசாளர் தெரிவு [ப: 1643]

**தேசிய கணக்காய்வு அலுவலகத்தின் வரவு செலவுத்திட்ட மதிப்பீடு – 2026** [ப: 1643]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1644]

**பொது மனுக்கள் பற்றிய குழுவின் அறிக்கை** [ப:1645]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1646]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1648-1696]

**தனி அறிவித்தல் மூல வினா:**
இறக்குமதி செய்யப்பட்ட மின்சார வாகனங்களுக்கான வரி விதிப்பு [ப: 1697]
கம்பஹா விக்ரமாரச்சி சுதேச மருத்துவப் பல்கலைக்கழகத்தில் எழுந்துள்ள பிரச்சினைகள் [ப: 1699]

**2020/2021 காலப்பகுதியில் வழங்கப்பட்ட முறைகேடான பட்டதாரி நியமனங்கள்:**
பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 1702]

**தமிழ் அரசியல் கைதிகளின் விடுதலை:**
நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரினது கூற்று[ ப: 1706]

**மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணனினது சொந்த விளக்கம்** [ப: 1708]

**சனாதிபதிகளின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1713]

**நாணய மாற்றுண்டியல்கள் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 1714]

**ஒத்திவைப்புப் பிரேரணை:**
நாட்டின் தற்போதைய பொருளாதார நிலைமை [ப: 1716-1832]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Election of a New Chairman for Committee on Public Accounts [Col. 1643]

BUDGET ESTIMATE OF NATIONAL AUDIT OFFICE - 2026 [Col. 1643]

AUDITOR-GENERAL'S REPORT [Col. 1644]

REPORT OF COMMITTEE ON PUBLIC PETITIONS [Col. 1645]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1646]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1648-1696]

QUESTION BY PRIVATE NOTICE:
Taxes Imposed on Imported Electric Vehicles [Col. 1697]
Issues Arisen at Gampaha Wickramarachchi University of Indigenous Medicine [Col. 1699]

IRREGULAR GRADUATE APPOINTMENTS MADE DURING 2020/2021:
Statement by Prime Minister and Minister of Education, Higher Education and Vocational Education [Col. 1702]

RELEASE OF TAMIL POLITICAL PRISONERS:
Statement by Minister of Justice and National Integration [Col. 1706]

PERSONAL EXPLANATION BY HON. (DR.) V. S. RADHAKRISHNAN [Col. 1708]

PRESIDENTS' ENTITLEMENTS (REPEAL) BILL:
Read the First time [Col. 1713]

BILLS OF EXCHANGE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed [Col. 1714]

ADJOURNMENT MOTION:
Current Economic Status of the Country [Cols. 1716-1832]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 අගෝස්තු 07වන බ්‍රහස්පතින්දා***
*2025 ஓகஸ்ட் 07, வியாழக்கிழமை*
*Thursday, 07th August, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සඳහා නව සභාපතිවරයකු තෝරා ගැනීම
### அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவுக்கான புதிய தவிசாளர் தெரிவு
### ELECTION OF A NEW CHAIRMAN FOR COMMITTEE ON PUBLIC ACCOUNTS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අරවින්ද සෙනරත් මහතා 2025.08.06වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිය සභාපති ධුරයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් එම කාරක සභාවේ පුරප්පාඩු වූ සභාපති ධුරයට සභාපතිවරයකු තෝරා පත්කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 132(1)හි විධිවිධාන ප්‍රකාරව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2025 සැප්තැම්බර් 12වන දින පැවැත්වෙන බව දන්වනු කැමැත්තෙමි.

## ජාතික විගණන කාර්යාලයේ අයවැය ඇස්තමේන්තුව - 2026
## தேசிய கணக்காய்வு அலுவலகத்தின் வரவு செலவுத்திட்ட மதிப்பீடு - 2026
## BUDGET ESTIMATE OF NATIONAL AUDIT OFFICE - 2026

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 34 වගන්තිය ප්‍රකාරව, ජාතික විගණන කාර්යාලය විසින් සකස් කරන ලදුව, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද සමඟ ඉදිරිපත් කරන ලද ජාතික විගණන කාර්යාලයේ 2026 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මම සභාගත කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී අයවැය ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ IV කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Sir, I present the Annual Performance Report of the Department of Technical Education and Training for the year 2024.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහතා]

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## பொது மனுக்கள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF COMMITTEE ON PUBLIC PETITIONS

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125 (5) අනුව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් නිරීක්ෂණ සමඟ ගත යුතු පියවරයන් සම්බන්ධයෙන් සිය මතය පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුතු අතර, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරය සඳහා කාරක සභාව වෙත යොමු කරන ලද මහජන පෙත්සම් 70ක් සම්බන්ධයෙන් කාරක සභාවේ නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් පළමු වාර්තාව මම සභාගත කරමි. ගරු කථානායකතුමනි, මෙම වාර්තාව සභාගත කිරීමෙන් අනතුරුව ඔබතුමා විසින් ස්ථාවර නියෝග 125(6) සහ 125(7) ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරමින් අසාධාරණයට පත් පෙත්සම්කරුවන් වෙනුවෙන් සාධාරණය ඉටු කරනු ඇතැයි කාරක සභාව අපේක්ෂා කරයි.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරනු ලබන පෙත්සම් සංඛ්‍යාව සංඛ්‍යාත්මකව ඉහළ අගයක් ගන්නා අතර, කාරක සභාවේ විභාග කිරීම තුළ පෙත්සම්කරුවන් අසාධාරණයට ලක් වූ බව නිරීක්ෂණය වන සෑම අවස්ථාවකදීම පවතින නෛතික ප්‍රතිපාදනයන් ද, ප්‍රස්තුත කරුණට අදාළ අනෙකුත් සියලුම ආනුෂංගික කරුණු ද සැලකිල්ලට ගනිමින් සාධාරණ වූත්, අපක්ෂපාතී වූත් නිර්දේශ කාරක සභාව විසින් ලබා දී ඇත.

ගරු කථානායකතුමනි, කාරක සභාවේ කටයුතු සාර්ථකව ඉටු කරලීම සඳහා මාහට සහාය දුන් කාරක සභාවේ ගරු මන්ත්‍රීවරුන්ටත්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ නිලධාරින්ට සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, සිය සහාය ලබා දුන් අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අනෙකුත් සියලුම නිලධාරින්ටත් මාගේ ස්තුතිය මේ අවස්ථාවේදී පළ කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

Sir, on behalf of the Chairman of the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital, I present the Report of the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital on Samurdhi (Amendment) Bill, which was referred to the Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

# පෙත්සම්
# மனுக்கள்
# PETITIONS

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) දියතලාව, කහගොල්ල, ගල්පට්ටිඅරාව යන ලිපිනයෙහි පදිංචි අමිත් ලසන්ත ගම්මන්පිල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) බණ්ඩාරවෙල, කහත්තේවල, පිටවත්ත යන ලිපිනයෙහි පදිංචි බී.එම්. ඉන්ද්‍රානි ගුණරත්න මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) වැලිමඩ, දඹවින්න, හපුතලේ පාර (2 කණුව) යන ලිපිනයෙහි පදිංචි පී. අබේරත්න පතිරණ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු කථානායකතුමනි, වත්තල, හැඳල, පල්ලියවත්ත, පළමු පටුමග, අංක 10/2 බී දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. ප්‍රියන්කා නිරෝෂා පෙරේරා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)

ගරු කථානායකතුමනි, මහනුවර, මැදබෝවල, බෝධියන්ගන මාවත, අංක 100 දරන ස්ථානයෙහි පදිංචි එස්.ආර්.ඒ.එම්.ටී.බී. රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

ගරු කථානායකතුමනි, හොරණ, බැල්ලපිටිය, ගංගොඩ පාර යන ලිපිනයෙහි පදිංචි ඩී.එල්.ඩබ්ලිව්. ගමගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, නුගේගොඩ, තලපත්පිටිය, පන්සල පාර, අංක 293/11 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. නවීන් යසස් ශ්‍රී මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) හිඟුරක්ගොඩ, යෝධ ඇළ, අංක 05 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්. ලංකා රාජනී විජේතිලක මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පොළොන්නරුව, පුලස්තිගම, බී.ඕ.පී. 313, 97 දරන ස්ථානයෙහි පදිංචි පී.ජී.ඩී. ඉනෝකා රුවන්ති සිල්වා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, පාදුක්ක, ලියන්වල, අංක 136 A දරන ස්ථානයෙහි පදිංචි ජී. ලයනල් මහතාගෙන් සහ වෙනත් හත්දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)

Hon. Speaker, I present a petition from Mr. T.A. Wanniarachchi and nine others of No. 29/21 A, Jayasinghe Road, Kirulapona, Colombo 06.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## මොනරාගල දිස්ත්‍රික්කයේ වගා කළ හැකි LRC ඉඩම්: පදිංචිකරුවන්ට ඔප්පු ලබාදීම
## மொனராகலை மாவட்டத்தில் பயிர்ச்செய்கை மேற்கொள்ளக்கூடிய LRC காணிகள்: குடியிருப்பாளர்களுக்கு காணி உறுதிகள்
## ARABLE LRC LANDS IN MONARAGALA DISTRICT: PROVISION OF TITLE DEEDS TO OCCUPANTS

722/2025

**1. ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති, වගා කිරීමට හැකි රජයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම්වලට ඔප්පු ලබා දීම මේ වනවිට අත්හිටුවා ඇති බව දන්නේද;

[ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා]

(iv) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් අවුරුදු 25-30ක් පමණ දීර්ඝ කාලයක් භුක්ති විඳින පුද්ගලයන්ට ඉඩම් ඔප්පු/බලපත්‍ර මේ දක්වා ලබාදී නොමැති බව දන්නේද;

(v) එම පුද්ගලයන්ට ඉඩම් ඔප්පු/බලපත්‍ර ලබා දීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகலை மாவட்டத்தில் பயிர்ச்செய்கை மேற்கொள்ளக்கூடிய அரச காணிகளின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) மொனராகலை மாவட்டத்தில் காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகளின் அளவு எவ்வளவு என்பதையும்;

(iii) அந்தக் காணிகளுக்கு உறுதி வழங்குதல் தற்போது இடைநிறுத்தப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(iv) காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகளில் 25-30 ஆண்டுகளாக, நீண்ட காலம் இருப்பாட்சி கொண்டுள்ள நபர்களுக்குக் காணி உறுதிகள்/உரிமங்கள் இதுவரை வழங்கப்படாதுள்ளதை அறிவாரா என்பதையும்;

(v) அந்த நபர்களுக்கு காணி உறுதிகள்/உரிமங்களை வழங்க நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the extent of the arable government lands in the Monaragala District;

(ii) the extent of the lands owned by the Land Reform Commission in the Monaragala District;

(iii) whether he is aware that the issuance of deeds for the lands concerned has been suspended at present;

(iv) whether he is aware that title deeds/land permits have not yet been issued to persons who have been possessing the lands belonging to the Land Reform Commission for long periods of about 25 to 30 years; and

(v) whether steps will be taken to issue title deeds/ land permits to the persons concerned?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

| අනු අංකය | වගාව | ඉඩම් ප්‍රමාණය (හෙක්ටෙයාර්) |
|---|---|---|
| 01. | තේ | 533 |
| 02. | පොල් | 3,938 |
| 03. | රබර් | 9,572 |
| 04. | උක් | 17,638 |
| 05. | වී | 32,869 |
| 06. | මිශ්‍ර වගා/බහු වාර්ෂික භෝග | 20,218 |
| 07. | වාර්ෂික භෝග | 44,744 |
| 08. | හේන් වගාව | 26,249 |
| 09. | වෙනත් | 5,745 |
| එකතුව | | 161,506 |

(ii) රජයට අත්පත් කර ගැනීම ආදී බැහැර කිරීම් කළ පසුව අවසන් වශයෙන් අක්කර 6,439 රූඩ් 1 පර්චස් 6.58ක ප්‍රමාණයක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව තිබෙනවා.

(iii) අත්හිටුවා නොමැත. එය ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

(iv) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්වල දීර්ඝ කාලයක් පදිංචිව සහ භුක්ති විඳිමින් සිටින අනවසරකරුවන් වෙත අඛණ්ඩව ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළක් කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා ඒ ඒ කාලසීමාවන්ට ගැළපෙන පරිදි ඉඩම් බැහැර කිරීමට අදාළ චක්‍රලේඛද සකස් කර ඔප්පු/බලපත්‍ර ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙමින් පවතී.

(v) සමස්ත දිවයිනම ආවරණය වන පරිදි 2025.12.31 දිනට ඔප්පු 7,000ක් ලබා දීමට කටයුතු කරමින් පවතින බැවින් මොනරාගල දිස්ත්‍රික්කයද එම වැඩසටහනට ඇතුළත් වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අපේ මොනරාගල දිස්ත්‍රික්කයේ LRC ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා, අවුරුදු 30, 40 පරණ, පරම්පරා දෙකක් භුක්ති විඳින. මේ ඔබතුමන්ලාට විතරක් ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. ඒ ඉඩම්වලට ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළක් තවම හරියාකාරව ක්‍රියාත්මක වෙලා නැහැ. ඔප්පු ලබා දීම ක්‍රියාත්මක වන සමහර තැන්වලදී, දැනට අවුරුදු තිහ හතළිහකට පෙර පදිංචි වෙච්ච අයටත් වර්තමාන තක්සේරුව අනුව

තමයි ඔප්පු ලබා දීමට කටයුතු කරන්නේ. මේ අය අවුරුදු තිහ හතළිහකට කලින් පදිංචි වුණු අය නිසා අතීතයේ පදිංචි වුණු කාල සීමාව ඇතුළත තක්සේරු වටිනාකමක් අරගෙන ඔප්පු ලබා දෙන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තමයි මම අහන්නේ.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා LRC එක ගැන සැහෙන්න ප්‍රශ්න අහනවා. ඒක තමයි තත්ත්වය. ගරු මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්නය අහනකොටත් කිව්වා, අපට විතරක් ඇඟිල්ල දිගු කරනවා නොවෙයි කියලා. ඒක තමයි ඇත්ත කථාව. ඔප්පු දෙනවා කියලා සේවකයින් පුරවලා, ව්‍යාපෘති හදනවා කියලා ඒවා අඩාළ කරලා තිබෙන්නේ. නමුත් අපේ රජය ඉඩම්වලට ඔප්පු, බලපත්‍ර ලබා දීමේ වැඩසටහන ලබන 13වැනි දා ආරම්භ කරනවා. කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ආරම්භ කරන්නේ, අපේ ගරු අමාත්‍යතුමාගේ සහ උතුරු පළාත් ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන්. අපි ඉස්සෙල්ලාම LRC ඔප්පු ටිකක් තමයි දෙන්න බලාපොරොත්තු වෙන්නේ කිළිනොච්චියේ. LRC එකෙන් ඔප්පු ලබා දීම අපි ආරම්භ කරනවා. තක්සේරු කිරීම සම්බන්ධයෙන් යම් ගැටලුවක් තිබෙනවා නම්, අපට ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තීරණයකට එන්න පුළුවන්. ඔප්පු ලබා දීමේ ක්‍රියාවලිය අප දැන් ආරම්භ කරලායි තිබෙන්නේ.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

ස්තුතියි, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඇත්තටම ඒ ඉඩම්වල විශාල වශයෙන් පදිංචි වෙලා ඉන්නේ, වගා කර තිබෙන්නේ දුප්පත් අයයි. අන්න ඒ නිසා තමයි මම ඒ ඉල්ලීම කළේ.

ගරු කථානායකතුමනි, රජයේ ඉඩම් පිළිබඳව ගත්තොත්, මේ වන විට "උරුමය" වැඩසටහන යටතේ ඔප්පු ලබා දීම තාවකාලිකව නතර කරලා තිබෙනවා. හැබැයි, ඒ ඉඩම්වලට අදාළ ඔප්පු ලබා ගැනීමේ අවශ්‍යතාව තදින්ම තිබෙනවා. මොකද, බැංකු ණයක් ලබා ගැනීමේදී, එහෙම නැත්නම් දරුවෙකුට පැවරීමේදී හෝ වෙනත් අවශ්‍යතාවලදී ඒ ඉඩම් හිමියන් ගැටලු රාශියකට මුහුණ පා තිබෙනවා. ඒ නිසා "උරුමය" ඔප්පු නැතිනම් මොනවා හෝ ඔප්පුවක්, එහෙමත් නැතිනම් තිබුණු ඔප්පු නැවත වලංගු කරලා කඩිනමින් ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද? ඒක තමයි මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ඊයේ හවසත් අපේ ගරු මන්ත්‍රීවරයෙක් ඇහුවා, "උරුමය" නමින් ක්‍රියාත්මක වුණු නිදහස් දීමනාපත්‍ර ලබා දීමේ වැඩසටහන ගැන. එතැන අපේ අවුලක් නොවෙයි තිබෙන්නේ. උරුමය නිදහස් දීමනාපත්‍ර ලබා දීමේ ක්‍රමවේදයේ අවුලක්, නීතිමය ගැටලුවක් තිබෙනවා. ඒ නිසා තමයි ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඔක්කොම අපට කිව්වේ, ඒක ක්‍රියාත්මක කරන්න එපා කියලා. අපි ඒ පිළිබඳව කැබිනට් මණ්ඩලයට වාර්තා කළාම, කැබිනට් මණ්ඩලයෙන් ඉඩම් පිළිබඳ විද්වත් කමිටුවක් පත් කළා, ඒ ක්‍රියාවලිය හදාරන්න. ඒ විද්වත් කමිටුවේ වාර්තාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. කැබිනට් මණ්ඩලය ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා නීතිපතිවරයාට යොමු කර තිබෙනවා. නීතිපතිවරයාගෙන් උපදෙස් ආවාට පසුව එය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

නමුත් එය එසේ තිබියදී අපේ රජයේ ඔප්පු, බලපත්‍ර ලබා දීමේ වැඩසටහන ඉස්සරහට ක්‍රියාත්මක වෙනවා. උරුමය නිදහස් දීමනා පත්‍රය ලබා ගැනීම සඳහා යම් කෙනෙකු බාර දුන්නු ඔප්පුව නැවත ලබා ගන්න ඕනෑ නම්, ඒ ගැන කථා කරගන්න පුළුවන්; නැවත ඔප්පු හැදෙන කාලයක ඔප්පුව හදාගන්න පුළුවන්.

## ඉන්දීය රජයේ සහාය ඇතිව ක්‍රියාත්මක කිරීමට අනුමත කරන ලද ව්‍යාපෘති: නැඟෙනහිර පළාත
## இந்திய அரசாங்கத்தின் உதவியுடன் நடைமுறைப்படுத்தப்படவுள்ள அங்கீகரிக்கப்பட்ட கருத்திட்டங்கள்: கிழக்கு மாகாணம்
## PROJECTS APPROVED TO BE IMPLEMENTED WITH ASSISTANCE OF INDIAN GOVERNMENT: EASTERN PROVINCE

918/2025

**2.ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරයේදී ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සහ ඉන්දීය අග්‍රාමාත්‍යවරයා අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව, ඉන්දීය රජයේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ නැඟෙනහිර පළාතේ ක්‍රියාත්මක කිරීමට නියමිත සියලුම අනුමත ව්‍යාපෘති පිළිබඳ විස්තර කවරේද;

(ii) ඉහත එක් එක් ව්‍යාපෘති හඳුනාගෙන අනුමත කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාවලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ව්‍යාපෘති හඳුනාගැනීමේ ක්‍රියාවලියේදී අදාළ පාර්ශ්වකරුවන්ගෙන් අදහස් විමසන ලද්දේද;

(iv) එසේ නම්, අදහස් ලබාගන්නා ලද පුද්ගලයින්ගේ/ අස්ථිත්වයන්ගේ නම් සහ අනෙකුත් අදාළ තොරතුරු කවරේද?

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இந்தியப் பிரதமரின் இலங்கைக்கான விஜயத்தின்போது இலங்கை சனாதிபதிக்கும் இந்தியப் பிரதமருக்கும் இடையில் கைச்சாத்திடப்பட்ட புரிந்துணர்வு உடன்படிக்கையின் பிரகாரம், இந்திய அரசாங்கத்தின் உதவியுடன் இலங்கையின் கிழக்கு மாகாணத்தில் நடைமுறைப்படுத்தப்படவுள்ள அனைத்து அங்கீகரிக்கப்பட்ட கருத்திட்டங்களினதும் விபரங்கள் யாவை என்பதையும்;

(ii) மேற்குறிப்பிடப்பட்ட ஒவ்வொரு கருத்திட்டத்தையும் அடையாளங்கண்டு அங்கீகரிப்பதில் பின்பற்றப்பட்ட செயன்முறை யாதென்பதை வெவ்வேறாகவும்;

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

(iii) மேற்குறிப்பிடப்பட்ட கருத்திட்டங்களை அடையாளப்படுத்தும் செயன்முறையின்போது, அவற்றுடன் தொடர்புடைய **பங்குதாரர்களுடன்** கலந்தாலோசிக்கப்பட்டதா என்பதையும்;

(iv) அவ்வாறாயின், கலந்தாலோசிக்கப்பட்ட நபர்களின் / அமைப்புகளின் பெயர்கள் மற்றும் ஏனைய தொடர்புடைய விபரங்கள் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the details of all approved projects to be implemented in the Eastern Province of Sri Lanka under the assistance of the Government of India, pursuant to the Memorandum of Understanding signed between the President of Sri Lanka and the Prime Minister of India during Indian Prime Minister's visit to Sri Lanka;

(ii) the process followed in identifying and approving each of the above projects, separately;

(iii) whether relevant stakeholders were consulted during the process of identifying the aforesaid projects; and

(iv) if so, the names and other relevant details of individuals/entities consulted?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඇස්තමේන්තුගත පිරිවැය සහිතව, ව්‍යාපෘති 33ක ලැයිස්තුවක් ඇමුණුම මඟින් දක්වා ඇත.

ඇමුණුම 01

**නැගෙනහිර පළාත සඳහා බහු අංශික මූල්‍ය ප්‍රදාන යටතේ වන ව්‍යාපෘති 33 සහිත ලැයිස්තුව**

| අනු. අංකය. | ව්‍යාපෘති මාතෘකාව | ව්‍යාපෘති යෝජනා කිරීමේ අධිකාරිය | පිරිවැය ඇස්තමේන්තුව ශ්‍රී.ල.රු. වලින් | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 1. | මැටි නිෂ්පාදන මධ්‍යස්ථාන | ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත | 42,000,000 (රුපියල් මිලියන හතළිස් දෙකකි) | ත්‍රිකුණාමලය |
| 2. | අත් යන්ත්‍ර රෙදි විවීමේ කර්මාන්තශාලා | ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත | 70,000,000 (රුපියල් මිලියන හැත්තෑවකි) | මඩකලපුව |
| 3. | තල් කර්මාන්තය ශක්තිමත් කිරීම | ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත | 6,250,000 (රුපියල් හය මිලියන දෙසිය පනස් දහසකි) | ත්‍රිකුණාමලය |
| 4. | බතික් පුහුණු මධ්‍යස්ථාන | ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත | 60,000,000 (රුපියල් මිලියන හැටකි) | අම්පාර සහ ත්‍රිකුණාමලය |
| 5. | ආහාර මිශ්‍ර කිරීමේ කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත | 531,000,000 (රුපියල් පන්සිය තිස් එක් මිලියනකි) | අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය |
| 6. | කොන්ත්‍රාත් ගොවි සමූහ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත | 30,000,000 (රුපියල් මිලියන තිහකි) | අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය |
| 7. | මඩ පොකුණුවල මිරිදිය විසිතුරු මත්ස්‍ය වගාව | ධීවර ඒකකය ,කෘෂිකර්ම අමාත්‍යාංශය ,නැගෙනහිර පළාත | 38,000,000 (රුපියල් මිලියන තිස් අටකි) | අම්පාර |
| 8. | කලපු වල මෝදා මත්ස්‍ය කොටු වගාව | ධීවර ඒකකය ,කෘෂිකර්ම අමාත්‍යාංශය ,නැගෙනහිර පළාත | 40,100,000 (රුපියල් හතලිස් මිලියන එකසිය දහසකි) | අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය |
| 9. | තිලාපියා මත්ස්‍ය පොකුණු වගාව | ධීවර ඒකකය ,කෘෂිකර්ම අමාත්‍යාංශය ,නැගෙනහිර පළාත | 100,000,000 (රුපියල් මිලියන සියයකි) | අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය |
| 10. | කාලීන වැව් සංවර්ධනය | ධීවර ඒකකය ,කෘෂිකර්ම අමාත්‍යාංශය ,නැගෙනහිර පළාත | 137,000,000 (රුපියල් මිලියන එකසිය තිස් හතකි) | අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය |
| 11. | මඩකලපුව දිස්ත්‍රික් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති ප්‍රතිසංස්කරණ හා අලුත්වැඩියා කටයුතු | මඩකලපුව දිස්ත්‍රික් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය , නැගෙනහිර පළාත | 1,500,000 (රුපියල් එක් මිලියන පන්සිය දහසකි) | මඩකලපුව |
| 12. | මිරිදිය ධීවර කර්මාන්තය සඳහා ඔරු සහ දැල් | සී/ස ධීවර සමුපකාර සමිතිය , වෙළඳ ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය , නැගෙනහිර පළාත. | 5,200,000 (රුපියල් පස් මිලියන දෙසිය දහසකි) | මඩකලපුව |
| 13. | වවුනතිව් ධීවර සමුපකාර සමිතිය සඳහා ධීවර ආම්පන්න | සී/ස ධීවර සමුපකාර සමිතිය , වෙළඳ ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය , නැගෙනහිර පළාත. | 5,020,000 (රුපියල් පස් මිලියන විසි දහසකි) | මඩකලපුව |
| 14. | සතුර්කොන්ඩන් සමුපකාර සමිතිය සඳහා ධීවර ධීවර ආම්පන්න | සී/ස ධීවර සමුපකාර සමිතිය , වෙළඳ ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය , නැගෙනහිර පළාත. | 5,000,000 (රුපියල් මිලියන පහකි) | මඩකලපුව |
| 15. | දොරින් දොරට කිරි එකතු කිරීම සහ විකිණී[illegible] | සී/ස [illegible] කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය | 6,000,000 (රුපියල් මිලියන හයකි) | මඩකලපුව |
| 16. | කෘෂි තාක්ෂණික උද්‍යානය පිහිටුවීම | කෘෂිකර්ම අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 50,000,000 (රුපියල් මිලියන පනහකි) | මඩකලපුව |
| 17. | ගැහැණු දරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන | අධ්‍යාපන අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 50,000,000 (රුපියල් මිලියන පනහකි) | අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය |
| 18. | සිසුන් සඳහා මග පෙන්වීම සහ උපදේශනය | අධ්‍යාපන අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 75,700,000 (රුපියල් හැත්තෑ පස් මිලියන හත්සිය දහසකි) | මඩකලපුව |
| 19. | කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථාන | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත | 8,700,000 (රුපියල් අට මිලියන හත් සිය දහසකි) | අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය |
| 20. | පාසල්වල ස්මාර්ට් පැනල් සවි කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 181,700,000 (රුපියල් එක්සිය අසූ එක් මිලියන හත් හත්සිය දහසකි) | ත්‍රිකුණාමලය |
| 21. | වාණිජ තණබිම් ඒකක පිහිටුවීම | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත | 50,000,000 (රුපියල් මිලියන පනහකි) | අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය |
| 22. | ඒකාබද්ධ සංචාරක මධ්‍යස්ථානය | නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශය. පළාත් පාලන හා සංචාරක අමාත්‍යාංශය , නැගෙනහිර පළාත | 94,000,000 (රුපියල් මිලියන අනූ හතරකි) | ත්‍රිකුණාමලය |
| 23. | විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා හා ගණිත අධ්‍යාපනය (STEAM) ඉහළ නැංවීම | අධ්‍යාපන අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 5,561,000 (රුපියල් පස් මිලියන පන්සිය හැට එක් දහසකි) | අම්පාර |
| 24. | තිරසර ආයුර්වේද ගම්මානය | දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 100,000,000 (රුපියල් මිලියන සියයකි) | ත්‍රිකුණාමලය |
| 25. | පංචකර්ම රෝහල | දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 123,000,000 (රුපියල් මිලියන එකසිය විසි තුනකි) | අම්පාර |
| 26. | පොතුවිල් මූලික රෝහලෙහි ගෙවීමේ වාට්ටුව | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 22,000,000 (රුපියල් මිලියන විසි දෙකකි) | අම්පාර |
| 27. | දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලෙහි නොමේරූ ළදරු ඒකකය (PBU) | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 40,000,000 (රුපියල් මිලියන හතළිහකි) | ත්‍රිකුණාමලය |
| 28. | මහඔය මූලික රෝහලෙහි අක්ෂි ඒකකය | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 30,000,000 (රුපියල් මිලියන තිහකි) | අම්පාර |
| 29. | මුතූර් මූලික රෝහලෙහි අක්ෂි, උගුර, කන, නාසය සහ මානසික සෞඛ්‍ය ඒකක | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 294,500,000 (රුපියල් දෙසිය අනූ හතර මිලියන පන්සිය දහසකි) | ත්‍රිකුණාමලය |
| 30. | තම්පලාගමුව ප්‍රාදේශීය රෝහලෙහි මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ට ප්‍රතිකාර කිරීමේ මධ්‍යස්ථානය | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 13,100,000 (රුපියල් දහතුන් මිලියන එකසිය දහසකි) | ත්‍රිකුණාමලය |
| 31. | ආයුර්වේද රෝහල් හි වෛද්‍ය නිවාස | දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 47,500,000 (රුපියල් හතලිස් හත් මිලියන පන්සිය දහසකි) | අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය |
| 32. | ත්‍රිකුණාමලයෙහි ගෝමරන්කඩවල පිහිටි මධ්‍යම ආයුර්වේද බෙහෙත් ශාලාවෙහි වාට්ටු සංකීර්ණය | දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 25,000,000 (රුපියල් මිලියන විසි පහකි) | ත්‍රිකුණාමලය |
| 33. | ආබාධ සහිත දරුවන් සඳහා රජයේ සුරැකුම් මධ්‍යස්ථාන | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | 84,000,000 (රුපියල් මිලියන අසූ හතරකි ) | මඩකලපුව |
| මුළු එකතුව | | | ශ්‍රී ල. රු. **2,371,831,000** (රුපියල් දෙ බිලියන, තුන්සිය හැත්තෑ එක් මිලියන, අටසිය තිස් එක් දහසකි) | |

(ii) නැඟෙනහිර පළාතේ සමාජ ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය ආධාර ලබා ගැනීමේ අපේක්ෂාවෙන්, 2023 වර්ෂයේ දී නැඟෙනහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් ව්‍යාපෘති යෝජනා කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය (HCI) වෙත ඉදිරිපත් කරන ලදී.

(iii) ඔව්, පවතින වාර්තාවලට අනුව මෙම මූල්‍ය සහාය යටතේ අනුමත උප ව්‍යාපෘති ඒ ඒ අංශවල අවශ්‍යතා සලකා බලා, ප්‍රාදේශීය මට්ටමේ නිලධාරින් ඇතුළු අදාළ අංශවල අදාළ පාර්ශ්වකරුවන්ගේ උපදෙස් විමසීමෙන් අනතුරුව අදාළ පළාත් දෙපාර්තමේන්තු විසින්ම විශේෂයෙන් හඳුනාගෙන, අදාළ පළාත් ආයතන විසින් ඉදිරිපත් කර ඇත.

(iv) පවතින වාර්තාවලට අනුව ඉහත ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම සඳහා පහත සඳහන් පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් පළාත් මට්ටමින් පවත්වා ඇත.

- 2023.07.28 වන දින ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් හා නැඟෙනහිර පළාත් සභාවේ පහත සඳහන් නිලධාරින්ගේ සහභාගිත්වයෙන් යුතුව රැස්වීමක් සංවිධානය කරනු ලැබ ඇත.
  - ප්‍රධාන ලේකම්
  - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - සැලසුම්
  - පළාත් අමාත්‍යාංශවල ලේකම්වරු
  - අධ්‍යාපන, සෞඛ්‍ය, සත්ත්ව නිෂ්පාදන සහ ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍රවල පළාත් අධ්‍යක්ෂවරු
  - පරිවාස හා ළමා ආරක්ෂක සේවා, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රවල පළාත් කොමසාරිස්වරු
  - අධ්‍යක්ෂ, ධීවර ඒකකය
  - සැලසුම් අධ්‍යක්ෂවරු සහ නියෝජ්‍ය සැලසුම් අධ්‍යක්ෂවරු
- 2023.10.16 වන දින, කෘෂිකර්මාන්තය, මිරිදිය ධීවර කර්මාන්තය, සත්ත්ව නිෂ්පාදන සහ සමුපකාර සංවර්ධනය යටතේ ව්‍යාපෘති යෝජනා පිළිබඳ කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා, කෘෂිකාර්මික අංශයේ රැස්වීමක් පහත සඳහන් නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පවත්වනු ලැබ ඇත.
  - ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, නැඟෙනහිර පළාත් සභාව
  - පළාත් අධ්‍යක්ෂ, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, නැඟෙනහිර පළාත් සභාව
  - පළාත් අධ්‍යක්ෂ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, නැඟෙනහිර පළාත් සභාව
  - නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරු - අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය
  - කොමසාරිස්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, නැඟෙනහිර පළාත් සභාව
  - සහකාර කොමසාරිස්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය
  - අධ්‍යක්ෂ - ධීවර, නැඟෙනහිර පළාත් සභාව
  - සංවර්ධන නිලධාරින්, ධීවර ඒකක හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

(ආ) අදාළ නොවේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

நன்றி, கௌரவ பிரதம அமைச்சர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

2023ஆம் ஆண்டு குறித்த தரப்பினருடன் ஆலோசனை நடத்திய பிற்பாடுதான் இந்தக் கருத்திட்டங்களை இனங்கண்டதாக நீங்கள் உங்களுடைய பதிலில் சொன்னீர்கள். ஆனால், 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் கிழக்குக்குரிய அபிவிருத்தியை இவற்றினூடாகப் பெற்றுக்கொள்ள வேண்டும் என்று குறிப்பிடப்பட்டு இருந்தது. அதன் அடிப்படையில்தான் இந்த அரசாங்கம் அந்த வரவு செலவுத்திட்டத்தை இச்சபையில் முன்வைத்தது. அப்படியென்றால், சென்ற அரசாங்கத்தால் 2023ஆம் ஆண்டு வழங்கப்பட்ட அந்தத் திட்டங்களை எப்படி நீங்கள் 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் கிழக்குக்குக் கொடுக்கவேண்டிய அபிவிருத்தித் திட்டங்களாக உள்ளடக்கினீர்கள்? எனக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහලා තිබෙන්නේ ඉන්දීය අග්‍රාමාත්‍යවරයා ලංකාවට ආපු වෙලාවේ අත්සන් කරපු අවබෝධතා ගිවිසුම්වලට අනුව කරන ව්‍යාපෘති සම්බන්ධයෙන්. රජයෙන් සිදු කරන නැඟෙනහිර පළාතේ සංවර්ධනය ඒකට විතරක් සීමා වෙලා නැහැ, ගරු කථානායකතුමනි. 2024, 2025 සහ 2026 අවුරුදු වෙනුවෙන් මේ රජය විසින් ඉදිරිපත් කරන නැඟෙනහිර පළාතේ සැලසුම් සඳහා වෙනම මුදල් වෙන් කර තිබෙනවා. ඒ සාකච්ඡා ඇත්තවශයෙන්ම 2025 අවුරුද්දේත් සිද්ධ වුණා. මේ මොහොතේ පළාත් මට්ටමින් යෝජනා ඉදිරිපත් කරන්න කියලා ඒ ප්‍රදේශයේ නිලධාරින්ටත්, මහජන නියෝජිතයන්ටත් දැනුම් දීලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මම මේ සඳහන් කළේ ඔබතුමා අහපු, ඉන්දීය අග්‍රාමාත්‍යවරයා එක්ක අත්සන් කරපු ගිවිසුම් ගැන පමණයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Thank you. Actually my second Supplementary Question is a continuation of what I asked first. Madam Prime Minister, I want to know about the opportunity that the Members of Parliament representing the East had in that. නැඟෙනහිර පළාත නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ඉන්දීය-ශ්‍රී ලංකා ගිවිසුම හරහා කෙරෙන සංවර්ධන ක්‍රියාවලියට යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් තිබෙනවා ද, ලබාදී තිබුණා ද කියන එකයි මට දැනගන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මගේ උත්තරයේදී මම පැහැදිලි කළා, 2023දී සිද්ධ වුණු සාකච්ඡා මත තමයි ඒ ව්‍යාපෘති හඳුනාගෙන තිබෙන්නේ කියලා. මම ඒ රැස්වීම්වලට සහභාගි වුණු අයගේත් ඒ නිලතල කියෙව්වා. ඉතින් ඒක 2023 වසර තුළ සිද්ධ වෙච්ච දෙයක්. මම නැවත් කියන්න කැමැතියි, 2025 සහ 2026 වසර සඳහා, ඒ කියන්නේ අපේ රජය විසින් ක්‍රියාත්මක කරන අය වැය යෝජනාවලදී නැඟෙනහිර පළාතේ සංවර්ධන ව්‍යාපෘති සඳහා නැඟෙනහිර පළාතේ මහජන නියෝජිතයන්ට දිස්ත්‍රික් සංවර්ධන කමිටු හරහා ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීමට හැකියාව තිබෙන බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -970/2025- (1), ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

## ඊ.එල්. ඉර්ෆාන් සහ කේ.එස්. නිෂ්ෆාර්: බෝට්ටු අනතුර සඳහා වන්දි
## ஈ.எல். இர்பான் மற்றும் கே.எஸ். நிஷ்பார்: படகு விபத்துக்கான இழப்பீடு
## E.L. IRFAN AND K.S. NISHFAR: COMPENSATION FOR BOAT ACCIDENT

976/2025

**4. ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2024.07.12 දින අඩ්ඩාලච්චේනේ, කප්පලඩි ධීවර තොටුපොළෙන් ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම සඳහා පිටත්ව ගිය, සින්න පාලමුනෙයි ප්‍රදේශයේ පදිංචි ඊ.එල්. ඉර්ෆාන් නමැති ධීවරයා තමිල්නාඩු වෙරළට ගසා ගෙන ගොස් තිබූ අතර, දින 130කට පසුව 2024.11.20 දින ඔහු නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගත් බවත්;

(ii) මෙහිදී, අඩ්ඩාලච්චේනේ 06 ප්‍රදේශයේ පදිංචිව සිටි කේ.එස්. නිෂ්ෆාර් නමැති ධීවරයා මරණයට පත්වූ බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මරණයට පත්වූ කේ.එස්. නිෂ්ෆාර් නමැති ධීවරයාට, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙන් වන්දි ගෙවා තිබේද;

(ii) ඊ.එල්. ඉර්ෆාන් නමැති ධීවරයාට සහ ඔහුගේ හානියට පත්වූ බෝට්ටුවට වන්දි ගෙවා තිබේද;

(iii) එසේ නම්, ඉහත සඳහන් ධීවරයන්ට ගෙවූ වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024.07.12ஆம் திகதி அட்டாளைச்சேனை, கப்பலடி மீன்பிடித் துறைமுகத்திலிருந்து ஆழ்கடலில் மீன்பிடிக்கப் புறப்பட்டுச்சென்ற, சின்ன பாலமுனைப் பிரதேசத்தில் வசிக்கும் ஈ.எல். இர்பான் என்ற மீனவர் தமிழகக் கடற்கரைக்கு அடித்துச் செல்லப்பட்டு இருந்ததுடன், 130 நாட்களுக்குப் பிறகு 2024.11.20ஆம் திகதி அவர் மீண்டும் இலங்கைக்குத் திருப்பி அழைத்துவரப்பட்டார் என்பதையும்;

(ii) இச்சம்பவத்தின்போது, அட்டாளைச்சேனை 06ஆம் பிரிவில் வசித்துவந்த கே.எஸ். நிஷ்பார் என்ற மீனவர் மரணமடைந்தார் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மரணமடைந்த கே.எஸ். நிஷ்பார் என்ற மீனவருக்கு கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களத்தால் நட்டஈடு செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஈ.எல். இர்பான் என்ற மீனவருக்கும் அவரது சேதமடைந்த படகுக்கும் இழப்பீடு செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், மேலே குறிப்பிடப்பட்ட மீனவர்களுக்குச் செலுத்தப்பட்ட இழப்பீட்டுத் தொகைகள் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Is he aware that -

(i) a fisherman named E.L. Irfan, a resident of Sinna Palamunai area, who had ventured for deep sea fishing from the Kappaladi fishing pier in Addalachchenai on 12.07.2024 was washed ashore on Tamil Nadu coast and was brought back to Sri Lanka on 20.11.2024 after 130 days; and

(ii) a fisherman named K.S. Nishfar, a resident of Addalachchenai 06 area died during the incident?

(b) Will he inform this House -

(i) whether the Department of Fisheries and Aquatic Resources has paid compensation to the deceased fisherman K.S. Nishfar;

(ii) whether compensation has been paid to fisherman E.L. Irfan and for his damaged boat; and

(iii) if so, the amounts paid as compensation to the above-mentioned fishermen, separately?

(c) If not, why?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, அந்த வினாவுக்கான விடை பின்வருமாறு:

(அ) (i), (ii) அட்டாளைச்சேனை, கப்பலடித்துறை மீன்பிடித் துறையிலிருந்து புறப்பட்ட இலக்கம் OFRP-A-1487 KMN எனும் கலனானது, 2024.07.12ஆம் திகதி இரண்டு மீனவர்களுடன் கடலில் காணாமல் போயுள்ளது. அக்கலனானது சென்னை, நாகபட்டினம் துறைமுகத்தில் இந்தியக் கரையோரப் பாதுகாப்புப் படையணியினரால் கண்டுபிடிக்கப்பட்டுள்ளது. அங்கு ஈ.எல். இர்பான் (832364630V) எனும் மீனவர் மீட்கப்பட்டதுடன், கே.ஆர்.எம். நிஷ்பார் (200034303957) என்பவர் கடலில் காணாமல் போயுள்ளார். 2024.12.20ஆம் திகதி ஈ.எல். இர்பான் எனும் மீனவர் கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களத்தின் தலையீட்டினால் இலங்கைக்கு அழைத்துவரப் பட்டுள்ளார்.

(ஆ) (i) இல்லை.

(ii) இல்லை.

(iii) ஏற்புடையதன்று.

(இ) காணாமல்போன கே.ஆர்.எம். நிஷ்பார் எனும் மீனவரின் வாரிசுதாரர்களுக்கு இழப்பீடு வழங்குவ தற்கு, தேவையான விபரங்களை முழுமையாகச் சமர்ப்பிக்குமாறு 2025.06.20ஆம் திகதி எங்களுடைய கடற்றொழில் திணைக்களம்மூலம் அம்மீனவரின் மனைவிக்கு எழுத்துமூலம் அறிவிக்கப்பட்டுள்ளது. ஆனால், விண்ணப்பப் படிவத்தை பூரணப்படுத்தி இதுநாள் வரைக்கும் எங்களுடைய திணைக்களத்துக்கு அனுப்பவில்லை.

ஜே.எம். அலாம் என்பவரே அந்த மீன்பிடிக் கலனின் உரிமையாளர். அவரது அறிக்கையின்படி, அந்த மீன்பிடிக் கலனானது சென்னை, நாகபட்டினம் துறைமுகத்தில் இன்னமும் நங்கூரமிடப்பட்டு இருக்கின்றது. அது அங்கிருந்து கொண்டுவரப்பட்ட பிறகு, அந்தக் கலனுக்கான நட்டஈட்டை வழங்க முடியும். அதற்குத் தேவையான சகல நடவடிக்கை களையும் நாங்கள் எங்களுடைய கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களத்தின் ஊடாக முன்னெடுத்து இருக்கின்றோம். எனவே, உரிய காலத்தில் உரிய விதத்தில் அனைத்தும் நடைபெறும் என்பதை உங்களுக்குத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ கடற்றொழில் அமைச்சர் அவர்கள் என்னுடைய கேள்விக்குச் சில பதில்களை அளித்திருக்கிறார். கௌரவ கடற்றொழில் அமைச்சரும் அமைச்சின் உயர் அதிகாரிகளும் உதவிசெய்து, குறித்த மீனவரை இலங்கைக்குத் திரும்பவும் அழைத்து வந்திருக்கிறார்கள். மரணித்த மீனவருக்கு நட்டஈடு வழங்குவதற்குரிய விண்ணப்பப் படிவம் உரியவர்களுக்கு அனுப்பப்பட்டு இருப்பதாகவும், அதனைப் பூரணப்படுத்தி வழங்கிய பின்னர் நட்டஈடு வழங்கப்படுமென கௌரவ அமைச்சர் அவர்கள் இங்கு சொன்னார். அண்மையில் கிழக்கு மாகாணத்தின் அம்பாறை மாவட்டத்துக்கு விஜயம்செய்த கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர் அவர்களிடம் நாங்கள் மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் இந்த விடயத்தை முன்வைத்தபோது, அதற்கான ஏற்பாட்டைச் செய்வதாகச் சொன்னார்.

என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன். கடலில் மிகவும் கஷ்டப்பட்டு மீன்பிடித் தொழிலைச் செய்யும்போது எங்களுடைய மீனவர்கள் மரணித்தால், அவர்களுக்கு கடற்றொழில் அமைச்சினால் எவ்வளவு தொகை நட்டஈடாக வழங்கப்படும் என்பதை இந்தச் சபைக்குத் தெரிவிக்க முடியுமா? நாகபட்டினத்தில் 7-8 மாதங்களாகத் தரித்து நிற்கின்ற அந்த மீனவர்களுடைய வள்ளங்களைக் கொண்டுவந்து, அவர்களிடம் பாரப்படுத்துவ தற்கான ஏற்பாடுகளைச் செய்ய முடியுமா? பாதிக்கப்பட்ட மீனவர்களுக்கான நட்டஈட்டை வழங்க முடியுமா?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ உறுப்பினர் அவர்களே, பாதிக்கப்படுகின்ற மீனவர்களுக்கு அல்லது உயிரிழக்கின்ற மீனவர்களுக்கு கடந்த காலங்களில் 2 இலட்சம் ரூபாய்தான் நட்டஈடாக வழங்கப்பட்டது. ஆனால், இப்பொழுது நாங்கள் அவர்களுக்கு 10 இலட்சம் ரூபாய் வழங்குவதற்குத் தீர்மானித்து இருக்கின்றோம். அந்த வகையில், நாங்கள் அவர்களுக்கான இழப்பீட்டுத் தொகையை அதிகரித்து இருக்கின்றோம். இவ்வாறு கைதுசெய்யப்பட்ட இலங்கை மீனவர்களின் படகுகள் நாகபட்டினம் உள்ளிட்ட இந்தியாவின் தமிழ் நாட்டில் தடுத்து வைக்கப்பட்டு இருக்கின்றன. அவற்றைத் தடுத்து வைப்பதற்குக் காரணமும் இருக்கின்றது. அது உங்களுக்கும் தெரியும்! இலங்கையிலும் அவ்வாறு படகுகள் தடுத்து வைக்கப்பட்டு இருக்கின்றன. இந்திய கடற்படையினரால் அந்தப் படகுகள் கைதுசெய்யப்பட்ட பிறகு, அவற்றை அவர்கள் வழக்குப் பொருளாகவே கருதுகின்றார்கள். வழக்கு நடவடிக்கைகள் முடிவடையும் வரைக்கும் குறித்த கப்பல்களையோ, கலன்களையோ அவர்கள் விடுவிப்பதில்லை. அவற்றை விடுவிப்பதற்காக நாங்கள் எமது நாட்டிலுள்ள இந்திய துணைத் தூதரகம்மூலம் பல்வேறு நடவடிக்கைகளை எடுத்திருக்கின்றோம். அதுமாத்திரமன்றி, அவர்களோடு உரையாடியும் வருகின்றோம். அவர்கள் என்னோடுகூட பேசியிருக்கிறார்கள். அங்கிருந்து விடுவிக்கப்படுகின்ற கலன்கள் சேதமடைந்திருந்தால், அதற்கு ஏற்ற வகையில் நாங்கள் நட்டஈட்டை வழங்குவதற்குத் தீர்மானித்து இருக்கின்றோம்.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, யாழ்ப்பாண மாவட்டத்திலிருந்து ஆழ்கடலுக்கு மீன்பிடிக்கச் சென்ற நான்கு பேர் இதே காலப்பகுதியில் இந்தியாவில் கரையொதுங்கி இருந்தார்கள். அது தொடர்பாக நானும் எங்களுடைய முஸ்லிம் காங்கிரஸின் தலைவர் கௌரவ ரஊப் ஹகீம் அவர்களும் அமைச்சுக்கு வந்து உங்களிடம் முறையிட்டதற்கு இணங்க, அவர்கள் மீண்டும் நாட்டுக்குத் திரும்ப அழைக்கப்பட்டு இருக்கிறார்கள். பாதிக்கப்பட்ட அந்த மீனவர்களுக்கும் சேதமடைந்த அவர்களுடைய வள்ளங்களுக்கும் இதுவரை எந்தவிதமான நட்டஈடும் வழங்கப்படாமல் இருக்கிறது. எனவே, இவ்வாறு பாதிக்கப்படுகின்றவர்களுடைய வாழ்வாதாரத்தைத் தற்காலிகமாகவேனும் மேம்படுத்துவதற்கு உங்களுடைய அமைச்சினால் ஏதாவது திட்டங்களை மேற்கொள்ள முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ உறுப்பினர் அவர்களே, எங்களுடைய நாட்டின் கடற்பரப்பைத் தாண்டி ஏனைய நாடுகளின் கடற்பரப்புக்குள் சென்று மீன்பிடியில் ஈடுபட்ட பலர் அந்தந்த நாடுகளில் தடுத்து வைக்கப்பட்டு இருக்கிறார்கள். அவர்களில் பலர் சிறையில் அடைக்கப்பட்டும் இருக்கிறார்கள். இவ்வாறு தடுத்து வைக்கப்பட்டு இருப்பவர்கள் இந்தியாவில் மாத்திரமல்ல, மொரிசியஸ் தீவிலும் இருக்கிறார்கள்; மாலைதீவிலும் இருக்கிறார்கள். விசேடமாக, இந்தியாவின் தமிழ் நாட்டில் எங்களுடைய மீனவர்கள் பலர் இவ்வாறான பிரச்சினைகளுக்கு முகங்கொடுத்து இருக்கிறார்கள். நீங்கள் கேட்ட வினாவில் இவ்விடயம் உள்ளடங்காவிட்டாலும்கூட, நான் கூறுகின்றேன். இவ்வாறு தற்செயலாக திசைமாறிச் செல்கின்ற மீனவர்கள், சந்தர்ப்ப சூழ்நிலையால் ஏனைய நாடுகளின் கடற்பரப்புக்குள் செல்கின்ற மீனவர்கள் என அனைத்து மீனவர்களிடமும் VMS இயந்திரம் இருக்கின்றது. அந்த இயந்திரத்தை இயக்கினால் அவர்கள் எந்தக் கடற்பரப்பில் இருக்கிறார்கள் என்பது அவர்களுக்கும் தெரியும்; எங்களுடைய மத்திய நிலையத்துக்கும் தெரியவரும். ஒருசிலர் அதை off பண்ணிவிட்டு செல்வதனால்தான் இவ்வாறான பிரச்சினைகள் ஏற்படுகின்றன. இது பற்றி என்னைவிட உங்களுக்கு நன்றாகத் தெரியும்! இருந்தாலும், நாங்கள் இந்தப் பிரச்சினைகள் தொடர்பில் கூடுதலான கவனத்தைச் செலுத்தி இருக்கின்றோம். அந்த இயந்திரத்தைப் பாவித்திருக்கின்ற நிலையில் அவர்கள் சென்றது சட்டவிரோதம் இல்லை என்றால், நிச்சயமாக அவர்களுக்கு நட்டஈடு வழங்கப்படும். அதுமாத்திரமன்றி, அவர்களுடைய பாதிக்கப்பட்ட கலன்களைப் புதுப்பிப்பதற்கான உதவிகளையும் வழங்குவதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம். நன்றி. வணக்கம்!

## පොහොර විධිමත් කිරීමේ පනත: ව්‍යාජ පොහොර නිෂ්පාදකයෙකුට පැනවිය හැකි උපරිම දඬුවම

### உர ஒழுங்குபடுத்தற் சட்டம்: போலி உர உற்பத்தியாளர்களுக்கு விதிக்கப்படும் உச்சபட்ச தண்டனை

### REGULATION OF FERTILIZER ACT: MAXIMUM PENALTY ON FAKE FERTILIZER MANUFACTURERS

1023/2025

**5. ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පොහොර විධිමත් කිරීමේ පනත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වර්ෂය කවරේද;

(ii) එම පනතට අනුව ව්‍යාජ පොහොර නිෂ්පාදකයෙකුට එරෙහිව පැනවිය හැකි උපරිම දණ්ඩනය කවරේද;

(iii) වෙළෙඳ පොළේ ඇති පොහොරවල ප්‍රමිතිය සම්බන්ධයෙන් පරීක්ෂා කරන්නේද;

(iv) ශ්‍රී ලංකාව තුළ කාබනික පොහොර හා රසායනික පොහොර නිෂ්පාදනය කිරීමට හෝ ඒවා නිෂ්පාදනය කිරීම දිරිමත් කිරීමට වැඩ පිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைப் பாராளுமன்றத்துக்கு, உர ஒழுங்குபடுத்தற் சட்டம் சமர்ப்பிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;

(ii) மேற்படி சட்டத்துக்கு அமைவாக போலி உர உற்பத்தியை மேற்கொள்ளும் உற்பத்தியாளர்களுக்கு எதிராக விதிக்கக்கூடிய உச்சபட்ச தண்டனை யாது என்பதையும்;

(iii) சந்தையில் காணப்படுகின்ற உரத்தின் தரம் பரிசோதிக்கப்படுகின்றதா என்பதையும்;

(iv) இலங்கைக்குள் சேதனப் பசளையை அல்லது இரசாயனப் பசளையை உற்பத்தி செய்வதற்கான அல்லது அவற்றை உற்பத்தி செய்வதை ஊக்குவிப்பதற்கான வேலைத்திட்ட மொன்று காணப்படுகின்றதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the year in which the Regulation of Fertilizer Act was presented to the Parliament of Sri Lanka;

(ii) the maximum penalty that can be imposed on a fake fertilizer manufacturer under that Act;

(iii) whether the standard of the fertilizers available in the market is examined; and

(iv) whether there is any course of action in Sri Lanka to produce organic and chemical fertilizers or to encourage such production?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 1988 වර්ෂය.

(ii) 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ 22වන වගන්තිය මඟින් දක්වා ඇති අතර, එහි මෙසේ සඳහන් කර ඇත.

මෙම පනත යටතේ වරදකට වරදකරුවකු වන සෑම තැනැත්තෙකුම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් 2,500කට නොඅඩු වූද, රුපියල් 5,000කට නොවැඩි වූද දඩයකට හෝ මාස 6ක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතුය;

තවද, දෙවන හෝ තදනන්තර වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් 5,000කට නොඅඩු වූද, රුපියල් 10,000කට නොවැඩි වූද දඩයකට හෝ මාස 12ක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ තැනැත්තා යටත් විය යුතුය.

(iii) ඔව්.

ආනයනය කරනු ලබන සියලුම පොහොර ආනයනයට පෙර ජාත්‍යන්තර රසායනාගාරයකින් ලබා ගත් ප්‍රමිති සහතිකයක් සහ ආනයනයට පසුව වෙළෙඳ පොළට නිකුත් කිරීමට පෙර ප්‍රතීතකරණය කරන ලද රසායනාගාරයකින් ප්‍රමිතිය තහවුරු කිරීමෙන් පසු පමණක් අළෙවි කිරීම සඳහා අවසරය දෙනු ලැබේ. එයට අමතරව රට තුළ නිෂ්පාදනය කරනු ලබන සියලුම රසායනික, කාබනික සහ දෙමුහුම් පොහොර සඳහා බලපත්‍ර ලබා දීමේදී රසායනාගාර විශ්ලේෂණයට ලක් කර ප්‍රමිතිය තහවුරු කිරීමෙන් පසු වෙළෙඳ පොළට නිකුත් කිරීම සඳහා අවසර දෙනු ලැබේ.

(iv) ඔව්.

ශ්‍රී ලංකාව තුළ කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම උදෙසා ජාතික පොහොර ලේකම් කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සමඟ එක්ව කටයුතු කරනු ලබයි. මෙමඟින් සාම්ප්‍රදායික කාබනික පොහොර නිෂ්පාදකයින් කාබනික පොහොර ව්‍යවසායකයින් බවට පත් කිරීම සඳහා වැඩසටහන් සංවිධානය, පුහුණු කිරීම, වැඩිදියුණු කරන ලද කාබනික කැට පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය සහ පෝෂක අනුපාත ඉහළ නැංවීම සඳහා හා පාංශු හිතකර ක්ෂුද්‍ර ජීවීන්ගේ ගහනය ඉහළ නැංවීම සඳහා කාබනික දියර හා ජෛව කාබනික දියර පොහොර සමඟ මිශ්‍ර කර නව නිෂ්පාදන කටයුතු කිරීම කර ඇත. 2024 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදකයින් 54ක පිරිසක්, 2025 වර්ෂයට අදාළව 2025.06.30 දින වන විට කාබනික පොහොර නිෂ්පාදකයින් 15ක පිරිසක් ද ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඊට අදාළ තවත් ක්‍රියාවලි සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, 2025.05.15වන දින පොළොන්නරුව පොලීසියට ලද ඔත්තුවක් අනුව පොළොන්නරුව දිඹුලාගල ප්‍රදේශයේ බාල පොහොර සකස් කරන ස්ථානයක් වැටලීමකට ලක් කරනවා. ඒ අවස්ථාවේදී ඇමෝනියා පොහොර, නයිට්‍රජන් සියයට 21ක් අඩංගු වෙලා තිබෙන පොහොර, අහිංසක ද්‍රවිඩ තරුණයන් 12දෙනෙක් යොදාගෙන වෙනත් මල්ලකට මාරු කරමින් හිටියා, යූරියා පොහොර විධියට. යූරියා පොහොර විධියට සකස් කරපු බෑග් එකේ සඳහන් කර තිබුණේ, නයිට්‍රජන් සියයට 46ක් අඩංගු වෙලා තිබෙනවා කියලා. ගරු කථානායකතුමනි, දීර්ඝ කාලයක් දේශපාලන රැකවරණයක් සහිතව එම වංචාව කරගෙන ආවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පසුගිය කාලය තුළ පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරාම තිබුණු මැසිවිල්ලක් තමයි, පොහොර යෙදුවාට වැඩක් නැහැ, අස්වැන්නක් ලැබෙන්නේ නැහැ කියන එක.

2021 වර්ෂයේදී චීනයේ Qingdao Seawin Biotech Group Company එකෙන් කාබනික පොහොර මෙට්‍රික් ටොන් 96,000ක් ගෙන්වීමට ඇණවුම් කරනවා. ඒ නිසා සිදු වෙච්ච අලාභයේ වන්දිය විධියට ඩොලර් 6,900,000ක් ගෙවන්න තීන්දු කරනවා.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. මේ වන්දි තීරණය කරනකොට ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රකාශ කරන පරිද්දෙන්ම පොහොර බෑග් 1,565ක් හමු වෙනවා. හැබැයි, දඩය වෙන්නේ රුපියල් 5,000යි. එම දණ්ඩනය ප්‍රමාණවත් වන්නේ නැහැ. අනික් පැත්තෙන්, දීර්ඝ කාලයක් තිස්සේ සිදු කරන මේ වංචාව නිසා ගොවිතැන බිඳ වැටීම, ගොවීන්ගේ දරිද්‍රතාව වැඩි වීම, දේශීය සහල් කර්මාන්තශාලා බිඳ වැටීම, සේවකයින්ට රැකියා අහිමි වීම, සහල් පිට රටින් ගෙන්වීම කියන සමාජ ව්‍යසනයන්ට ලබා දෙන වන්දිය කුමක්ද කියන එක මම අහන්න කැමැතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය නිවැරදියි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිද්ධ වෙච්ච ඔය පොහොර වංචාව සම්බන්ධයෙන් මමත් මැදිහත් වුණා. මට ඒ සම්බන්ධයෙන් තොරතුරු ආවා. අපේ රත්වත්ත මන්ත්‍රීතුමියත්, වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ පිළිබඳව මාව දැනුවත් කළා. ඒ වාගේම, ඔබතුමන්ලාත් මාව දැනුවත් කළා. ඔබතුමන්ලාගේ මැදිහත් වීම යටතේ තමයි ඇත්තටම ඒ මහා වංචාව නිරාවරණය කරගන්න පුළුවන් වුණේ. බාල පොහොර විශාල ප්‍රමාණයක් ඒ වෙනකොටත් බෙදා හැර තිබුණා. එම පොහොරවල නයිට්‍රජන් සියයට 46ක් තිබෙනවාය කිව්වාට සියයට විසි ගණනක් තමයි තිබිලා තිබුණේ. ඒ තුළ තවත් වංචා ගණනාවක් හෙළිදරව් වෙනවා. ඒ වංචා තුළින් ගොවි ජනතාවට, රටේ ආර්ථික දේහයට විශාල හානියක්, පාඩුවක් සිද්ධ වුණා. හැබැයි, මේ පනතට අනුව එම වංචනිකයින්ට ලබා දුන් දඬුවම ගැන සලකා බැලුවොත්, ඒ ගැන සෑහීමකට පත් වෙන්න බැහැ. ඒ පනත තවම තිබෙනවා. ඔබතුමා කියන කාරණය අපට පැහැදිලියි. මේ පනතට අනුව ඉතාම අවම දඬුවමක් තමයි ඒ වංචනිකයින්ට, වැරදිකරුවන්ට දෙන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ නිසා මේ දඬුවමට ලක් වෙච්ච අය නැවත නැවතත් ඒ වැරැද්ද කරන්න පුළුවන්කම තිබෙනවා. ඊට අදාළව අනිවාර්යයෙන්ම මේ පනත සංශෝධනය විය යුතුයි, ඊට අදාළ දඬුවම් මීට වඩා ඇඩි කළ යුතුයි කියන තැන අපි ඉන්නවා.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, එම පිළිතුර ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මා ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම පසුගිය කාලය පුරාම ගොවි බිම්වල විශාල හඬක් නඟපු කෙනෙක් විධියට එතුමාව හඳුන්වන්න පුළුවන්. මේ ආණ්ඩුව බලයට පත් වනකොට පොහොර සහනාධාරය වශයෙන් දුන්නේ රුපියල් 15,000යි. ඒක රුපියල් 25,000ක් බවට පත් කළා. ඊට අමතරව වී වගා කරන භූමිවල අතුරු භෝග වගා කරනවා නම් හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක දීමනාවක් ලබා දෙන්නට ඔබතුමන්ලා තීරණය කර තිබෙනවා.

[ගරු සුනිල් රත්නසිරි මහතා]

නමුත් ගරු කථානායකතුමනි, අද තිබෙන ගැටලුව තමයි අවිද්‍යාත්මක කෘෂි කර්මාන්තයක් රට පුරා ව්‍යාප්ත වෙලා තිබීම. පස පිළිබඳව කිසිදු පරීක්ෂණයක් නැහැ. රටේ ජනතාවගේ එළවලු අවශ්‍යතාව පිළිබඳව සැලකිල්ලට ගන්නේ නැහැ. ඒ නිසා එළවලු මිල විශාල වශයෙන් උච්චාවචනය වෙනවා. පස පිළිබඳව කිසිදු අධ්‍යයනයකින් තොරව තමයි මේ පොහොර සහනාධාරය ඔබතුමන්ලා ලබා දීමට තීන්දු කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ සම්බන්ධව ඔබතුමාගේ මතය මොකක්ද කියා මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් මා අහන්නට කැමැතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, චීන පොහොර නැව පිළිබඳ කාරණයත් ගරු මන්ත්‍රීතුමා කලින් මතු කළා. ඒ ගැනත් වචනයක් කියන්න ඕනෑකම තිබෙනවා. පොහොර මෙට්‍රික් ටොන් 96,000ක් ඇණවුම් කළා. එයින් මෙට්‍රික් ටොන් 20,550ක් රට ඇතුළට ආවේ නැහැ. නැව රට වටේ කැරකි-කැරකී තිබුණා. එම පොහොර ලංකාවට ගෙනෙන්න ඇණවුම් කර තිබුණේ කිසිදු ප්‍රසම්පාදන සැලැස්මකට අනුව නොවෙයි, නීති විරෝධී විධියටයි. එම පොහොරවල අඩංගු ක්ෂුද්‍ර ජීවීන් අපේ රටට ඔරොත්තු දෙන්නේ නැහැ; ගැළපෙන්නේ නැහැ. ඒ තත්ත්වය තුළ තමයි එම පොහොර තොගය ප්‍රතික්ෂේප වුණේ. නමුත් මේකෙන් අපට වුණු පාඩුව මේකයි. අපිට පොහොරත් නැහැ, මොනවත් නැහැ. අන්තිමට චීන නැවත් නැහැ. ඒක රට වටේ කැරකි-කැරකී තිබුණා. ආපසු නැව ගියා. හැබැයි, ඒ ඇණවුම් කළ මෙට්‍රික් ටොන් 96,000ක් වූ සමස්ත පොහොර තොගය වෙනුවෙන් සියයට 75ක වන්දියක් අපට ගෙවන්න සිද්ධ වුණා. ඒ අනුව තමයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු විධියට ඩොලර් හැටනවලක්ෂයක් -රුපියල් මිලියන 1,383ක්- අපට ගෙවන්න සිද්ධ වුණේ. මේවාට කිසිම සමාවක් දෙන්න බැහැ. මීට අදාළ නීත්‍යනුකූල කටයුතු මේ වනවිටත් සිද්ධ කරගෙන යනවා. ඒ අනුව ඒ අයට උපරිම දඬුවම් එම නීතිමය ක්‍රියාමාර්ග තුළ ලැබේවි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු දෙවැනි අතුරු ප්‍රශ්නය තුළින් මතු කළේ ඉතා වැදගත් කාරණයක්. ඇත්තටම අපේ ගොවි ජනතාව පොහොර භාවිත කිරීමේදී විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව නොවෙයි, පොහොර භාවිත කරන්නේ. ඒ නිසා මේ වෙනකොට අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඊට අදාළ සැලැස්මක් හදා තිබෙනවා. විශේෂයෙන්ම අපි ඉලක්ක කර තිබෙනවා, කන්න 4ක් ඇතුළත වී වගාවට අදාළව පස පරීක්ෂා කරලා ඒ පස තුළ තිබෙන පෝෂක කොටස් ලැබෙන විධියට සහ වගා කරන භෝගයට ගැළපෙන විධියට පොටෑසියම්, පොස්පරස්, නයිට්‍රජන් කියන ප්‍රධාන මූලද්‍රව්‍ය ටික ලැබෙන විධියට ප්‍රමිතිගත කරලා පොහොර ක්‍රියාවලිය ඉදිරියට ගෙන යෑමට. අපි ඒ සඳහා සැලසුම් සකස් කරගෙන යනවා. ඒ අනුව මේ වනවිට පස පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා. එම ක්‍රමවේදය තුළ අස්වැන්න වැඩි කරගන්න පුළුවන්, පොහොර සඳහා කරන වියදම අඩු කරගන්න පුළුවන්, පස විනාශ වෙන එක අවම කරගන්න පුළුවන්. ඊට අදාළ විද්‍යාගාර 32ක් තිබෙනවා. ඒවායේ පවතින අඩුපාඩු වන මානව සම්පත සහ භෞතික සම්පත් මේ වනවිට සම්පූර්ණ කරමින් තිබෙනවා. එම ක්‍රියාවලියට මේ වනවිට අත ගසා තිබෙනවා. ඒ අනුව ඉදිරි කාලය තුළ පස පරීක්ෂා කරලා, යායෙන් යායට, වගා බිමෙන් බිමට, ඒ පසේ තිබෙන ගැළපෙන තත්ත්ව අනුව පොහොර නිර්දේශ කිරීම අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්මාන්තය ගත්තොත්, අපි පිම්මක් පැනීම සඳහා මේ වෙනකොට සකස් කරපු සැලසුම් තුළ ඔබතුමා කියපු කාරණයත් ඇතුළත් වෙනවා කියන එක මම මේ වෙලාවේදී මුළු රටේම ජනතාවට ප්‍රකාශ කරනවා.

## අලව්ව, හුම්බුළුව ග්‍රාමය: ඉඩම් ගැටලුව
### அலவ்வ, ஹும்புலுவ கிராமம்: காணிப் பிணக்கு
### HUMBULUWA VILLAGE, ALAWWA: LAND ISSUE

1065/2025

6. **ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දඹදෙණිය, අලව්ව, හුම්බුළුව ග්‍රාමයේ ඉඩම් ගැටලුවක් පවතින බව දන්නේද;

(ii) 1911 වර්ෂයේ මැනුම අනුව සකස් කරන ලද අංක 455 දරන හුම්බුළුව ගම් පිඹුර බලාත්මකද;

(iii) 1910 වර්ෂයේ සිට ඉහත ග්‍රාමයට අයත් වූ ඉඩම්, පෞද්ගලික පාරම්පරික ඉඩම් ලෙස ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සඳහන් කර ඇති බව දන්නේද;

(iv) අංක 2621 දරන සන්නස ලියාපදිංචි කර තිබේද;

(v) එසේ නම්, එම සන්නස ලියාපදිංචි කරන ලද දිනය සහ අදාළ භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) හුම්බුළුව විහාරය, 2013 අංක 34 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනතේ 4(1) වගන්තිය යටතට පත් වූ දිනය කවරේද;

(vii) හුම්බුළුව ග්‍රාමයේ ජනතාව විසින් පාරම්පරිකව භුක්ති විඳිනු ලැබූ සින්නක්කර ඉඩම්වලට හිමිකම් පෑම, 2017 වර්ෂයෙන් පසුව අහිමි කිරීමට හේතු කවරේද;

(viii) ඒ සම්බන්ධයෙන් ගම්වැසියන් දැනුවත් නොකිරීමට හේතු කවරේද;

(ix) මෙහිදී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් 'ජනතා පරමාධිපත්‍ය බලය' උල්ලංඝනය වී ඇති බව පිළිගන්නේද;

(x) ඉහත ගැටලුව සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தம்பதெனிய, அலவ்வ, ஹும்புலுவ கிராமத்தில் காணிப் பிணக்கொன்று உள்ளதென்பதை அறிவாரா என்பதையும்;

(ii) 1911ஆம் ஆண்டின் நில அளவையின் பிரகாரம் ஆக்கப்பட்ட 455ஆம் இலக்க ஹும்புலுவ கிராம நில அளவை வரைபடம் செல்லுபடியாகுமா என்பதையும்;

(iii) 1910ஆம் ஆண்டிலிருந்து மேற்படி கிராமத்துக்குரிய காணிகளை, தனியார் பரம்பரைக் காணிகளாக காணி உரித்து நிர்ணயத் திணைக்களம் குறிப்பிட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(iv) 2621ஆம் இலக்க அரச எழுத்தாணை பதிவு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், மேற்படி அரச எழுத்தாணை பதிவு செய்யப்பட்ட திகதி மற்றும் ஏற்புடைய காணியின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(vi) ஹும்புலுவ விஹாரையை, 2013ஆம் ஆண்டின் 34ஆம் இலக்க, பௌத்த அறநிலையங்கள் (திருத்தம்) சட்டத்தின் 4(1)ஆம் பிரிவின்கீழ் கொண்டுவரப்பட்ட திகதி யாது என்பதையும்;

(vii) ஹும்புலுவ கிராம மக்கள் பரம்பரை பரம்பரையாக அனுபவித்து வந்த அறுதி உறுதிக் காணிகளுக்கான உரிமையை 2017ஆம் ஆண்டுக்கு பின்னர் இழக்கச் செய்தமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(viii) அது தொடர்பாக கிராம மக்களுக்கு விழிப்புணர்வூட்டாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ix) இதன்போது இலங்கை அரசியலமைப்பில் குறிப்பிடப்பட்டுள்ள 'மக்களின் இறைமை தத்துவம்' மீறப்பட்டுள்ளதை ஏற்றுக்கொள்கின்றாரா என்பதையும்;

(x) மேற்படி பிரச்சினை தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) whether he is aware that there is a land issue in Humbuluwa village in Alawwa in Dambadeniya;

(ii) whether the Humbuluwa Village Plan No. 455 prepared according to the survey of the year 1911 is in force;

(iii) whether he is aware that the lands belonging to the above village since the year 1910 have been mentioned by the Department of Land Title Settlement as private hereditary lands;

(iv) whether the grant bearing No. 2621 has been registered;

(v) if so, the date on which the said grant was registered and the relevant area of land, separately;

(vi) the date on which Humbuluwa Temple came under Section 4(1) of the Buddhist Temporalities (Amendment) Act, No. 34 of 2013;

(vii) the reasons for the depriving of the right to claim the freehold lands traditionally possessed by the people of Humbuluwa village after the year 2017;

(viii) the reasons for not informing the villagers in that regard;

(ix) whether he accepts that the 'people's sovereignty', as provided in the Constitution of Sri Lanka, has been violated due to this; and

(x) the measures that will be taken regarding the above-mentioned issue?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)

(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ Additional Assistant Settlement Officer ජෝන් ස්ටීල් විසින් වර්ෂ 1910 ජනවාරි 06 දිනැතිව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ වාර්තාව මඟින් අංක B.S.P.P 455 දරන පිඹුරට අදාළ වන හුම්බුළුව ග්‍රාමයට අදාළව නිරවුල් කිරීම ප්‍රකාශයට පත් කර ඇත. එමඟින් කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් 18වන සියවසේදී ප්‍රදානය කරන ලද සන්නසට අනුව හුම්බුළුව සම්පූර්ණ ග්‍රාමය හුම්බුළුව විහාරයේ දේපළක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

(iv) ලියාපදිංචි කර ඇත. එය 1866 අංක 06 දරන AN ORDINANCE TO COMPEL THE REGISTRATION OF "SANNASAES", OLD DEEDS AND OTHER INSTRUMENTS OF TITLE යටතේ ලියාපදිංචි කර ඇත.

(v) 1893 මැයි 02වන දින කුරුණෑගල ඉඩම් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි කර ඇත. භූමි ප්‍රමාණය සැටයාල සොළොස් අමුණක් - අක්කර 832ක් - පමණ වේ.

(vi) 2013.12.30 දින අමාත්‍යතුමාගේ අනුමැතියෙන් 2014.01.17 දින ගැසට් පත්‍රය මඟින් ගැසට් කර ඇත.

(vii) හුම්බුළුව රජමහා විහාරයේ භාරකාර පූජ්‍ය උරුලෑවත්තේ ධම්මකිත්ති ස්වාමීන් වහන්සේ විසින් විහාරස්ථානයේ ඉඩම්වල හිමිකම සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් අංක 7913/ඉඩම් දරන නඩු තීන්දුවට අනුව හුම්බුළුව ගමෙහි සංජීව බණ්ඩාර ආදාගල, ප්‍රියංගනී ආදාගල කෙහෙල්වල, අමිත බණ්ඩාර ආදාගල යන අය භුක්ති විඳින ඉඩම් කොටස් හුම්බුළුව රජමහා විහාරයට අයත් ඉඩම් ලෙස තීන්දුවක් ලබා දී ඇත. එමෙන්ම එම නඩුවෙහි, තීන්දුව අභියෝගයට ලක් කරමින් එම නඩුවෙහි විත්තිකරුවන් විසින් කුරුණෑගල සිවිල් අභියාචනාධිකරණයේ අංක NWP/HCCA/KUR යටතේ 85/2022/F හා NWP/HCCA/KUR 86/2022/F දරන නඩුකර පවරා ඇත.

ගරු කථානායකතුමනි, හුම්බුළුව ගම්වාසීන් විසින් මෙම විහාරස්ථානයේ ඉඩකඩ සම්බන්ධයෙන් දෙපැත්තෙන්ම නඩුකර පැවරිලා තිබෙන්නේ.

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

එමෙන්ම හිමිකම් අභියෝගයට ලක් කරමින් අභියාචනාධිකරණයේ CAW/628/2024 දරන නඩු අංකය යටතේ නඩුකරයක් පවත්වා ගෙන යනු ලබයි. මෙම අධිකරණ ක්‍රියාමාර්ග හා නඩු තීන්දු මත මේ වනවිට හුම්බුළුව ග්‍රාමයේ ජනතාව අතර ඉඩම් හිමිකම් සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් පැන නැඟී ඇත. මෙතැන තමයි වැදගත්ම තොරතුර තිබෙන්නේ.

(viii) ගම්වැසියන් අවස්ථා කිහිපයකදීම දැනුවත් කරලා තිබෙනවා.

(ix) නැත.

(x) මේ සඳහා බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක MBRCA/01/01/39 හා 2023.06.09 දිනැති ලිපිය මඟින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවද සැදුම්ලත් පරිදි කමිටුවක් පත් කරලා තිබෙනවා. එම කමිටුව මඟින් වර්තමානයේ මහනුවර අස්ගිරි විහාරස්ථානයේ තැන්පත් කර ඇති තඹ සන්නස නිරීක්ෂණය කර ඇති අතර, දැනට ගැටලු සහගතව ඇති හුම්බුළුව විහාරස්ථානයට අදාළ සන්නස පිළිබඳව පුරාවිද්‍යා අගය තහවුරු කරමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් වාර්තාවක් ලබා දීලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් දැනට ගරු අධිකරණවල පවතින අධිකරණ කටයුතු මඟින් අයිතිය සනාථ කර ගැනීමෙන් පසු ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට සඳහන් කර ප්‍රාදේශීය ලේකම්, අලව්ව වෙත බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් 2023.10.17 දිනැති ලිපියෙන් දැනුම් දීලා තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, මේ ගම්වාසීන් මීට අවුරුදු 200කට පමණ පෙර සිට භාවිත කරන ලද සින්නක්කර ඔප්පු සහිත ඉඩම් මේ භූමිය තුළ තිබෙනවා. මෑත කාලීනව අංක 95204 ලෙස සකස් කළ පිඹුර මඟින් දක්වා ඇත්තේ මෙම ඉඩම කටුගම්පොළ හත්පත්තුවට අයත් බවයි. නමුත් 1911 අංක 455 දරන මුල් ගම් Plan එක තුළ සඳහන් වන්නේ සත්‍ය ලෙස මෙම ඉඩම දඹදෙණිහත්පත්තුවට අයත් බවයි. එබැවින් ගරු අමාත්‍යතුමනි, මේ සම්බන්ධව ඔබතුමාගේ ඉක්මන් අවධානය යොමු කර මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කළ හැක්කේ කුමක්ද යන්න මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විමසන ප්‍රශ්නය සහ එම ප්‍රශ්නයට පදනම් වුණු පසුබිම් කථාව ඉතාම වැදගත් එකක්. මේක අලව්ව, හුම්බුළුවට පමණක් සීමා වුණු තත්ත්වයක් නොවෙයි. විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ මෙබඳුම ප්‍රශ්න රාශියක් දකින්නට ලැබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ මුළු ප්‍රශ්නයම මා සලකන්නේ ගැඹුරු අධ්‍යයනයකින් පසු ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු අඩවියක් හැටියටයි.

ඔබතුමා අහනවා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව. රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම කළ යුතුයි වාගේම අධිකරණය සම්බන්ධ වෙලා තිබෙන නිසා ඒ අදාළ ගෞරවය සහිතවමයි මා පිළිතුරු සපයන්නේ. අක්කර 832ක ඉඩම් ප්‍රමාණය දීර්ඝ කාලීනව ජනතාව භුක්ති විඳිනවා, ස්ථිර ගොඩනැඟිලි තිබෙනවා, හවභෝග වවා තිබෙනවා, බදු ගෙවා තිබෙනවා. ඒ සියල්ල සත්‍යයි. ඒ වාගේම කාරණා 6ක් නිසා මේ ප්‍රශ්නය,විසඳන්න තිබෙන තත්ත්වය ඉතාම උග්‍ර වෙලා තිබෙනවා. රජය මඟින් "ජන්ම භූමි" ඔප්පු ලබා දීලා තිබෙනවා. නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස තනලා සහන මිලට විකුණලා, ඉඩම් වෙන්දේසිකරුවන් විසින් ඉඩම් වෙන්දේසි කරලා, ප්‍රසිද්ධ වෙන්දේසි මඟින් ඉඩම් හා නිවාස විකුණලා දීර්ඝ කාලීනව භුක්ති විඳින ඉඩම් තිබෙනවා, ඔබතුමා කිව්වා වාගේ. ඒ වාගේම විහාරස්ථානයක් ඉදි කර ඇති ඉඩම්ද තිබෙනවා. ඒ අනුව ඉතාම සංකීර්ණ තත්ත්වයක් ජනිත වෙලා තිබෙන්නේ. අතීත සමාජ තත්ත්වය අනුව තමයි රාජසිංහ රජතුමාගේ කාලයේ සන්නස තිබෙන්නේ. නමුත් අපි ඉන්නේ ඉතාම නූතන ජීවිතයක. ඔබතුමාට කියන්නට ඕනෑ, මේ ගම් වැසියන් පැමිණ මා මුණ ගැසුණා, මන්ත්‍රීවරුන්ව මුණ ගැසුණා. ඒ ප්‍රශ්න සත්‍යයක්, ඔවුන් විඳින පීඩාව සත්‍යයක්. ඒ වාගේම විහාරය සතුව තිබෙන පැරණි සන්නස්වලටත් ප්‍රමාණවත් සාධක පෙනෙන්නට තිබෙනවා. ඒ නිසා අමාත්‍යාංශය හැටියටත්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හැටියටත් දෙපැත්ත දැනුවත් කරලා අපි ඉතාම සාධාරණ තැනකට යන්නට අවශ්‍යයි. ඒ වාගේම දෙපාර්ශ්වයෙන් පැවරුණු නඩු කටයුතු අවසන් වෙනතුරු ඉන්න වෙනවා. එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ නඩු කටයුතු ඉතා ඉක්මනින් විසඳා ගන්න මග පෙන්වීම සහ මැදිහත්වීම තමයි කරන්න තිබෙන හොඳම දේ.

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. මෙම ගැටලුව නිසා ගම්වාසීන් 6,000කට තමන්ගේ දරුවෝ පාසලකට ඇතුළත් කර ගැනීමට බැරි ප්‍රශ්නය තිබෙනවා. ඊළඟට, සුළු පරිමාණ ව්‍යාපාර ලියාපදිංචි කර ගන්න බැහැ. බැංකු ණයක් ගන්න බැහැ, ගෙයක් හදා ගන්න ගියාම plan එක අනුමත කර ගන්න බැහැ. මේ, කාලයක් තිස්සේ ඒගොල්ලන් භුක්ති විඳපු තත්ත්වයන්. හැබැයි දැන් වසර 10ක පමණ ඉඳලා තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ඔවුන් පරම්පරා ගාණක් තිස්සේ භුක්ති වින්ද ඒ අයිතිවාසිකම් අහිමි වෙලා තිබෙන්නේ 2024.07.23වෙනි දා බෞද්ධ කටයුතු කොමසාරිස් ජෙනරාල් විසින් අලව්ව ප්‍රාදේශීය ලේකම් වෙත යවන ලද ලිපියක් මඟින්. ඇත්තටම, බෞද්ධ කටයුතු අමාත්‍යාංශයකින් වෙන්න ඕනෑ ජනතාවගේ පැත්ත ගැන හිතලා කටයුතු කිරීමයි. ඒ ජනතාව භුක්ති විඳපු දේවල් අහිමි කිරීම නිසා ඔබතුමාගේ පැත්තෙන් කඩිනමින් කළ හැකි යමක් තිබේද කියලා දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, එතුමා ඉදිරිපත් කරන ඒ තත්ත්වය ඉතාම සත්‍යයක්. එතැන ඉඩම් අක්කර 832ක් තිබෙනවා. රත්නපුර කොළඹගේආර සංඝපාල විහාරය ගත්තත්, නැඳුන් විහාරයට අයිති දුම්බර මානාන ඉඩම් ගත්තත් ඒවා අක්කර හත් අටදහස් ගණනක් විශාල ඉඩම්. අඩුම තරමින් දැන් ජීවත් වන අයට වැසිකිළියක් ඉදි කරගන්න හෝ පහසු නැහැ. අවශ්‍යතාව මත එබඳු උත්සාහයක් ගත්තොත්, ඒකට හරස් වෙන්න ඉස්සරහට එන්නේ, අවුරුදු දහස් ගණනක් පැරණි සන්නසක්. ඒ නිසා අප වටහා ගත යුතු කාරණය මෙයයි. මේ තත්ත්වය ඉතාම පැහැදිලිව සොයා බලා බෞද්ධ විහාර දේවාලගම් පනත, පුරාවිද්‍යා ආඥා පනත වාගේ ඒවාට

සාධාරණ සංශෝධන එකතු කරලා තමයි ගරු මන්ත්‍රීතුමනි, මේ ගැටලුව විසඳන්න තිබෙන්නේ. ඒ වාගේම මේ දෙපාර්ශ්වය අතර ඉතාම පැහැදිලි අවබෝධයක් ඇති කරගන්නට ඕනෑ. එහෙම වුණොත් විතරයි අපට මෙතැන ඇති වෙන විරසකය පාලනය කරගන්න පුළුවන් වෙන්නේ. දෙවනුව, අපි නිවැරදිව අධිකරණයේ පිහිට පතන්නට ඕනෑ; නඩු කටයුතු ඉක්මන් කරගන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව තව තවත් ගැටලු මතු වෙනවා. ඔවුන් මුහුණ දීලා තිබෙන පීඩාව ඉතාම සත්‍යයක්. ඒ නිසා මගේ පැත්තෙන් මේ කාරණයට මැදිහත් වෙනවා. ඇත්තටම හුම්බුළුව ග්‍රාමය ගැන විතරක් නොවෙයි, මේ හා සමානව තිබෙන සියලුම දේවල් එකට සලකා බලා ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න ඉතා ඉක්මනින් රජයේ අවධානය යොමු කරනවා.

## පවුල් සෞඛ්‍ය සේවිකාවන්: සංයුක්ත දීමනාව
### குடும்பநல மருத்துவ மாதுகள்: இணைந்த கொடுப்பனவு
### PUBLIC HEALTH MIDWIVES: COMBINED ALLOWANCE

1067/2025

**7. ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා මේ වනවිට ලබා දෙන සංයුක්ත දීමනාව ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(ii) එම දීමනාව වැඩි කිරීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) එම දීමනාව වැඩි කිරීම සම්බන්ධයෙන් ඇති සීමාවන් හඳුනාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குடும்பநல மருத்துவ மாதுகளுக்குத் தற்பொழுது வழங்கப்படுகின்ற இணைந்த கொடுப்பனவு போதுமானதாக இல்லை என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) மேற்படி கொடுப்பனவை அதிகரிப்பதற்கான ஏதேனும் வேலைத்திட்டம் உள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி கொடுப்பனவை அதிகரிப்பது தொடர்பில் காணப்படுகின்ற வரையறைகள் அடையாளம் காணப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media :

(a) Will he inform this House -

(i) whether he accepts that the current combined allowance provided to Public Health Midwives is not adequate;

(ii) whether there is a course of action to increase the said allowance;

(iii) if so, the steps that have been taken in that regard; and

(iv) whether limitations for increasing that allowance have been identified?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දැනටමත් අපි පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ මූලික වැටුප් වැඩිවීමක් කරලා තිබෙනවා. ඒ අනුව සංයුක්ත දීමනාව වැඩි වෙනවා. ඉදිරියේදී තවත් වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා.

(ii) ඔව්. රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමේදී එය අදාළ කරගන්නවා.

(iii) මෙය, පසුගිය වැටුප් වැඩිවීමත් එක්ක වැඩි කරපු බව මම කියන්න කැමැතියි.

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ වන විට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි මහත්ම මහත්මීන්ගේ කාර්යාල දීමනාව සම්බන්ධයෙන් ලොකු ගැටලුවක් පවතිනවා. රුපියල් 250ක මුදලක් තමයි ඔවුන්ගේ කාර්යාල දීමනාව වශයෙන් තිබෙන්නේ. අර්ධ නාගරිකව, නාගරිකව, ග්‍රාමීයව කාර්යාල පවත්වාගෙන යන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් ඒ තුළ දැඩි දුෂ්කරතාවකට පත් වෙලා සිටිනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඒ කාරණය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඒ වාගේම, මම ඒ පිළිබඳව ඔබතුමාගෙන් විමසීමක් ද කරන්න කැමැතියි. මේ මොහොතේ ඔවුන්ගේ කාර්යාල දීමනාව තිබෙන්නේ අපට කථා කරන්නවත් පුළුවන් මට්ටමක නොවෙයි. ඒ නිසා එහි යම් සංශෝධනයක් කරන්න රජය එකඟද? ඒ වාගේම, ගම තුළ -ග්‍රාමීයව- පවත්වාගෙන යනවා, "නිල සෙවන", "නිල පියස". ඉදිරියේදී ප්‍රතිපත්තිමය තීන්දුවක් මත ඒ කියන නිල සෙවන තුළ හෝ ඔවුන්ට කාර්යාලයක් ලබා දීමේ යම් එකඟතාවක් සඳහා යම් මැදිහත්වීමක් සිදු කරනවාද කියන කාරණය මම ගරු ඇමතිතුමාගෙන් විමසන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, Universal Health Coverage එකේ අපි දැන් ඉන්නේ 67වන තැන. එතැනට ඒම සඳහා, විශේෂයෙන් මාතෘ හා ළදරු සෞඛ්‍යය පවත්වාගෙන යෑමේදී ප්‍රාථමික සෞඛ්‍ය සේවාව විධිමත් කිරීම සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් විසින් ගම් මට්ටමින් කරන ලද කාර්යභාරය විශාල වශයෙන් හේතු වුණා. ඔවුන්ට ලබා දෙන කාර්යාල දීමනාව, ප්‍රවාහන දීමනාව ආදියෙහි ගැටලු තිබෙනවා. අපි දැන් ඒ පිළිබඳව සාකච්ඡා කරගෙන යනවා.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ගරු මන්ත්‍රීතුමනි, කාර්යාල දීමනාව වැඩි කරනවාට අමතරව ලබන වසරේ මුල් මාස තුන තුළදී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ට අවශ්‍ය කරන බයික් එකක් -යතුරුපැදියක්- ලබා දෙන්නත් පුළුවන්කම ලැබේවි. ඒවාත් එක්කම ඉතිරි සියලු දීමනා පිළිබඳවත් අප සලකා බලමින් ඉන්න බව මම ඔබතුමාට කියන්න කැමැතියි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය ගරු විපක්ෂ නායකතුමා විමසනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා හොඳින් අවබෝධ කරගෙන තිබෙනවා, ළමා සහ මාතෘ සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන. ක්ෂේත්‍රය තුළ ඉඳගෙන වඩාත් සාධනීය සේවාවක් කරන කොට්ඨාසයක් තමයි Public Health Midwives. මේ ප්‍රශ්නය තුළ විශේෂ කාරණයක් කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. පිට කොට්ඨාසවල රාජකාරි කරන බොහෝ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් ඉන්නවා. මොකද, හැම කොට්ඨාසයකටම PHMs නැහැ. ඒ අය වැඩ ආවරණය කරන කොට ඒ අයට වරු 6කට පමණයි ගෙවන්නේ. වරු 10ක් වැඩ කළත්, 20ක් වැඩ කළත්, 25ක් වැඩ කළත් වරු 6 සීමාවේ තමයි ගෙවීම තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඒ වාගේම, ඒ අයට ගමන් දීමනාව වශයෙන් ගෙවන්නේ කිලෝමීටරයකට රුපියල් 2යි. ඒක ප්‍රමාණවත් නැහැ කියන එක බොහොම පැහැදිලියි. සංයුක්ත දීමනාව පිළිබඳ ප්‍රශ්නය මීට ඉහතදී ඉදිරිපත් වුණා. කාර්යාල දීමනාව හැටියට ග්‍රාමීය බල ප්‍රදේශවලට අදාළව ගෙවන්නේ රුපියල් 250යි; නාගරික බල ප්‍රදේශවලට රුපියල් 450යි. ගරු ඇමතිතුමනි, එයත් කිසිසේත් ප්‍රමාණවත් නැහැ කියන එක ඔබතුමාත් පිළිගන්නවා ඇති. ඉතින් මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, විශේෂයෙන් අර හිස් වුණු පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස සම්බන්ධයෙන්. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගෙන් හුඟක් අය දැන් තවත් කොට්ඨාසවල වැඩ ආවරණය කරනවා නේ. මොකද, අංග සම්පූර්ණ නිලධාරිනියන් ප්‍රමාණයම නැහැ. ඒ පත් කිරීම් ටික ඉතාම ඉක්මනින් කරන්න ඔය විභාග ක්‍රමය තුළ ක්‍රියාත්මක වන්නේ කවදාද කියන ප්‍රශ්නයත් මා අහනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය මධ්‍යස්ථාන නොමැති පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාසවලට පවුල් සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදි කර දීමත් ඉතාම වැදගත් වෙනවා. මම කරුණු ගණනාවක් ඉදිරිපත් කළා ළමා සහ මාතෘ සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන්. මොකද, එය ඉතාම වැදගත් සේවයක්. ඒ අඩුපාඩුකම් මඟ හැරවීම සඳහා වන විසඳුම් ලබා දෙන්න ඔබතුමන්ලා කටයුතු කරන්නේ කවදාද කියන ප්‍රශ්නයත් මම මේ අවස්ථාවේ අහන්න කැමැතියි.

අවසාන වශයෙන් මම තවත් කාරණයක් කියන්න ඕනෑ. අපේ රටේ ග්‍රාම නිලධාරි වසම් 14,021ක් තිබෙනවා. හැබැයි, පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාසවලට සමහර අවස්ථාවල ග්‍රාම නිලධාරි වසම් ගණනාවක් අයිති වෙනවා. එදා තිබුණු පවුල් නිර්ණායකයයි, අද තිබෙන පවුල් නිර්ණායකයයි වෙනස්. ඒ කියන්නේ, එක නිලධාරිනියක් ආවරණය කරන ජනගහනයේ කොටස බැලුවාම, අද එම කාර්යය කරන්න ඇත්තවශයෙන්ම ඉතාම අපහසුයි. මම යෝජනා කරනවා, පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාසය කියන එකත් කුඩා කළ යුතුය කියලා. එයත් ඉතාම වැදගත්. ගරු ඇමතිතුමනි, ඒ කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, දැන් අපේ රටේ උපත් ප්‍රමාණය අඩු වෙමින් යන බව. ඒ නිසා හැම ග්‍රාම නිලධාරි වසමටම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් අවශ්‍ය වන්නේ නැහැ. නමුත්, අපි එය විද්‍යානුකූලව ගණනය කරගෙන යනවා. ඒ වාගේම, දැන් අපි ප්‍රාථමික සෞඛ්‍ය සේවාව සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ යටතේත් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් විසින් සේවාව ලබා දෙන මාතෘ හා ළදරු සායන, සායන පවත්වාගෙන යන ගරු වැටීමට ලක්ව ඇති ස්ථාන විශාල ප්‍රමාණයක් අලුත්වැඩියා කරනවා; නවීකරණය කරනවා සහ සමහර තැන්වල අලුත් ඒවා ද ඉදි කරනවා. අර කියපු රුපියල් 250 දීමනාව 2015-2020 කාල සීමාව තුළ රුපියල් 2,000ක්වත් කරලා තිබුණා නම්, අපට එතැනින් එහාට යන්න පුළුවන්කම තිබුණා. කාලයක් තිස්සේ එසේ දීමනා වැඩි කරලා තිබුණේත් නැහැ. මාතෘ හා ළදරු සෞඛ්‍යයට අදාළ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට අපි කොහොමත් කටයුතු කරනවා. මා කලින් කිව්වා වාගේ, ඔවුන්ගේ සංයුක්ත දීමනාව, ප්‍රවාහන දීමනාව, යතුරු පැදි, කාර්යාල පහසුකම ඇතුළු සියලු පහසුකම් සලසා අලුත් ව්‍යාපෘතියක් යටතේ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඇත්තටම පසුගිය කාලයේදී ණය ලබාගෙන පවා, ලෝක බැංකුවේ ව්‍යාපෘතිවලින් පවා මේ ක්ෂේත්‍රය වැඩිපුර ආවරණය වෙලා තිබුණේ නැහැ. ඒ නිසා අපි ඒ ගැන සැලකිල්ල යොමු කරනවා. මීට දවස් කිහිපයකට කලිනුත් අපි Family Health Bureau එක සමඟත් සාකච්ඡාවක් කරලා මේ සම්බන්ධයෙන් මැදිහත්වීමක් කරමිනුයි ඉන්නේ, ගරු කථානායකතුමනි.

## ජාතික අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ තනතුරු: බඳවා ගැනීමේ සුදුසුකම්

தேசிய கல்வி நிறுவகத்தின் சிரேஷ்ட விரிவுரையாளர் மற்றும் சிரேஷ்ட கல்வியியலாளர் பதவிகள்: ஆட்சேர்ப்புத் தகைமைகள்

POSTS OF SENIOR LECTURER AND SENIOR EDUCATOR OF NATIONAL INSTITUTE OF EDUCATION: RECRUITMENT QUALIFICATIONS

1069/2025

**8. ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ යන තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය යාවත්කාලීන කිරීමේදී, පෙර පැවැති සුදුසුකම වූ ප්‍රථම උපාධියේ පන්ති සාමර්ථ්‍යයක් ලබා තිබීමේ සුදුසුකම ඉවත් කර තිබේද;

(ii) එසේම පෙර පැවැති සුදුසුකමක් වූ ඉගැන්වීමේ පළපුරුද්ද ඉවත් කර තිබේද;

(iii) ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය යාවත්කාලීන කිරීමේදී පෙර පැවැති 'පිළිගත් ආයතනයකින් ලබාගත් පළපුරුද්ද' වෙනුවට 'පිළිගත් පෞද්ගලික ආයතනයකින් ලබා ගත් පළපුරුද්ද' ලෙස සංශෝධනය කර තිබේද;

(iv) ඉහත පරිදි බඳවා ගැනීමේ සුදුසුකම් සංශෝධනය කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய கல்வி நிறுவகத்தின் சிரேஷ்ட விரிவுரையாளர் மற்றும் சிரேஷ்ட கல்வியியலாளர் ஆகிய பதவிகளுக்கு ஆட்சேர்க்கும் நடைமுறையை இற்றைப்படுத்தும்போது, முன்பிருந்த இளங்கலை பட்டப்படிப்பில் வகுப்புச் சித்தி பெற்றிருக்க வேண்டும் என்ற தகைமை நீக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறே இதற்கு முன்பிருந்த கற்பித்தல் அனுபவம் தொடர்பான தகைமையும் நீக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) மேற்படி பதவிகளுக்கு ஆட்சேர்க்கும் நடை முறையை இற்றைப்படுத்தும்போது, முன்பிருந்த ‘ஏற்றுக்கொள்ளப்பட்ட நிறுவனமொன்றிட மிருந்து பெற்ற அனுபவம்’ என்பதற்குப் பதிலாக ‘ஏற்றுக்கொள்ளப்பட்ட தனியார் நிறுவன மொன்றிடம் இருந்து பெற்ற அனுபவம்’ எனத் திருத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iv) மேற்படி ஆட்சேர்ப்புத் தகைமைகளைத் திருத்துவதன் நோக்கங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether the qualification of having obtained a bachelor's degree with a class, which was a requirement for recruitment to the posts of Senior Lecturer and Senior Educator of the National Institute of Education, has been removed in the process of updating the said recruitment scheme;

(ii) similarly, whether the previous requirement of having the qualification of experience in teaching has also been removed;

(iii) whether the previous requirement of having the qualification of ‘experience obtained from a recognized institution’ has been amended to include ‘experience obtained from a recognized private institution’ in the process of updating the recruitment scheme for the above-mentioned posts; and

(iv) the objectives of amending the recruitment qualifications as is mentioned above?

(b) If not, why ?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති නිර්ණායකවලට අනුකූල වන පරිදි එම සුදුසුකම ඉවත් කර තිබේ.

(ii) ඔව්. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්ණායකවලට අනුකූලව සහ ආයතනයේ බහුතර එකඟතාව අනුව එසේ කර ඇත.

(iii) නැත.

දැනට ක්‍රියාත්මක පටිපාටියේ සේවා පළපුරුද්ද පිළිබඳව සටහන් කර ඇතත්, එම පළපුරුද්ද ලබා තිබිය යුතු ආයතන පිළිබඳ සටහනක් නොමැත.

නමුත් යෝජිත පටිපාටියේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති නිර්ණායකවල දැක්වෙන පරිදි අපේක්ෂිත සේවා පළපුරුද්ද රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයකින් ලබා තිබිය යුතු බව දැක්වේ. මෙය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති නිර්ණායකවල තිබෙන්නකි.

(iv) ජාතික අධ්‍යාපන ආයතනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයනට අනුකූල වන පරිදි නව බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීම 2018 වසරේදී ආරම්භ කර තිබූ අතර, මේ වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ මධ්‍ය මට්ටමේ සිට ප්‍රාථමික සේවා ශ්‍රේණිය දක්වා තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටි අනුමත කර ගැනීමට හැකි වී ඇත.

ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ සේවා ශ්‍රේණියේ සහ අධ්‍යයන හා පර්යේෂණ සේවා ශ්‍රේණියේ තනතුරු සඳහා ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයනට අනුකූලව සකස් කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරින්ගේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ අදාළ වෘත්තීය සංගම්වල බහුතර එකඟතාව මත සකස් කර අධ්‍යක්ෂ ජනරාල්ගේ සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ සහිතව අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අගමැතිතුමියනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරන කාල වකවානුවක්, මේක. ජාතික අධ්‍යාපන ආයතනය තමයි, පාසල් අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කරන apex body එක. 1985දී ඒ ආයතනය පටන් ගත්තු දවසේ ඉඳලා මෑතක් වනකල්ම එම ආයතනයේ විශේෂයෙන් අධ්‍යාපනඥ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරුවලට බඳවා ගැනීමේ නිර්ණායකවල, ප්‍රථම උපාධියේ පන්ති සාමර්ථ්‍යක් ලබා තිබීම කියන එක අනිවාර්ය වෙලා තිබුණා. ඒ, එම තනතුරුවල

[ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා]

ගුණාත්මකභාවය පවත්වා ගන්න ඕනෑ නිසා. SOR එක - Scheme of Recruitment - හදද්දී මා දන්නා තරමින් ඒක කරන්න ඕනෑ මානව සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුවයි. නමුත් ඊට පරිබාහිරව වෙනත් කණ්ඩායම් මැදිහත් වෙලා, එම තනතුරු සඳහා බඳවා ගැනීමේදී ප්‍රධාන වශයෙන් තිබෙන්න ඕනෑ ඒ මූලික සුදුසුකම ඉවත් කර තිබෙනවා. ඉස්සර කාලයේ එම සුදුසුකම ගැන බලන්න එච්චර වුවමනාවක් තිබුණේ නැහැ. අද කාලය වනකොට ප්‍රථම උපාධියේ පන්ති සාමර්ථයන්, දෙවැනි පෙළ ඉහළ සාමර්ථයන් ලබපු අධ්‍යාපනඥයන්, උපාධිධාරින් ඕනෑ තරම් ඉන්න නිසා එම තනතුරුවලට බඳවා ගැනීමේදී ප්‍රථම උපාධියේ පන්ති සාමර්ථයක් ලබා තිබිය යුතුය කියන සුදුසුකම ඉවත් කළේ ඇයි කියන කාරණය සම්බන්ධව අපට බරපතළ ගැටලුවක් තිබෙනවා. දෙවැන්න, එම අධ්‍යාපනඥයන් බඳවා ගැනීමේදී පෙර පැවැති, ඉගැන්වීමේ පළපුරුද්ද කියන සුදුසුකම ඉවත් කිරීම පිළිබඳ ගැටලුවයි. මම අහන්න කැමැතියි, එම බඳවා ගැනීමේ පටිපාටිය යාවත්කාලීන කරන්න මැදිහත් වුණේ කවුද, ඒ සුදුසුකම් ඉවත් කිරීමට ඇත්තවශයෙන්ම අරමුණු වුණේ මොන කාරණයද කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නිර්ණායක අනුව, පන්ති සාමර්ථයේ - Class එකේ - තියෙන එකයි, ඒ අයට ලැබෙන වැටුපයි ගැළපෙන්නේ නැහැයි කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. එතකොට, Class එකක් අනුව බඳවා ගැනීමක් කරනවා නම්, ඔවුන් ස්ථානගත වන තැන අනුව වැටුප් තලය වෙනස් විය යුතුයි. ඒ නිසා තමයි මේ සාකච්ඡාව මේ දවස්වල සිද්ධ වෙමින් තිබෙන්නේ. Class එකක් තිබෙන කෙනෙක් බඳවා ගන්න කිසිසේත්ම බාධාවක් නැහැ. නමුත්, ඒක condition එකක් හැටියට දානවා නම්, ඒගොල්ලන් ඒ වැටුප් තලයේ පිහිටුවිය යුතු තැනකුත් තිබෙනවා. ඒ අනුව තමයි මේ සාකච්ඡාව මේ වෙලාවේ සිදු වෙන්නේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව තුළින් දීලා තිබෙන උපදෙස්වලට අනුකූලව අපි මේ නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකේ අවසාන තීරණයක් ඇවිල්ලා නැහැ. පළපුරුද්ද ඕනෑ නැහැ කියන කාරණය කිසිසේත්ම ඉවත් කරලා නැහැ. පළපුරුද්ද අවශ්‍යයි. ඒ කොන්දේසිය තවම තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියපු අදහසට මම සම්පූර්ණයෙන් එකඟයි. බඳවා ගැනීමේ පටිපාටිය සහ එහි තිබෙන ගුණාත්මකභාවය රැක ගැනීමේ අවශ්‍යතාව මේ මොහොතේ අපට තදින් දැනෙන දෙයක්. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශවලටත් අපට අනුකූල වෙන්න තිබෙන නිසා තමයි මේක ඉදිරිපත් කරලා තිබෙන්නේ. නමුත්, මේ සඳහා තවම අනුමැතිය ලැබී නැහැ.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තවශයෙන්ම වැටුප් මූලික කරගෙන මේ වාගේ අඩු සුදුසුකම් තිබෙන පිරිස මෙම ප්‍රධාන අධ්‍යාපන ආයතනයට බඳවා ගැනීම සම්බන්ධ ගැටලුවක් තිබෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා, ඒ වාගේම ගරු අධ්‍යාපන ඇමතිතුමියගෙන් ඉල්ලා සිටිනවා, මේක මීට වඩා පුළුල් සංවාදයකට ලක් කරන්න කියලා. මේක ලංකාවේ තිබෙන ප්‍රධාන අධ්‍යාපන ආයතනය; ප්‍රතිපත්ති හදන ආයතනය. මෙතැනට එක එක trade unionsවල වාගේ ඉන්න සුදුසුකම් නොලත් පිරිසකගේ මූලිකත්වයෙන් මේ වාගේ,- විශේෂයෙන්ම Scheme of Recruitment කියන එක කාලාන්තරයක් තිස්සේ පවත්වාගෙන ආපු එකක් - පහත් මට්ටමකට දාලා සුදුසුකම් නොලත් කට්ටිය, ප්‍රථම උපාධියේ පන්ති සාමර්ථයක් නොමැති කට්ටිය මේ වාගේ අධ්‍යාපනඥ තනතුරුවලට, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරුවලට බඳවා නොගෙන, මෙම Scheme of Recruitment නැවත පුළුල් සංවාදයකට භාජන කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒ සංවාදයට අපි විවෘතයි. මොකද, අපිත් එකඟ වෙනවා, ජාතික අධ්‍යාපන ආයතනය ශක්තිමත් විය යුතුයි කියලා. මෙතැනින් විෂය මාලා හදන එක විතරක් නොවෙයි, ගුරුවරු පුහුණු කරන එකත් කරනවා. එම ආයතනය පනතක් මඟින් පිහිටුවනු ලැබූ ආයතනයක්. එම නිසා ඒ යෝජනාව අපි පිළිගන්නවා. මේ කාරණය සංවාදයට භාජන කරන්නත් අපි සම්පූර්ණයෙන්ම එකඟයි.

## පෞද්ගලික වතු සමාගම්වලට ලබා දී ඇති රාජ්‍ය ඉඩම්: මාතර දිස්ත්‍රික්කය

### தனியார் தோட்ட நிறுவனங்களுக்கு வழங்கப்பட்டுள்ள அரச காணிகள்: மாத்தறை மாவட்டம்

### STATE LANDS GRANTED TO PRIVATE PLANTATION COMPANIES: MATARA DISTRICT

1072/2025

**9. ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් අතරින් පෞද්ගලික වතු සමාගම්වලට ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ලබාදී ඇති එක් එක් වතු සමාගමේ නම, ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය සහ එම ඉඩම්වල වගා කර ඇති භෝග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත වතු සමාගම්වලට ලබාදී ඇති ඉඩම් අතරින් වගා කටයුතු සිදුකර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත වතු සමාගම් අතරින්, ලබාදී ඇති ඉඩම්වල වගා කටයුතු සිදුකර නොමැති වතු සමාගම් කවරේද;

(v) එම ඉඩම් නැවත රජයට පවරා ගැනීමට සැලසුම් කර තිබේද;

(vi) ඉහත වතු සමාගම්වලින් රජයට අයවිය යුතු ආදායම් නියමිත පරිදි අයවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்திலுள்ள அரச காணிகளில் தனியார் தோட்ட நிறுவனங்களுக்கு வழங்கப் பட்டுள்ள காணிகளின் அளவு யாது என்பதையும்;

(ii) அந்தக் காணிகள் வழங்கப்பட்டுள்ள ஒவ்வொரு தோட்ட நிறுவனத்தினதும் பெயர், வழங்கப் பட்டுள்ள காணிகளின் அளவு மற்றும் அந்தக் காணிகளில் பயிரிடப்பட்டுள்ள பயிர்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி தோட்ட நிறுவனங்களுக்கு வழங்கப் பட்டுள்ள காணிகளில் பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்டுள்ள காணிகளின் அளவு எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி தோட்ட நிறுவனங்களில், வழங்கப் பட்டுள்ள காணிகளில் பயிர்ச்செய்கை நடவடிக்கைகளை மேற்கொள்ளாத தோட்ட நிறுவனங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி காணிகளை மீண்டும் அரசாங்கத்துக்குக் கையகப்படுத்துவதற்குத் திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(vi) மேற்படி தோட்ட நிறுவனங்களிடமிருந்து அரசாங்கத்துக்குக் கிடைக்கப் பெறவேண்டிய வருமானங்கள் உரிய முறையில் அறவிடப் பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) the extent of land granted to private plantation companies, out of the State-owned lands in the Matara District;

(ii) the name of each of the companies to which such lands were made available, the extent of lands given to each such company and the crops grown on each of the lands, separately;

(iii) the extent of land in which cultivation has been carried out, out of the lands given to the plantation companies referred to above;

(iv) the names of the plantation companies which have not carried out cultivation activities on the lands given to them, out of the plantation companies referred to above;

(v) whether plans have been made to take those lands back to the Government; and

(vi) whether revenues accruable to the Government have been recovered properly from the plantation companies concerned?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) හෙක්ටෙයාර 8,410.28යි.

(ii) තොරතුරු පහත වගුවේ දැක්වේ.

| වැවිලි සමාගම | දිස්ත්‍රික්කය | වතුයාය | මුළු බිම් ප්‍රමාණය (හෙක්.) | වගා කළ මුළු බිම් ප්‍රමාණය (හෙක්.) | තේ (හෙක්.) | රබර් (හෙක්.) | පොල් (හෙක්.) | ඔයිල් පාම් (හෙක්.) | වෙනත් (හෙක්.) | වන වගා (හෙක්.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| නමුණුකුල | මාතර | අකුරැස්ස | 807.54 | 620.67 | 51.00 | 254.24 | 45.94 | 188.70 | 46.30 | 34.49 |
| | | හුලන්දාව | 676.24 | 336.07 | 51.27 | 48.99 | - | 235.81 | 0.00 | - |
| | | තැන්නහේන | 593.01 | 409.88 | 20.28 | 43.44 | - | 290.41 | 2.25 | 53.50 |
| | | | 2,076.79 | 1,366.62 | 122.55 | 346.67 | 45.94 | 714.92 | 48.55 | 87.99 |
| තලවකැලේ | | දෙනියාය | 691 | 319.36 | 213.16 | 13.55 | 5.00 | - | 50.95 | 36.70 |
| | | ඉන්දොළ | 300.64 | 227.94 | 82.39 | 77.64 | 20.47 | - | 18.19 | 29.25 |
| | | කිරිවාණගහ | 516.88 | 442.79 | 329.65 | - | 9.77 | - | 54.87 | 48.50 |
| | | | 1,508.52 | 990.09 | 625.20 | 91.19 | 35.24 | 0 | 124.01 | 114.45 |
| මතුරට | | අන්දපාන | 348.95 | 281.23 | 24.75 | 80.34 | 51.85 | 118.54 | 0.00 | 5.75 |
| | | අනින්කන්ද | 624.00 | 298.73 | 107.37 | 6.00 | 3.00 | 5.00 | 30.50 | 146.86 |
| | | බෙවර්ලි | 425.54 | 247.29 | 94.75 | - | - | - | 21.00 | 131.54 |
| | | දිද්දෙනිපොත | 685.60 | 480.01 | 173.61 | 162.87 | 2.51 | 0 | 120.49 | 20.53 |
| | | එන්සල්වත්ත | 2,230.38 | 528.88 | 343.8 | 38.78 | - | - | 6.00 | 140.25 |
| | | විල්පිට | 510.50 | 295.95 | 17.44 | 77.15 | 67.75 | - | 133.61 | - |
| | | | 4,824.97 | 2,132.09 | 761.77 | 365.14 | 125.11 | 123.54 | 311.60 | 444.93 |

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

(iii) හෙක්ටෙයාර 4,488.80

(iv) ඔබතුමා විමසීම් කරන්නේ වගා නොකළ, වගා කළ හැකි ඉඩම් යැයි සලකා අපි පිළිතුරක් සූදානම් කරලා තිබෙනවා. ඒකත් දීර්ඝ වගුවක්. ඔබතුමා අහනවා නම් ඒකත් කියවන්න පුළුවන්. නැත්නම්, ඇමුණුම මඟින් තොරතුරු ඉදිරිපත් කරනවා. ඇමුණුම **සභාගත*** කරමි.

(v) රජය හා වැවිලි සමාගම් අතර විවිධ කොන්දේසි ඇතුළත් බදු ගිවිසුම් තමයි ගහලා තිබෙන්නේ. ගිවිසුම් වර්ග කිහිපයක් තිබෙනවා. ඒවා නිරීක්ෂණය කරලා අපි ඉදිරි සමාලෝචනයක් කරලා ඔබතුමා අහන ප්‍රශ්නයට ඉදිරියේදී තීන්දු ගන්න සූදානම් කරලා තිබෙනවා.

(vi) ඔව්. එම වැවිලි සමාගම් විසින් නියමිත කාල පරිච්ඡේදයට අදාළ බදු කුලිය සම්පූර්ණයෙන් ගෙවා ඇති අතර, 2025 වර්ෂයේ පළමු හා දෙවන කාර්තුවේ බදු කුලිය ද පහත පරිදි ගෙවා ඇත.

1. මතුරට වැවිලි සමාගම - රුපියල් 13,456,555.00
2. නමුණුකුල වැවිලි සමාගම - රුපියල් 56,635,182.00
3. තලවාකැලේ වැවිලි සමාගම - රුපියල් 34,914,861.00

(ආ) අදාළ නොවේ.

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් අසන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

රජයට අයත්ව තිබූ මෙම වැවිලි සමාගම් 80 දශකයේ අග භාගයේ තමයි ජනසතු කරන්න පටන් ගත්තේ. එහි අවසාන ප්‍රතිඵලය විධියට දැන් අපට ඉතුරු වෙලා තිබෙන්නේ මුඩු ඉඩම් ටිකක් විතරයි. මොකද, ඔබතුමා ඔය උත්තරයේ සඳහන් කරපු ගොඩක් දේවල් මහ පොළොවේ පෙනෙන්න නැහැ. ඒ වාගේම, මේ ගිවිසුමට අනුව කටයුතු කරනවා කියලා අපට පෙනෙන්නේ නැහැ. මොකද, ගොඩක් ඉඩම්වල එක්කෝ තේ ගලවලා කුරුඳු හිටවනවා. එහෙම නැත්නම් රබර් ගලවලා වෙනත් වගාවක් කරනවා. නමුත් මේ ගිවිසුම්වල එහෙම සඳහනක් නැහැ කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම මෙන්න මේ විධියට අවභාවිත වන ඒ ඉඩම් මේ විධියට අවභාවිත කිරීම නැවැත්වීම සඳහා අමාත්‍යාංශය පැත්තෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මම අර මුලින් පැහැදිලි කළා වාගේ ගිවිසුම් වර්ග කිහිපයක් තිබෙනවා. ඒ ගිවිසුම් අනුව කටයුතු කරනවා. කොහොම නමුත්, අමාත්‍යාංශය පැත්තෙන් පසුගිය ඉතිහාසයේ තුළ මේ පිළිබඳ ඍජු අධීක්ෂණයක් නිවැරදි ලෙසම වුණා කියා මාත් විශ්වාස කරන්නේ නැහැ. නමුත් අපි සැලසුම් කරලා තිබෙනවා ඉස්සරහට එවැනි අධීක්ෂණ ක්‍රියාවලියක් හදන්න, සමාලෝචනය කර ගන්නට. කොහොම නමුත් ගිවිසුම් ප්‍රකාරව සමාගම්වලට වෙනත් වැවිලි භෝග, තේ වගාවේ වෙනත් වැවිල්ලක් කරන්න පුළුවන්. රබර් වගාවේ වෙනත් වැවිල්ලක් කරන්න පුළුවන්කමක් තිබෙනවා. කොහොම නමුත්, අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා, නිසි අධීක්ෂණයක් කරලා, නැවත වගා කිරීම් කරන්නට. පාළු සිටුවීම් කරලා නැත්නම් ඒවා සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගන්න අපි සූදානම් කියන පණිවුඩය මේ මොහොතේ දෙන්න ඕනෑ.

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශයේත්, ජනාධිපතිතුමා විසින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශයේත්, ඒ වාගේම, විශේෂයෙන්ම ආණ්ඩුව විධියටත් සඳහන් කළා ඌන උපයෝගිතා සහිත ඉඩම් නැවත වගා කරන්න ජනතාවට ලබා දෙනවා කියලා. ඒ ලබා දීම සඳහා නිසි වැඩපිළිවෙළක් දැනට සකසා තිබෙනවාද, එහෙම නම් මොන වාගේ කාලපරිච්ඡේදයක එය ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවාද කියා දැන ගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ඔව්, ගරු මන්ත්‍රීතුමා. ජනාධිපතිතුමා පසුගිය අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් මේ පාර්ලිමේන්තුවේදීම කිව්වා, රටේ වගා කළ හැකි ඉඩම් වගා නොකර තැබීම අපරාධයක්. ඒ නිසා රජය සතුව ඌන උපයෝජිත ඉඩම් තිබෙනවා නම්, ඒවා වගා කිරීම සඳහා ඉදිරියේදී බදු දීමට සූදානම් කියලා. ඒ අනුව වැවිලි අමාත්‍යාංශය යටතේ අපටම වෙච්ච ආයතන වන ජනවසම තිබෙනවා, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව තිබෙනවා. දැන් ඒවායේ ඌන උපයෝජිත ඉඩම් හඳුනාගෙන තිබෙනවා. ඒවා යම් බදු දීමක් කරනවා නම්, නීත්‍යනුකූලව ලබා දීම සඳහා අදාළ මැනුම් කටයුතු කරලා ඒවා සූදානම් කරන්න ඕනෑ. මේ දවස්වල අපි ඒ කටයුතු සූදානම් කරනවා. කොහොමටත් අපි විශ්වාස කරනවා, තව මාසයක් එකහමාරක් යනකොට ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පළ කරලා වගා කටයුතු හෝ අපි නිර්දේශ කරන වෙනත් කටයුත්තක් සඳහා ඉඩම් බදු අරගෙන ඒ කටයුතු කරන්න කැමැති කෙනෙක් ඉන්නවා නම් ඔවුන්ට ඒවා ලබා දෙන්නට. ඒ අදාළ සූදානම් කිරීම මේ මොහොතේ කරමින් තිබෙන බවට ඔබතුමා දැනුවත් කරන්න කැමැතියි.

## විශේෂඥ වෛද්‍ය සේවා: විස්තර
நிபுணத்துவ மருத்துவ சேவை: விபரம்
SPECIALIST DOCTORS' SERVICES: DETAILS

1080/2025

**10. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විශේෂඥ වෛද්‍ය සේවා සංඛ්‍යාව, ඒවායේ නම් සහ එක් එක් සේවාවේ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව;

(ii) විශේෂඥ වෛද්‍යවරුන්ගේ ඌනතාව හේතුවෙන් එම සේවා නොමැති, 2020 වර්ගීකරණය අනුව ද්විතීයික, තෘතීයික හා විශේෂිත සත්කාරක රෝහල් සංඛ්‍යාව සහ ඒවායේ පුරප්පාඩු සංඛ්‍යාව;

(iii) 2020-2024 දක්වා එක් එක් විශේෂඥ වෛද්‍ය සේවාවෙන් විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය, විදේශ නිවාඩු ගත්, මිය ගිය සහ ඉල්ලා අස්වූ සංඛ්‍යාව;

---
* පුස්තකාලයේ තබා ඇත.
* நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

(iv) 2020-2024 දක්වා එක් එක් විශේෂඥ වෛද්‍ය සේවාවට තෝරා ගත් සංඛ්‍යාව;

(v) ඌනතාව/විශ්‍රාම යෑම අනුව තරග විභාගයෙන් අවශ්‍ය විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව තෝරා ගන්නේ නම්, පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂය සඳහා තෝරා ගත් සංඛ්‍යාව;

(vi) අවුරුදු 60ට වැඩි සහ 55-60 අතර විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) විශේෂඥ වෛද්‍ය සේවා ලැබිය යුතු ශ්‍රේණිගත රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) පශ්චාත් උපාධි ආයතනයෙන් සහ අදාළ කොලීජියෙන් අවශ්‍ය ප්‍රමාණයට විශේෂඥ වෛද්‍යවරුන් සමත් නොකරන්නේ නම්, ඊට හේතු කවරේද;

(iii) එය නිවැරදි කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் நிபுணத்துவ மருத்துவ சேவைகளின் எண்ணிக்கை, அவற்றின் பெயர்கள் மற்றும் ஒவ்வொரு சேவையிலும் உள்ள நிபுணத்துவ வைத்தியர்களின் எண்ணிக்கை;

(ii) நிபுணத்துவ வைத்தியர்களின் பற்றாக்குறை காரணமாக குறிப்பிட்ட சேவை காணப்படாத, 2020 வகைப்படுத்தலுக்கு ஏற்ப இரண்டாம் நிலை, மூன்றாம் நிலை மற்றும் விசேட சிகிச்சை வைத்தியசாலைகளின் எண்ணிக்கை மற்றும் அவற்றிலுள்ள வெற்றிடங்களின் எண்ணிக்கை;

(iii) 2020-2024 வரையில் ஒவ்வொரு நிபுணத்துவ வைத்திய சேவையிலிருந்தும் ஓய்வுபெற்ற, சேவையிலிருந்து விலகிய, வெளிநாட்டு விடுமுறை பெற்றுக்கொண்ட, உயிரிழந்த மற்றும் இராஜினாமா செய்துள்ளவர்களின் எண்ணிக்கை;

(iv) 2020-2024 வரை ஒவ்வொரு நிபுணத்துவ மருத்துவ சேவைக்கும் தெரிவுசெய்யப்பட்டு உள்ளவர்களின் எண்ணிக்கை;

(v) பற்றாக்குறை/ ஓய்வுபெறுவதற்கு ஏற்ப போட்டிப் பரீட்சைமூலம் தேவையான எண்ணிக்கைக்கேற்ப நிபுணத்துவ வைத்தியர்கள் தெரிவு செய்யப்படுவார்களாயின், கடந்த 5 வருட காலப்பகுதியில் ஒவ்வொரு வருடத்திலும் தெரிவு செய்யப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை;

(vi) 60 வயதை விஞ்சிய மற்றும் 55-60க்கு இடைப்பட்ட நிபுணத்துவ வைத்தியர்களின் எண்ணிக்கை;

வெவ்வேறாக யாது என்பதை அவர் தெரிவிப்பாரா?

(ஆ) (i) நிபுணத்துவ மருத்துவ சேவைகள் கிடைக்கப்பெற வேண்டிய தரவரிசைப்படுத்தப் பட்ட வைத்தியசாலைகளின் எண்ணிக்கை எத்தனை;

(ii) பட்டப் பின்படிப்பு நிறுவனமும் உரிய கல்லூரியும் தேவையானளவு நிபுணத்துவ வைத்தியர்களை சித்தியடையச் செய்வதில்லை யெனில் அதற்கான காரணங்கள் யாவை;

(iii) அதனை மாற்றியமைப்பதற்கு நடவடிக்கை எடுப்பாரா?

என்பதையும் அவர் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he state, separately -

(i) the number of specialist doctors' services available in Sri Lanka, the names of those services and the number of specialist doctors in each of such services;

(ii) the number of secondary, tertiary and specialized-care hospitals according to the 2020 classification, in which specialist doctors' services are not available due to the shortage of specialist doctors and the number of such vacancies prevailing in them;

(iii) the number of those who retired, vacated, obtained overseas leave, died and resigned from each category of the specialist doctors' services from 2020 to 2024;

(iv) the number of those who were selected for each specialist doctors' service from 2020 to 2024;

(v) if the required number of specialist doctors were selected through a competitive examination based on shortages/ retirements, how many were selected in each of the past five years; and

(vi) the number of specialist doctors over the age of 60 years and in the age band of 55-60?

(b) Will he also state -

(i) the number of graded hospitals which should have specialist doctors' services;

(ii) if the Post-Graduate Institute and the relevant College do not pass specialist doctors in necessary numbers, the reasons for it; and

(iii) whether steps will be taken to rectify it?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ විශේෂඥ වෛද්‍ය සේවා සංඛ්‍යාව 72යි. එම 72ට අදාළව අනුමත cadre එක තිබෙනවා, 3181ක්. 2025 ලැයිස්තුවට ඉල්ලුම් කළ ප්‍රමාණයත් එක්කම ගත්තාම, දැනට සිටින ප්‍රමාණය 2,042යි. ඒ අනුව පුරප්පාඩු 1,139ක් පවතිනවා. එය ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

ඇමුණුම 01

Total Specialist Medical Officers on 30.06.2025

| | Specilists | 1<br>Approved cader | 2<br>Specialist Doctors already in Speciality Grade | 3<br>Newly B C Specialists - Has been applied to annual 2025 list | (4) 2+3<br>Total Specialist Medical Officers | (5) 1-4<br>Total Vacancies |
|---|---|---|---|---|---|---|
| 1 | Consultant Anaesthetists | 310 | 124 | 14 | 138 | 172 |
| 2 | Consultant Cardiologists | 54 | 51 | 3 | 54 | 0 |
| 3 | Consultant Cardio Electrophysiology | 4 | 7 | | 7 | -3 |
| 4 | Consultant Cardiothoracic Surgeons | 26 | 14 | | 14 | 12 |
| 5 | Consultant Cornia & External Eye Dieses | | 2 | | 2 | -2 |
| 6 | Consultant Chemical Pathologists | 34 | 17 | 4 | 21 | 13 |
| 7 | Consultant Clinical Microbiology +myco+imm | 46 | 37 | 3 | 40 | 6 |
| 8 | Consultant Critical Care | | 5 | 1 | 6 | -6 |
| 9 | Consultant Community Physicians | 332 | 76 | 11 | 87 | 245 |
| 10 | Consultant Dermatologists | 74 | 60 | 4 | 64 | 10 |
| 11 | Consultant Endocrinologist | 14 | 19 | 2 | 21 | -7 |
| 12 | Consultant Emergency Physicians | | 6 | 6 | 12 | -12 |
| *** | Consultant Family Physician | | 13 | | 13 | -13 |
| 14 | Consultant Forensic Psychiatrists | 8 | 2 | | 2 | 6 |
| 15 | Consultant Gastroenterologist | 12 | 23 | 1 | 24 | -12 |
| 16 | Consultant Gastroenterological Surgeons | 11 | 11 | | 11 | 0 |
| 17 | Consultant General Physicians | 376 | 198 | 15 | 213 | 163 |
| 18 | Consultant General Surgeons | 230 | 131 | 9 | 140 | 90 |
| 19 | Consultant Genito Urinary Surgeons | 19 | 24 | 1 | 25 | -6 |
| 20 | Consultant Haematologists | 35 | 55 | 3 | 58 | -23 |
| 21 | Consultant Histopathologists | 96 | 51 | 5 | 56 | 40 |
| 22 | Consultant Judicial Medical Officers | 64 | 40 | 1 | 41 | 23 |
| 23 | Connsultant Haemato Oncologists | 8 | 4 | | 4 | 4 |
| 24 | Consultant Interventional Radiologist | 12 | 1 | | 1 | 11 |
| 25 | Consultant Neonatalogist | 36 | 11 | 1 | 12 | 24 |
| 26 | Consultant Nephrologists | 16 | 23 | 1 | 24 | -8 |
| 27 | Consultant Neuro Physiologist | 10 | 3 | | 3 | 7 |
| 28 | Consultant Neuro Surgeons | 31 | 13 | | 13 | 18 |
| 29 | Consultant Neurologists | 35 | 25 | 3 | 28 | 7 |
| 30 | Consultant Obstetricians & Gynaecologists | 226 | 117 | 14 | 131 | 95 |
| 31 | Consultant Oncologists | 32 | 39 | 3 | 42 | -10 |
| 32 | Consultant Gynacological Oncological Surgeon | 7 | 4 | | 4 | 3 |
| 33 | Consultant Oncological Surgeons | 12 | 17 | 1 | 18 | -6 |
| 34 | Consultant Ophthalmologists | 106 | 41 | 6 | 47 | 59 |
| 35 | Consultant Orthopaedic Surgeon | 44 | 61 | 3 | 64 | -20 |
| 36 | Consultant Otolaryngologists (ENT Surgeons) | 84 | 38 | 5 | 43 | 41 |
| 37 | Consultant Paediatric Surgeon | 18 | 13 | | 13 | 5 |

| | | 1 | 2 | 3 | (4) 2+3 | (5) 1-4 |
|---|---|---|---|---|---|---|
| | Specilists | Approved cader | Specialist Doctors already in Speciality Grade | Newly B C Specialists - Has been applied to annual 2025 list | Total Specialist Medical Officers | Total Vacancies |
| 38 | Consultant Paediatricians | 255 | 131 | 6 | 137 | 118 |
| 39 | Consultant Paediatric Cardiologists | 7 | 6 | | 6 | 1 |
| 40 | Consultant Paediatric Neurologists | 7 | 6 | 1 | 7 | 0 |
| 41 | Consultant Paediatric Intensivists | 3 | 6 | 1 | 7 | -4 |
| 42 | Consultant Paediatric Nephrology | 6 | 5 | | 5 | 1 |
| 43 | Consultant Paediatric Oncologists | 15 | 4 | | 4 | 11 |
| 44 | Consultant Paediatric Ophthalmologists | 4 | 4 | 1 | 5 | -1 |
| 45 | Consultant Paediatric Pulmonologists | | 3 | 2 | 5 | -5 |
| 46 | Consultant Paediatric Endocrinologists | | 2 | 3 | 5 | -5 |
| 47 | Consultant Parasitalogist | | | | 0 | 0 |
| 48 | Consultant Plastic Surgeon | 17 | 9 | | 9 | 8 |
| 49 | Consultant Phychiatrist | 69 | 43 | 5 | 48 | 21 |
| 50 | Consultant Child and Adolescent Psychiatrists | 15 | 3 | | 3 | 12 |
| 51 | Consultant Radiologists | 125 | 112 | 2 | 114 | 11 |
| 52 | Consultant Respiratory Physicians | 35 | 29 | 1 | 30 | 5 |
| 53 | Consultant Rheumatologists + Rehabilitaton Medici | 46 | 30 | 3 | 33 | 13 |
| 54 | Consultant Sub Fertility Specialist | 7 | 3 | | 3 | 4 |
| 55 | Consultant Thoracic Surgeons | 10 | 4 | | 4 | 6 |
| 56 | Consultant Transfusion Physician | 37 | 18 | 1 | 19 | 18 |
| 57 | Consultant Urology & Transplant Surgeons | | 1 | | 1 | -1 |
| 58 | Consultant Vascular & Transplant Surgeons | 20 | 13 | 1 | 14 | 6 |
| 59 | Consultant Venereololgists | 34 | 21 | 1 | 22 | 12 |
| 60 | Consultant Virology under Microbiology | 13 | 8 | | 8 | 5 |
| 61 | Consultant Vitreo Retinal Surgeons | 12 | 11 | | 11 | 1 |
| 62 | Consultant Medical Mycologists | | 1 | 1 | 2 | -2 |
| 63 | Consultant Nutrition Physician | | 10 | 8 | 18 | -18 |
| 64 | Consultants Health Informaticians | | 14 | 1 | 15 | -15 |
| 65 | Consultants Community Paediatrician | | 1 | | 1 | -1 |
| 66 | Consultants Old Age Psychiastry | 6 | 1 | 2 | 3 | 3 |
| 67 | Consultant Clinical Phamacology | | | | 0 | 0 |
| 68 | Sports & Exercise Medicine | 10 | | 1 | 1 | 9 |
| 69 | Rehabilitation Medicine | | | 3 | 3 | -3 |
| 70 | Geriatric Medicine | | | 1 | 1 | -1 |
| 71 | Consultant Neuro Radiologists | 5 | | 2 | 2 | 3 |
| 72 | Rehablitation Psychiastry | 1 | | | 0 | 1 |
| | | 3181 | 1875 | 167 | 2042 | 1139 |

(ii) විශේෂඥ වෛද්‍ය සේවාව ලබා දිය යුතු රෝහල් සංඛ්‍යාව 134යි. මා සඳහන් කළ ආකාරයට, එහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව 1,139යි. එතුමා අහන මෙම ප්‍රශ්නයට පිළිතුර මට සභාගත කරන්න පුළුවන්. මෙම රෝහලවල තිබෙන පුරප්පාඩු සංඛ්‍යාව කොතෙක්ද කියන එක පිළිබඳව ඇමුණුම්වල සඳහන් වෙනවා. එය ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

ඇමුණුම 02

| | | ඌණතාවය හේතුවෙන් සේවාවන් නොලැබෙන රෝහල් සංඛ්‍යාව සහ ඌණ විශේෂඥ වෛද්‍යවරු ප්‍රමාණය | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූලික රෝහල් " බී ශ්‍රේණිය" | | මූලික රෝහල් " ඒ ශ්‍රේණිය" | | දිස්ත්‍රික් මහ රෝහල් | | පළාත් මහ රෝහල් | | ශික්ෂණ රෝහල් | | විශේෂිත රෝහල් | | ජාතික රෝහල් | | වෙනත් | |
| | විශේෂඥ වෛද්‍ය සේවය | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන |
| 1 | නිර්වින්දනවේදය | 10 | 4 | 21 | 16 | 19 | 19 | | | 15 | 38 | 3 | 17 | 3 | 40 | | |
| 2 | හෘද රෝග | | | | | 17 | 11 | | | 9 | 23 | | | 3 | 20 | | |
| 3 | හෘද විද්‍යුත් භෞතවේදය | | | | | | | | | 2 | 1 | 1 | 1 | 3 | 5 | | |
| 4 | හෘද උරස් | | | | | | | | | 2 | 0 | 1 | 3 | 3 | 10 | | |
| 5 | අක්ෂිවේදය සහ කණීනිකාව හා බාහිර අක්ෂි රෝග | | | | | | | | | 2 | | 1 | 1 | 2 | 1 | | |
| 6 | රසායන ව්‍යාධිවේද | | | | | 7 | 6 | | | 10 | 9 | 3 | 4 | 2 | 2 | | |
| 7 | ක්ෂුද්‍රජීව විශේෂඥ | | | 2 | 2 | 17 | 11 | | | 14 | 12 | 5 | 6 | 3 | 5 | 2 | 2 |
| 8 | දැඩිසත්කාරවේදය | | | | | | | | | | | 6 | 2 | 2 | 4 | | |
| 9 | ප්‍රජා විශේෂඥ වෛද්‍ය | | | | | | | | | | | | | | | 59 | 87 |
| 10 | චර්ම රෝගවේදය | 11 | 6 | 19 | 11 | 21 | 10 | | | 12 | 23 | 1 | 1 | 3 | 10 | 1 | 1 |
| 11 | අන්තරාසර්ගවේදය | | | | | 13 | 7 | | | 11 | 10 | | | 3 | 6 | | |
| 12 | හදිසි ප්‍රතිකාර | | | | | 3 | 1 | | | 10 | 5 | | | 3 | 7 | | |
| 13 | පවුල් වෛද්‍ය වේදය | | | | | | | | | | | | | | | 13 | 13 |
| 14 | අධිකරණ මනෝ වෛද්‍ය වේදය | | | | | | | | | 1 | 0 | | | 2 | 1 | 1 | 1 |
| 15 | අන්ත්‍ර වේදය | | | | | 10 | 7 | | | 10 | 10 | | | 3 | 6 | | |
| 16 | අමාශ අන්ත්‍රයික ශල්‍ය | | | | | | | | | 9 | 7 | | | 3 | 4 | | |
| 17 | කායික රෝග | 48 | 30 | 26 | 40 | 20 | 37 | | | 13 | 70 | 7 | 6 | 3 | 44 | | |
| 18 | ශල්‍ය විශේෂඥ වෛද්‍ය | 21 | 16 | 28 | 27 | 19 | 31 | | | 10 | 39 | | | 3 | 26 | | |
| 19 | මෛත්‍රික ශල්‍ය වේදය | | | | | 12 | 6 | | | 9 | 12 | | | 3 | 7 | | |
| 20 | රුධිර ව්‍යාධිවේදය | 1 | 0 | 9 | 9 | 18 | 13 | | | 15 | 20 | 3 | 5 | 3 | 9 | | |
| 21 | පටක ව්‍යාධිවේදය | 1 | 1 | 11 | 9 | 16 | 14 | | | 15 | 17 | 4 | 5 | 3 | 9 | | |
| 22 | පිලිකාවේදය - රුධිර | | | | | | | | | | | 4 | 3 | 1 | 1 | | |
| 23 | ප්‍රවේශ විකිරණවේදය | | | | | | | | | | | | | 2 | 1 | | |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

| | විශේෂඥ වෛද්‍ය සේවය | ඌණතාවය හේතුවෙන් සේවාවන් නොලැබෙන රෝහල් සංඛ්‍යාව සහ ඌණ විශේෂඥ වෛද්‍යවරු ප්‍රමාණය | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූලික රෝහල් " බී ශ්‍රේණිය" | | මූලික රෝහල් " ඒ ශ්‍රේණිය" | | දිස්ත්‍රික් මහ රෝහල් | | පළාත් මහ රෝහල් | | ශික්ෂණ රෝහල් | | විශේෂිත රෝහල් | | ජාතික රෝහල් | | වෙනත් | |
| | | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන | රෝහල් ගණන | විශේෂඥ වෛද්‍යවරු ගණන |
| 24 | අධිකරණ වෛද්‍ය | | | 9 | 8 | 17 | 10 | | | 17 | 16 | | | 2 | 4 | 1 | 5 |
| 25 | නව ජන්මවේදය | | | | | 3 | 1 | | | 16 | 10 | | | 2 | 1 | | |
| 26 | වෘක්කවේදී | | | | | 9 | 6 | | | 9 | 9 | 1 | 2 | 3 | 7 | | |
| 27 | ස්නායු භෞතවේද | | | | | | | | | | | | | 3 | 3 | | |
| 28 | ස්නායු ශල්‍යවේද | | | | | | | | | 7 | 4 | | | 3 | 9 | | |
| 29 | ස්නායුවේදය | | | | | 8 | 5 | | | 10 | 12 | | | 3 | 11 | | |
| 30 | ප්‍රසව හා නාරි | 26 | 21 | 20 | 30 | 19 | 32 | | | 14 | 43 | | | 1 | 3 | 1 | 1 |
| 31 | පිළිකාවේදය | | | | | 14 | 9 | | | 8 | 14 | 1 | 10 | 2 | 7 | | |
| 32 | නාරි පිළිකා ශල්‍ය | | | | | | | | | 3 | 1 | 1 | 3 | 1 | 0 | | |
| 33 | පිළිකා ශල්‍ය | | | | | | | | | 7 | 8 | 1 | 5 | 2 | 5 | | |
| 34 | අක්ෂි ශල්‍ය | 1 | 0 | 13 | 8 | 18 | 12 | | | 10 | 12 | 1 | 8 | 2 | 6 | | |
| 35 | විකලාංග | | | 3 | 3 | 17 | 17 | | | 14 | 28 | | | 2 | 16 | | |
| 36 | උගුර කණ නාසය | | | 18 | 5 | 17 | 11 | | | 9 | 14 | 3 | 3 | 3 | 7 | | |
| 37 | ළමා ශල්‍ය | | | | | | | | | 8 | 3 | 2 | 5 | 1 | 4 | | |
| 38 | ළමා රෝග | 30 | 15 | 22 | 20 | 19 | 25 | | | 15 | 58 | 3 | 4 | 2 | 12 | | |
| 39 | ළමා හෘද රෝග | | | | | | | | | 6 | 1 | 2 | 5 | 1 | 1 | | |
| 40 | ළමා ස්නායු | | | | | | | | | 7 | 6 | | | 1 | 1 | | |
| 41 | ළමා දැඩිසත්කාර | | | | | | | | | 5 | 5 | | | 1 | 2 | | |
| 42 | ළමා වකුගඩු | | | | | | | | | 3 | 4 | 1 | 0 | 1 | 1 | | |
| 43 | ළමා පිළිකා | | | | | | | | | | | 1 | 4 | 1 | 0 | | |
| 44 | ළමා අක්ෂි | | | | | | | | | 5 | 4 | | | 1 | 1 | | |
| 45 | ළමා ශ්වසනවේදය | | | | | | | | | 4 | 3 | | | 1 | 2 | | |
| 46 | ළමා අන්තරාසර්ගවේදය | | | | | | | | | 5 | 4 | | | 1 | 1 | | |
| 47 | ළමා විකිරණවේදය | | | | | | | | | 2 | 1 | | | 1 | 0 | | |
| 48 | පරපෝෂිතවේදය | | | | | | | | | | | | | 1 | 0 | | |
| 49 | ප්ලාස්ටික් ශල්‍ය | | | | | | | | | 10 | 5 | | | 3 | 4 | | |
| 50 | මනෝ වෛද්‍යවේදය | 6 | 3 | 17 | 7 | 18 | 10 | | | 10 | 14 | 3 | 9 | 3 | 6 | | |
| 51 | ළමා හා යෞවන මනෝ වෛද්‍යවේදය | | | | | | | | | 3 | 0 | 3 | 2 | 1 | 0 | | |
| 52 | විකිරණවේදය | 17 | 10 | 21 | 17 | 18 | 19 | | | 12 | 24 | 5 | 15 | 3 | 23 | | |
| 53 | ශ්වසන වේදය | | | 1 | 1 | 17 | 9 | | | 8 | 8 | | | 3 | 11 | | |
| 54 | රක්තවාතවේදය | | | | | 20 | 11 | | | 9 | 10 | 4 | 3 | 3 | 8 | | |
| 55 | මදසරුභාවය | | | | | | | | | 3 | 3 | | | 1 | 0 | | |
| 56 | උරස් ශල්‍ය වේදය | | | | | | | | | | | 1 | 4 | 1 | 0 | | |
| 57 | රුධිරපාරවිලයනවේදය | | | | | 8 | 4 | | | 11 | 9 | 2 | 1 | 3 | 3 | 1 | 3 |
| 58 | මෛත්‍රලිංගික ශල්‍ය වේදය | | | | | | | | | | | 1 | 1 | | | | |
| 59 | වාහනික හා ඉන්ද්‍රිය බද්ධ | | | | | | | | | 8 | 5 | 1 | 1 | 3 | 8 | | |
| 60 | සමාජරෝගවේදය | | | 1 | 1 | 6 | 4 | | | 1 | 1 | 20 | 15 | | | | |
| 61 | වෛරසවේදය | | | | | | | | | 3 | 1 | 2 | 7 | | | 1 | 1 |
| 62 | අක්ෂිවේදය සහ කාච දෘෂ්ටිවිතානවේදය | | | | | | | | | 7 | 4 | 3 | 6 | | | | |
| 63 | දිලීරවේදය | | | | | | | | | | | 1 | 1 | 1 | 1 | | |
| 64 | පෝෂණවේදය | | | | | 5 | 3 | | | 9 | 6 | 4 | 5 | 3 | 4 | | |
| 65 | සෞඛ්‍ය තොරතුරු තාක්ෂණවේදය | | | | | | | | | | | 2 | 2 | 2 | 2 | 10 | 10 |
| 66 | ළමා ප්‍රජා වෛද්‍ය විද්‍යාව | | | | | | | | | 1 | 1 | | | | | | |
| 67 | වැඩිහිටි මනෝවෛද්‍යවේදය | | | | | | | | | 2 | 2 | 1 | 1 | 1 | 0 | | |
| 68 | සායනික පාමකොලොජි | | | | | | | | | | | | | 0 | 0 | | |
| 69 | ක්‍රීඩා හා ව්‍යායාම වෛද්‍ය වේදය | | | | | | | | | | | | | 2 | 1 | | |
| 70 | පුනරුත්ථාපක වෛද්‍ය වේදය | 2 | 1 | | | | | | | 1 | 1 | | | 2 | 1 | | |
| 71 | jවෘද්ධ වෛද්‍ය වේදය | | | | | | | | | 1 | 0 | | | 2 | 1 | | |
| 72 | ස්නායු විකිරණවේදය | | | | | | | | | | | | | 2 | 2 | | |

* දිවයිනේ පිහිටි සියළුම A ශ්‍රේණියේ මූලික රෝහල් ගණන 35

දිවයිනේ පිහිටි සියළුම B ශ්‍රේණියේ මූලික රෝහල් ගණන 45

දිවයිනේ පිහිටි සියළුම දිස්ත්‍රික් මහ රෝහල් ගණන 20

දිවයිනේ පිහිටි සියළුම ශික්ෂණ රෝහල් ගණන 17

ඉහත ලැයිස්තුවේ දක්වා ඇත්තේ ඒ ඒ විශේෂඥතාව යටතේ දැනට විශේෂඥ වෛද්‍යවරුන් සේවය කරනු ලබන රෝහල් ගණන වේ.

මෙලෙස රෝහල් තිබුනද ප්‍රමුඛතාව සහ යටිතල පහසුකම් හා සහායක මානව සම්පත් ඇති පරිදි සේවා අවශ්‍යතාව අනුව ඒ ඒ විශේෂඥ තනතුරු හඳුනාගෙන ඇතිඅතර ප්‍රමුඛතාව මත සිටින විශේෂඥ වෛද්‍ය නිලධාරීන් ඒ ඒ රෝහල් සඳහා පත්කර ඇත.

(iii) 2020-2024 වර්ෂය 5 තුළදී සේවය හැරයාමේ නිවේදනය නිකුත් කර ඇති විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව 82යි. සේවයෙන් ඉල්ලා අස්වූ විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව 07යි. ස්ථිර ලෙස වෙනත් ආයතනවලට මුදා හැර ඇති විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව 57යි. වැටුප් රහිත නිවාඩු ලබාගත් විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව 191යි. විශ්‍රාම ගත් විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව 233යි. ඒ අනුව මුළු එකතුව 570ක් වෙනවා. එය ඇමුණුම 03 මඟින් දක්වා ඇත.

ඇමුණුම 03

| කාරණය | 2020 වර්ෂය | 2021 වර්ෂය | 2022 වර්ෂය | 2023 වර්ෂය | 2024 වර්ෂය | |
|---|---|---|---|---|---|---|
| සේවය හැරයාමේ නිවේදනය නිකුත් කර ඇති විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව | 03 | 08 | 29 | 16 | 26 | 82 |
| සේවයෙන් ඉල්ලා අස් වූ විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව | 01 | 02 | 04 | 00 | 00 | 07 |
| ස්ථිර ලෙස වෙනත් ආයතනවලට මුදාහැර ඇති විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව | 04 | 14 | 19 | 04 | 16 | 57 |
| වැටුප් රහිත නිවාඩු ලබා ගත් විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව | 00 | 00 | 74 | 95 | 22 | 191 |
| විශ්‍රාම ගත් විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව | 17 | 28 | 50 | 66 | 72 | 233 |
| එකතුව | | | | | | 570 |

(iv) 2020 සිට 2024 වර්ෂය දක්වා එක් එක් විශේෂඥ වෛද්‍ය සේවාවාට තෝරාගත් සංඛ්‍යාව: 2020 වර්ෂයේ 51යි; 2021 වර්ෂයේ 82යි; 2022 වර්ෂයේ 199යි; 2023 වර්ෂයේ 275යි; 2024 වර්ෂයේ 294යි.

(v) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් වෛද්‍යවරුන් අදාළ පශ්චාත් උපාධි පාඨමාලාවන්ට බඳවා ගන්නේ, බඳවා ගැනීමේ විභාගයෙන් ඔවුන් සමත් වූ පසුවයි.

2020 - 2024 වර්ෂය දක්වා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ වෛද්‍යවරුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඇමුණුම 04 මඟින් දක්වා ඇත. එය මා කලින් සඳහන් කළ විශේෂඥ වෛද්‍ය සේවා 72 ට අදාළව වෙන් වෙන්ව දක්වා ඇත.

Annexure 04

Postgraduate Institute of Medicine
University of Colombo

No: Registered for MD Programmes in last 5 Years

| Course | 2020 | 2021 | 2022 | 2023 | 2024 | TOT |
|---|---|---|---|---|---|---|
| MD Anaesthesiology | 19 | 38 | 42 | 28 | 33 | 160 |
| MD Chemical Pathology | 12 | 11 | 4 | 6 | 10 | 43 |
| MD Clinical Oncology | 5 | 5 | 2 | 3 | 4 | 19 |
| MD Clinical Nutrition | 21 | 21 | 22 | 20 | 13 | 97 |
| MD Community Dentistry | | | 3 | 3 | 2 | 8 |
| MD Community Medicine | 20 | | 8 | 18 | 15 | 61 |
| MD Chemical Pathology Part1 | 8 | 8 | 9 | 8 | 8 | 41 |
| MD Dermatology | 6 | 5 | 5 | 8 | 8 | 32 |
| MD Emergency Medicine | | 28 | 16 | 21 | 19 | 84 |
| MD Family Medicine | 5 | 17 | 16 | 17 | 34 | 89 |
| MD Forensic Medicine | 10 | | | 12 | 8 | 30 |
| MD Geriatric Medicine | 4 | 4 | 2 | 3 | 4 | 17 |
| MD Haematology | 3 | 16 | 11 | 11 | 9 | 50 |
| MD Histopathology | 20 | 11 | 14 | 8 | 11 | 64 |
| MD Histopathology P1 | 14 | 14 | 14 | 12 | 8 | 62 |
| MD Medicine | 93 | 96 | 90 | 102 | 100 | 481 |
| MD in Medical Education | | | | | 1 | 1 |
| MD Medical Microbiology | 8 | 13 | 11 | 12 | 10 | 54 |
| MD Ophthalmology Part I | 12 | 10 | 10 | 8 | 10 | 50 |
| MD Ophthalmology part II | 20 | 11 | 10 | 11 | 5 | 57 |
| MD OMF Surgery | 11 | 4 | 6 | 3 | 1 | 25 |
| MD Obstetrics & Gynaecology | 31 | 29 | 30 | 22 | 22 | 134 |
| MD Orthodontics | 4 | 1 | 5 | | 4 | 14 |
| MD Orthopeadic Surgery | 6 | 7 | 9 | 9 | 11 | 42 |
| MD Otorhinolaryngology | 2 | 3 | | 2 | 1 | 8 |
| MD Paediatrics | 45 | 50 | 48 | 45 | 39 | 227 |
| MD Psychiatry | 20 | 21 | 18 | 24 | 21 | 104 |
| MD Radiology | 28 | 32 | 23 | 21 | 22 | 126 |
| MD Surgery | 41 | 13 | 49 | 43 | 47 | 193 |
| MD Transfusion Medicine | 4 | 7 | 6 | 4 | 5 | 26 |
| MD Venerology | 5 | | 12 | | 5 | 22 |
| MD Virology | | 4 | | | 1 | 5 |
| MD Medical Administration Part1 | | 29 | 8 | 13 | | 50 |
| MD Medical Administration | | 19 | 21 | 18 | | 58 |
| MD Restorative Dentistry | 3 | 3 | 5 | 1 | | 12 |
| MD Health Informatics | 9 | 19 | 8 | | | 36 |
| MD Sports & Exercise Medicine | 12 | | 11 | | | 23 |
| MD Medical Parasitalogy | 1 | | | | | 1 |
| | 502 | 549 | 548 | 516 | 491 | 2606 |

(vi) අවුරුදු 60ට වැඩි - 201

අවුරුදු 55-60 - 546

(ආ) (i) 134කි.

(ii) වෛද්‍යවරුන් පශ්චාත් උපාධි පාඨමාලාවන්ට බඳවා ගන්නේ පශ්චාත් උපාධි ආයතනය විසින් පවත්වනු ලබන බඳවා ගැනීමේ විභාගය සමත් වූ පසුවයි. එම විභාගය සමත් වූ පසු ලකුණු ලබා ඇති අනුපිළිවෙළ - merit order එක - අනුව පවතින පුහුණු කිරීමේ ඒකක සංඛ්‍යාවට ගැළපෙන පරිදි අදාළ රෝහල්වල පුහුණුවීම් ලබා දෙයි.

එම පුහුණුව අවසන් වීමෙන් පසුව ඔවුන් අදාළ විෂයයෙන් පශ්චාත් උපාධියට මුහුණ දෙයි. එක් එක් විෂයෙහි සමත්වීමේ නිර්ණායක වෙනස් වන අතර එම නිර්ණායක සපුරා ඇති වෛද්‍යවරුන් අදාළ පශ්චාත් උපාධියෙන් සමත් වෙයි. (අසමත් වෛද්‍යවරුන්ට තවත් පස් වතාවක් අදාළ විභාගයට මුහුණ දීමට හැකියාව ඇත.)

විභාගය සමත් වන වෛද්‍යවරුන් වැඩිදුරටත් අවම වසරක දේශීය පුහුණුවක් මෙන්ම අවම වසරක විදේශීය පුහුණුවක් ලබා ගත යුතුය. (මෙම පුහුණු කාලය විෂයෙන් විෂයට වෙනස් වේ.) විදේශීය පුහුණුව අවසන් කර ලංකාවට නැවත වාර්තා කරන වෛද්‍යවරුන්හට මාණ්ඩලික සහතික කරණයට, Board Certification එකට පෙර වාචික විභාගයකට - Pre-Board Certification Assessment, PBCA; portfolio based viva එකකට - මුහුණ දීමට සිදු වේ. එය සමත් වූ වෛද්‍යවරුන්ට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් අදාළ අනුමැතීන් ලබාගත් පසුව මාණ්ඩලික සහතිකකරණය - Board Certification - ලබා දෙයි.

මෙම ක්‍රියාපටිපාටියට අනුව අදාළ නිර්ණායක සපුරාලන වෛද්‍යවරුන් විශේෂඥ වෛද්‍යවරුන් ලෙස නම් කෙරේ.

(iii) විශේෂඥ වෛද්‍යවරුන් පුහුණු කිරීම සිදු කරනු ලබන්නේ පවතින ගෝලීය සම්මත දර්ශක අනුව පුහුණු කිරීමේ ක්‍රමවේදයට අනුවයි. ඒ සඳහා පශ්චාත් උපාධි ආයතනයන්හි නිරීක්ෂණ ලබා ගන්නා අතර, එය කාලානුරූපව වෙනස්වීම්වලට භාජන වේ.

(ඇ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, මෙය රට තුළ පවතින විශේෂඥ වෛද්‍ය සේවාව පිළිබඳව overview එකක් හදා ගන්න තිබෙන අවස්ථාවක්. ගරු ඇමතිතුමාගේ පැත්තෙනුත් ප්‍රකාශ වුණා, Cadre

[ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා]

එක 3,181ක් නියමිතයි, නමුත් vacancies 1,139ක් තිබෙනවා කියලා. දළ වශයෙන් ගත්තාම සියයට 35ක විතර හිඟයක් තිබෙනවා. සමහර විෂයය ක්ෂේත්‍ර ගත්තාම ඒක ටිකක් සලකා බැලිය යුතු හිඟයක් ලෙස තිබෙනවා.

මේ නිසා මතු වෙලා තිබෙන ප්‍රශ්නය තමයි, විශේෂඥ වෛද්‍යවරුන්ගේ ඌනතාව නිසා ගුණාත්මක සහ ප්‍රමාණාත්මක සෞඛ්‍ය සේවාවක් සමාන ලෙස සෑම පුරවැසියෙකුටම ලබා දීම කියන වුවමනාව සහ ජනතාවට තිබෙන අයිතිය නැති වෙලා තිබෙනවාය කියන අදහසක් සෞඛ්‍ය පද්ධතිය තුළින් ගම්‍ය වීම. ඒ නිසා මේ සේවාව නිසි ලෙස ස්ථාපිත කිරීම සඳහා රජය ගෙන ඇති පියවර මොනවාද කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අපට ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යෑමේදී, ප්‍රමාණවත් විශේෂඥ වෛද්‍යවරු සංඛ්‍යාවක් වුවමනායි. එහි තර්කයක් නැහැ. නමුත්, පසුගිය කාලයේ සිදු වුණු දේ තමයි, විදේශ පුහුණුවට ගිය සමහර වෛද්‍යවරුන් නොපැමිණීමේ ප්‍රවණතාවක් තිබීම. 2024 සැප්තැම්බර් මාසය විතර වනකොට සාමාන්‍යයෙන් දළ වශයෙන් ගත්තොත්, ගිය අයගෙන් සියයට 40ක් විතර තමයි නැවත ලංකාවට ඇවිල්ලා තිබුණේ. දැන් ඒක සියයට 65ක්, 70ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඉතුරු අයත් නැවත ලංකාවට පැමිණෙයි කියලා. විදේශීය පුහුණුව අවසන් කරලා එන විශේෂඥ වෛද්‍යවරයාට ඉස්සෙල්ලාම ටිකක් දුර බැහැර පර්යන්ත මූලික රෝහලකට හෝ සමහර විට දිස්ත්‍රික් මහ රෝහලකට පත්වීම ලැබුණාට පස්සේ, යම් අයෙකු යළිත් පෙරළා තමා පුහුණුව ලබපු රටට යෑමේ ප්‍රවණතාවකුත් තිබුණා. මේ සියලු දේවල් පිළිබඳ අපි අවධානය යොමු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගම් එක්කත් සාකච්ඡා කරලා ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීමත් වැදගත්. ඒ, ඒ අයගේ වැටුප්, දීමනා, ප්‍රවාහන දීමනා ඇතුළු පහසුකම් ලබා දීම සහ ඒ විශේෂඥ වෛද්‍යවරු යොමු කරන දිස්ත්‍රික් මහ රෝහල් හෝ මූලික රෝහල්වලට අවශ්‍ය කරන පහසුකම් ලබා දීම. මේ කරුණු ස්ථාපිත කිරීමෙන් පමණමයි මේ ප්‍රමාණය රඳවා ගන්න අපට පුළුවන්කම ලැබෙන්නේ. එපමණක් නොවෙයි, අමාත්‍යාංශය හැටියට අපි මේ පවතින cadre එක revise කරගෙන යනවා. එතනැදීත් මේ සංඛ්‍යාවේ වෙනසක් සිදු වනවා. සංඛ්‍යාව වැඩි වීමට තමයි නියමිත වෙලා තිබෙන්නේ. මේ cadre එක වැඩි කර ගන්නවා වාගේම ඉන්න අය රඳවා ගන්නත්, අනෙක් පැත්තෙන්, විශේෂඥ වෛද්‍යවරු අලුතින් බිහි කර ගැනීමටත් ක්‍රමානුකූලව අපි කටයුතු කරගෙන යනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, මේ සඳහා යම් කාලයක් ගත වනවා කියලා. අපට හිතු හිතු පමණින් විශේෂඥ වෛද්‍යවරු බිහි කරන්න බැහැ.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, තවදුරටත් ගත්තාම, විදේශ පුහුණුවට යන්න කලින් ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි පුහුණුව, එහෙම නැත්නම් SR period එක ගත්තාම, කෙටි කාලයකට ඒ කණ්ඩායම රජයේ රෝහල් වෙත විශේෂඥ සේවාව සැපයීම සඳහා යොමු කරනවා. නමුත්, ඔවුන් බොහෝ විට කෙටි කාලයක් ඇතුළත තමන්ගේ විශේෂඥ පුහුණුව සඳහා විදේශගත වනවා. ඒ නිසා විශේෂඥ වෛද්‍ය සේවා සැපයීමේ ක්‍රියාවලිය නිතර නිතර අඩපණ වෙනවා. එහෙම අයගෙන් තමයි ඒ රෝහල් බොහෝ විට සේවාව සපයාගෙන තිබෙන්නේ. විශේෂයෙන්ම විශේෂඥ පුහුණුව සඳහා තෝරාගනු ලබන වෛද්‍යවරුන්ගේ ප්‍රමාණය වැඩි කර ගන්න එකත්, ඒ වාගේම මේ කාරණය පිළිබඳ යම් අවබෝධයක් සහිත සාකච්ඡාවකුත් එක්ක, විශේෂයෙන්ම පශ්චාත් උපාධි ආයතනයෙන් සහ විශේෂඥ වෛද්‍ය සේවාවන්ට අදාළ colleges එක්ක සාකච්ඡා කරලා යම් එකඟතාවක් ගොඩ නඟා ගන්න ආණ්ඩුවට මැදිහත් වෙන්න පුළුවන්ද කියලා මා අහන්න කැමැතියි.

ඒ වගේම, ගරු ඇමතිතුමා මතු කළා වාගේම රට හැර ගිහිල්ලා විදේශ සිටින ශ්‍රී ලාංකික වෛද්‍යවරුන් බොහෝ පිරිසක් දැන් කැමැත්ත ප්‍රකාශ කරමින් ඉන්නවා, රට තුළට නැවත එන්න. ඔවුන්ට මේ රටට ඇවිල්ලා නැවත සේවය කිරීම සඳහා යම් අවස්ථාවක් සලසා දිය හැකිද කියන කාරණයත්, ඒ සම්බන්ධ නීතිමය ගැටලු නිරාකරණය කර ගනිමින් එය කරන්න පුළුවන්ද කියන කාරණයත් පිළිබඳව ගරු ඇමතිතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, cadre revision එක කරන්නේ ඇත්තටම PGIM එකේ සහ අපේ collegesවල සම්බන්ධතාව සහිතව. ඒ, අපට තිබෙන අවශ්‍යතාව වාගේම ඒවායින් ගොඩ නඟා ගන්නා ප්‍රමාණයත් වැදගත් නිසා.

ඊළඟට ඔබතුමා මතු කළ දෙවැනි කාරණය ගැන කිව්වොත්, ලංකාව හැර ගිය විශේෂඥවරුන් යළි කැඳවා ගැනීමේදී යම් යම් බාධා පැවතුණා. නමුත්, අපි ඒ බාධාවන් දැන් ලිහිල් කරගෙන යනවා. පසුගිය කාලයේ විවිධ හේතු මත රට හැර ගිය විශේෂඥ වෛද්‍යවරු ප්‍රමාණයක් දැන් අපේ රටට ඇවිල්ලා සේවය කරනවා. සමහර පුරප්පාඩු පුරවා ගන්න වෙන්නේ ඒ අයගෙන් තමයි. ඒ අයට තිබෙන තවත් බාධා අපි ඉවත් කරගෙන යනවා. මේ වෙලාවේදී අපි බලාපොරොත්තු වනවා, ඒ අය මොන හේතුවක් මත පසුගිය කාලයේ රට අත්හැර ගියත් මේ රටේ සෞඛ්‍ය සේවාව යළි ගොඩ නැඟීම සඳහා ඒ අයගේ මැදිහත්වීම ලබා දෙයි කියලා.

මොකද, අපි ඒ අය වෙනුවෙන් -ඔවුන්ගේ අධ්‍යාපනයට, දේශීය හා විදේශීය පුහුණුවීම්වලට, සායනික පුහුණුවීම්වලට- අපේ රටේ ජනතාවගේ බදු මුදල් විශාල වශයෙන් යොදවලාත් තිබෙනවා. ඉතින්, ඒ වෙනුවෙන් වූ යුතුකම විශේෂඥ වෛද්‍යවරුන් ඉටු කරලා අපේ රටේ සෞඛ්‍ය සේවාව ඉහළට ඔසවා තබන්නත්, අඩුම තරමේ අපට Universal Health Coverage එකේ 80, 85 rank එකකටවත් එන්න පුළුවන් වෙන්නත් ඒ විශේෂඥ වෛද්‍යවරුන් මැදිහත් වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඒ නිසා ඒ අයට විවෘත ආරාධනයකුත් මම මේ වෙලාවේ කරනවා, එන්න, ඔබට තිබෙන බාධා අපි ඉවත් කරලා දෙන්නම් කියලා. ඔබගේ සේවා ස්ථානය අනුව දරුවන් පාසල්වලට ඇතුළත් කර ගැනීමේදී හෝ ප්‍රවාහන ප්‍රශ්න වැනි වෙනත් ප්‍රශ්නවලදී ඒවාට මැදිහත් වීමක් කරන්නත් රජය සූදානම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## ඌන සේවා නියුක්ත උපාධිධාරීන්: සුදුසු සේවා ස්ථාන

கீழ் உழைப்பு நிலையிலுள்ள பட்டதாரிகள்: பொருத்தமான சேவை நிலையங்கள்

UNDEREMPLOYED GRADUATES: PROVISION OF SUITABLE PLACES OF WORK

970/2025

**3. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා (ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා වෙනුවට)**

(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர - மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி சார்பாக)

(The Hon. (Dr.) Nishantha Samaraweera on behalf of the Hon. Rajeevan Jeyachandramoorthy)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව PL 1, PL 2 සහ PL 3 යන වැටුප් පරිමාණවල පිහිටුවා ඇති නිලධාරීන් අතර උපාධිධාරීන්ද සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඌන සේවා නියුක්ත උපාධිධාරීන්ට සුදුසු සේවා ස්ථාන ලබා දෙන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(v) ඌන සේවා නියුක්ත ඉහත උපාධිධාරීන් අතර වයස අවුරුදු 40 ට වැඩි උපාධිධාරීන්ද සිටින බැවින්, ඔවුන්ට ලබා දෙන විසඳුම කවරේද;

(vi) ඌන සේවා නියුක්ත උපාධිධාරී නිලධාරීන්ට ඔවුන්ගේ සුදුසුකම් අනුව විභාගයකින් තොරව උසස්වීම් ලබා දීමේ ක්‍රමවේදයක් තිබේද;

(vii) නොඑසේ නම්, එවැනි ක්‍රමවේදයක් හඳුන්වා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொது நிருவாக சுற்றறிக்கை இல. 06/2006இன் பிரகாரம், PL 1, PL 2 மற்றும் PL 3 ஆகிய சம்பள அளவுத்திட்டங்களில் வைக்கப்பட்டுள்ள அலுவலர்களில் பட்டதாரிகளும் இருக்கிறார்கள் என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி பட்டதாரிகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) மேற்படி கீழ் உழைப்பு நிலையிலுள்ள பட்டதாரிகளுக்குத் தகுந்த சேவை நிலையங்கள் பெற்றுக்கொடுக்கப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், அதற்காகப் பின்பற்றப்படும் செயன்முறை யாது என்பதையும்;

(v) மேற்படி கீழ் உழைப்புப் பட்டதாரிகள் மத்தியில் 40 வயதுக்கு மேற்பட்ட பட்டதாரிகளும் இருப்பதால் அவர்களுக்கு வழங்கப்படும் தீர்வு யாது என்பதையும்;

(vi) மேற்படி கீழ் உழைப்பு நிலையிலுள்ள பட்டதாரி அலுவலர்களுக்கு அவர்களின் தகைமைகளுக்கு ஏற்ப பரீட்சை ஏதுமின்றி பதவி உயர்வு வழங்கும் செயன்முறையொன்று காணப்படுகின்றதா என்பதையும்;

(vii) இன்றேல், அவ்வாறான செயன்முறையொன்று அறிமுகப்படுத்தப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether he is aware that there are graduates among the officers placed in PL 1, PL 2 and PL 3 salary scales according to the Public Administration Circular 06/2006;

(ii) if so, the number of such graduates;

(iii) whether the aforementioned underemployed graduates will be provided with suitable places of work;

(iv) if so, the methodology that will be adopted to implement that;

(v) the solution that will be provided to the graduates over 40 years of age, who are among the underemployed;

(vi) whether there is a system in place to promote underemployed graduates based on their qualifications without conducting an examination; and

(vi) if not, whether such a system will be introduced?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) නිශ්චිත ගණනය කිරීමක් සිදුකර නොමැත.

(iii) ඌන සේවා උපාධිධාරීන් ලෙස වර්ගීකරණයක් සිදුකර නොමැත.

(iv) ඉහත (iii) ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර අනුව පැන නොනඟී.

(v) ඉහත (iii) ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර අනුව පැන නොනඟී.

(vi) ඉහත (iii) ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර අනුව පැන නොනඟී.

(vii) ඉහත (iii) ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර අනුව පැන නොනඟී.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ආනයනික විද්‍යුත් වාහන මත පනවන බදු
### இறக்குமதி செய்யப்பட்ட மின்சார வாகனங்களுக்கான வரி விதிப்பு
### TAXES IMPOSED ON IMPORTED ELECTRIC VEHICLES

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, වාහන ආනයනයේදී බදු අය කර ගැනීම විවිධ පාර්ශ්වයන්ගේ වුවමනා ඉටු වන සේ සංකීර්ණ ලෙස සකස්ව තිබීම නිසා බදු දැලෙන් රිංගමින් ආනයනික බදු පැහැර හැරීම් දිගින් දිගටම සිදුවන බව ආර්ථික විශේෂඥයින් ඇතුළු අපගේ මතයයි. සරල හා විනිවිදභාවයකින් යුතු වාහන ආනයන බදු ක්‍රමයක් හඳුන්වා දීම දිනෙන් දින ප්‍රමාද වීම නිසා රජයේ ආදායම අහිමි වන අතරම, අසමතුලිත වෙළෙඳ පොළ තරගයක් හා අවසන් පාරිභෝගිකයාද දැඩි අපහසුතාවන්ට පත් කරයි. ඒ නිසා මේ මාතෘකාව පිළිබඳව රජයේ පැහැදිලි ප්‍රතිපත්තිය බලාපොරොත්තුවෙන් මා මෙම ප්‍රශ්න ඉදිරිපත් කරනවා.

01. ආනයනික විද්‍යුත් වාහනවලට බදු අය කරනු ලබන්නේ එම වාහනවල උපරිම ධාරිතාව - maximum motor capacity - මතද? ශ්‍රේණිගත ධාරිතාව - rated motor capacity - මතද? නැතහොත්, වෙනත් කුමන නිර්ණායක මීට ඇතුළත්ද? එම සීමා මත පැනවෙන බදු වෙන වෙනම දක්වන්නේද?

    ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය ඇහුවේ මේ නිසායි. සමහර වෙලාවට parallel importersලාට එක වැඩ පිළිවෙළකුත්, නියෝජිත ආයතනයට තවත් වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක වනවා කියලා චෝදනාවක් තිබෙනවා. Parallel importersලාට maximum motor capacity සූත්‍රයත්, නියෝජිත ආයතනයට rated motor capacity සූත්‍රයත් යොදා ගන්නවා. අපි දැනගන්න කැමැතියි, මේක ක්‍රියාත්මක කරන ක්‍රමවේදය මොකක්ද කියලා.

02. පාවිච්චි කරන ලද හෝ නවතම BYD විද්‍යුත් වාහන හෝ මෙරටට ආනයනය කරන නියෝජිත ආයතන විසින් මෙතෙක් එම වාහන නිෂ්කාසනය කිරීමේදී බදු ගෙවා ඇත්තේ කුමන ධාරිතාවක් මතද යන්න වෙන් වෙන් වශයෙන් දක්වන්නේද?

03. ශ්‍රී ලංකාවට BYD දේශීය නියෝජිත ආයතනය විසින් ආනයනය කරනු ලබන ATTO 3 හා අනෙකුත් විද්‍යුත් වාහනයක වාර්තා කොට ඇති උපරිම ධාරිතාව හා ශ්‍රේණිගත ධාරිතා කොපමණද?

04. මේ වන විට ආන්දෝලනාත්මක තත්ත්වයක් උද්ගත වී ඇති මෙම විද්‍යුත් වාහනවල සැබෑ ධාරිතාව තහවුරු කර ගැනීමට අදාළ පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත්ද? එම පරීක්ෂාවන් සිදු කරනු ලබන්නේ කවුරුන්ද? ඊට ජාත්‍යන්තර මට්ටමේ සහයෝගය ලබාගෙන තිබේද? එහි ප්‍රගතිය කුමක්ද?

ගරු කථානායකතුමනි, චෝදනාවක් තිබෙනවා, මේ ප්‍රතිපත්ති හරියාකාරව ක්‍රියාත්මක නොවීම තුළ එක වාහනයකින් රටට බදු ආදායම වශයෙන් රුපියල් ලක්ෂ 40ක්, 45ක් අහිමි වෙනවා කියලා. මේ කාරණාව පිළිබඳව සමාජයේ කථා වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව නිවැරදි තොරතුරු අපට අවශ්‍යයි.

05. බදු අය කිරීමේ ව්‍යාකූලත්වය මත කොපමණ වාහන සංඛ්‍යාවක් රේගුව තුළ සිරවී ඇත්ද? කොපමණ වාහන සංඛ්‍යාවක් මේ වන විට නිදහස් කර ඇත්ද? බදු ව්‍යාකූලත්වය සඳහා විසඳුම් ලැබෙන තුරු මෙම සියලු වාහන තවදුරටත් රේගුවේ රඳවා තබා ගැනීමක් සිදු කරන්නේද? නොඑසේ නම්, මේ සම්බන්ධයෙන් රජයේ විසඳුම කුමක්ද?

06. මේ නිසා අද වන විට රජයට අහිමිව ඇති බදු ආදායම කොපමණද? එයට වගකිව යුත්තේ කවුරුන්ද? ඒ සම්බන්ධයෙන් රජය ගනු ලබන පියවර මොනවාද?

ගරු කථානායකතුමනි, මේක ඉතාම වැදගත් ප්‍රශ්නයක්. දැන් අපට ආරංචියක් තිබෙනවා, ඒ රඳවා ගත් වාහනවල බදුවල වෙනසට, ඒ වටිනාකමට බැංකු ඇපකරයක් - bank guarantee එකක් - තියලා එම වාහන release කරන්න හදනවාය කියලා. ඒ කාරණාව ගැන අද කථා බහ වනවා. එලෙස එම වාහන release කරනවා නම් duty plus value කියන සූත්‍රය හරහා තමයි release කරන්නට ඕනෑ. ඒවායේ යම්කිසි වරදක් සිදු වෙලා තිබෙනවා නම් රජයට අහිමි වන බදු ආදායම අපි අනිවාර්යයෙන්ම ලබා ගන්නට ඕනෑ.

07. මෙම ගැටලුව තුළින් ඉගෙනුම් ලබා, වාහන ආනයනය සම්බන්ධ බදු ප්‍රතිපත්තිය සංශෝධනයට රජය සතුව යෝජනා තිබේද? එය ආරම්භ කරනු ලබන්නේ කවදා ද?

ලෝකයේ බොහෝ දියුණු රටවල, රටට ඉතා වැදගත් වන, රටට හානියක් නොවන සූත්‍ර ක්‍රියාත්මක වනවා. ඒවායෙනුත් අත්දැකීම් ලබාගෙන නිවැරදි සූත්‍රයක් නිර්මාණය කරලා, විශේෂයෙන්ම වාහන ආනයනයේදී සිදු වන මේ අක්‍රමිකතා අවම කරන්නට වඩාත් සුදුසු වැඩසටහනක් අවශ්‍යයි කියා මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, ඉහත ප්‍රශ්නවලට මම පිළිතුරු බලාපොරොත්තු වනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු විපක්ෂ නායකතුමනි, සමහර විට ඔබතුමා දන්නවාත් ඇති, BYD වාහන ආනයනකරුවෙක් මේ වන විටත් මේ සම්බන්ධව අභියාචනාධිකරණයේ නඩුකරයක් ගොනු කර තිබෙන බව. එම නිසා මෙම ප්‍රශ්නයට මේ අවස්ථාවේ පිළිතුරක් ලබා දීමට නොහැකි බව දන්වනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ඇත්තවශයෙන්ම මම සූදානම් වන්නේ නැහැ, කිසිම නඩුවක පාර්ශ්වකරුවන්ට අගතියක් හෝ සුගතියක් වන ආකාරයට බලපෑම් කරන්න. ගරු කථානායකතුමනි, නමුත් මෙම ප්‍රශ්නය නිසා පරිභෝගිකයන් සහ ආනයනකරුවන් විශාල පිරිසක් අගතියට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ සම්බන්ධව සමාජය තුළ කථා බහක් තිබෙනවා, ඒ කථා බහ අපේ රටේ ආර්ථික කළමනාකරණයට ඒ තරම්ම සුදුසු නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් දෙන්න. මට පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. බාධා කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා - *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට බාධා කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බාධාවක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කියන්න හදන්නේ, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමා, ඔය කාරණාව වාදයක් කර ගන්න බැහැ.

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා.

## II

## ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ මතුව ඇති ගැටලු
### கம்பஹா விக்ரமாரச்சி சுதேச மருத்துவப் பல்கலைக்கழகத்தில் எழுந்துள்ள பிரச்சினைகள்
### ISSUES ARISEN AT GAMPAHA WICKRAMARACHCHI UNIVERSITY OF INDIGENOUS MEDICINE

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Speaker, thank you for providing me this opportunity. I have given you the Question of Privilege in Sinhala. Unfortunately, I am not good at reading Sinhala. So, I am reading it after writing it in Tamil. Therefore, I apologize if there would be any mistakes while reading it.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා මෙම ප්‍රශ්නය අහනවා.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව පැවතුණු ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය පහසුකම් වැඩිදියුණු කිරීමකින් තොරව ගැසට් නිවේදනයක් මඟින් 2021 වසරේදී නව පීඨ දෙකක් ආරම්භ කරමින් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය බවට උසස් කරන ලදී. එහිදී, විශ්වවිද්‍යාලයෙහි පහසුකම් වැඩිදියුණු කිරීමකින් තොරව, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය සහ දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ පීඨය ලෙස පීඨ දෙකක් අලුතින් ආරම්භ කරන ලදී. මෙහි දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින පීඨය වන අතර, මේ වන විට සිසුන් 1,000කට අධික සංඛ්‍යාවක් එම පීඨයේ ඉගෙනුම ලබයි.

ඔවුන්ට අවශ්‍ය විද්‍යාගාර පහසුකම් නැත. පරිගණකාගාර පහසුකම් ඉදිකර නැත. තවමත් මේ පීඨයේ සිසුන්ට ස්ථිර ගොඩනැඟිල්ලක් හෝ නොමැත. දේශනශාලා තිබෙන්නේ 7ක් පමණයි. සිසුන් 1,000කට අධික සංඛ්‍යාවක් ඉන්න මේ පීඨයේ ශිෂ්‍යයන්ට ඊළඟ සැප්තැම්බර් මාසයේ සිට අධ්‍යයන කටයුතු කරන්න ඉඩකඩ නැහැ.

ඒ වාගේම, මේ ආරම්භ කරලා තිබෙන අලුත් උපාධි පාඨමාලාවන්ගේ විෂය නිර්දේශය ප්‍රථම උපාධි කණ්ඩායම බඳවාගෙන වසරක් ඇතුළත සිසුන් දැනුවත් නොකර වෙනස් කර තිබෙනවා. නීති විරෝධීව මේ විෂය නිර්දේශය වෙනස් කිරීම නිසා ඔවුන් මුලින් ලියාපදිංචි වූ විෂය නිර්දේශය නොවෙයි වර්තමානයේ ඉගෙන ගන්නේ. මේ හේතුවෙන් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් කඩවී තිබෙනවා. ඒ වාගේම, මේ අලුත් උපාධි පාඨමාලාවන් නිශ්චිත රැකියා ක්ෂේත්‍රයක් අරමුණු කරගෙන නොවෙයි ආරම්භ කර තිබෙන්නේ. ඒ නිසා මේ සිසුන්ට උපාධියට අදාළ රැකියා ක්ෂේත්‍රයක් නැත.

2021දී බඳවා ගත් ප්‍රථම උපාධි කණ්ඩායම 2026 වසරේදී උපාධිය සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණත් ඔවුන්ගේ මේ ගැටලු තවමත් විසඳී නැත. මෙම ගැටලු විසඳා ගැනීම වෙනුවෙන් එම පීඨයේ සිසුන් 2025 ජනවාරි 29 දින විරෝධතාවක් සමඟ සත්‍යාග්‍රහයක් ආරම්භ කරන ලදී. එම සත්‍යාග්‍රහය අඛණ්ඩව දින 36ක් පැවති අතර, ඉන් අනතුරුව 2025.02.28 දින අගමැතිතුමිය සමඟ සාකච්ඡාවක් ශිෂ්‍ය සංගමයට ලැබුණු අතර, 2025.03.05 දින අගමැතිතුමිය මෙම ගැටලුවලට අදාළ නිර්දේශ ලබා ගැනීමට විශේෂ පංච පුද්ගල කමිටුවක් පත් කරන ලදී.

මාස හතරකට ආසන්න කාලයකින් පසු එම කමිටුව විසින් ඔවුන්ගේ නිර්දේශ ඇතුළත් වාර්තාව 2025 ජූලි 02 දින අගමැතිතුමියට භාර දෙන ලදී. එහෙත් තවමත් එම සිසුන්ට නිර්දේශවල සඳහන් විසඳුම් රජය විසින් ක්‍රියාත්මක කර නැත. ඉතා කෙටි කාලයක් එම පීඨයේ ප්‍රථම උපාධි කණ්ඩායම උපාධිය සම්පූර්ණ කරන්නට ඉතුරුව තිබුණත් මේ උග්‍ර ගැටලු විසඳී නැති නිසාත්, ගුණාත්මක උපාධියක් නැති නිසාත් ඔවුන්ට රැකියා නැත. ඒ අනුව, මා පහත ප්‍රශ්න විමසා සිටිමි.

1. 2025 ජූලි 02වැනි දා කමිටුව විසින් අගමැතිතුමියට භාර දුන් වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක නොකරන්නේ ඇයි? විසඳුම් ක්‍රියාත්මක වීම පළමු කණ්ඩායමේ උපාධි අවසන් වීමට පෙර සිදු කරනවාද?
2. එම නිර්දේශ ක්‍රියාත්මක වීමේ දී ඔවුන්ගේ උපාධි පාඨමාලාවල විශේෂීකරණයන් වෙනස් වීමට ඉඩ තිබේද? (උදා:- BSc උපාධි BA වීමට හෝ BHSc උපාධි BTech වීමට)
3. නාමිකව ආරම්භ කරන ලද මෙම විශ්වවිද්‍යාලයේ මූලික අරමුණුවලට පරිබාහිරව තිබෙන උපාධි පාඨමාලා සඳහා රජයේ තීරණය කුමක්ද? (මූලික අරමුණ ලෙස සඳහන් වන්නේ ආයුර්වේද ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම වුවත් නව උපාධි වශයෙන් තාක්ෂණ සහ කළමනාකරණ ක්ෂේත්‍රයන්හි උපාධි පාඨමාලා ආරම්භ කර ඇත.)

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

4. නොගැළපෙන පාඨමාලා වෙනත් විශ්වවිද්‍යාලවලට අනුබද්ධ කරන බව රජය ප්‍රකාශ කර තිබෙනවා. ඒ ක්‍රියාවලිය ප්‍රමාද ඇයි?

5. සිසුන්ගේ විෂය නිර්දේශ ඉක්මනින් නැවත සුදුසු පරිදි සකස් කර දීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ රජය කටයුතු නොකරන්නේ ඇයි?

6. මෙම උපාධි හදාරන සිසුන්ගේ රැකියා ක්ෂේත්‍ර සම්බන්ධව රජයට තිබෙන වැඩ පිළිවෙළ කුමක්ද?

7. නව කණ්ඩායම සහ දැනට සිටින කණ්ඩායම් තුන සැප්තැම්බර් මාසයේ සිට ඉගෙනුම ලබන්නේ කොහේද? ඉඩ පහසුකම් නොමැති වීම සම්බන්ධයෙන් රජයේ වැඩ පිළිවෙළ කුමක්ද?

8. මෙම උපාධි පාඨමාලාවල නව බඳවා ගැනීම් සම්බන්ධව රජයේ වැඩ පිළිවෙළ කුමක්ද?

9. විෂය නිර්දේශ නීති විරෝධීව වෙනස් කරමින් සිසුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළ නිලධාරින් සම්බන්ධව පරීක්ෂණ ප්‍රමාද ඇයි?

10. ආචාර්යවරු බඳවා ගැනීමේදී සිදුවී ඇති වංචාවලට නීතිය ක්‍රියාත්මක නොකරන්නේ ඇයි?

ගරු කථානායකතුමනි, මගේ අතින් මොකක් හරි වරදක් සිදු වුණා නම් සමාවෙන්න. මම මේ ප්‍රශ්න දෙමළ භාෂාවෙන් ලියාගෙන ආවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඔබතුමා සිංහලෙන් නේ කිව්වේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
සිංහලෙන් කියැවෙන විධියට ලියාගෙන ආවේ දෙමළ භාෂාවෙන්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු අග්‍රාමාත්‍යතුමිය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ගන්නවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම තව කාරණා දෙකක් ගැන කියන්නම්. මම මේ කියන දේ වැරදියි නම් ඔබතුමා ආයෙත් මට කථා කරන්නවත් දෙන්න එපා, පාර්ලිමේන්තුව ඇතුළේ. එම කාරණා දෙකෙන්ම කියැවෙන්නේ එක සමාන සිද්ධි දෙකක්. මම ඒ ගැන Ministersලා දෙදෙනාම දැනුවත් කර තිබෙනවා. මම කියන්නේ නැහැ, ඒ කොහේද කියලා. *[බාධා කිරීමක්]* මට තත්පර 20ක් දෙන්න. ළමයෙක්ව ගෙනැල්ලා වීඩියෝ කරලා, ඒ ළමයාට හානියක් කරලා,- එම කාරණා දෙක ගැනම මම Ministersලා දැනුවත් කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක සභාව conduct කිරීම පිළිබඳ රීති ප්‍රශ්නයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

අමාත්‍යාංශ නිවේදන, ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය.

## 2020/2021 කාලය තුළ සිදු කරන ලද අවිධිමත් උපාධිධාරී පත්වීම්: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය

## 2020/2021 காலப்பகுதியில் வழங்கப்பட்ட முறைகேடான பட்டதாரி நியமனங்கள்: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று

## IRREGULAR GRADUATE APPOINTMENTS MADE DURING 2020/2021: STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් 2025.07.11වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් 2019.12.31 දිනට පෙර උපාධිය ලබා තිබූ වයස අවුරුදු 45 නොඉක්මවූ රැකියා විරහිත උපාධිධාරීන් අමප/20/0312/201/008 හා 2020.02.05 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශයට අදාළව 2020.02.05 දිනැතිව ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය, අමප/20/0428/201/008-1 හා 2020.02.18 දිනැති අමාත්‍ය මණ්ඩල සටහනට අදාළව 2020.02.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අමප/20/1187/301/002 දිනැති

අමාත්‍ය මණ්ඩල සටහන සම්බන්ධයෙන් 2020.08.19 දිනැතිව රැස් වූ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සියලුම දිස්ත්‍රික් ලේකම්වරු මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත උපාධිධාරී අභ්‍යාසලාභීන් 49,448දෙනෙකු 2020.09.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ද, 7,885දෙනෙකු 2021.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ද, 783දෙනෙකු 2021.03.26 දින සිටද පුහුණුව සඳහා අනුයුක්ත කර ඇත. එම නිලධාරීන් අතුරින් එක් එක් දිස්ත්‍රික්ක යටතේ ඇමුණුමෙහි දක්වා ඇති පරිදි අභ්‍යාසලාභීන් පුහුණුව සඳහා වාර්තා කර ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

එක් එක් දිස්ත්‍රික්කයන්හි පුහුණුව සඳහා වාර්තා කරන ලද අභ්‍යාසලාභීන්:

| අනු අංකය | දිස්ත්‍රික්කය | පුහුණුවට වාර්තා කරන ලද අභ්‍යාසලාභීන් ගණන |
|---|---|---|
| 1 | කොළඹ | 3252 |
| 2 | ගම්පහ | 4399 |
| 3 | කළුතර | 3096 |
| 4 | මහනුවර | 3991 |
| 5 | මාතලේ | 1410 |
| 6 | නුවරඑළිය | 861 |
| 7 | ගාල්ල | 3360 |
| 8 | මාතර | 2774 |
| 9 | හම්බන්තොට | 1650 |
| 10 | යාපනය | 2099 |
| 11 | මන්නාරම | 332 |
| 12 | වවුනියාව | 378 |
| 13 | මුලතිව් | 244 |
| 14 | කිලිනොච්චිය | 281 |
| 15 | මඩකලපුව | 2182 |
| 16 | අම්පාර | 2175 |
| 17 | ත්‍රිකුණාමලය | 1223 |
| 18 | කුරුණෑගල | 5324 |
| 19 | පුත්තලම | 785 |
| 20 | අනුරාධපුර | 2427 |
| 21 | පොළොන්නරුව | 621 |
| 22 | බදුල්ල | 2593 |
| 23 | මොනරාගල | 1873 |
| 24 | රත්නපුර | 3029 |
| 25 | කෑගල්ල | 2826 |

ඒ අනුව, අමප/21/1639/315/033 හා 2021.09.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ සංවර්ධන නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතින් ප්‍රකාරව ඉහත සඳහන් කරනු ලැබූ උපාධිධාරී අභ්‍යාසලාභීන් අතුරින් අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති 2020.09.02 බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභීන්ට 2022.01.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ද, 2021.02.01 හා 2021.03.26 බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභීන්ට 2022.04.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරී සේවයේ පත්වීම් ද ලබා දී ඇත.

2. ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ 2014 වසරේදී සිදු වූ කටයුත්තක් සම්බන්ධයෙන්. අපි මේ පිළිබඳ තොරතුරු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලා තිබෙනවා. මොකද, ඒවා අධ්‍යාපන අමාත්‍යාංශය සතු තොරතුරු නොවෙයි. ඊට අදාළ තොරතුරු තවම අපට ලැබී නැහැ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය කියන්නේත් ඔවුන් ළඟත් මේ පිළිබඳව නිසි තොරතුරු නැහැ කියලායි.

3. 2014 වර්ෂයේ අපොස (උසස් පෙළ) විභාගයෙන් යාපනය විශ්වවිද්‍යාලය (වවුනියා මණ්ඩපයද ඇතුළත්ව) නැඟෙනහිර විශ්වවිද්‍යාලය (ත්‍රිකුණාමලය මණ්ඩපයද ඇතුළත්ව) සහ අග්නිදිග විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලයන්හි විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගත් සිසුන් සියයට 71ක් පමණ 2020 වර්ෂය අවසාන වන විට උපාධිය අවසන් කර ඇති අතර, මේ අතරින් බඳවා ගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කළ සිසුන්ට ඉහත සංවර්ධන නිලධාරී තනතුරු සඳහා අයදුම් කිරීමට හිමිකම තිබී ඇත.

4. එසේ පත්වීම් ලබා දී නොමැත.

5. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලද 2025.06.30 දරන පුද්ගල දත්ත අනුව පුරප්පාඩු 404ක් දක්නට තිබේ. ගුරු සේවා ව්‍යවස්ථාව අනුව ගුරු පුරප්පාඩු පිරවිය හැක්කේ විද්‍යාපීඨ මඟින් හෝ උපාධිධාරීන්ගේ විවෘත තරග විභාගයකින් තෝරා ගැනීමෙන් පසුවය. ඊට පරිබාහිර මෙවැනි ඉල්ලීම් සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගත යුතුය.

6. උතුරු පළාත් ලේකම්වරයා විසින් ගුරු හිඟය පිරවීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

i. ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023.10.23 වැනි දින පුරප්පාඩු 195ක් සඳහා ඉල්ලුම්පත් කැඳවා තිබුණි. ඒ අනුව සුදුසුකම් සපිරූ උපාධිධාරීන් 121කට 2024.06.03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී ඇත.

ii. ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023.10.23 වැනි දින පුරප්පාඩු 371කට ඉල්ලුම්පත් කැඳවා ඇති අතර, සුදුසුම්කම් සපිරූ උපාධිධාරීන් 253කට 2024.06.03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී ඇත.

iii. 2024.12.31 වැනි දින පැවැති පුරප්පාඩු අනුව 3,516ක ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ පටිපාටිය සමාලෝචනය කිරීමේ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුව මඟින් 1,758කින් යුත් පුරප්පාඩුවලට බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දුන්නද, අංක 25/0961/802/004-V සහ 2025.06.04 වැනි දින දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇත.

`iv. ජාතික ශික්ෂණලාභී ඩිප්ලෝමාධාරීන් 215දෙනෙකුටද 2025.05.02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී ඇත.

v. ගරු ආණ්ඩුකාරතුමන් ලබා දී ඇති අනුමැතිය පදනම් කොටගෙන පොදු සම්මුඛ පරීක්ෂණයෙන් සහ ප්‍රායෝගික විභාගයෙන් සුදුසුකම් ලැබූ රාජ්‍ය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනඥ උපාධිධාරීන් 6දෙනෙකුට සහ 13දෙනෙකුට 2023.11.01 හා 2024.07.15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී ඇත.

ඒ අනුව පළාත් මට්ටමින් හා රේඛීය අමාත්‍යාංශයේ යොමු කිරීම් අනුව ඉහත පරිදි ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කර ඇත.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, මට එක කාරණයක් අහන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට පැහැදිලි කර ගැනීමක් සඳහා අවස්ථාව තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Sir. I would like to ask this question in Tamil.

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, வழமையாக எந்த appointment வழங்கினாலும் அது seniority அடிப்படையில்தான் வழங்கப்படுகின்றது என்பது உங்களுக்கு நன்றாகவே தெரியும்! மருத்துவத் துறையை எடுத்துக்கொண்டால், அதில் ஒவ்வொரு batchஉம் pass out ஆகிய பிறகு, seniority அடிப்படையில்தான் நியமனம் வழங்கப்படுகின்றது. ஆனால், மற்றைய துறைகளில் seniorityஐப் பார்ப்பதில்லை. அதாவது, ஏற்கனவே degree முடித்தவர்களுக்கு general knowledge exam ஒன்று வைக்கப்பட்டுத்தான் நியமனம் வழங்கப்படுகின்றது. இதனால் சிலநேரங்களில் 35-40 வயதுக்கு உட்பட்டவர்கள் அந்த general knowledge examஇல் pass பண்ணாமல்விட்டால், அவர்கள் seniorஆக இருந்தாலும் நியமனம் கிடைப்பதற்குரிய வாய்ப்புகள் குறைவு! உங்களுடைய அரசாங்கத்தால் வழங்கப்பட இருக்கின்ற அடுத்தடுத்த appointmentsஇன்போது, general knowledge examஐ வைக்காமல், pass out பண்ணுகின்றவர்களுக்கு seniority அடிப்படையில் appointmentsஐ வழங்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ඒ පත්වීම් ලබා දෙන ක්‍රමවේද සේවාවෙන් සේවාවට වෙනස් වෙනවා. උදාහරණයක් ගත්තොත්, ගරු මන්ත්‍රීතුමා අහන්නේ ගුරුවරුන් බඳවා ගැනීම පිළිබඳව නම්, ඒකට විශේෂ සේවා ව්‍යවස්ථාවක් තිබෙනවා. ඒ අනුව තමයි බඳවා ගැනීම් කරන්නේ. ඒක සේවාවෙන් සේවාවට වෙනස් වෙන නිසා, මට පොදු උත්තරයක් දෙන්න බැහැ. නමුත්, සංවර්ධන නිලධාරින් බඳවා ගැනීමේ සහ ගුරුවරුන් බඳවා ගැනීමේ ප්‍රශ්න ගණනාවක් අවුරුදු ගණනාවක් තිස්සේ නිර්මාණය වෙලා තිබීම නිසාත්, ඒ පිළිබඳව නඩු ගණනාවක් පවතින නිසාත්, අපේ රජය ආවාට පස්සේ අපි ඒකට වයස් සීමාව සලකන්නේ නැතුව බඳවා ගැනීම් කරන්න කියන යෝජනාව ගරු අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙන්නේ. මට මේකට පොදු උත්තරයක් දෙන්න බැරි, සේවාවෙන් සේවාවට බඳවා ගැනීම් වෙනස් වන නිසායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්තුතියි, ගරු අග්‍රාමාත්‍යතුමිය.

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා.

## දමිළ දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම: අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## தமிழ் அரசியல் கைதிகளின் விடுதலை: நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரினது கூற்று
## RELEASE OF TAMIL POLITICAL PRISONERS : STATEMENT BY MINISTER OF JUSTICE AND NATIONAL INTEGRATION

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා විසින් 2025.02.28 දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට මම පිළිතුර ලබා දෙනවා.

1. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ එල්ටීටීඊ ක්‍රියාකාරකම් සඳහා චෝදනා ලබා බන්ධනාගාර භාරයට පත් කර ඇති දමිළ සිරකරුවන් සහ සැකකරුවන් මේ වනවිට රඳවා ඇත.
   - එල්ටීටීඊ සැකකරුවන් ගණන 4යි.
   - එල්ටීටීඊ සිරකරුවන් ගණන 8යි. (ජීවිතාන්තය දක්වා දඬුවම් ලැබූ 3යි. ජීවිතාන්තය දක්වා දඬුවම් ලබා එය appeal කර ඇති සිරකරුවන් ගණන 2යි. මරණ දණ්ඩනය ලැබූ සිරකරුවන් 2ක් සහ සිරකරුවන් 01ක් වශයෙන්)
2. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින සිරකරුවන් හා සැකකරුවන් පහත බන්ධනාගාර ආයතනවල රඳවා ඇත.
   - වැලිකඩ බන්ධනාගාරය,
   - මැගසින් බන්ධනාගාරය,
   - කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය,
   - මහර බන්ධනාගාරය,
   - දුම්බර බන්ධනාගාරය,
   - බූස්ස හා මීගමුව යන බන්ධනාගාර.
     (රැඳවියන් අධිකරණ කටයුතු සඳහා ඉදිරිපත් කිරීමේදී සහ ආරක්ෂක, බුද්ධි තොරතුරු මත මෙම රැඳවීමේ බන්ධනාගාර ආයතන වෙනස් වන අවස්ථා ඇත.)
3. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින සිරකරුවන් හා සැකකරුවන් පහත අයුරින් නිදහස් කිරීම සිදු කරනු ලබයි.
   - ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින සිරකරුවන් සිය දඬුවම් කාලය අවසන් වීමෙන් පසුව නිදහස් කරනු ලැබේ.
   - ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින සැකකරුවෙකු අධිකරණය මඟින් ඇප මත නිදහස් කළහොත් එම සැකකරුට බන්ධනාගාරයෙන් නිදහස් විය හැක.
   - යම් සිරකරුවෙකු අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම්, එම අභියාචනය විභාග කර අවසානයේදී අධිකරණය මඟින් නිදහස් කළහොත් එම සිරකරුට බන්ධනාගාරයෙන් නිදහස් විය හැක.
   - යම් සැකකරුවෙකු අධිකරණය මඟින් නිදොස් කොට නිදහස් කළහොත් ඔහුට බන්ධනාගාරයෙන් නිදහස් විය හැක.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 ව්‍යවස්ථාව ප්‍රකාරව, සිරකරුවෙකු නිදහස් කිරීමේ, සිරකරුවෙකුට සමාව දීමේ ක්‍රමවේදය සඳහා නීතිමය ප්‍රතිපාදන අඩංගු වේ.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, எதிர்காலத்தில் அரசியல் கைதிகளை பொது மன்னிப்பின் அடிப்படையில் விடுதலை செய்வதற்கான சாத்தியப்பாடுகள் குறித்து நீங்கள் சொன்ன விடயத்தை நான் வரவேற்கின்றேன். மிக முக்கியமாக, கதிர்காமத் தம்பி சிவகுமார், விக்னேஸ்வரநாதன் பார்த்தீபன், கிருஷ்ணசாமி ராமச்சந்திரன், சண்முகலிங்கம் சூரியகுமார், ஜோன்ஷன் கொலின் வெலன்டினோ, சச்சிதானந்தம் ஆனந்த சுதாகர், ஏ.எச். உமர் ஹத்தாப், தங்கவேலு நிமலன், செல்வராஜா கிருபாகரன், தம்பி ஐயா பிரகாஷ் ஆகியோர் நீண்ட காலமாக சிறையில் இருக்கிறர்கள். அதாவது, 14-30 வருடங்களாக jailஇல் இருக்கிறார்கள். தயவுசெய்து, இவர்களின் குடும்பங்களை எண்ணிப் பாருங்கள்! ஆனந்த சுதாகரனின் மனைவியும் இறந்து விட்டார். அவரது இரண்டு பிள்ளைகளை வளர்த்த பாட்டியும் இறந்து விட்டார். அந்தப் பிள்ளைகள் அப்பா, அம்மா இல்லாத பிள்ளைகளாக இருக்கிறார்கள். மேற்குறித்த அரசியல் கைதிகள் jailஇல் இருந்த காலத்தைக் கருத்தில் எடுத்தாவது, அவர்களை மனிதாபிமான அடிப்படையில் விடுதலை செய்ய வேண்டுமென நான் இந்தச் சபையில் மாண்புமிகு சனாதிபதி அவர்களையும், கௌரவ நீதி அமைச்சர் அவர்களையும் கேட்டுக் கொள்கின்றேன். நீங்கள் அவர்களைப் பொது மன்னிப்பின் அடிப்படையில் விடுதலை செய்வதற்கான ஒரு வழியை ஏற்படுத்தித் தருவீர்களென நாங்கள் நம்புகின்றோம். இதற்குரிய பதிலை நான் உங்களிடமிருந்து எதிர்பார்க்கின்றேன்.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

As I have indicated to you, Hon. Member, granting of pardon is basically a Presidential prerogative and a right, according to the Constitution. That is why, in my Answer, I said that as per Article 34 of the Constitution, the President has the powers, not the Minister of Justice. However, a group of about 15 persons, whose loved ones are now convicted and imprisoned under the Prevention of Terrorism Act, their families, came to meet me and handed over a letter. So, those names had been taken in and are being considered at the moment as to what we could do. Other than that, I cannot make any promise because this prerogative is not within the purview of the Ministry of Justice, but with the President. So, whatever applications you have, you may present them to the President also. However, the members of their families came and spoke to me. That is a matter I am studying now. There were about 11 or 15 individuals in that letter, if I am not mistaken.

That is my Answer.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(8) යටතේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා.

## ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
## மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணனினது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. (DR.) V. S. RADHAKRISHNAN

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ சபாநாயகர் அவர்களே, இது சனாதிபதி நிதியத்திலிருந்து புலமைப் பரிசில் பெற்றமை தொடர்பானது.

தேசிய மக்கள் சக்தியின் பாராளுமன்ற உறுப்பினர் கௌரவ ரவீந்திர பண்டார அவர்களால் 2025.08.05 அன்று கௌரவ பிரதம அமைச்சரிடம் கேட்கப்பட்ட வாய்மூல விடைக்கான வினாவில் முன்னாள் சனாதிபதிகள், அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்களின் பிள்ளைகள், உறவினர்கள் மற்றும் நண்பர்களுக்கு 2005ஆம் ஆண்டுக்குப் பிறகு சனாதிபதி நிதியத்தின்மூலம் நிதி வழங்கப்பட்டது பற்றி கேட்கப்பட்டுள்ளது.

குறித்த பெயர்ப்பட்டியலில், 2006ஆம் ஆண்டில் முன்னாள் தேசியப்பட்டியல் பாராளுமன்ற உறுப்பினரான வீ. இராதாகிருஷ்ணன் அவர்களுக்காக திருமதி கே. இராதாகிருஷ்ணன் அவர்களுக்கு வெளிநாட்டுப் புலமைப் பரிசில் வழங்கப்பட்டுள்ளதாக குறிப்பிடப்பட்டு இருக்கின்றது. அதனை அடிப்படையாகக்கொண்டு, தற்போது பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் எனக்கு அவதூறு ஏற்படும் வகையில், பொய்யான செய்திகள் சமூக வலைத்தளங்கள் மூலமாகவும், இலத்திரனியல் ஊடகங்கள் மூலமாகவும் பரவுகின்றன.

அதில் குறிப்பிடப்பட்டுள்ள "வீ. இராதாகிருஷ்ணன்" எனும் பெயர் "பெருமாள்பிள்ளை இராதாகிருஷ்ணன்"ஆக இருக்க வேண்டும் என்றும், அது வேலுசாமி இராதாகிருஷ்ணன் ஆகிய என்னைப் பற்றியதல்ல என்றும், அந்த நேரத்தில் நான் மாகாண சபையைப் பிரதிநிதித்துவப்படுத்தியே உறுப்பினராக இருந்தேன் என்றும், பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவப் படுத்தவில்லை என்றும் இந்த உயரிய சபைக்கும் நாட்டு மக்களுக்கும் அறியத் தருகின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 (2) (අ) යටතේයි මම මේ කාරණය මතු කරන්නේ. ගරු අධිකරණ අමාත්‍යතුමනි, එය, ඔබතුමා ඉදිරිපත් කරන්න හදන 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත ඉවත් කිරීම පිණිස වූ පනත් කෙටුම්පත සම්බන්ධවයි. ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (1) කියවා බලන්න කියා මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. එහි මෙසේ සඳහන් වනවා:

> "සෑම පනත් කෙටුම්පතක් ම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යටත් පිරිසෙයින් දවස් හතකට පෙර ගැසට් පත්‍රයේ පළකළ යුත්තේ ය."

ඒ එක්කම, මා ඔබතුමාට පෙන්වා දෙන්න කැමැතියි, ස්ථාවර නියෝග 52 (5). එහි මෙසේ සඳහන් වනවා:

> "පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින හතක කාලයක් ඉකුත් වීමෙන් අනතුරුව කවර හෝ වේලාවක ඉහත (2) ඡේදයේ දක්වා ඇති යෝජනාව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය."

"දින හතක කාලයක් ඉකුත් වීමෙන් අනතුරුව" කියන කොටස මා යළි අවධාරණය කරනවා. ඒ වාගේම, ඉංග්‍රීසි භාෂාවෙනුත් මම එය කියවන්නම්.

Article 78 (1) of the Constitution states, I quote:

> "[(1) Every Bill shall be published in the Gazette at least seven days before it is placed on the Order Paper of Parliament.]"

එහෙම නම්, මේක බොහොම පැහැදිලියි. 31වන දායි මෙය ගැසට් පත්‍රයට ඇතුළත් කරන්නේ. සාමාන්‍යයෙන් අපි 31 ගණන් ගන්නේ නැහැ. අපේ තිබෙන නීති තත්ත්වයන් එක්ක සාමාන්‍යයෙන් ගණන් ගැනෙන්නේ 31වන දා රාත්‍රි 12.00ට කියන එකයි. එතකොට ඒ දවස ගණන් ගැනෙන්නේ නැහැ. ඊළඟට, අගෝස්තු 01වන දා, 02වන දා, 03වන දා, 04වන දා, 05වන දා, 06වන දා සහ 07වන දා. ගරු කථානායකතුමනි, අද තමයි හත්වෙනි දවස. එය ඉකුත් වෙලා නැහැ. ස්ථාවර නියෝගවල බොහොම පැහැදිලිව තිබෙනවා, "ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින හතක කාලයක් ඉකුත්වීමෙන් අනතුරුව" කියලා. ඒ කියන්නේ, අද රෑ 12.00ට තමයි මේ කියන දින හත සම්පූර්ණ වෙන්නේ. හෙට පාර්ලිමේන්තුවේ රැස්වීම තිබුණා නම් ඇත්තවශයෙන් හෙට තමයි මේක ගන්න පුළුවන් වෙන්නේ. නමුත්, හෙට නිවාඩු දිනයක් නිසා එය කරන්න බැහැ. මම ඉල්ලීමක් කරනවා දින හත ඉකුත් වෙලා නැති නිසා ඊළඟට පාර්ලිමේන්තුව රැස් වන වෙනත් දිනයක මෙය ගෙන එන්න කියලා. අපට නම් ප්‍රශ්නයක් නැහැ. නමුත්, මේ procedure එක කඩනවා නම්, ඒක හොඳ තත්ත්වයක් නොවෙයි කියන එකයි මා ඔබතුමාට කියන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Supreme Court එකේ challenge කරනකොටත් ප්‍රශ්නයක් වෙයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, මේක challenge කරනකොටත් ප්‍රශ්නයක් වෙයි. මොකද, වැරදි විධියටයි මේ කටයුත්ත කරන්න යන්නේ. මෙය තව දවසක් ඉදිරියට ගියා කියලා අපට ප්‍රශ්නයක් නැහැ නේ. කරන එක හරියට කරන්න. මෙය ගෙනෙන එකට අපේ විරෝධතාවක් නැහැ. හැබැයි, මේකේ fundamentalsවල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ කියන්නේ, දින හත ඉකුත් වන්නේ අද රාත්‍රි 12.00ට. හේතුව මොකක්ද? 31 මෙය ඉදිරිපත් කළාට, 31 රාත්‍රි 12.00ට කියන එක තමයි අපි සාමාන්‍යයෙන් පිළිගන්නේ. එතකොට 01වන දා තමයි අපේ පළමුවෙනි දිනය විධියට සැලකෙන්නේ. එම නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (1) ව්‍යවස්ථාවේ තිබෙන තත්ත්වයත්, ස්ථාවර නියෝග 52 (5) හි පවතින තත්ත්වයත් හොඳින් අවබෝධ කරගෙන අපි මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරමු කියලා. එසේ කළ යුතුය කියා මා ඔබතුමාට යෝජනා කරනවා. මොකද, මේක අයින් කළා කියලා ලොකු ප්‍රශ්නයක් වෙන්නේ නැහැ; මේක තව දවසක් එහාට ගියා කියලා ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Parliamentary Business Committee එකේදීත් ඒ සම්බන්ධයෙන් කථා වුණා නේද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධිකරණ අමාත්‍යතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමනි, මම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (1) ව්‍යවස්ථාව කියවන්නේ නැතිව මෙතැනට ආවා නොවෙයි. එහි සඳහන්ව තිබෙන, "දින හත" කියන එක පිළිබඳව මට අවබෝධයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. නමුත්, ඔබතුමා දන්නවා මේක ගැසට් පත්‍රයේ පළ වෙන්නේ 31වන දා බව. 30වන දායි print කරන්නේ. 30වන දා මධ්‍යම රාත්‍රිය කියන්නේ 31වන දා උදේ. ඒක පළමුවන කාරණය.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඊට පස්සේ ඔබතුමා තර්කයක් ගෙනාවා, සාමාන්‍යයෙන් 31වන දා ගණන් කරන්නේ නැහැ කියලා. ඇයි ඒ? ඒකට හේතුවක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ගණන් කරන්න වෙන්නේ 31වන දා ඉඳන් තමයි. 31වන දා ඉඳන් ගණන් කළාම දවස් හත සම්පූර්ණ වෙනවා, 06වන දාට. ඒ නිසා මේක නිවැරදි පටිපාටිය අනුවයි ගෙනැල්ලා තිබෙන්නේ. ඒ කරුණ නිසා මම කියනවා, මේ විරෝධතාව ගණන් ගන්න පුළුවන්, පදනමක් ඇති එකක් නොවෙයි කියලා. මෙය අද ඉදිරිපත් කිරීමට කිසිදු නෛතික බාධාවක් නැති බව මම සඳහන් කරනවා, ගරු කථානායකතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, Order Paper එකට කරුණු ඉදිරිපත් කරන්නේ සභානායක කාර්යාලයෙන් සභානායකවරයා වශයෙන් මා වන නිසාත්, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වැදගත් කරුණක් මතු කළ නිසාත් ඒ ගැන කිව යුතුයි. පළමුවෙනි කරුණ මේකයි. ගරු කථානායකතුමනි, අමතර වශයෙන් ගරු ඇමතිතුමාත්, මමත් මුද්‍රණාලයෙනුත් සොයා බැලුවා. මෙම ගැසට් පත්‍රය මුද්‍රණය කර තිබෙන්නේ ජූලි 30 දින රාත්‍රි 12.00ට පෙර.

එතකොට, 31වන දා අලුයම 12.01 සිට මේ ගැසට් පත්‍රය පළ වූ එකක්. ඒක තමයි ගැසට් පත්‍ර සම්බන්ධයෙන් තිබෙන පොදු නියාමය.

ගරු කථානායකතුමනි, දෙවැනි කාරණය මේකයි. මේ සතිය ගණන් කරන්නේ කොහොමද කියන එක පිළිබඳව බලමු. මම හිතනවා මේක ඉතා හොඳ අත්දැකීමක් කියලා. මම මේ සම්බන්ධයෙන් උදාහරණ කිහිපයක් කියන්න කැමැතියි. ගරු කථානායකතුමනි, එකක් තමයි ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත ගැසට් කරන්නේ 2014 ඔක්තෝබර් 03වන දා. එහි First Reading එක කරන්නේ 2014.10.10වන දා. අපි මේ උදාහරණය අද මතු වෙච්ච ප්‍රශ්නයට අදාළ කරලා ගත්තොත්, 30වන දා රාත්‍රි 12.00ට හෝ ඊට කලින් ගැසට් පත්‍රය print වෙනවා; 31වන දා උදේ ඉඳන් මේ ගැසට් පත්‍රය වලංගුයි. ජූලි 31, අගෝස්තු 01, 02, 03, 04, 05, 06 කියන දවස් ගත්තාම, අගෝස්තු 06වන දාට දවස් 7 සම්පූර්ණයි. අද අගෝස්තු 07වන දා. අද අටවැනි දවස. ඒ නිසා මේකේ කිසිම ප්‍රශ්නයක් නැහැ.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අපේ අවබෝධය සඳහා උදාහරණ කීපයක් කියන්නම්. මොකද, ටිකක් අධ්‍යයනය කරලා මෙතැන කථා කරන්න අපට අවස්ථාව ලැබෙන්නේ කලාතුරකින්. ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත ගැසට් කළා, 2014 ඔක්තෝබර් 03වන දා. ඒකේ පළමුවන වර කියවීම තිබුණේ 2014 ඔක්තෝබර් 10වන දා. එහෙම ගත්තොත්, 03වන දා තමයි ගැසට් පත්‍රය පළ කරන්නේ. ඔක්තෝබර් 03වන දා සිට 09වන දා දක්වා දවස් 7 යි. ඔක්තෝබර් 10වන දා එය පළමුවන වර කියවීම සිදු කරනවා.

තවත් උදාහරණයක් තමයි, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත් කෙටුම්පත. එය ගැසට් කරනවා, 2014 ඔක්තෝබර් 03වන දා. ඒකෙත් First Reading එක ඔක්තෝබර් 10වන දා; මේ විධියටමයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ඉතාම විශේෂ පනත් කෙටුම්පතක් වන 2015 විසර්ජන පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කළේ 2014 සැප්තැම්බර් 19වන දායි. ඒ, මුළු ආණ්ඩුවේම පැවැත්ම සම්බන්ධ පනත් කෙටුම්පතක්. ඒක ගැසට් කරන්නේ සැප්තැම්බර් 19වැනි දා. එතකොට, මේ සමහර අය ඒ ආණ්ඩුවේ ඇමතිවරු. 26වැනි දා තමයි ඒකේත් First Reading එක කරන්නේ. එතකොට ඒ දවස් ගණන හරි. ඒ වාගේ තවත් ඒවා තිබෙනවා. 2021 අප්‍රේල් මස 23වන දා තමයි මුල්‍යා කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ. ඒක ගැසට් කරන්නේ, අප්‍රේල් 28වන දා. ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ, මැයි 05වන දා. මම මෙතැනදී ඒ නඩු තීන්දු ගැන කියන්න යන්නේ නැහැ. ඒ අනුව මේ පනත් කෙටුම්පත ගත්තොත් මෙහි කිසිදු ආකාරයක ගැටලුවක් නැහැ. ඔබතුමාට බලය තිබෙනවා. මෙයට අදාළ ගැසට් පත්‍රය මුද්‍රණය කරන්නේ, ජූලි 30වන දා හෝ ඊට පෙර දිනයක. ඒ නිසා ජූලි 31වන දා ඉඳලා ඕනෑම පුරවැසියෙකුට මේ සම්බන්ධයෙන් නඩු දමන්නත් පුළුවන්, ඔබතුමා ඇතුළු අපට එය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නත් පුළුවන්. ඒ ගැන සොයා බලා තමයි අපි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. ආණ්ඩු පක්ෂය ලෙස ස්ථාවර නියෝගවලටත්, රටේ නීතියටත් එකඟවයි මේ පනත් කෙටුම්පත අපි ඉදිරිපත් කළේ. ඒ නිසා මෙය පළමුවන වර කියවීමට ඉදිරිපත් කරමින් ඉදිරියට යන්න කියලා තමයි අපි ඉල්ලා සිටින්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමනි, මෙය මුද්‍රණය - print - කළ දිනය ගැන ගැටලුවක් නැහැ. හැබැයි ඔබතුමාගේ කථාවේදී ඔබතුමා කිව්වා, 31වන දා අලුයම 12.01ට කියලා. 12.01 කියනකොට ගරු සභානායකතුමනි, පහුවදාටයි ගණන් ගැනෙන්නේ. එතකොට ගරු කථානායකතුමනි, ඒ හරියෙම ප්‍රශ්නය තිබෙනවා. අපට මේ පිළිබඳ ගැටලුවක් නැහැ. හැබැයි, ඔබතුමන්ලාම දෝෂයක් හදලා මේක කරන එක ඔබතුමන්ලා විසින්ම වළක්වා ගැනීමට නොයන්න කියන යෝජනාවයි මම මේ සභාවට කරන්නේ.

පොලිස්පති දේශබන්දු ඉවත් කරන්න ඊයේ ඔබතුමන්ලා Motion එකක් ගෙනැල්ලා ඒ කටයුත්ත නීත්‍යනුකූලව කෙරුණා. ඒක හරි. හැබැයි, දැන් මේ කටයුත්ත කරන්න හදන්නේ නීතියේ යම් හිඩැසක් තියලා. උසාවියේ මේ ප්‍රශ්නය හදලා, මේකට කවුරු හරි නඩු දැම්මා, මේක මෙහෙම වුණා, අතපසු වුණා කියලා මේක මඟ හරින්නදෝ යන්නේ කියන සැකය නිවැරදි කරන්න තමයි අපි මේ උත්සාහ කරන්නේ. මේක කළ යුතුයි. හැබැයි, නීත්‍යනුකූලව කළ යුතුයි, ගරු සභානායකතුමනි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, my point of Order is in relation to Section 8 of the Interpretation Ordinance. අර්ථ නිරූපන ආඥා පනතේ 8 වගන්තිය යටතේ දවස් 7ක් වාගේ කෙටි කාලයක් නම්, පළමුවෙනි දවස අනිවාර්යයෙන්ම ඉවත් විය යුතු බව ඔබතුමා දන්නවා. ඒකත් කරුණාවෙන් අවධානයට ගන්න. 31වන දා කවදා ද කියන එක argue කරන්න බැහැ. The 31st cannot be counted.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පළමුවෙනි කරුණ මෙයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78.(1) අනුව, පාර්ලිමේන්තුවට පවරා දීපු බලයක් තිබෙනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"සෑම පනත් කෙටුම්පතක් ම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යටත් පිරිසෙයින් දවස් හතකට පෙර ගැසට් පත්‍රයේ පළකළ යුත්තේ ය."

එය හරි පැහැදිලිව සිදු වෙලා තිබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ගැන විවාදයකට යන්න අවශ්‍යතාවක් නැහැ. කරුණු පැහැදිලි වුණා නේ, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම, ගරු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත
### சனாதிபதிகளின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலம்
### PRESIDENTS' ENTITLEMENTS (REPEAL) BILL

"1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත ඉවත් කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***

***2025 අගෝස්තු 21වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 ஓகஸ்ட் 21, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Attorney-at-Law, Minister of Justice and National Integration; to be read a Second time upon Thursday, 21st August, 2025*

*and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. මධ්‍යහ්න 12.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2025 අගෝස්තු 19 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විනිමය පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත - විවාදයකින් තොරව සම්මත කරගැනීම.

## විනිමය පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත
## நாணய மாற்றுண்டியல்கள் (திருத்தம்) சட்டமூலம்
## BILLS OF EXCHANGE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය:*
*'පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු හර්ෂණ නානායක්කාර මහතා]*

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Harshana Nanayakkara]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
*[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. SPEAKER in the Chair.]*

*1 සිට 18 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*1ஆம் வாசகத்திலிருந்து 18ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 18 ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සඳහා සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

## රටේ වත්මන් ආර්ථික තත්ත්වය
### நாட்டின் தற்போதைய பொருளாதார நிலைமை
### CURRENT ECONOMIC STATUS OF THE COUNTRY

[පූ.භා. 11.41]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු කථානායකතුමනි, "රටේ වත්මන් ආර්ථික තත්ත්වය" පිළිබඳව ආණ්ඩු පක්ෂය විසින් ගෙන එනු ලබන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මා ඉදිරිපත් කරනවා.

> "වැරදි ආර්ථික උපාය මාර්ග හේතුවෙන් කඩා වැටුණු රටක් ක්‍රම ක්‍රමයෙන් ස්ථාවරත්වයට පත් කිරීමට වර්තමාන රජයට මේ වන විට හැකියාව ලැබී ඇත. නමුත් එමගින් පමණක් අවදානම අඩු වී ආර්ථිකය වේගයෙන් වර්ධනය නොවේ. සමාජ, ආර්ථික, දේශපාලන යන සියලු අංශයන්ගෙන් බිඳවැටුණු රටක් නැවත යථා තත්ත්වයට පත් කිරීම සහ පරිවර්තනය කිරීමේ වගකීම මෙරට ජනතාව විසින් පසුගිය මැතිවරණ තුනකදී බලය ලබා දෙමින් ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ජාතික ජන බලවේග ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තබා තිබේ.
>
> මේ වන විට පැවති ආර්ථික අර්බුදයෙන් මිදීමට පමණක් නොව ගෝලීය වශයෙන් ඇති වන තත්ත්වයන්ටද සාර්ථකව මුහුණ දීමට හැකියාව වත්මන් ආණ්ඩුවට ලැබී තිබේ. විශේෂයෙන්ම ඇමෙරිකානු රජයේ නව තීරු බදු ප්‍රතිපත්තියත් (Reciprocal tariff) සමඟ මෙරට අපනයන ක්ෂේත්‍රය මුහුණ දුන් දැඩි අවදානම් තත්ත්වය රාජ්‍ය තාන්ත්‍රික සහ උපාය මාර්ගික ප්‍රවේශයකින් මේ වන විට ඉතා යහපත් තැනකට ගෙන ඒමට රජයට හැකියාව ලැබී තිබේ.
>
> රටේ ආර්ථික තත්ත්වය වඩා දියුණු තැනකට පත් කරමින් ආර්ථික ජයග්‍රහණ අත්පත් කර ගනිමින් වඩා ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණ කරා යොමුවෙමින් ජනතාවට ඒ ආර්ථික ප්‍රතිලාභ අත්පත් කර දීම මෙම ජනතා රජයේ අපේක්ෂාවයි. එම අපේක්ෂාව කරා ගමන් කිරීමට අවශ්‍ය සියලු ශක්තිය සහ දායකත්වය ලබා දීම සහ කැප වීම රටට සහ ජනතාවට ආදරය කරන සියලුදෙනාගේ වගකීමයි. ඒ අනුව රට ආර්ථික වශයෙන් නඟා සිටුවීමට අවශ්‍ය කටයුතුවලදී මූල්‍ය බලය හිමි මෙම ගරු සභාවේ දායකත්වය පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව ලබා දිය යුතු යැයි යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා ආර්ථිකය පසුගිය දශකය තුළ දැඩි ආතතියකට මුහුණ දුන්නා කියලා අපි දන්නවා. විශේෂයෙන්ම

[ගරු විජේසිරි බස්නායක මහතා]

2022දී, නිදහසින් පසුව අපේ රටේ ඇති වෙච්ච ඒ දරුණුම ආර්ථික අර්බුදය කරා අපි ගමන් කරමින් පැමිණියා. මේ ආර්ථික අර්බුදය හදිසි සංසිද්ධියක් නිසා ඇති වෙච්ච කාරණාවක් නොවෙයි. වැරදි දේශපාලන නායකත්වය යටතේ සිදු වූ දිගුකාලීන ව්‍යුහාත්මක දුර්වලතා, ප්‍රතිපත්තිමය වැරදි පියවරයන්, ගෝලීය කම්පන වාගේම අභ්‍යන්තර දේශපාලන අස්ථාවරත්වයන්ගේ ප්‍රතිඵලයක් නිසා තමයි අපේ රට ඒ තත්ත්වයට පත් වුණේ. මේ පිළිබඳව එදා කොපමණ අනතුරු ඇඟවුවත් එවකට සිටි දේශපාලන නායකත්වයන් ඊට අවධානය යොමු කළේ නැහැ. ගරු කථානායකතුමනි, මේකේ ප්‍රතිඵලයක් විධියට Fitch Ratings, Moody's, Standard & Poor's වැනි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන මඟින් ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම පහළට දැමුවා. මේ නිසා රජයට වාගේම රටේ බැංකු පද්ධතියට විදේශ මූල්‍ය පහසුකම් සඳහා තිබූ ප්‍රවේශයන් සීමා වෙනවා; අහිමි වෙනවා. මේ යටතේ ආර්ථිකය සියයට 7.3කට සංකෝචනය වෙනවා. මේ රටේ උද්ධමනය සියයට 70ක් වැනි ඉහළ අගයකට ගමන් කරනවා. රුපියල කෙටි කාලයක් තුළ සංකෝචනය වෙනවා. ඒ වාගේමයි, ඒ භාවිත කරන්න පුළුවන් විදේශ සංචිත අවම මට්ටමකට පත් වෙනවා. ඒ වාගේම, විදේශ ණය සේවාකරණය පිළිබඳව දැවැන්ත අර්බුදයකට රට මුහුණ දෙනවා.

ගරු කථානායකතුමනි, මේ නිසා අපේ රටේ දැවැන්ත සමාජ, ආර්ථික, දේශපාලන බෙදවාචකයක් නිර්මාණය වෙනවා. මේ හරහා රටේ බඩු මිල අහස උසට ඉහළ යනවා. අපේ රටේ වෘත්තිකයන් විශාල ප්‍රමාණයක් රට හැර යනවා. අපට වාහන ආනයනය කරන්න බැහැ. LC එකක් open කරන්න බැහැ. ප්‍රතිඵලය, ජනතාව වීථි බහිනවා. මෙන්න මේ ආකාරයට සියලුම අංශවලින් බිඳ වැටිච්ච රට යථා තත්ත්වයට පත් කරන්න, පරිවර්තනය කරන්න මේ රටේ ජනතාව ජාතික ජන බලවේගයට ආණ්ඩු බලය ලබා දෙනවා. මෙන්න මේ විධියට අපේ රටේ ආදරණීය ජනතාව අප කෙරෙහි තබන ලද විශ්වාසය පලුදු කර නොගෙන, මේ මොහොත වන විටත් අපි රට ඉතාම ස්ථාවර තත්ත්වයට ගෙනැවිත් තිබෙනවා. 2025 පළමුවැනි කාර්තුවේදී අපි සියයට 4.8ක ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගන්නවා. මෙන්න මේ තුළ අපි අර කියපු නිෂ්පාදන ආර්ථිකයේ කාර්මික අංශයේ දායකත්වය සියයට 9.7ක්. ඒ විතරක් නොවෙයි, සේවා වර්ධනය සියයට 2.8ක්.

ගරු කථානායකතුමනි, අපේ රටේ ආර්ථික වර්ධන වේගය පිළිබඳව ලෝක බැංකුව කියන්නේ මොකක්ද? 2025දී අපි අත්පත් කර ගන්නේ සියයට 3.5ක්. ඒ වාගේම, 2026දී අපි අත්පත් කර ගන්නට බලාපොරොත්තු වන්නේ සියයට 3.1ක් කියනවා. ඒ විතරක් නොවෙයි. ආසියානු සංවර්ධන බැංකුව කියනවා, 2025දී ශ්‍රී ලංකාව අත්පත් කර ගන්නේ සියයට 3.9ක් කියලා. ඒ වාගේම, 2026දී අපි සියයට 3.4ක් අත්පත් කර ගන්නවා කියලා කියනවා. ගරු කථානායකතුමනි, අපි මේ වර්ෂයේ මුල් කාර්තුවේදීම සියයට 4.8ක වර්ධනයක් අත්පත් කර ගන්නවා. අපට මේක සියයට 5 ඉක්මවා යන්න තිබුණා. විශේෂයෙන්ම කෘෂි අංශයේ සියයට 0.7ක අවගමනයක් තිබෙනවා. ඒකට හේතුව තමයි, මේ අවුරුද්ද පටන් ගන්නකොට ඇති වෙච්ච ඉතාම අවාසනාවන්ත අයහපත් කාලගුණික තත්ත්වය නිසා අපේ රටේ කෘෂි අංශයේ වර්ධනය පහළට යාම. ගරු කථානායකතුමනි, ලෝකයේ ප්‍රකට ආර්ථික සහ ව්‍යාපාරික වෙබ් අඩවියක් වන Bloomberg කියනවා, 2026 වන විට අපේ රටේ ආර්ථිකය 2018 තිබුණු ආකාරයට සාමාන්‍ය තත්ත්වයට පත් වෙනවා කියලා. එහෙම නම් මේ මොහොත වන විට ඔබට පැහැදිලියි මේ රට ඇවිල්ලා තිබෙන තැන. ඒ විතරක් නොවෙයි. පෞද්ගලික අංශයට දෙන ණය - private credit - පුළුල් වෙලා, එහි වර්ධනය සියයට 16ක් වෙලා තිබෙනවා. ඒ වාගේම credit cards ප්‍රමාණයත් වැඩි වෙලා. අපි දන්නවා, මේ මොහොත වන විට කොටස් වෙළෙඳ පොළ කරටි කඩාගෙන ඉහළ යනවා කියලා. ඇයි මේ? ඒ, ආයෝජකයන්ගේ විශ්වාසය - confidence එක - මේ ආණ්ඩුව කෙරෙහි ඉහළ ගිහිල්ලා තිබෙන නිසා. ගරු කථානායකතුමනි, නමුත් මේ සභාවේ විපක්ෂයේ ඉදිරි පේළිවල සිටින මේ ආදරණීය මිනිසුන් පසුගිය කාලයේ මොකක්ද කිව්වේ? ඒ ආර්ථික ඔස්තාර්ලා මොකක්ද කිව්වේ? "මාලිමාවට බලය දෙන්න එපා, මාලිමාවට බලය දුන්නොත් කොටස් වෙළෙඳ පොළ කඩාගෙන වැටෙනවා" කියලා කිව්වා. නමුත් මේ මොහොතේ එහි වෙනසක්, පරිවර්තනයක් සිදුවෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. 2025 අප්‍රේල් 2 වැනි දා ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් එතුමාගේ අර බර පැනෙන් දිග අත්සනක් දමලා, ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 70කට අධික ප්‍රමාණයකට අන්‍යෝන්‍ය තීරුබදු ප්‍රතිපත්තියක් හඳුන්වා දුන්නා, අපි දැක්කා. ඒ අනුව ලංකාවට සියයට 44ක තීරු බද්දක් පැනවෙනවා. ඒ ඊට පස්සේ ඒක සියයට 30ට අඩු වෙනවා. ඊට පස්සේ අවසානයේ ඒක සියයට 20 දක්වා පහත බහිනවා. ඒක කොහොමද වෙන්නේ? එහෙම වෙන්නේ, ආධුනික, අත්දැකීම් අඩු යැයි කියන වර්තමාන රජය ඇමෙරිකාවේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ට 'මචං' නොකියා අදාළ පාර්ශ්ව එක්ක කරපු රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඔස්සේ. වර්තමාන රජයට මේක විසඳා ගන්න ඒ රාජ්‍ය තාන්ත්‍රික දූත පිරිස් නැහැ, ඊට අදාළ ශක්තිමත් රාජ්‍ය සබඳතා නැහැ කියන එක තමයි විපක්ෂයේ අදහස වුණේ. ධවල මන්දිරයත් එක්ක අපි Zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡා පවත්වනකොට එතුමන්ලා කිව්වා, ඉන්දියාව වාගේ ඇමෙරිකාවටම ගිහිල්ලා වට මේස සාකච්ඡා පවත්වන්න කියලා. ඒ වාගේ සරල ගැලරි තර්ක ගෙනැල්ලා අප උපහාසයට අපහාසයට ලක් කළා. ගරු කථානායකතුමනි, නමුත් අවසානයේ ඒකට පිළිතුරු ලැබී තිබෙනවා.

ඒ වාගේම මේ මොහොත වන විට මේ ආණ්ඩුවේ සාර්ව ආර්ථික ස්ථායිතාව, ස්ථාවර ප්‍රතිපත්ති අනුව, මේ ආණ්ඩුව දක්වන නොසැලෙන කැපවීම මත ජාත්‍යන්තර ආයෝජකයන්ගේ විශ්වාසය තහවුරු වෙලා, මේ වසරේ පළමුවැනි මාස හය තුළ සියයට 101ක වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ පළමු මාස හය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නව ව්‍යාපෘති 57කට අනුමැතිය දීලා තිබෙනවා. මෙන්න මේ හරහා විශාල රැකියා ප්‍රමාණයක් අපට නිර්මාණය කර ගන්න පුළුවන්. එහෙම නම් මේ මොහොතේදී කියන්න ඕනෑ, අපි රටේ ආර්ථික ස්ථායිතාව ඇති කරලා තිබෙන බව. 2025 මුල් මාස හය තුළ ලංකාවේ අපනයන අංශයේ කැපී පෙනෙන විශාල වර්ධනයක් සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ මොහොත වන විට වෙළෙඳ පොළ විවිධාංගීකරණය කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. අපි අප්‍රිකාවට, බ්‍රිතාන්‍යයට, ඉන්දියාවට භාණ්ඩ අපනයනය කරනවා. ඒ විතරක් නොවෙයි. අපි නව වෙළෙඳ පොළ, ගෝලීය සැපයුම් දාම ඉලක්ක කරගෙන, යන්න පුළුවන් හැම දිශාවකටම අපනයනය වැඩි කරනවා. ඒකේ ප්‍රතිඵලයක් විධියට එය යුරෝපා වෙළෙඳ සංගමයේ සියයට 23ක වර්ධනයක්, බ්‍රිතාන්‍ය වෙළෙඳ පොළේ සියයට 20ක වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. අන්න ඒකේ ප්‍රතිඵලයක් විධියට 2025 වසරේ පළමු භාගය තුළ ජංගම ගිණුමේ ශේෂය මාසිකව අඛණ්ඩ අතිරික්තයක් පෙන්නුම් කළා, ගරු කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි. ජංගම ගිණුමේ සියයට 30.2ක වර්ධනයක් සිදු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ වන විට සංචාරකයන් ලංකාව වටා රොද බැඳගෙන සිටිනවා. මේ මෑතකදී ලංකාවට පැමිණියා, මහාචාර්ය කිෂෝර් මහ්බුබානි. ඔහු ලංකාව සම්බන්ධයෙන් කියන්නේ මොකක්ද? ලෝකයේ විශාලතම වෙළෙඳ පොළවල් මේ රටේ දොරකඩට ඇවිල්ලා, ශ්‍රී ලංකාවට උදව් කරලා -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over now.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු කථානායකතුමනි, ඉන්දියාව සහ චීනය කියන්නේ අග්නිදිග ආසියාවේ බිලියන 3.5ක් සහිත විශාල ජනගහනයක් සිටින රටවල්. ඔහු කියනවා, ඔවුන් සංචාරයට කැමැතියි කියලා. එහෙම නම්, අන්න ඒ සඳහා අපි වැඩසටහන් නිර්මාණය කරන්න ඕනෑ; වැඩසටහන් නිර්මාණය වෙනවා. එවැනි වාතාවරණයක් තුළ අපි මේ මොහොත වන විට රටේ ආර්ථිකයේ ස්ථාවරතාව ඇති කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙන මේ ආසියාකරයේ ප්‍රබල රට, පොහොසත් රට නිර්මාණය කරන්න ඔක්කෝම එකතු වෙලා උදව් වෙන්න, ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියලා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මා ඉල්ලා සිටිනවා. එසේ ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව ස්ථිර කිරීම, the Hon. Thilina Samarakoon. You have 10 minutes.

[පූ.භා. 11.52]

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
ගරු කථානායකතුමනි, රටේ වාර්තමාන ආර්ථික තත්ත්වය පිළිබඳව අපේ ආණ්ඩු පක්ෂයේ ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින්, මම මේ අවස්ථාවේදී මේ සභාවට කරුණු කිහිපයක් ගෙනහැර දක්වන්නට බලාපොරොත්තු වෙනවා. එතුමාගේ අදහස් දැක්වීම ඇතුළේ ඉදිරිපත් කළ කරුණුවලට අමතරව යමක් ඉදිරිපත් කරන්නට මා උත්සාහ දරනවා. එතුමාගේ අදහස් ප්‍රකාශ කිරීමේදී සඳහන් වුණා, නිදහසෙන් පසුව අපි ආර්ථික වශයෙන් මුහුණ දුන් දරුණුම ආර්ථික අර්බුදයට පසුගිය 2022-2023 වර්ෂවලදී අපි මුහුණ දුන්නාය කියලා. ඊට පස්සේ මිනිස්සුන්ගේ අලුත් බලාපොරොත්තුත් එක්ක 2024 වර්ෂයේ අග භාගය වන විට රට තුළ නව ආණ්ඩුවක් බිහි වුණාට පස්සේ රටේ ආර්ථිකය ක්‍රමානුකූලව සැලකිය යුතු මට්ටමකට වර්ධනය කරලා සමාජයීය වශයෙන්, ආර්ථිකමය වශයෙන් වූ හැම ක්ෂේත්‍රයක්ම යම් කිසි මට්ටමකින් ඉහළට ඔසවා තබන්නට අපට හැකි වුණා. ඊට අදාළ කරුණු අද අපි මේ සභාවට ඉදිරිපත් කරන්නේ, මේ සමාජය ඇතුළේ යම් යම් කථා බහ සිද්ධ වන අවස්ථාවලදී නිවැරදි කරුණු වාගේම වැරදි කරුණුත් සමාජගත වන ආකාරය අපි දකින නිසායි. මේ සභාවේ සිටින අපේ ගෞරවනීය මන්ත්‍රීවරුන්ට යම් අවබෝධයක් ලබා දීම සඳහාත්, ඒ වාගේම මේ රටේ සමස්ත ජනතාවට ආර්ථිකයේ වර්තමාන තත්ත්වය සහ අපේ වැඩ පිළිවෙළ පිළිබඳව යම් අවබෝධයක් ලබා දීම සඳහාත් තමයි අද අපි මේ යෝජනාව ගෙනැල්ලා මේ සාකච්ඡාව කරන්නේ.

2025 වර්ෂයේ පසුගිය මාස කිහිපය ඇතුළත අපේ රටේ මූර්ත ආර්ථිකයේ වර්ධනයක් පෙන්නුම් කරලා තිබෙනවා. ඒ කියන්නේ භාණ්ඩ විධියට ගත්තොත්, රටේ ආර්ථිකය යම් කිසි විධියකට වර්ධනය වෙමින් තිබෙන බවට වූ සාධක ඕනෑ තරම් දකින්න තිබෙනවා. ඒ වාගේම 2024 දී පැවති වෙළෙඳ පොළ මිල අනුව අපේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 29,898 දක්වා ඉහළ නංවාගන්නට අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම 2025 වර්ෂය වෙද්දී එය ක්‍රමානුකූලව තවත් ඉහළ යන තත්ත්වයක් දක්නට ලැබෙනවා. වර්තමානය ගත්තොත්, ජූනි මාසය වෙනකොට සියයට 4.8ක ආර්ථික වර්ධනයක් සිදු වෙමින් තිබුණා. ඒ වාගේම 2025 වර්ෂය අවසාන වෙද්දී දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 5කට වැඩි වර්ධනයක් අපේක්ෂා කරලා තිබෙනවා. මේ කාරණා තුළින් අපේ ආර්ථිකය යම් කිසි විධියකට ඉහළට ඔසවා තබා, අපේ ජන ජීවිතත්, සමස්ත ආර්ථික ක්‍රියාවලියත් ඉහළ තැනකට ගන්න ආණ්ඩුවක් විධියට අපි බලාපොරොත්තු වෙනවා.

මෙම යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදීත් කියැවුණා, නිෂ්පාදන ආර්ථිකයේ කාර්මික අංශයේ දායකත්වය සියයට 9.7ක් වාගේම සේවා වර්ධනය සියයට 2.8ක් කියලා. මේ අවස්ථාවේදී අපි විශේෂයෙන්ම කථා කරන්නට ඕනෑ කාරණය තමයි, පසුගිය කාලයේ බංකොලොත් වුණු, එහෙම නැත්නම් stuck වුණු ආර්ථිකයක් අපේ රට ඇතුළේ ක්‍රියාත්මක වුණත්, සේවා වියුක්තිය, එහෙම නැත්නම් රැකියා නොකරන ජන ප්‍රජාව යම් කිසි විධියකට සංඛ්‍යාත්මකව පහළ මට්ටමකට ගේන්න අපට පුළුවන් වෙලා තිබෙනවා කියන එක. එය සියයට 4.5 සිට මේ වන විට සියයට 3.8 දක්වා අඩු කර ගැනීමේ හැකියාව අපට ලැබී තිබෙනවා. ඒ වාගේම 2025 ජූලි මාසය වන විට උද්ධමනය සියයට 0.3කට ගේන්න අපට හැකියාව ලැබී තිබෙනවා. ඇත්තටම එය සියයට බින්දුවට ආසන්න අගයක රඳවා ගැනීමත් ඉතාම විශිෂ්ට ක්‍රියාවලියක්. ඉතින්, මෙවැනි ආකාරයට ස්ථාවර වුණු ආර්ථිකයක් තමයි අපි නායකත්වය දෙමින් මේ වන විට රට ඇතුළේ පවත්වාගෙන යමින් තිබෙන්නේ.

ඒ වාගේම දළ දේශීය නිෂ්පාදනයට අදාළ කරුණු කාරණා ඒ ආකාරයට ඉදිරිපත් කරද්දි, විශේෂයෙන්ම මූල්‍ය ස්ථාවරත්වයට අදාළ කරුණුත් අපි ඉදිරිපත් කරන්න ඕනෑ. මූල්‍ය ස්ථාවරත්වය මේ වන විට රට ඇතුළේ ක්‍රමානුකූලව ගොඩනැංවෙමින් තිබෙනවා. ඒ වාගේම මේ වන විට රටේ සමස්ත ඉතුරුම් වර්ධනය වෙමින් තිබෙනවා. උදාහරණයක් විධියට 2023 දී සියයට 26ක් වුණු සමස්ත ඉතුරුම් ප්‍රමාණය, 2024 දී සියයට 28 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. රට ඇතුළේ එවැනි ඉතුරුම් වර්ධනයක් ක්‍රියාත්මක කරද්දි ආයෝජනය සඳහා අපට වඩ වඩාත් අවස්ථාව ලැබෙනවා. ඒ වාගේම බැංකු අතර මුදල් හුවමාරුවේදී, විශේෂයෙන්ම මහ බැංකුවත් එක්ක මුදල් හුවමාරුව සිදු වන විට නිත්‍ය පහසුකම් තැන්පතු අනුපාතය සියයට 7.25ක රඳවා ගනිමින්, ඒ වාගේම නිත්‍ය ණය පහසුකම් අනුපාතය සියයට 8.25ක රඳවා ගනිමින්, රටේ සාමාන්‍ය පොලී අනුපාතය සියයට 12කට, සියයට 14කට ආසන්න අගයක රඳවාගන්නත් අපට පුළුවන් වෙලා තිබෙනවා.ඒ වාගේම පෞද්ගලික ණය ගැනීම් සියයට 16කට ආසන්න ප්‍රමාණයකින් වර්ධනය කර ගන්නත් අපට පුළුවන් වෙලා තිබෙනවා. සමස්ත බැංකු පද්ධතිය ඇතුළත ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පසුගිය කාලයේදී වාගේ සියයට 2ක මට්ටමක පවත්වා ගනිමින් තමයි අපි මේ හැම දෙයක්ම පවත්වාගෙන යමින් තිබෙන්නේ. ඒ වාගේම කොටස් වෙළෙඳ පොළේ ගනුදෙනු ප්‍රමාණයත් මේ වන විට වැඩි වෙලා තිබෙනවා. නමුත් විරුද්ධ මත දරන, වෙනත් දේශපාලන මත දරන පිරිස් කියන්න උත්සාහ කළා, අපේ රටේ ආර්ථිකය අස්ථාවරයි, එහෙම නැත්නම් රටේ ආර්ථිකය ආපස්සට ගමන් කරනවා කියලා. ඔවුන්ගේ පැත්තෙන් එවැනි කරුණු කාරණා ගෙනහැර දක්වන්නට උත්සාහ කළත්, සමස්ත ආර්ථික ක්‍රියාවලිය පිළිබඳව විචක්ෂණශීලීව හරියට අධ්‍යයනය කරලා බැලුවා නම්, අපේ ආර්ථිකය ඉතාම ඉහළ තැනකට වර්ධනය වෙමින් පවතින බව පෙනෙනවා. ඒ වාගේම 2024 වර්ෂය වෙද්දි දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස 1.1ක්ව තිබුණු

[ගරු විජේසිරි බස්නායක මහතා]

ජංගම ගිණුමේ ශේෂය 1.5 දක්වා වර්ධනය කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ, ඇමෙරිකානු ඩොලර් බිලියනවලින් ගත්තාම. ඒ වාගේම වෙළෙඳ ගිණුමේ ශේෂයත් යම්කිසි විධියකට වර්ධනය වෙලා තිබෙනවා. රටේ අපනයනය වර්ධනය වන ගමන් ආනයනයත් මේ වෙනකොට වර්ධනය වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම පසුගිය කාලයේ අපේ රටට වාහනයක්වත් ගෙන්වා ගන්න බැරි තැනකට අපේ ආර්ථිකය බංකොලොත් වෙලා තිබුණේ. ඒ තත්ත්වය වෙනස් කරලා රටේ සාමාන්‍ය ජන ජීවිතයට අවශ්‍ය යාන වාහන ගෙන්වා ගන්න පුළුවන් විධියට අපේ ආර්ථිකය යම්කිසි තැනකට ගේන්නත් දැන් අපට පුළුවන් වෙලා තිබෙනවා. 2024 ජුනි දක්වා බැලුවාම, ඇමෙරිකානු ඩොලර් බිලියන 6.1ක තිබුණු අපනයනය 6.5ක් දක්වා වර්ධනය කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. රටේ ආනයන අපනයන ගැන කථා කරනකොට විශේෂයෙන්ම සේවා අංශයේ ශුද්ධ ලැබීම් ද වර්ධනය කර ගන්න අපට හැකියාවක් ලැබිලා තිබෙනවා. 2024ට සාපේක්ෂව බැලුවාම ඇමෙරිකානු ඩොලර් බිලියන 1.9ක් වුණු එක 2.1 දක්වා වර්ධනය කර ගන්න අපට හැකියාවක් ලැබිලා තිබෙනවා. විශේෂයෙන් විදේශීය සේවා ආර්ථිකය ගැන කථා කරද්දී, මුහුදු සහ ගුවන් ප්‍රවාහන සේවා ආශ්‍රිත අංශත් දියුණු වෙලා තිබෙනවා. ඒ වාගේම සංචාරක ඉපැයීම් අංශත් දියුණු වෙලා තිබෙනවා. සේවා අපනයනයට අදාළව තොරතුරු තාක්ෂණය වැනි අංශත් දැන් දියුණු වෙලා තිබෙනවා.

පසුගිය කාලය ගත්තාම, අපේ රටේ සංචාරක ක්ෂේත්‍රයට මොන වාගේ ප්‍රමුඛතාවක්ද ආණ්ඩුව පැත්තෙන් ලැබිලා තිබුණේ කියන එක පිළිබඳව සලකා බලා අපි වර්තමානයේ සූදානම් වෙලා තිබෙනවා, සංචාරක කර්මාන්තය ආශ්‍රිතව මුහුණ දෙන සහ මුහුණ දෙමින් තිබෙන ප්‍රශ්න විසඳීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් හදලා සංචාරක කර්මාන්තය වඩා හොඳ තැනකට ගෙනැල්ලා, රටට සංචාරකයන්ගෙන් ලැබිය යුතු ආදායම, එහෙම නැත්නම් සංචාරක ක්ෂේත්‍රයට අදාළව ලැබිය යුතු ආදායම යම්කිසි විධියකට ඉහළ තැනකට ගේන්න. ඒ වාගේම තමයි විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ.

මේ අවස්ථාවේදී මම විනිමය අනුපාත පිළිබඳවත් කථා කරන්න ඕනෑ. 2023-2024 කාලය ගත්තොත්, ඩොලරයේ අගය රුපියල් 327ට, රුපියල් 328ට ගිය කාලයක් තිබුණා. හැබැයි, අපි බලයට එන්නට කලින් මැතිවරණයක් රට ඇතුළේ ක්‍රියාත්මක වෙද්දී, විපක්ෂයේ මන්ත්‍රීවරුන්, විපක්ෂයේ නායකත්වය ඇතුළු ඒ පිරිස මොකක්ද කිව්වේ? ඩොලරයේ අගය රුපියල් 400ට යයි කිව්වා. හැබැයි, අද අපි ඩොලරය රුපියල් 300කට ආසන්න අගයක රඳවා ගනිමින් ඉතාම හොඳ කළමනාකරණයකට ලක් කරලා තිබෙනවා.

ඊට අමතරව අපනයන ක්ෂේත්‍රයට අදාළව ගත්තාම, පසුගිය කාලයේ රට මුහුණ දුන් ප්‍රශ්න ටික දැන් අපට හොඳින් කළමනාකරණය කරන්න හැකියාවක් ලැබිලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඇමෙරිකාවෙන් පනවපු තීරුබදු සියයට 44 සිට සියයට 20 දක්වා අඩු කර ගන්නත් අපට පුළුවන් වෙලා තිබෙනවා. නමුත් අදහස් දක්වන අපේ සමහර ආර්ථික න්‍යායාචාර්යවරු මොනවාද කිව්වේ? ලෝකයේ කොයි රටටත් සහන දුන්නා කිව්වා. ඊයේ වෙද්දී ඉන්දියාවට ලැබිච්ච result එක මොකක්ද? හැබැයි, අපට මේ වෙනකොට ඒ තත්ත්වය හරියට කළමනාකරණය කරලා ඉතාම යහපත් තැනකට එම තීරුබදු අනුපාතය ගේන්න පුළුවන් වෙලා තිබෙනවා. දකුණු ආසියානු කලාපයේ සියයට 20කට ආසන්න ගණනක මේ තීරුබදු රඳවා ගැනීමම ඉන්දියාවට ඊයේ පනවපු තීරු බදු තත්ත්වයන් එක්ක බැලුවාම ලොකු ජයග්‍රහණයක්. අපි හිතනවා, මේ නිසා අපේ අපනයන ක්ෂේත්‍රයේ නව ගැම්මක් අපට ඉදිරියේදී ගන්නට පුළුවන් වෙයි කියලා. ඉතින් අර ආර්ථික න්‍යායාචාර්යවරු, මේ සම්බන්ධව අදහස් දක්වන අය ඇතුළු අපේ විපක්ෂය ගත්තාම, පසුගිය කාලයේ ඔවුන්ගේ න්‍යාය කොතැනද තිබුණේ, න්‍යායේ භාවිතය කොතැනද තිබුණේ කියන දේ පිළිබඳව කල්පනා කරනකොට අපි කරගෙන යන මේ ආර්ථික වැඩ පිළිවෙළත් එක්ක එය මනාව සමාජය ඉදිරියේ දිස් වෙමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙන්න මේ විධියට රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය අපි සැලකිය මට්ටමකට අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව ආදී ආයතන හරහා දේශීය ආදායම ඉහළ නංවා ගන්න අපට හැකියාවක් ලැබිලා තිබෙනවා. හැබැයි පසුගිය ආණ්ඩු කාලය ගත්තොත්, පසුගිය කාලයේ විශේෂයෙන්ම බදු සහන ලබා දුන්නේ කාටද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is up.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
ගරු කථානායකතුමනි, මම තව විනාඩියක් ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තත්පර 30ක් ලබා දෙනවා.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මේ විධියට ගත්තාම, රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය යම්කිසි විධියකට කළමනාකරණය කරලා, රාජ්‍ය ආදායම සැලකිය යුතු මට්ටමකින් පවත්වාගෙන යමින් මේ සියලු දේවල් කළමනාකරණය කරන ගමන් රටේ අධ්‍යාපනය, සෞඛ්‍යය, ඒ වාගේම සේවක වැටුප් වැඩි කිරීම්, විශ්‍රාම වැටුප් වැඩි කිරීම්, මහජන ආධාර වැඩි කිරීම්, ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති, මහාමාර්ග, වාරිමාර්ග, නගර නිර්මාණ ආදී ඒ සියලු කටයුතු ඉතාම හොඳින් පවත්වාගෙන යමින් තිබෙන මොහොතකයි අපි අද මේ කථා කරන්නේ.

ඒක නිසා විපක්ෂයේ මන්ත්‍රීවරු ඇතුළු තවත් අපි ගැන සැක සිතමින් සිටින ඕනෑම කෙනෙකුට මෙන්න මේ ආර්ථික දත්ත හරියට විශ්ලේෂණය කරලා අපේ රට කොයි තැනකද තිබෙන්නේ කියලා සොයා බලන්න පුළුවන්. අපේ රට ඉතා හොඳ ස්ථාවරත්වයකින් සහ ප්‍රවර්ධනය වෙන ආර්ථික රටාවක් තුළ තිබෙනවා කියන දේ මේ සභාවට ඉදිරිපත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Chaminda Wijesiri. You have eight minutes.

[අ.භා. 12.04]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා අද දින ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව දවසින්, දවස හරි ඔබතුමන්ලාට ගෙනෙන්න වෙනවා. මොකද, පාර්ලිමේන්තුවේ මේක කිව්වාම ඒක මාධ්‍යයේ යනවා නේ, ගරු මන්ත්‍රීතුමනි. එළියේ කියන්න බැහැ නේ. ටයිකෝට් එක ඇඳගෙන ගිහිල්ලා පොළක කියන්න පුළුවන්ද? පාරේ යන්න පුළුවන්ද? බස් එකේ යන්න පුළුවන්ද? එතුමන්ලා මහ ලොකුවට ඔය එකතු කරගත් ආදායම පුංචි මිනිහාගේ බඩට, සාක්කුවට දැනිලා නැහැ, ගරු කථානායකතුමනි. එහෙම දැනුණා නම් ප්‍රශ්නයක් නැහැ. එහෙම දැනෙන්නේ නැති නිසා ඔබතුමන්ලාගේ දේශපාලන සංස්කෘතිය පාවිච්චි කරලා කථාවෙන්, මාධ්‍යයෙන් ප්‍රායෝගිකව රටේ ආර්ථිකය නඟාසිටුවන්න. මේ මහ පොළොවේ දුක් විඳින පුංචි මිනිසුන්ට, ඔබතුමන්ලාට ඡන්දය දුන් මිනිසුන්ට කිසිම දෙයක් ඉටු නොවී තිබෙන එක ගැන අද හැමෝම කථා වෙනවා.

මම හිතනවා, මේ යෝජනාව ගෙනා මන්ත්‍රීතුමා NPP එකේ කියලා. මේක ස්ථිර කරපු මන්ත්‍රීතුමාත් NPP එකේ කියලා මම හිතනවා. එහෙම හිතන්නේ මේකයි. ඔබතුමන්ලා වාගේම තමයි අපිත් මේ දේශපාලනය පිළිබඳව විශ්වාස කළේ. අපි හිතුවා, මේ නායකයෝ ඇතුළේ කථා කරනකොට, ඒ අය කරන ක්‍රියාකාරකම් ඒ විධියටම ප්‍රායෝගිකවත් සිදු කරයි කියලා. උගත්කම, දැනුම වාගේම වෘත්තිය පවා උකසට තියලා මේ රටේ අනාගතය බේරා ගත යුතුයි කියන අදහසින් ආපු ඔබට සිදු වෙලා තිබෙනවා ඒ අයට කඩේ යන්න. ඒක නිසා මම හැම දාම කථා කරන මේ උගතුන්ට, වියතුන්ට කියනවා, හොර තක්කඩින් එකතු වෙලා කරන මේ වැඩ පිළිවෙළ පරාජය කරන්න බුද්ධිමත්ව ආණ්ඩුවේ ඉඳගෙන හරි හිටගන්න කියලා.

මම එහෙම කියන්නේ ඇයි? ඔබතුමන්ලා හදපු "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණා නේද, පළමුවැනි අය වැයෙන් ළදරු ආහාරවලට, බෙහෙත්වලට, පොත පතට VAT එක අයින් කරනවා කියලා. කවුරු හරි නැඟිටලා ඒ ගැන කියන්න කෝ. දැන් ආදායම උපයා තිබෙනවා. බදු ආදායම වැඩි වෙලා තිබෙනවා. ඒක හොඳයි. ඒ සියල්ල මේ රටේ ව්‍යාපාරිකයන්ගෙන්, දුක් විඳින මිනිසුන්ගෙන් ගත්තේ. ඒක ඒ අය දන්නවා. හැබැයි, ඔබතුමන්ලාට හැකියාවක් තිබෙනවාද, උපයා ගත් ආදායම මේ පුංචි මිනිසුන් අතරට ගෙන ගිහින් වියදම් කරලා ඔබතුමන්ලාගේ ඡන්දදායකයාට, අසරණ ගොවියාට, කම්කරුවාට දැනෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ කවදාද කියලා කියන්න. ඒකයි අපි බලාපොරොත්තු වෙන්නේ. එවැනි දෙයක් ඉටු නොවන නිසායි මෙහෙම කියන්නේ.

ඔබ අපට ඇරයුම් කරනවා, "එන්න, ඇවිල්ලා වැඩේ කරන්න" කියලා. නමුත් අපට සැකයක් තිබෙනවා, ඔබතුමන්ලා පරණ ආණ්ඩු ගිය සුපුරුදු ගමනේමද යන්නේ කියලා. මේ කාරණය ගැන කල්පනා කරන්න, ගරු කථානායකතුමනි. ඉන්දියන් ගිවිසුම පිළිබඳව අදටත් කියන්න විධියක් නැහැ නේ. හැබැයි, ඉන්දියාවත් එක්ක එකඟ වෙච්ච ගිවිසුම් අතර මේ රටේ ආර්ථික ඝාතනයට හේතු වෙච්ච මර්මස්ථාන සියල්ල නැවත ඔවුන්ට ලබා දෙන කොන්දේසි පිළිබඳව එකඟවීම් සහ ඒක කරනවා කියන කාරණය ඔබතුමන්ලාගේ නායකයෝ -එදා විරුද්ධ වෙච්ච කඳවුර- අද උජාරුවට කියන එක පිළිබඳව ඔබතුමන්ලා කනගාටු වෙන්නේ නැද්ද? ඔබතුමන්ලාට ඡන්දය දුන් මිනිස්සු කනගාටු වෙන්නේ නැද්ද? හැබැයි, ඒක නොවෙයි වර්තමානයේ තිබෙන ප්‍රශ්නය.

ගරු කථානායකතුමනි, ඊයේ මම අගමැතිතුමියගෙන් ඇහුවා, ඔබතුමිය එදා විපක්ෂයේ ඉන්දෙද්දී මේ රට බංකොලොත් වෙච්ච, රට විනාශ වෙච්ච, මේ රටේ ජනතාවට තුන් වේල කන්න බැරි වෙච්ච මහා බරපතළ වංචා, දැවැන්ත අපරාධ, මංකොල්ලකෑම් ගැන කිව්වා නේද කියලා. සමහර මංකොල්ලකෑම්වලට අපිත් චූදිතයෝ. මොකද, අපිත් ඒ ආණ්ඩු නියෝජනය කරපු නිසා. මහ බැංකු බැඳුම්කර වංචාව ගැන ඇහුවා. සුදු ලූනු වංචාව ගැන ඇහුවා. සීනි බදු වංචාව ගැන ඇහුවා. ගරු කථානායකතුමනි, මම ළඟ මේ තිබෙන්නේ අගමැතිතුමියගේ පිළිතුර. මේ පිළිතුරේ කිසි තැනක කියන්නේ නැහැ, එක වංචාවක්, එක හොරකමක් ගැන. ඒ සඳහා වෝහාරික විගණනයක් කරන්න කියලා යෝජනා කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, දෙවැනි ප්‍රශ්නය විධියට මම ඇහුවා, "එම සිදුවීම් සම්බන්ධව චෝදනා එල්ල වූ පුද්ගලයින් හා ආයතනවල නම, ලිපිනයන් කවරේද?" කියලා. අගමැතිතුමිය ඊයේ දුන් පිළිතුර මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඇයි, මෙහෙම බොරු කියන්නේ? බොරු බව NPP එකේ උගතුන්ට, වියතුන්ට දැනෙනවා නම්, ඒ ගැන එළියේ බැරි නම් මේ සභාව ඇතුළේ හරි කොතැන හරි සාකච්ඡා කරන්න. මේවා තමයි ජනතාව විශ්වාස කළේ. මේ හොරකම, වංචාව, දූෂණය කියන සියල්ල අල්ලනවා විතරක් නොවෙයි, මේ උපයා තිබෙන සියලු ධනය රාජසන්තක කරනවාද කියන ප්‍රශ්නය මම අවසානයේදී අහනවා, ගරු කථානායකතුමනි. ඒකටත් පිළිතුරක් නැහැ. හැබැයි, ඒක නොවෙයි ප්‍රදුමය.

මම දැක්කා ඩී.වී. චානක මන්ත්‍රීතුමා ගරු අගමැතිතුමියගෙන් අහනවා, හිටපු ජනාධිපතිතුමාගේ බාල පුතා යවපු රොකට් එක සඳහා ආයෝජනය කර ඇති මුදල සම්බන්ධයෙන්. එහිදී අගමැතිතුමිය කිව්වා, ඒ සඳහා මුදලක් ආයෝජනය කරලා නැහැ, ඒකෙන් රජයට පාඩුවක් වුණේ නැහැ කියන කාරණය. මොකක්ද මේ කියන්න හදන්නේ? මේක පුරවැසියා තේරුම් ගන්න; මේක ඡන්දදායකයා තේරුම් ගන්න. මෙන්න මේක තමයි ඩීල් එක. මෙතුමන්ලාට වරදිනකොට, මෙතුමන්ලා පිරිහෙනකොට මේ තුන් කට්ටුව අතයට මාරු කර ගැනීමේ දේශපාලන උපාය, න්‍යාය පාවිච්චි කරනවා. ඒක තමයි නාමල් රාජපක්ෂ මහත්මයා ඊයේ - පෙරේදා ගුවනේදී හම්බ වුණේ. ගුවනේදී හම්බ වුණේ ඇයි? පුතාට රස්සාව අරගෙන දුන්නේ නාමල් රාජපක්ෂ මහත්මයා. පුතාගෙන් ඉල්ලීමක් කරනවා, රාජපක්ෂ මහත්වරු. පුතා තාත්තාට මුණගස්සනවා, රාජපක්ෂවරු. මුණ ගස්සවලා උඩු ගුවනේදී අදහස් හුවමාරු කර ගන්නවා, ගිලිහෙන බලය රැක ගැනීමට. මේවා නිවැරදියි, හොරකම් කළේ නැහැ කියලා අද ඒ හොරු සියල්ල පිරිසිදු කරලා ඔවුන් නැවත බලයට ගෙන ඒමේ කූටප්‍රාප්තිය මේ ජනතා විමුක්ති පෙරමුණ කඳවුර කරන බව NPP එකේ මහත්වරු හොඳට මතක තියා ගන්න. එහෙම නොවෙයිද මේ වෙන්නේ?

ජනතාව කියනවා, ඒවා හොරකම් නොවෙයි, විචීගේ රොකට් එකෙන් කිසි පාඩුවක් වෙලා නැහැ, ඒ අය හොරා කාලා නැහැ, මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධ හොරු නැහැ, සුදු ලූනු වංචාවට සම්බන්ධ හොරු නැහැ, ඒ හොරකම් කරපු අයගේ නම් නැහැ,

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු චමින්ද විජේසිරි මහතා]

එහෙනම් අපරාදේ මේ උදවියට විරුද්ධව දඬුවම් දුන්නේ, ඒ අය හොරා කෑවාත් රටට යමක් කළා, පාරවල් හැදුවා, අධිවේගී මාර්ග හැදුවා, ගුවන් තොටුපොළවල් හැදුවා කියලා. දැන් ඒවා තමයි කථා වෙන්නේ, ගරු කථානායකතුමනි. රනිල් වික්‍රමසිංහ මහත්මයා කොහොමද එතුමන්ලාව බේරා ගත්තේ, එතුමන්ලා ආණ්ඩුව රැක ගත්තේ කොහොමද කියන කාරණය දන්නවා. රාජපක්ෂවරු නිර්මාණය කිරීමේ අයිතිය ජනතා විමුක්ති පෙරමුණට තිබෙනවා. අවසානයේ, රටේ පුරවැසියා තේරුම් ගන්න, මේ ආර්ථික අර්බුද සියල්ල ලිහනවා කියලා ගෙනාපු අය, ඒ සියලු දේවල් විනාශ කරන තැනට පත් කර තිබෙන බව.

*[මෙම අවස්ථාවේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]*

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage, the Hon. President Anura Kumara Dissanayake entered the Chamber.]*

මේ අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමා සභාවට එනවා. ඔබතුමා ජනතාවට ලබා දෙනවාය කියපු සියලු දේවල් ලබා දෙන්න පුළුවන් වැඩ පිළිවෙළ මොකක්ද කියලා කියන්න. අපි දන්නවා, ඔබතුමා දැන් පැය දෙකක් විතර කථා කරනවා කියලා. ඒ පැය දෙක තුළ ජනතාවගේ හදවතේ තිබෙන සැබෑ ප්‍රශ්නය, ජනතාවගේ සැබෑ කඳුළ, ඔබේ කඳුළක් විධියට ඔබතුමා හැම දාම කථාවෙන් කියනවා. ඔබතුමා ඒකට බොහොම දක්ෂයි. හැබැයි, ඒවා ප්‍රායෝගික වෙලා නැහැ, ගරු ජනාධිපතිතුමනි. ඒවා ප්‍රායෝගික වෙලා නැහැ. ඔබතුමා ජනතාවගේ තිබෙන ඒ ප්‍රායෝගික ප්‍රශ්නය හරියට තේරුම් ගෙන කථා කරනවා වාගේ ඒක ප්‍රායෝගිකව මහ පොළොවේ පැළ කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න.

අපි ඒක විපක්ෂයේදී දැක්කා. අපි විපක්ෂයේදී තමුන්නාන්සේත් එක්ක ඒවා ගැන සාකච්ඡා කළා. අපි පාර්ලිමේන්තුවට එනකොට අපිත් තමුන්නාන්සේගේ හැසිරීමට, කථා විලාසයට රැවටුණා, ගරු ජනාධිපතිතුමනි. හැබැයි, ඒ රැවටීම තවදුරටත් ඔබතුමාට කරන්න බැහැ. ඔබතුමාට කාලය එළඹිලා තිබෙනවා. දැන් "Hummingbird" කියලා නේ කියන්නේ. ඒ නිසා පැණි කුරුල්ලා වාගේ රටේ ජනතාවට පැණි බෙදන ඒ වැඩ පිළිවෙළ, රටේ ජනතාවට අවශ්‍ය සහන ලබා දෙන වැඩ පිළිවෙළ ගැන කියන්න. ආදායම් එකතු කරලා ගෙදර තියාගෙන වැඩක් වෙන්නේ නැහැ. කම්කරුවාට, ඉස්කෝලේ යන දරුවාට ලබා දෙන සහන මොනවාද? ඒ දරුවන්ගේ බෙහෙත් ටික ලබා දෙන්නේ කවදාද, කොහොමද කියන කාරණය කියන්න. පළමුවෙනි අය වැයෙන් ඒ සහන දෙනවාය කිව්වා. ඒකත් නැත්නම්, මේ ලැබෙන ආදායම තුළ රටේ ජනතාවට අවශ්‍ය සම්පත් ටික බෙදන වැඩ පිළිවෙළ ගැන කියන්න. දේශපාලන ඩීල්, ගේම් ගහලා මේ රට නන්නත්තාර කරන යුගය නැවත නිර්මාණය කරන්න එපා. ඊට විරුද්ධව පෙළ ගැහෙන්න පුළුවන් හයියක්, ශක්තියක්, කොන්දක්, එකමුතුවක් සමගි ජන බලවේගයේ අපට තිබෙනවාය කියන කාරණය මම මතක් කරනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජනාධිපතිතුමා.

[අ.භා. 12.12]

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayaka - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

ගරු කථානායකතුමනි, රටේ ආර්ථික තත්ත්වය පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී ආර්ථිකය පිළිබඳ යම් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. පසුගිය කාලයේ ජාත්‍යන්තරවත්, රට තුළත් ඇති වුණු යම් යම් ගැටුම්කාරී ස්වභාවය මත මේ ආණ්ඩුව බිඳ වැටෙයි කියලා බොහෝ අයගේ ප්‍රාර්ථනයක් තිබුණු බව අපි දන්නවා. ඉස්සෙල්ලාම මේ බිඳ වැටීම අපේක්ෂා කළා, ඉන්දියාව සහ පාකිස්තානය අතර යම් යුද ගැටුමක වාතාවරණයක් නිර්මාණය වුණාට පස්සේ. ඒ වෙලාවේදී මම දැක්කා, නිරන්තර මාධ්‍ය සාකච්ඡා තියන මහත්වරු කොළඹට බෝම්බ දමයි කියලා අපේක්ෂා කරනවා. ඒ කියන්නේ, පාකිස්තානය විසින් කොළඹට බෝම්බ දමයි කියලා. ඒ යුද ගැටුම් පවතින අවස්ථාවේදීත් -ඒ වාතාවරණය පවතින අවස්ථාවේදීත්- අපේ ආරක්ෂක ලේකම්තුමා, අපේ හමුදාපතිවරු ගණනාවක් හිටියේ, පාකිස්තානයේ ලාහෝර්වල. හැබැයි, මෙහේ විපක්ෂය අපේක්ෂා කළා, කොළඹට ඇවිල්ලා බෝම්බ දමයි කියලා. ඒක ප්‍රාර්ථනාව. ඊට පස්සේ අපේක්ෂා කළා, ඊශ්‍රායලය සහ ඉරානය අතර ජාත්‍යන්තර මට්ටමේ යුද්ධයක් පැන නැඟුණාට පස්සේ දැන් අවස්ථාව ලැබේවි, බිඳ වැටීමට භාජන වේවි කියලා. ඒක සිද්ධ වුණේ නැහැ. ඊළඟ විශාලතම ප්‍රාර්ථනාව වුණේ ඇමෙරිකා එක්සත් ජනපදය විසින් පනවන ලද බදු ප්‍රතිපත්තිය නිසා අපේ ආර්ථිකය බිඳ වැටේවි කියන එකයි. දවස් දෙකකට පෙරත් මම දැක්කා,- *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලාගේ ආර්ථික න්‍යායාචාර්ය ද හර්ෂ? ගොඩහේවාද? *[බාධා කිරීමක්]* මම දන්නේ නැහැ, ගොඩහේවාත් දැන් නැද්ද? *[බාධා කිරීමක්]* ආ, ගොඩහේවා නැහැ, දැන්. හර්ෂ. *[බාධා කිරීමක්]* මම දැක්කා, ඡන්දය කාලයේ ගොඩහේවා කිව්වා. *[බාධා කිරීමක්]* ආ, නැද්ද එතුමා? කෝ, දැන් එතුමා? *[බාධා කිරීමක්]* නැහැ, මට අවශ්‍ය නැහැ. මොකද, මම දැක්කා, එක වැඩසටහනකට ඇවිල්ලා තමුන්නාන්සේලා විසින් ඉදිරිපත් කරපු මැතිවරණ ප්‍රකාශය ඒක නොවෙයි කියලා ගොඩහේවා මහත්මයා කිව්වා. කවුරු වුණත්, දවස් දෙකකට කලිනුත් කිව්වා, මේ යන විධියට සියයට 30 නොවෙයි සියයට 44ට නඟියි කියලා. ඒක ප්‍රාර්ථනාව. ඉන්දියාවේ සියයට 15ට, 20ට අඩු වෙයි කිව්වා. ඒක ප්‍රාර්ථනාව. තමුන්නාන්සේලා හැම වෙලාවේම අපේ රටේ ආර්ථිකයේ ව්‍යසනයක් ඇති වේවි කියලා කුරිරු සිහිනයක් දකිනවා. කුරිරු සිහිනයක්, විනාශකාරී සිහිනයක්. මතක තබා ගන්න, ඒ විනාශකාරී සිහිනය සැබෑ වන්නේ නැති බව. ඒක විතරක් ලියලා තබා ගන්න. දේශපාලනය වෙන රාමුවකින් කරන්න පටන් ගන්න. ඔයගොල්ලන්ගේ දේශපාලනය වෙන රාමුවකට මාරු කරන්න. ඔය රාමුව වැරදියි.

දැන් අගෝස්තු ජනාධිපති පාර්ලිමේන්තුවේත් නැහැ. හිටියා නේද, අගෝස්තු ජනාධිපති කෙනෙක්? අඩුම තරමේ එතුමා පාර්ලිමේන්තුවේත් නැහැ. කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, එතකොට දෙසැම්බර් ජනාධිපති? දෙසැම්බර් මාසයේ පුටුවේ වාඩි කරවන්න සැලසුම් හදලා ඔක්කෝම කරලා තිබෙන්නේ කියලා කිව්වා නේද? කොහොමද? දෙසැම්බර්වලට තව මාස තුනයි තිබෙන්නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒක 2027ට කල් ගියා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
2027ට කල් ගියාද? ඒ කියන්නේ, ජනාධිපති ධුර පුටුවේ වාඩිවීමේ තීරණය දෙසැම්බර් සිට 2027 දක්වා කල් තැබීමේ යෝජනාව ගේන්නේ සම්පත් මැතිතුමා. ඔයගොල්ලෝ යෝජනා ගේනවා, කල් තබනවා. ඕක හැමදාම කරන්න වෙනවා, හොඳේ. දෙසැම්බර් ජනාධිපති කෙනෙක් ඇති වෙන්නේත් නැහැ, මතක තබා ගන්න. ඒ නිසා තමුන්නාන්සේලාගේ මේ දේශපාලන ව්‍යාපාරය, දේශපාලන මතය වෙනුවට වෙන රාමුවක ඉඳන් දේශපාලනය කරන්න පටන් ගත්තොත් හොඳයි කියලා මම හිතනවා.

විශේෂයෙන් මම මේ අවස්ථාවේදී කරුණු පැහැදිලි කරන්න කැමැතියි, ඇමෙරිකා එක්සත් ජනපදය විසින් අපට පනවන ලද තීරු බදු පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධව. අප්‍රේල් මාසයේ 2වැනි දා එය ප්‍රකාශයට පත් කරලා කිව්වා, අප්‍රේල් මාසයේ 9වැනි දා සිට මේක බලපවත්වනවා කියලා. ඇමෙරිකා එක්සත් ජනපදය අපේ රටට එවැනි බදු ප්‍රමාණයක් පනවනකොට ඔවුන් එය තීරණය කරපු මූලධර්මයක් තිබුණා. ඒ මූලධර්මය අනුව රටවල් දෙක අතර තිබෙන වෙළඳ පරතරයේ ප්‍රතිශතයෙන් හරි අඩක් තමයි අපේ බදු ප්‍රතිපත්තිය හැටියට නම් කළේ. ඒක ආර්ථික වශයෙන් හොඳ ද, නරකද කියන එක විවාදයක්. නමුත්, ඔවුන් පදනම් කර ගත්තේ ඇමෙරිකා එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර වෙළඳ පරතරය සියයට 88ක් තිබෙනවා, ඒකෙන් සියයට 50ක් කියන එකයි. ඒ කියන්නේ සියයට 44යි. හැම රටකටම, ඒ ඒ රටවල් අතර තිබෙන වෙළඳ පරතරයේ ප්‍රතිශතයෙන් සියයට 50ක් තමයි බදු ප්‍රතිශතය කියලා නම් කළේ. ඒ අනුව තමයි අපට සියයට 44ක් ආවේ. ඒ වෙලාවේත් කිව්වා මම දැක්කා, අර රටවලට මේ විධියට දමලා තිබියදී ලංකාවට සියයට 44ක් පැනවුයේ ආණ්ඩුවේ අසාර්ථක බව නිසාය කියලා. නැහැ, ආණ්ඩුවේ අසාර්ථකභාවයක් නොවෙයි. ඔවුන් ඒ බදු පැනවීම සඳහා සකස් කරගත්තු මූලධර්මය තමයි, වෙළඳ පරතරය ප්‍රතිශතාත්මකව ගත්තාම එයින් හරි අඩක් කියන එක. යම් රටකට සියයට 25ක් ආවා නම් ඒ රටවල් දෙක අතර තිබෙන වෙළඳ පරතරය සියයට 50යි. වෙළෙඳ පරතරය සියයට 50ක් නම් ඒ බදු ප්‍රතිශතය සියයට 25ක් වෙනවා. ඒ අනුව අපට සියයට 44ක් ආවා. එතකොට අපට ඒ සියයට 44ක අගය නිර්මාණය වෙන්නේ අපේ රටේ අභ්‍යන්තර ප්‍රශ්නයක් මත නොවෙයි, ඇමෙරිකා එක්සත් ජනපදය සහ අප අතර තිබෙන වෙළඳ පරතරයේ ස්වභාවය මත. ඒක හරි පැහැදිලියි.

විශේෂයෙන්ම අපි ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක මේ පිළිබඳව සාකච්ඡාවලට අවතීර්ණ වන්නේ, -අපි විවෘතව පිළිගත යුතුයි- යම් අසීරු තත්ත්වයක සිට. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක එකඟතාවකට එමින් තිබෙනවා. ඒ රාමුව තුළ අපි ගමන් කරමින් තිබෙනවා. අනික් පසින් ගත්තොත්, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර ජනගහනයේ විශාලත්වයේ තිබෙන වෙනස්කම්, ආර්ථිකයේ විශාලත්වයේ තිබෙන වෙනස්කම්, ජනතාවගේ ජීවන රටාවේ - life-style එකේ - තිබෙන වෙනස්කම් කියන මේ ඔක්කෝමත් එක්ක සංසන්දනාත්මකව බැලුවාම අපට මේ තුළ එක තැනකට ඒමේ දුෂ්කරතාවක් තිබෙනවා. ඒ වාගේම අපේ අපනයනවලින් සියයට 25කට වඩා වැඩි ප්‍රමාණයක් යන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයට. එය අපේ අපනයන ආර්ථිකයට විශාල බලපෑමක් ඇති කිරීමේ අනතුරක් තිබුණා. අපේ ඇඟලුම්වලින් සියයට 60කට ආසන්න ප්‍රමාණයක් යන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයට. එම නිසා කම්කරුවන් ලක්ෂ තුනහමාරකට ආසන්න ප්‍රමාණයකගේ රැකියාවලට -ඍජු රැකියාවලට- බලපෑමක් ඇති වීමේ අනතුරක් තිබුණා. එම නිසා අපි මෙම සාකච්ඡාවලට ප්‍රවිෂ්ට වුණේ යම් අසීරු අඩියක සිට. ඒ අනුව අපි ඉතා ප්‍රබල කණ්ඩායමක් නම් කළා. මම එකක් කියන්න කැමැතියි. මේකේ පියවරෙන් පියවර රතිඤ්ඤා දමන්න, අත්පොළසන් නඟන්න අපි මෙතැන ඇවිල්ලා කිව්වේ නැහැ. පියවරෙන් පියවර අපේ සාකච්ඡා කළ අයට මාධ්‍ය සාකච්ඡා තියලා, රඟ දක්වන්න අපේ වුවමනාවක් තිබුණේ නැහැ. අපි මේ ගැඹුරේ තිබෙන අර්බුදයේ ස්වභාවයත්, ඒ අසීරුතාවත් හඳුනාගෙන තිබුණා. එම නිසා අපි නිරන්තරයෙන් සාකච්ඡා කරමින් ඉතා හොඳ කණ්ඩායමක් පත් කළා. මුදල් අමාත්‍යාංශයේ වර්තමාන ලේකම් හර්ෂණ සූරියප්පෙරුම මහතා, මහ බැංකුවේ අධිපති නන්දලාල් වීරසිංහ මහතා, වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් විමලේන්ද්‍ර රාජා මහතා -එතුමා බදු පිළිබඳව විශේෂඥ ඥානයක් තිබෙන කෙනකු බව අපි කවුරුත් පිළිගන්නවා- සහ ජනාධිපති ආර්ථික උපදේශක දුමින්ද හුළංගමුව මහතා පත් කළා. ඒ වාගේම අපට එහිදී විශාල සම්බන්ධීකරණ සහායක් ලබා දුන්නා එක්සත් ජනපදයේ අපේ තානාපති මහින්ද සමරසිංහ මහත්මයා. අපි දන්නවා ඇමෙරිකා එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර කාලයේ වෙනස්කමක් පවතින බව; දහවල් සහ රාත්‍රියේ වෙනසක් තිබෙනවා. ඒ නිසා සමහර අවස්ථාවල අපට පාන්දර දෙකට, තුනට සාකච්ඡාවලට අවතීර්ණ වෙන්න සිදු වුණා. එහිදී, මම දන්නවා එක්සත් ජනපදයේ අපේ තානාපති මහින්ද සමරසිංහ මැතිතුමා නිදි වර්ජිතව විශාල කාර්යභාරයක් සිදු කළ බව.

අපේ කණ්ඩායම අවස්ථා දෙකකදී එක්සත් ජනපදයට ගිහින් සාකච්ඡා කළා. ඒ වාගේම අවස්ථා කිහිපයක් අපි Zoom තාක්ෂණය හරහා සාකච්ඡා පැවැත්වුවා. මමද ඍජුව මැදිහත් වෙලා එක්සත් ජනපදයේ අදාළ බලධාරීන් එක්ක සාකච්ඡා පැවැත්වුවා. අපට අවශ්‍ය කර තිබුණා මේ තත්ත්වය ඉතා හොඳින් අවසන් කර රටේ ආර්ථිකයට අහිතකර බලපෑමක් ඇති නොවන ආකාරයෙන් මේ ප්‍රශ්නය විසඳා ගැනීමට. එවැනි අභියෝගයක් අපට තිබුණා. එම අභියෝගය අපි ඉතා සාර්ථකව නිමා කළා කියන සතුටක් අපට තිබෙනවා. ඒ, රට පිළිබඳව. පෞද්ගලිකව මා පිළිබඳව නොවෙයි, රට පිළිබඳව සතුටක් අපට තිබෙනවා. ඒ අර්බුදය පියමං කර ගන්න අප සමත් වුණා.

එහිදී විශේෂයෙන්ම එක්සත් ජනපදය විසින් අපට ඉදිරිපත් කරන ලද සමහර යෝජනා තිබුණා. ඒ යෝජනා පිළිබඳව අපි සාකච්ඡා මට්ටමේ ඉන්නවා. අපි මේ වන තෙක් කිසිදු අවසන් එකඟතාවකට ඇවිල්ලා, ගිවිසුමක් අත්සන්කොට නැහැ. ඒක මා කියන්න ඕනෑ. තවම කිසිදු ගිවිසුමක් අත්සන්කොට නැහැ. නමුත්, අපි සාකච්ඡාවලින් යම් ප්‍රගතියක් ලබා තිබෙනවා. යම් එකඟතාවලට අපි ඇවිල්ලා තිබෙනවා. නමුත්, අපි තවම එක්සත් ජනපදය සමඟ අවසන් වශයෙන් ගිවිසුමට අත්සන් කරලා නැහැ. නමුත්, අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑකම තිබෙනවා. එම සාකච්ඡා ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් හැටියට සැලකිය යුතු ප්‍රමාණයකින්, -සියයට 20 දක්වා- තීරු බදු ප්‍රතිශතය අඩු කර ගන්න අප සමත් වුණා.

එහිදී බලන්න ඕනෑකම තිබෙන්නේ මේකයි. අපේ වෙළෙඳ පරතරය මත තමයි අපට සියයට 44 ලැබෙන්නේ. ඒක තමයි ඔවුන්ගේ මූලධර්මය. ඒ සියයට 44, සියයට 20 දක්වා අඩු කර ගැනීම සාකච්ඡා හා ඔවුන් සහ අප අතර තිබෙන එකඟතාවේ වැදගත් ප්‍රතිඵලයක් ලෙස අපි කල්පනා කරනවා. ඒ නිසා ඒ පිළිබඳව හැම තීන්දුවක් ගැනීමේදීම අපි අදාළ හැම කෙනෙක් සමඟම සාකච්ඡා කළා. සමහර HS codes ප්‍රමාණයක් ඔවුන්ට

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

නිදහස් කළ යුතුව තිබෙනවා. ඊට බලපාන කර්මාන්තකරුවන්, ව්‍යවසායකයන් එක්ක අපි සාකච්ඡා කළා. අපි යම් ක්ෂේත්‍රයක් විවෘත කිරීම පිළිබඳව සාකච්ඡා කරනවා නම් ඊට අදාළ පාර්ශ්වකරුවන් ගෙනැල්ලා, "මේ ක්ෂේත්‍රය මේ ආකාරයෙන් විවෘත කිරීමක් සිදු වුණොත් කුමක්ද සිද්ධ වෙන්නේ, ඔබේ ව්‍යාපාරයට, ඔබේ කර්මාන්තයට කවර ආකාරයේ බලපෑමක් සිද්ධ වනවාද?" කියන කරුණු පිළිබඳව නිරන්තරයෙන් සාකච්ඡා කරමින් තමයි අපේ සාකච්ඡා කණ්ඩායම මේ සාර්ථකත්වය කරා ගමන් කළේ. එහෙම නැතුව කාමරයක් ඇතුළේ හතර පස්දෙනෙකු කරන කුමන්ත්‍රණයක් ලෙස නොවෙයි. ඊට අදාළ පාර්ශ්වකරුවන් එක්ක නිරන්තරයෙන් සාකච්ඡා කරමින්, "මේ ගනු ලබන තීන්දුව, එක්සත් ජනපදයත් එක්ක එනු ලබන මේ එකඟතාව, ඔබගේ කර්මාන්තයට කෙසේ බලපාවිද, ඔබේ වෙළෙඳ පොළට කෙසේ බලපාවිද?" කියන සාධක සැලකිල්ලට ලක් කරමින් තමයි, අපි මේ එකඟතාවට එමින් තිබෙන්නේ. එම නිසා මෙයට සහභාගී කරවා ගත් හැම පාර්ශ්වකරුවෙකුම සහභාගී කරවා ගැනීම අපේ වගකීමක් ලෙස සලකා අපි කටයුතු කළා. එම නිසා මම හිතනවා එක්සත් ජනපදයේ බදු ප්‍රතිපත්තිය මත තමුන්නාන්සේලා අපේක්ෂා කළා නම් ආර්ථිකයේ බිඳ වැටීමක්, ඒකත් දැන් අවසන්. අවසන් නේ? තවමත් අවසන් එකඟතාවක් නැහැ. අපට සියයට 20ක් දක්වා බදු ප්‍රතිශතය අඩු කර තිබෙනවා. අපි තවමත් උත්සාහ දරනවා ඒ සියයට 20ක ප්‍රතිශතයත් අඩු කර ගන්න පුළුවන්ද කියලා බලන්න. ඒ සඳහා අපි සාකච්ඡා ආරම්භ කර තිබෙනවා. ඒක තමයි රට පැත්තෙන් අපි ගත යුතු තීරණය.

ගරු කථානායකතුමනි, අපට බාහිරව අභියෝග තුනක් තිබුණා. එකක්, අපි නොසිතූ ආකාරයෙන් එක්සත් ජනපදය විසින් අපට පටවන ලද බදු. ඒක අපි නොසිතූ, අපි හදාගෙන එන ලද සැලැස්මට පරිබාහිරව අපට ආපු තර්ජනයක්. අපි සැලැස්ම සකස් කරලා තිබෙන්නේ එවැනි තර්ජනයක් අපේක්ෂාවෙන් නොවෙයි. නමුත්, එම තර්ජනයෙන් අපි මිදෙන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය කටයුතු අපි කරනවා.

ඊළඟට අපට බාහිරව එන අභියෝගය තමයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන පිළිබඳවත් මම දැක්කා බොහෝ අය ඉතා වැරදි, අසත්‍ය සහ විකෘති කරන ලද තොරතුරු ඉදිරිපත් කරනවා. කිසිසේත්ම අපේ සමාලෝචනයන් පහු වුණේ නැහැ. ඇත්තටම පහු වුණේ තුන්වන සමාලෝචනය. තුන්වන සමාලෝචනය ආරම්භ කරන්න තිබුණේ ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ. හැබැයි, සැප්තැම්බර් මාසයේ මැතිවරණය පවත්වන නිසා ඔවුන් විසින්ම ප්‍රකාශයට පත් කළා, මැතිවරණයක් තිබෙන වෙලාවක සාකච්ඡා ආරම්භ කරන්න ඔවුන් සූදානම් නැහැ කියලා. නැවත පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. පාර්ලිමේන්තුව විසුරුවා හැරියාට පසුවත් නැවත ප්‍රශ්නයකට මුහුණ දුන්නා. මොකක්ද? මැතිවරණයක් තිබෙන වෙලාවක සාකච්ඡා ආරම්භ කරන්න බැහැ කියලා ඔවුන් කිව්වා. ඒ මැතිවරණය අවසන් වුණා නොවැම්බර් මාසයේ 14වැනි දා. නොවැම්බර් මාසයේ 16වැනි දාම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කණ්ඩායම ලංකාවට ආවා. ඒ වෙනුවෙන් අපි ඒ අයට ස්තූතිවන්ත වෙනවා. ඒ කියන්නේ, මැතිවරණය අවසන් වී දවසකින් පසුව අපි නැවත සාකච්ඡා පටන් ගත්තා. ඒ සාකච්ඡාවලදී සමහර එකඟතා තිබුණා. ඒ, අපි පූර්වයෙන් ආපු එකඟතා. සමහර දේවල් අපි අය වැය ලේඛනයෙන් ප්‍රකාශයට පත් කළ යුතුව තිබුණා. සමහර ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුව තිබුණා. නොවැම්බර් මාසයේ 14වැනි දා මහ මැතිවරණය පවත්වා, නොවැම්බර් මාසයේ 18වැනි දා කැබිනට් මණ්ඩලය පිහිටුවා, අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්න අපට අවස්ථාවක් තිබුණේ නැහැ. ඒ නිසා අය වැය ලේඛනය සම්මත කර ගැනීම මාර්තු මාසයේ 21වැනි දා දක්වා පසුපසට ගියා. අඩුම තරමින් අය වැය ලේඛනය ඉදිරිපත් කරන තෙක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යම් එකඟතාවන්ට ඒමේ අවශ්‍යතාවක් තිබුණා. අය වැය ලේඛනයේ ඔවුන් ප්‍රකාශයට පත් කළ යුතු අදහස් තිබුණා. ඉතින්, ඒ නිසා කාලයක් ගියා. හැබැයි, අය වැය ලේඛනය ඉදිරිපත් කරලා, පෙබරවාරි මාසයේ 28වන දා වාගේ වනකොට අපේ තුන්වන සමාලෝචනයේ සාකච්ඡා සාර්ථකව අවසන් කරගෙන අපට පුළුවන්කම ලැබුණා ඒ වැඩසටහනේ ඉන්න. ඒ වාගේම, සමහර දේවල් සංශෝධනය කරගන්න අපි සමත් වුණා. අපි PAYE Tax එක අඩු කර ගත්තා; කිරි ආශ්‍රිත බදු අඩු කර ගත්තා. මාර්තු මාසයේ සේවා බද්ද පනවන්න අපට තිබුණා. ඒක අපි පස්සට දාගත්තා. මාර්තු මාසයේ දේපළ බද්ද පනවන්න තිබුණා. අපි ඒක පස්සට දාගත්තා. ඒ නිසා යම් සාර්ථක සමාලෝචනයකින් පසුව තමයි අපි තුන්වන සමාලෝචනය නිමා කළේ. තුන්වන සමාලෝචනයෙන් පසු 4වන වාරිකය ලැබුණා. ඊට පස්සේ මොකක්ද? ඊළඟට හතරවන සමාලෝචනය ආරම්භ කරන්න ඕනෑ. හතරවන සමාලෝචනය අපි නිසි පරිදි අවසන් කළා. එය ජූනි මාසයේ 30වන දා වනකොට අවසන් විය යුතුව තිබුණා. ජූනි මාසයේ 01වන දා වනකොට හතරවන සමාලෝචනය අවසන් කරලා අපට 5වන වාරිකය ලබා දීම සඳහා එකඟතාවකට ආවා. එම වැඩසටහනට අදාළව අපි ඒ රාමුවේ ඉන්නවා.

ඊට පසුව විදුලි බිල පිළිබඳව විශාල ආන්දෝලනයක් හදනවා මම දැක්කා. කිසිදු ප්‍රශ්නයක් නැහැ අප ඉන්න ප්‍රතිපත්තිය ගැන. ඉතාම පැහැදිලියි ඒ ප්‍රතිපත්තිය. ලංකා විදුලිබල මණ්ඩලයට සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අධික ණය බරක් තිබුණා. ඒ තොරතුරු මා පසුව දවසක ඉදිරිපත් කරන්නම්. තෙල් සංස්ථාවේ ණය කන්දරාව නිසා අපේ ලංකා බැංකුව සහ මහජන බැංකුව බිඳ වැටීමේ අනතුරකට මුහුණ දී තිබුණා. ඒ නිසා තෙල් සංස්ථාව සතුව තිබුණු සියලු ණය වගකීම භාණ්ඩාගාරය ගත්තා. භාණ්ඩාගාරය ඒ ණය වගකීම අරගෙන තමයි තෙල් සංස්ථාවත් බේරාගෙන, ලංකා බැංකුවත් බේරාගෙන, මහජන බැංකුවත් බේරාගෙන කටයුතු කරගෙන යන්නේ. මේවා, අර්බුදයන්. විශාල ණය කන්දක් තිබුණා. ඩොලර් බිලියන 3ක, 4ක ණය කන්දක් තිබුණා, ලංකා බැංකුවට සහ මහජන බැංකුවට. ඒ ඩොලර් බිලියනවලින් බව මතක තබාගන්න. තෙල් සංස්ථාව ඩොලර් බිලියන 3ක, 4ක ණය කන්දක් තිබුණා, රාජ්‍ය බැංකු දෙකට. රාජ්‍ය බැංකු දෙකත් අනතුරක තිබුණා, තෙල් සංස්ථාවත් අනතුරක තිබුණා. අපි තෙල් සංස්ථාවේ තිබුණු ණය වගකීම භාණ්ඩාගාරයට පවරාගත්තා. හැබැයි, විකුණන තෙල්වලින් ලීටරයකට රුපියල් 50කට ආසන්න මුදලක් අපි භාණ්ඩාගාරයට ගන්නවා, ණය ගෙවීම සඳහා. වැරදි ද? මේවා තමයි ප්‍රතිපත්ති. බැංකු ආරක්ෂා කරගන්නත් ඕනෑ, තෙල් සංස්ථාව ආරක්ෂා කරගන්නත් ඕනෑ. විදුලිබල මණ්ඩලය ගත්තාම, විදුලිබල මණ්ඩලයේත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

රජය අපේ ආර්ථිකයේ ව්‍යාපාර ක්ෂේත්‍රවල සිටිය යුතුයි කියලා අප හඳුනාගත් ක්ෂේත්‍ර තිබෙනවා. මූල්‍ය වෙළෙඳ පොළේ රජය ඉන්න ඕනෑ. බලශක්ති වෙළෙඳ පොළේ රජය ඉන්න ඕනෑ. වරාය වැනි උපාය මාර්ගිකව ඉතාම වැදගත් ක්ෂේත්‍රවල රජය ඉන්න ඕනෑ. අපි ඒකට එකඟයි. අපි, ඒක ප්‍රතික්ෂේප කරන දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි, ඒක වෙනස් කරපු දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි; ඒක සහවපු දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. අපේ බලශක්ති වෙළෙඳ පොළේ රාජ්‍ය පංගුවක් නියෝජනය විය යුතුයි. කවුද ඒක එපා කියන්නේ? අපේ මූල්‍ය වෙළෙඳ පොළේ රාජ්‍ය පංගුවක් නියෝජනය විය යුතුයි. උපාය මාර්ගික වශයෙන් වැදගත් වරාය වාගේ ක්ෂේත්‍රවල රාජ්‍ය පංගුවක් නියෝජනය විය යුතුයි. අපි ඒවා අත් හරින්නේ නැහැ. හැබැයි, රජයේ තෙල් සංස්ථාව බලශක්ති වෙළෙඳ පොළේ යම් පංගුවක් නියෝජනය කරනවා නම් එය ජනතාවට බරක් නොවිය යුතුයි.

ඒවා අධික ලෙස පුරවා, අධික ලෙස නාස්ති කරලා, විනාශ කරලා පවත්වාගෙන යන්න බැහැ. ඒ නිසා මොකක්ද කරන්න ඕනෑකම තිබෙන්නේ? කරන්න ඕනෑකම තිබෙන්නේ නිෂ්පාදන පිරිවැයට අනුව මිල ගළපන එකයි. ඒක වැරැදි දෙයක් නොවෙයි. තෙල් ලීටරයක් ගමට ගෙනිහිල්ලා පෙට්‍රල් ෂෙඩ් එකේ විකුණන්න කොච්චර පිරිවැයක් යනවාද, ඒ පිරිවැයට අනුව මිල ගළපන්න ඕනෑ. ඒ මිල ගැළපීමේ සූත්‍රයට අපි එකඟයි. හැබැයි, ඒක තමන්ගේ ආර්ථිකයට ප්‍රබල ලෙස බාධාවක් ඇති වන යම් පාර්ශ්වයක් ඉන්නවා නම්, අපි ඒ වෙනුවෙන් සහනාධාරයක් දෙන්න ඕනෑ. අපි ධීවර ක්ෂේත්‍රයට භූමිතෙල් සහනාධාරයක් ලබා දෙනවා. මොකක් වෙනුවෙන්ද? මිල ගැළපුවාම ධීවර ක්ෂේත්‍රයේ කර්මාන්තයට බලපෑමක් ඇති වෙනවා. ඒ නිසා අපි සහනාධාරයක් දෙනවා. හැබැයි, ප්‍රතිපත්තියක් ලෙස නිෂ්පාදන පිරිවැයට අනුව මිල ගැළපීමේ අපි ඉන්නවා. ඒක ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට කියනවාද, නැද්ද කියන එක අදාළ නැහැ. ඒක කළ යුතු දෙයක්. කවුරු හරි කියනවාද ඒක වැරැදියි කියලා? 'මේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි; මේ, ඒකේ උගුලක්' කිව්වාම හරිද? ඒකේ උගුල නොවෙයි, මේ. මේක මොකක්ද? මේක අපේ ප්‍රතිපත්තිය. ඊට පසුව සමහරු හිතුවා විදුලි බිලේ ප්‍රශ්නය මත ඊළඟ අර්බුදය ඇති වේවි කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අද දින දිවා ආහාර විවේක කාලය ලබා නොගෙන සභාවේ වැඩකටයුතු පවත්වාගෙන යා යුතු යැයි මම යෝජනා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින දිවා ආහාර විවේකයෙන් තොරව රැස්වීම පවත්වාගෙන යෑමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ගරු කථානායකතුමනි, මම කියන්න හැදුවේ මේකයි. මේ විදුලි බිල පිළිබඳ ප්‍රශ්නයේදී ආණ්ඩුව කඩා වැටෙයි කියලා සමහරු කල්පනා කළා. එහෙම වෙන්නේ නැහැ. ඒක වුණේ නැහැ නේද? මොකද, අපි ඉතා හොඳින් විදුලිබල මණ්ඩලය පවත්වාගෙන **යනවා.** අපි ඔවුන් දිගටම කැඳෙව්වා. ඒ ආයතනයේ ගිණුම් පරීක්ෂා කර බලමින්, ඒවායේ ශේෂයන් බලමින්, ඒ ගිණුම්වල තිබෙන වියවුල්භාවය ගැන කල්පනා කරමින් අපි ඒවා අධ්‍යයනය කළා. අපි දිවා රෑ විදුලිබල මණ්ඩලය කැඳවා ඒ ගිණුම්වල ඇත්ත ශේෂයන් අධ්‍යයනය කළා. සමහර ඒවා හොයා ගන්න බැහැ. මොකද, ගිණුම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. සමහර ගිණුම්වල ස්ථාවර තැන්පතු; සමහර ගිණුම්වල OD. එහෙමයි ඒ ආයතන දුවලා තිබෙන්නේ. අපි අතිසමීපව අධ්‍යයනය කළා, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා; දත්ත, තොරතුරු, ගිණුම් තිබෙන්නේ කොහොමද කියලා. හැබැයි මම දැක්කා, විපක්ෂ නායකතුමා ආණ්ඩුවටත් කලින් විදුලි බිල ප්‍රකාශයට පත් කළා. සියයට 33යි කිව්වා. එතුමා දැන් අහගෙන ඉන්නවාද දන්නේ නැහැ. සියයට 33යි කිව්වා. හැබැයි, අපි හරියට අධ්‍යයනය කර බැලුවා ගිණුම්වල තත්ත්වය මොකක්ද කියලා. ගිණුම්වල තත්ත්වය බලලා, ඔරොත්තු දීමේ හැකියාව බලලා, ඉතිරි මාස හයේ පුරෝකථනය බලලා, වර්ෂාව කොච්චර ඒවිද, සුළං බලයෙන් කොච්චර විදුලිය නිපදවන්න පුළුවන්ද, ගල් අඟුරු කොච්චර පාවිච්චි කරන්න පුළුවන්ද ආදි වශයෙන් ඒ ඔක්කෝම බලලා අපි ඉතාම හොඳ සූත්‍රයකට අනුව විදුලි බිල තීරණය කළා. කුඩා වැඩිවීමක් සිද්ධ වුණා. ඇයි ඒ? වැඩි වෙන්නේ මොකක් නිසා ද දන්නවාද? විදුලි බිල මේ අවුරුද්දේ ජනවාරි මාසයේ සියයට 20කින් අඩු වුණා. පසුගිය අවුරුද්දේ ජුනි මාසයේ සියයට 23කින් අඩු වුණා. පසුගිය අවුරුද්දේ ජුනි වෙනකොට සියයට 23කින් අඩු වෙලා, මේ අවුරුද්දේ සියයට 20කින් අඩු වෙලා, සියයට 43කින් අඩු වුණා විදුලි බිලත්.

පසුගිය මාස හයේ විදුලි බිල අඩුවීමට හේතු සාධක වුණේ පුරෝකථනයේදී නොවෙයි. පසුගිය අවුරුද්දේ අඩු නොකරපු කාලයේ තිබුණු ලාභය ගෙනැල්ලා තමයි ඒක fix කළේ. දැන් ලාභයක් ගෙනෙන්න නැහැ. ඒවා තේරුම් ගන්න. 'වැඩි කළා' කියලා නිකම්ම කියන්න එපා, රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. දත්ත, තොරතුරු හා සිද්ධාන්ත මොනවාද කියලා හරයාත්මකව අධ්‍යයනයක් කරන්න. එහෙම අධ්‍යයනයක් කරලා කථා කරන්න. මොකද, පසුගිය අවුරුද්දේ ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා විදුලි බිල අඩු කළේ නැහැ, අඩු කරන්න තිබියදීත්. හැබැයි, රුපියල් බිලියන 41ක විතර ලාභයක් එහිදී ලැබුවා. අන්න ඒ බිලියන 41 මේ අවුරුද්දේ ජනවාරි සිට ජුනි මාසය දක්වා විදුලි බිලට පාරිභෝගිකයන්ට දෙන්න ඕනෑ කියලා අපි තීරණය කළා. විදුලි බිල අඩු වෙන්නේ පසුගිය අවුරුද්දේ සමාන්තර මාස හයේ ලාභය මේ අවුරුද්දට ගළපන නිසා. ඊළඟ මාස හයට ගළපා නැහැ. ගිය අවුරුද්දේ ජුනි මාසයේ විදුලි බිල සියයට 23කින් අඩු කළා. ඒ නිසා අවසන් මාස හයේ ලාභයක් ලබන්නේ නැහැ. ලාභයක් ගෙනැල්ලා ගළපන්නේ නැහැ. ඒක මතක තබා ගන්න. මේවා ඉතාම විද්‍යාත්මක ක්‍රමවේද. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, නිකම්ම ඔහේ නැඟිටලා 'වැඩි වුණා', 'අඩු වුණා' කියනවා. එහෙම 'වාඩි වුණා, නැඟිටුණා' වාගේ කථා නොවෙයි මේවා. මේවා ඊට වඩා එහා ගිය ආර්ථික සිද්ධාන්ත බව මතක තබා ගන්න. ඒ සිද්ධාන්තවල ඉඳන් අපි වැඩ කරනවා. ඒ නිසා අපි සමත් වෙලා තිබෙන්නේ කුමකටද? අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනත් එක්ක ඉදිරියට යමින් තිබෙනවා. එය බිඳ වැටීම් පිළිබඳ තමුන්නාන්සේලා අපේක්ෂා කළා නම්, ඒ අපේක්ෂාව යථාර්ථයක් වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඊළඟට අපි බාහිර වශයෙන් මුහුණ දෙන තුන්වැනි සාධකය තමයි GSP Plus බදු සහනය අහිමි වීම. 2027 අවසන් වනකොට, දැනට GSP Plus බදු සහනයේ ඇති එකඟතාව අවසන් වනවා. සාමාන්‍යයෙන් අපි අපේ අපනයනවලින් සියයට 23ක් විතර යවන්නේ යුරෝපා සංගමයේ රටවලට. යුරෝපා සංගමයේ රටවලට තමයි අපි අපේ අපනයනවලින් සියයට 23ක් විතර යවන්නේ. GSP බදු සහනය ගත්තොත්, HS codes 7100ක විතර, HS codes 6200ක වාගේ බදු සහනයක් යුරෝපා මාර්කට් එකේ අපට තිබෙනවා. ඒ නිසා මේ ආර්ථිකය තිබෙන තත්ත්වය අනුව එම බදු සහනය අහිමි වීමේ කම්පනයත් අපට කෙටි කාලයකට දරා ගන්න අමාරු වෙයි. ආර්ථිකය ස්ථාවර වුණොත්, අපට ඒක දරාගන්න පුළුවන්. නමුත්,

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

අපි තවමත් ආර්ථිකය ස්ථාවර කරමින්, ගොඩ නඟමින් යන ගමනක්, මෙය. ඒ වාගේ වෙලාවක එක්සත් ජනපදයේ බදු ප්‍රතිපත්තිය, ඒ වාගේ වෙලාවක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් විතැන් වීම, ඒ වාගේ වෙලාවක GSP Plus බදු සහනය අහිමි වීම යන සාධක අපේ ආර්ථිකයට විශාල කම්පනයක් ඇති කරනවා. ඒ නිසා අපි විශාල සාකච්ඡාවක යෙදෙමින් ඉන්නවා. යුරෝපා සංගමයට අප යවන අපනයනවලට අදාළව අපට ලැබෙන GSP Plus බදු සහනය පිළිබඳ එකඟතාව 2027 අග වන විට අවසන් වන නිසා GSP Plus බදු සහනය ආරක්ෂා කර ගැනීම සඳහා අපි ඔවුන් එක්ක සාකච්ඡා කරනවා. ඒ සාකච්ඡාවලදී අපි එකඟතාවලට ඇවිල්ලා තිබෙනවා. අපි ඉතාමත් හොඳ ස්ථාවරයක ඉන්නවා. මේ රටේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි විය යුතුයි. ඒක අපි ඉන්න ස්ථාවරයක්. Online Safety Act එක වෙනස් විය යුතුයි. එයත් අපි ඉන්න ස්ථාවරයක්. ඒ වාගේම, මේ රටේ සැඟවුණු ඝාතන සහ අපරාධ පිළිබඳව නිසි පරීක්ෂණ පැවැත්විය යුතුයි. ඒකත් අපේ ස්ථාවරයක්. අපි ඉතාම හොඳින් යුරෝපා සංගමයේ නියෝජිත මහත්වරුන් එක්ක සාකච්ඡා කළා. ඒක තමයි අපේ ආණ්ඩුවේ ස්ථාවරය. අපේ රටේ මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම මේ වෙලාවේ පවතින රජයේ වගකීම. ඒක අපි භාර ගන්නා වගකීම. මොකද, ඒක අපේ ආණ්ඩුවේ වගකීම.

අපට බාහිර පාර්ශ්වයකින් ඒක පෙන්වා දෙනවා නම්, අපි සතුටුයි. බාහිර පාර්ශ්වයක් ඒ පිළිබඳව අවධානය යොමු කරනවා නම්, අපි කැමැතියි. හැබැයි අපට වගකීමක් තිබෙනවා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සුරක්ෂිත කිරීමට. මා හිතනවා, ඒවා සුරක්ෂිත කිරීමේ ක්‍රියාමාර්ගය තුළ මෑත කාලයේ රජයක් ගත් ඉතා ඉදිරි පියවර අපි අරගෙන තිබෙනවා කියලා.

ඊළඟට, GSP බදු සහනය අවසන් වීම. මොකද, තව මාස 6කින් විතර ඕක කියන්න පටන් ගන්නවා. ඒකයි දැන්ම ම ඒ ගැනත් කියන්නේ. තව මාස 6කින් විතර කියන්න පටන් ගන්නවා, "යුරෝපා බදු සහනය අහිමි වෙනවා. 2027 අගවෙනකොට වැටෙයි" කියලා. ඒකයි මේ කියන්නේ හොඳද? ඒක වෙන්නේත් නැහැ. ඒ ගැනත් අපි ඉතා සාර්ථකව සාකච්ඡා පවත්වනවා. ඒ නිසා බාහිර වශයෙන් අපට ආපු අභියෝග, බාහිර පාර්ශ්ව සමඟ අපේ තිබෙන ගනුදෙනු, බාහිර බාර්ශ්ව එක්ක අපි විසඳා ගත යුතු කරුණු අපි ඉතා හොඳින් විසඳා ගන්න සමත් වෙමින්, මේ ආර්ථිකය කළමනාකරණය කරමින් තිබෙනවා. ඊට පස්සේ ඒකේ ප්‍රතිඵල බවට පත් වෙන්න ඕනෑ මොකක්ද?

මීට කලින් කථා කළ මන්ත්‍රීවරයා කිව්වා, පහළ ජනතාවට සහන යන්න ඕනෑ කියලා. ඔව්, ඒ පිළිබඳ ඉතාම අවංක වුවමනාවක් තිබෙන ආණ්ඩුවක්, මේක. ඒකත් මතක තබා ගන්න. හැබැයි, පහළ ජනතාවට ආර්ථික ප්‍රතිලාභ ගලා ගෙන යන්න කලින් හොඳ ආර්ථිකයක් ඕනෑ. හොඳ ආර්ථිකයක් නැතුව, ආර්ථිකයේ ශක්තිමත්භාවයක් නිර්මාණය කරගන්නේ නැතුව, ආර්ථිකය ලොකු කරගන්නේ නැතුව කොහොමද, පහළ ජනතාවට ආර්ථික ප්‍රතිලාභ ගලා ගෙන යන්නේ? පළමු අභියෝගය ආර්ථිකය ශක්තිමත්භාවයට පත් කර ගැනීමයි. එහෙම ගත්තාම, අර කරුණු 3න් අපි සාර්ථකභාවයට පත් වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් ගත්තාම අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, අපේ මහ බැංකුව ඇතුළු මුදල් අමාත්‍යාංශයට. මොකද, එම ආයතන සැලකිය යුතු ප්‍රමාණයකින් සමත් වෙලා තිබෙනවා, අවුරුද්දකට ආසන්න කාලයක් ඩොලරයේ වටිනාකම රුපියල් 300 සීමාවේ ආරක්ෂා කරගෙන යෑමට. ඒක වැදගත් සාධකයක් නොවෙයිද? තමුන්නාන්සේලා ආණ්ඩුවේ හිටපු කාලයේ අපිත් මේ පාර්ලිමේන්තුවේ හිටියා නේ. ඒ කාලයේ නිදා ගන්නකොට ඩොලරයේ වටිනාකම එක අගයක, නැඟිටිනකොට තව අගයක. මතකද සම්පත්ට? එහෙම රටක් තිබුණේ.

ඒ කාලයේ ඩොලරය පිළිබඳ විශාල අවිනිශ්චිතතාවක් නිර්මාණය වුණා. එම අවිනිශ්චිතතාවේ ප්‍රතිඵලය බවට පත් වුණේ මොකක්ද? රුපියල් 400ට ඩොලරයේ අගය ඉහළ යයි කියලා සැකයක් ඇති වුණා. විශාල කළු ආර්ථිකයක් - black market එකක් - නිර්මාණය වුණා. ඩොලරයේ වටිනාකම ඉහළ දැමීම, එක්රැස් කර ගැනීම, උණ්ඩියල් යනාදී ඉතා කළු ආර්ථිකයක් මේ විනිමයත් එක්ක ගොඩ නැඟුණා. අද ඒ කළු ආර්ථිකය කුඩා වෙමින් තිබෙනවා. මා කියන්නේ නැහැ, මුළුමනින්ම අහෝසි වෙලා කියලා. හැබැයි, කුඩා වෙමින් තිබෙනවා. ඇයි? විනිමය අනුපාතිකය පිළිබඳ ස්ථාවරයක් තමයි විනිමය කළු ආර්ථිකය දුර්වල කරන්නේ. විනිමය අනුපාතිකය පිළිබඳ තිබෙන අස්ථාවරභාවය හැම වෙලාවේම විනිමය පිළිබඳ විශාල කළු ආර්ථිකයක් හදනවා. එහෙම කළු ආර්ථිකයක් තිබුණේ නැද්ද? බැංකුවලට ගිහිල්ලා ඩොලර් මාරු කරනවාට වඩා, කළේ මොකක්ද? අපේ නයන දන්නවා, ඩොලර් ගැන ගොඩක් දේවල්. ඩොලර් මාරු කරනකොට කොහෙන්ද මාරු කළේ? දන්නවා නේ. කළු ආර්ථිකයෙන් මාරු කළා. ඇයි, කළු ආර්ථිකයෙන් මාරු කරන්නේ? ඩොලරය පිළිබඳ අවිනිශ්චිතතාවක් ආවා. හැබැයි, අද කිසිදු කර්මාන්තකරුවෙක්, මූල්‍ය විශේෂඥයෙක්, මූල්‍ය පද්ධතියට සම්බන්ධ වෙන කෙනෙක්, පුරවැසියෙක් ඩොලරය පිළිබඳව අවිනිශ්චිතතාවක නැහැ. ඒක ආර්ථිකයේ වැදගත් සාධකයක්. මතක තබා ගන්න, ලංකාවේ පළමු වතාවට අවුරුද්දකට ආසන්න කාලයක් ඩොලරයේ වටිනාකම ස්ථාවර අගයක තබා ගෙන තිබෙනවා. ඒක වැදගත් සාධකයක්. ඇයි ඒ? අපි දන්නවා, අපට තිබෙන ඩොලර් ප්‍රභව මොනවාද කියලා. ඩොලර් ප්‍රභව ගත්තොත්, අපට ප්‍රධාන වශයෙන් අපේ අපනයනවලින් ඩොලර් එනවා. අපනයන ආදායම කියන්නේ එක් ප්‍රධාන ආදායමක්. අපනයන ආදායමට කුමක්ද සිදු වී තිබෙන්නේ? මම ඒ ගැන කියන්න සතුටුයි. මා ළඟ 2015 ඉඳලා 2025 දක්වා දත්ත තිබෙනවා. අවුරුදු 11ක පමණ දත්ත තිබෙනවා. අවුරුදු 11ක දත්ත අනුව බැලුවාම මේ අවුරුද්දේ ජනවාරි සිට ජූනි මාසය දක්වා වූ කාලය තමයි ලංකා ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම උපයපු මාස 6. එතකොට කොහොමද ආර්ථිකයක් වැටෙන්නේ? සාමාන්‍යයෙන් ගත්තොත්, ගිය අවුරුද්දේ මුල් මාස 6 තුළ උපයා තිබෙන අපනයන ආදායම බිලියන 7.8යි. මේ අවුරුද්දේ මුල් මාස 6 තුළ බිලියන 8.4යි. මිලියන 600කට වඩා වැඩියි. මාස 6ක් ඇතුළත මිලියන 600කට වඩා වැඩි අපනයන ආදායමක් උපයාගෙන තිබෙනවා. ඒක වර්ධනයක්. ඒක තමයි ඩොලරයේ වටිනාකම ස්ථාවර වීමේ සාධකය. අපි අපනයන වෙළෙඳ පොළ ජයග්‍රහණය කරමින් තිබෙනවා.

ඒ වාගේම මම ඔබතුමන්ලාට කියන්න කැමැතියි, අපි අපනයන වෙළෙඳ පොළ විවිධාංගීකරණය කරමින් තිබෙන බව. අපනයනය කරන භාණ්ඩ විවිධාංගීකරණය කරන්න ඕනෑ, වෙළෙඳ පොළ විවිධාංගීකරණය කරන්නත් ඕනෑ. මම කලින් කියපු විධියට අපේ අපනයනවලින් සියයට 25ක් යන්නේ එක්සත් ජනපදයට. අපේ අපනයනවලින් සියයට 23ක් යන්නේ යුරෝපා සංගමයට. ඒ, එක්සත් රාජධානිය හැර. අපේ අපනයන ආදායමින් සියයට 48ක්ම තිබෙන්නේ යුරෝපා සංගමය සහ එක්සත් ජනපදය මත. එතකොට ඒවායේ ඇති වන ඕනෑම විචලනයක්, අර්බුදයක් අපේ රටට මාරාන්තික අර්බුද ගෙනැවිත් දෙනවා. ඒ නිසා අපේ රටේ ආර්ථිකය, අපේ රටේ අපනයන විවිධාංගීකරණය පැතිරෙන්න ඕනෑ තවත් රාජ්‍යයන් වෙත. මම කියන්න කැමැතියි, ගිය අවුරුද්දේ ජූනි මාසය දක්වා වූ මුල් මාස 6ත්, මේ අවුරුද්දේ මුල් මාස 6ත් සංසන්දනය කර බලන කොට, එක්සත් ජනපදය හැර යුරෝපා සංගමයේ මාර්කට් එක තුළ අපේ අපනයනවල සියයට 11ක වර්ධනයක් පෙන්නුම් කර තිබෙන බව. ජූනි මාසයේ විතරක් සංසන්දය කළොත්, ගිය අවුරුද්දේ ජූනි මාසයේ හා මේ අවුරුද්දේ ජූනි මාසයේ බැලුවොත්, යුරෝපා සංගමයට කරපු අපේ අපනයන වැඩි කරගෙන තිබෙනවා සියයට 23කින්. ඒවා වැදගත්.

ඊළඟට, අප්‍රිකානු රටවල්. අපි අලුත් වෙළෙඳ පොළවල් හොයන්න ඕනෑ. අපි රටවල් දෙක තුනක් මත, භාණ්ඩ කිහිපයක් මත අපනයන වෙළෙඳ පොළ පවත්වා ගෙන ගිහින් හරියන්නේ නැහැ. අපි අලුත් වෙළෙඳ පොළ හොයන්න ඕනෑ. අපි කවුරුත් දන්නවා, අප්‍රිකානු කලාපයේ අලුත් වෙළෙඳ පොළක් වේගයෙන් වර්ධනය වෙමින් තිබෙන බව. අපි කියන්න කැමැතියි, ගිය අවුරුද්දේ මුල් මාස හයයි, මේ අවුරුද්දේ මුල් මාස හයයි දිහා බැලුවාම, අප්‍රිකානු කලාපයට කරපු අපේ අපනයන සියයට 35කින් වැඩි කරගෙන තිබෙන බව. පසුගිය ජූනි මාසයේ විතරක් අපි සියයට 58කින් වැඩි කරගෙන තිබෙනවා. ගිය අවුරුද්දේ ජූනි මාසයත්, මේ අවුරුද්දේ ජූනි මාසයත් බැලුවොත්, අපි අප්‍රිකානු වෙළෙඳ පොළේ මාර්කට් එක සියයට 58කින් වැඩි කරගෙන තිබෙනවා. මේවා ආර්ථිකයේ සාධක නොවෙයිද? ඒ වාගේම අග්නිදිග ආසියානු රටවල් ගත්තොත්, අපි ජූනි මාසයේ සියයට 30කින් මාර්කට් එක වැඩි කරගෙන තිබෙනවා. මුල් මාස හය සංසන්දනය කරලා බැලුවොත්, සියයට 22කින් වැඩි කරගෙන තිබෙනවා. මම කියන්න කැමැතියි, ආසියාතික රටවල් අතරින් ඉන්දියාව ගැන. ගිය අවුරුද්දේ මුල් මාස හයත්, මේ අවුරුද්දේ මුල් මාස හයත් සංසන්දනය කරලා බැලුවොත්, ගිය අවුරුද්දේ මුල් මාස හයට සාපේක්ෂව ඉන්දියාවේ වෙළෙඳ පොළට අපේ අපනයන සියයට 26කින් වැඩි කරගෙන තිබෙනවා. ඒ විධියට අපනයනවලට ඉතා හොඳ ස්ථාවරයක් අපි නිර්මාණය කරගෙන තිබෙනවා. තව අර්බුද තිබෙනවා. අපි අපේ කර්මාන්තකරුවන් සම්බන්ධයෙන් තව විසඳිය යුතු දේ තිබෙනවා.

ඊයේත් අපේ කර්මාන්ත අමාත්‍යාංශය භාර නියෝජ්‍ය අමාත්‍යතුමා මේ කරුණු පැහැදිලි කළා. සමහර කර්මාන්තවලට තෙකලා විදුලිය ඔවුන්ම ගෙවලා ගන්න ඕනෑ. සමහර විට ජල පහසුකම් ඔවුන් ගෙවලා ගන්න ඕනෑ. නැත්නම් නතර කරනවා. විදුලිය අනෙක් යටිතල පහසුකම් සියල්ල කර්මාන්තකරුවාට ආණ්ඩුව ලබා දෙනවා. හැබැයි, කර්මාන්තකරුවා විසින් නිසි බදු ප්‍රමාණය ගෙවිය යුතුයි. එච්චරයි කරන්න තිබෙන්නේ. නිසි බදු ප්‍රමාණය කර්මාන්තකරුවා විසින් ගෙවන්න, අපි අනෙක් ඔක්කොම යටිතල පහසුකම් දෙනවා. අපි අපනයන වෙළෙඳ පොළ විවිධාංගීකරණය කරනවා. වෙළෙඳ පොළ විවිධාංගීකරණය කිරීමත්, භාණ්ඩ විවිධාංගීකරණය කිරීමත් දෙකටම අපි ප්‍රවිෂ්ට වෙලා තිබෙනවා. මම දැක්කා, අපි මොනවාද කරන්නේ කියලා කවුද ඇහුවා. ඒවා තමයි කරන්නේ රටක ආර්ථිකය වෙනුවෙන්.

ඊළඟ වැදගත් සාධකය මොකක්ද? ඊළඟ වැදගත් සාධකය තමයි, අපේ රටේ සංචාරක කර්මාන්තය. සංචාරක කර්මාන්තය ගත්තොත්, ගිය අවුරුද්දේ මුල් මාස හයේ ආදායම හා සංසන්දනය කරනකොට මේ අවුරුද්දේ මුල් මාස හයේ සියයට 10ක වර්ධනයක් තිබෙනවා. මා හිතනවා, සංචාරක කර්මාන්තයේ වැඩිම වර්ධනය පටන් ගන්නේ, සැප්තැම්බර්, ඔක්තෝබර් මාස වෙනකොට කියලා. ඒ නිසා අපි අපේක්ෂා කරනවා, ලංකා ඉතිහාසයේ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් ආපු වසර බවට මේ වසර පත් කරන්න. එය ලංකා ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම උපයා ගත් වසර බවට මේ වසර පත් වෙනවා.

ඊළඟට, විදෙස් සංක්‍රාම. විදෙස්ගතවී සිටින ශ්‍රී ලාංකිකයන් අපට ක්ෂණිකව එවන සංක්‍රාම තමයි, අපේ ආර්ථිකයට වැදගත්ම සාධකය වන්නේ. අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපේ විදෙස් සංක්‍රාම ගත්තොත්, 2023 මුළු අවුරුද්දේම ඇමෙරිකානු ඩොලර් බිලියන 5.9යි. 2024 මුළු අවුරුද්දේම ඩොලර් බිලියන 6.5යි. මේ අවුරුද්දේ මුල් මාස හයේ විතරක් ඩොලර් බිලියන 3.7යි. අපි කවුරුත් දන්නවා, සැප්තැම්බර්, ඔක්තෝබර්, දෙසැම්බර් මාස වෙනකොට විදේශ සංක්‍රාමවල වැඩිවීමක් තිබෙන බව. ඒ නිසා අපි කියන්න කැමැතියි, ලංකා ඉතිහාසයේ වැඩිම විදෙස් සංක්‍රාම ආපු අවුරුද්ද බවට මේ අවුරුද්ද පත් වෙන බව. ඉතින් කොහේද වැටෙන්නේ කියලා මම අහනවා. මම පස්සේ නැවත ඒ ගැන කියන්නම්.

ඊළඟට අපට වැදගත්ම සාධකය තමයි, සෘජු විදෙස් ආයෝජන. දීර්ඝ කාලයක් තිස්සේ හැම පක්ෂයක්ම මැතිවරණ වේදිකාවේදී සෘජු විදෙස් ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරලා තිබුණා. ඒක කවුරුත් ප්‍රතිපත්තියක් හැටියට පිළිගන්නවා. සෘජු විදෙස් ආයෝජන අවශ්‍යයි. අපි විශාල අමුද්‍රව්‍ය තිබෙන රාජ්‍යයක්, අපි විශාල වෙළෙඳ පොළක් තිබෙන රාජ්‍යයක් නොවෙයි. ඒ නිසා සෘජු විදෙස් ආයෝජන අපට කැඳවා ගන්න වෙන්නේ ම, අසීරුතා එක්ක. ඒ නිසා අපි සෘජු විදෙස් ආයෝජන වෙනුවෙන් යම් සහනයක් ලබා දිය යුතුයි. එහෙම නැති වුණොත් අපේ විශේෂයක් වෙන්නේ නැහැ. ඒ නිසා යම් සහනයක් ලබා දෙමින්, සෘජු විදෙස් ආයෝජන කැඳවා ගැනීම සඳහා අපි කටයුතු කරමින් තිබෙනවා. එහෙම ගත්තාම මම කියන්න කැමැතියි, ගිය අවුරුද්දේ මුල් මාස හයේ සෘජු විදෙස් ආයෝජන ඇමෙරිකානු ඩොලර් මිලියන 252යි. මේ අවුරුද්දේ මුල් මාස හයේ සෘජු විදෙස් ආයෝජන ඩොලර් මිලියන 507යි. ගිය අවුරුද්ද හා සංසන්දනය කරලා බලනකොට මේ අවුරුද්දේ සියයට 101ක වර්ධනයක් තිබෙනවා. සෘජු විදෙස් ආයෝජනවල දෙගුණයක වර්ධනයක් තිබෙනවා.

මම කැමැතියි, අපේ ආයෝජන මණ්ඩලයේ නිලධාරි මහත්වරු ගැනත් කියන්න. ස්වේච්ඡාවෙන් වැඩ කරන සභාපතිවරයෙක් ඉන්නවා. එතුමා ස්වේච්ඡාවෙන් වැඩ කරන්නේ. වැටුප් ගන්නේ නැතුව වැඩ කරනවා, ඒ මිනිස්සු. දිවා රෑ නොබලා වැඩ කරලා ආයෝජන ගෙන්වා ගැනීම සඳහා කටයුතු කරමින් සිටිනවා. මේ වසර තුළ බිලියනයත්, බිලියන එකහමාරත් අතර ආයෝජන, සෘජු විදේශ ආයෝජන හැටියට BoI එක හරහා ගෙන්වීමට අපි අපේක්ෂා කරනවා.

ඒ වාගේම කොළඹ නගර ව්‍යාපෘතිය ගත්තොත්, විශාල කාන්තාරයක් තිබෙන්නේ. මේ Port City එක ගොඩ කරලා තිබෙන්නේ, දැන් හදන්න ඕනෑ. මේක හදන්නේ නැතුව බැහැ නේ. අපි පසුගියදා Port City එකට ව්‍යාපෘති හතරක් සම්මත කරලා දුන්නා. එක ව්‍යාපෘතියක් ඩොලර් මිලියන 518යි. අනෙක් ව්‍යාපෘතිය ඩොලර් මිලියන 143යි. අනෙක් ව්‍යාපෘතිය ඩොලර් මිලියන 112යි. අනෙක් ව්‍යාපෘතිය ඩොලර් මිලියන 540යි. මේ ව්‍යාපෘතිවල එකතුව ගත්තාම ඩොලර් මිලියන 1,313යි. ඒවා සෘජු විදේශ ආයෝජන, වරාය නගරය හරහා ලැබෙන. ඒක මතක තියාගන්න. ඒ කොහොමද? ඒවා හදලා ගොඩක් කල්. මේ විධියටම අපි සැලසුම් හදලා තිබෙනවා. දැන් පාළු වෙලා තිබෙන මත්තල පුරවන්නේ කොහොමද? ඒ සඳහා සැලසුම් හදනවා. මොකද, දැන් ඒවා වහන්න බැහැ; නතර කරන්න බැහැ. ඒවා කාන්තාර හැටියට තියන්න බැහැ. මේවා දැන්වත් සංවර්ධනයට උපයෝගී කර ගන්න ඕනෑ. මේවාට මහජනයාගේ ධනය වැය කරලා තිබෙනවා. Port City එක, මත්තල ගුවන් තොටුපළ ආදී සියල්ල කාන්තාර. අපි මේවා ගොඩ නඟනවා. ඒක මතක තබා ගන්න. අපට තිබෙන්නේ විනාශයේ බරවලින් මේ රට සමෘද්ධිය කරා ගෙන යන්නයි. විනාශයේ බරත් දරාගෙන අපි වැඩ කරමින් ඉන්නවා. ඉතාම හොඳ ඩොලර් සංචිතයක් අපට නිර්මාණය කර ගත හැකියි. අපේ අපේක්ෂාව තිබෙනවා, ඩොලර් බිලියන 7 ඉක්ම වන විදෙස් සංචිතයක් මේ දෙසැම්බර් මාසය වෙනකොට ආරම්භ කරන්න. ඩොලර් බිලියන හතකට වැඩි සංචිතයක් අපි ආරම්භ කරනවා. මොන තත්ත්වයක් ඇතුළේද අපි මේ නිර්මාණය කරලා තිබෙන්නේ?

අවුරුදු පහකට පස්සේ වාහන වෙළෙඳ පොළ විවෘත කළා. මෙතැන බොහෝ අය කියපු දේවල් මට මතකයි. ඔහොම වාහන එන්නේ නැහැ, ඔහොම ගේන්න හැකියාවක් නැහැ කියලා කිව්වා. දැන් මොකද වෙලා තිබෙන්නේ? ඊයේ වෙනකොට, මේ වාහන සඳහා ඩොලර් මිලියන 1,267ක LCs open කරලා තිබෙනවා. ඒක 2022 පැවැති ආර්ථිකයේ ඩොලරයට තිබුණු බලපෑමක් නොවෙයි.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

2023 ඒ බර ආවේ නැහැ. 2024 ඒ බර ආවේ නැහැ. හැබැයි, අපි දැන් ඒ බර අරගෙන තිබෙනවා. අපි දන්නවා, අපේ රටේ අවුරුදු 15, 20 පැරණි වාහන තිබෙනවා කියලා. ඒවා දුවන්න බැහැ. ඒවායේ නඩත්තු වියදම් වැඩියි. වාහන කියන්නෙත් කර්මාන්තයක්. ඒ නිසා රටේ ආර්ථිකයට අපි ඒක සම්බන්ධ කරගන්න ඕනෑ. අපට එය විශාල ආදායම් ප්‍රභවයක්. අපි ඒක සම්බන්ධ කරගන්න ඕනෑ. ඩොලර් මිලියන 1,260ක ණයවර ලිපි මේ වෙනකොට නිකුත් කරලා තිබෙනවා. අපි අපේක්ෂා කරනවා, මේ දෙසැම්බර් වෙනකොට ඩොලර් මිලියන 1,500ක්, 1,800ක් වාගේ ප්‍රමාණයකින් LCs open කරයි කියලා. හැබැයි, මෙතැනත් කුමන්ත්‍රණයක් තිබෙනවා. මම ඒක කියන්න ඕනෑ. මතයක් හදනවා, දැන් මේක වහන්න හදන්නේ කියලා. නැහැ, වහන්නේ නැහැ. ඒක මතක තියාගන්න. මේක වහන්න හදනවා කියලා, පසුව වාහන ගන්න ඉන්න කට්ටියත් වෙළෙඳ පොළට කැඳවන්න කුමන්ත්‍රණයක් තිබෙනවා. මේ තර්ජනය මෙතැනට දෙන්න හදනවා, ඩොලර්වලට බලපෑම් ඇති කරන්න. මම දැක්කා, ගොඩක් අය ප්‍රවෘත්ති - news - හදනවා; මාධ්‍ය සාකච්ඡාවලින් කියනවා, වාහන ආනයනය සීමා කරන්න, නතර කරන්න හදන්නේ කියලා. එතකොට මොකද කරන්නේ? ලබන අවුරුද්දේ වාහනයක් ගන්න ඉන්න කෙනාත් මේ අවුරුද්දේ ගන්න උත්සාහ කරනවා. ඇයි ඒ? ඩොලරයට බලපෑම් ඇති කරවන්න; තර්ජන ඇති කරවන්න. ඒ නිසා අපි මේ රටේ පුරවැසියන් සියලු දෙනාට කියනවා, අපි වාහන ආනයනය සීමා කරන්නේ නැහැ, විවෘත කරන ලද වෙළෙඳ පොළ මේ විධියටම පවත්වා ගෙන යනවා කියලා. ඔබට මේ අවුරුද්දේ ගන්න හැකියාවක් නැත්නම් ලබන අවුරුද්දේ ගත හැකියි. හැබැයි තමුන්නාන්සේලා මතයක් හදනවා, වාහන වෙළෙඳ පොළ වහන්න යන්නේ කියලා. ඒ කියන්නේ මේ වෙලාවේ ගිහින් LCs විවෘත කරන්න, මේ වෙලාවේ ගන්න කියලා. මේ තර්ජනය ඇති කරන්නේ ආර්ථිකයට. ඒ කැත වැඩේ යෙදෙන්න එපා කියලා මම කියනවා.

ඊළඟට කියන්නේ මොකක්ද? බදු වැඩි කරයි, බදු වැඩි කරයි කියලා. අපි කවුරුත් පිළිගන්නවා, මේ වෙලාවේ තිබෙන බද්ද විශාලයි කියලා. වාහනයකට තවත් කොහොමද බදු වැඩි කරන්නේ? ඒ නිසා අපි කිසිදු බදු වැඩි කිරීමක් කරන්නේ නැහැ. මේ විවෘත කරන ලද වාහන වෙළෙඳ පොළ මේ විධියටම අඛණ්ඩව පවත්වා ගෙන යෑම තමයි අපේ ආණ්ඩුවේ අපේක්ෂාව. ඩොලර් මිලියන 1,800ක විතර අමතර වැය බරක් අපට දරන්න සිදුවේවි. හැබැයි, ඒ සඳහා අපි ඩොලර් උපයා ගන්නවා. ආර්ථිකය වහලා, ආර්ථිකයේ කර්මාන්ත අවස්ථාවන් වහලා ආර්ථිකයක් ඉදිරියට යන්නේ නැහැ. අපේ අපේක්ෂාව තමයි ආර්ථිකයට අවශ්‍ය නිදහස් චලනය උපරිම වශයෙන් දෙන්න ඕනෑය කියන එක. බැරියර්, සීමාවන් දාලා ආර්ථිකයක් ගොඩගන්න බැහැ. ඒක හරි, වැටිච්ච වෙලාවක හුස්ම ගන්න. හැබැයි, ගොඩ නඟන වෙලාවක ආර්ථිකයේ නිදහස්භාවය අපි නිර්මාණය කරන්න ඕනෑ. අපි ඒක නිර්මාණය කරලා තිබෙනවා. ඒ නිසා ඩොලර් සංචිත පිළිබඳ තමුන්නාන්සේලා හදන සැකය, අවිශ්වාසය, සිද්ධ වෙන දෙයක් නොවෙයි.

ඊළඟට ප්‍රධාන වශයෙන් ගත්තොත්, මේ හා සමානවම අපි ආයෝජන මණ්ඩලය හරහා දේශීය ආයෝජනත් වැඩිකරගෙන තිබෙනවා. සාමාන්‍යයෙන් ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ සියයට 18ක දේශීය ආයෝජන වැඩි වෙලා තිබෙනවා, ආයෝජන මණ්ඩලය - BoI - හරහා. එතකොට ආයෝජන වැඩි වෙලා තිබෙනවා. ඒකෙන් තමයි රැකියා නිර්මාණය වෙන්නේ, ඒකෙන් තමයි ආර්ථිකයේ වර්ධනයක් ඇති වෙන්නේ. අපේ ආර්ථිකයේ ඩොලර්, විදේශ විනිමය, සෘජු විදේශ ආයෝජන, සංක්‍රාම, සංචාරක කර්මාන්තය, අපනයන ආදායම කියන මේ සියල්ලගෙන්ම ලංකාවේ හොඳම අවුරුද්ද බවට මෙය පත් වෙන බවට මේ මාස හය සංඥා දීලා තිබෙනවා. මේක තවත් වර්ධනය වෙනකොට ආපස්සට යන්නේ නැති බවක් මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි.

අපි අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට ආසන්න වශයෙන් ට්‍රිලියන 4.5ක - බිලියන 4,500ක - ආදායමක් අපේක්ෂා කළා. මට මතකයි මේ පාර්ලිමේන්තුවේදී බොහෝ අය කිව්වා, මේ ආදායම කවදාවත් සපුරා ගන්න පුළුවන් ආදායමක් නොවෙයි, ඒක මිරිඟුවක්, ඒක උටෝපියාවක්, ඒක ආණ්ඩුව දන්න ඇතුළේ කරන විජ්ජාවක් කියලා. හැබැයි, අපේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව ඉතා හොඳින් ප්‍රතිව්‍යුහගත කිරීමකට භාජන කරලා, ඒවා කාර්යක්ෂමතාවට ගෙනැල්ලා, බදු මඟ හැරලා සිටින අයව බදු ගෙවීම සඳහා පොළඹවා ගත හැකි බවට අපට ලොකු විශ්වාසයක් තිබුණා.

මෑත කාලයේ ලංකාවේ බදු ගෙවීම් මග හැරපු ප්‍රධානම දෙසීයදෙනාගේ ලේඛනය මා ළඟ තිබෙනවා. භය වෙන්න එපා, ඔබතුමන්ලාගේ මේ මුහුණුවලින් එක නමක්වත් මේකේ නැහැ. වෙන මුහුණක් තිබුණා නම් මම කියනවා. 200 ගාණක් තිබෙනවා. එහි සමස්ත වටිනාකම බිලියන 100කට, 150කට ආසන්න මුදලක්. අපි ඒක අය කර ගන්න ඕනෑ. ඒක වැරදියි කියලා කවුරුවත් කියනවාද?

රාජ්‍ය බැංකු දෙකට ඉතාම අහිතකර ආකාරයෙන් පොලු තියපු කණ්ඩායම් ඉන්නවා. මම ප්‍රධාන පණිහ ගැන සොයා බලා, වාර්තා ගෙන්වා ගත්තා. විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒක අස්සේ දේශපාලනඥයනුත් ඉන්නවා. ඉතාම සමීපතම ව්‍යාපාරිකයන් ඉන්නවා, බිලියන ගණන් රාජ්‍ය බැංකුවලට ණය පොලු තියපු. කියන්නත් දෙයක්ද, හම්බන්තොට ණය දුන්නා පන්සලේ ඉඩම උගසට අරගෙන. පන්සලේ ඉඩමට ණය දුන්නා, ව්‍යාපාරිකයන්ට. වීරකැටියට ආසන්න විහාරයක ඔප්පුව තමයි බැංකුවට තිබ්බේ. එහෙමයි සිද්ධ වුණේ. හැබැයි අපි විනිවිදභාවය ඇති කරලා තිබෙනවා. බැංකුවලට ස්වාධීනත්වය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඉතාම හොඳ මහත්වරු පත් කරලා තිබෙනවා. ලංකා බැංකුවේ සභාපතිවරයා ස්වේච්ඡාවෙන් වැඩ කරනවා. ඉතාම හොඳ වරප්‍රසාද ගත හැකි කෙනෙක් Port City එකේ සභාපතිවරයා. එතුමා ස්වේච්ඡාවෙන් වැඩ කරනවා, වාහනයක් ගන්නේ නැහැ, දීමනාවක් ගන්නේ නැහැ. කුමක් වෙනුවෙන්ද? මේ රට ගොඩ නැඟීම සඳහා ඒ ක්ෂේත්‍රවල අත්දැකීම්, හැකියාවන් තිබෙන මිනිස්සු පොරබදලා එකතු වෙමින් සිටිනවා. දූෂිත ආණ්ඩුවකට කවුරුවත් ස්වේච්ඡාවෙන් වැඩ කරන්න එන්නේ නැහැ. එන කෙනා එන්නෙත් කීයක් හරි ගහගන්න බලාගෙන, එයත් ගහනවා, මටත් ගහන්න පුළුවන් කියලා.

තමුන්නාන්සේලා දැන් කන්ටේනර් කථාවක් කියනවා. මොනවාද මේ කන්ටේනර් කථා? තමුන්නාන්සේලා හිතනවාද අපේ බිමල් රත්නායක සහෝදරයා කන්ටේනර් හොරකම් කරනවා කියලා? මොනවාද මේ කියන්නේ? අඩුම තරමින් කෙනෙකුගේ ඉතිහාසය කුමක්ද, දේශපාලනය මොකක්ද, මොකක් වෙනුවෙන්ද වැඩ කරලා තිබෙන්නේ කියලා බලලා මිනිස්සු ගැන මනින්න. එහෙම ඉතිහාසය ගැන මැනපු මිනිස්සුත් ඉන්නවා, ඉතිහාසය ගැන නරක ලෙස මැනපු මිනිස්සුත් ඉන්නවා, තමුන්නාන්සේලාගේ. අපි දන්නවා, හොඳ ලෙස අයත් ඉන්නවා. හැබැයි, නරක ලෙස අයත් ඉන්නවා. එහෙම ඇඟිලි දිගු කරන්න එපා කාටවත්. තමුන්නාන්සේලා ඇත්ත චෝදනාවක් ගේන්න.

මම මුදල් අමාත්‍යාංශය හරහා කමිටුවක් පත් කළා. ඒ කමිටුවෙන් අපට වාර්තාවක් ලබා දීලා තිබෙනවා. සමහර අය ඒ

වාර්තාවට අත්සන් කළා, සමහර අය ප්‍රතික්ෂේප කළා. එතකොට ඒ වාර්තාව මුළුමනින්ම කමිටුව පිළිගන්නේ නැති වාර්තාවක්. නමුත් මම විසින් ඒක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරලා තිබෙනවා. වරදක් වෙලා තිබෙනවා නම් කොයි ආයතනයද කියන එක අපි සැලකිල්ලට භාජන කරන්නේ නැහැ. මොකද, මේක පළමු වතාවට නොවෙයි සිද්ධ වෙලා තිබෙන්නේ. 13 වතාවක් ඒ ක්‍රියාදාමය සිද්ධ වෙලා තිබෙනවා. 13 වතාවෙන් තමුන්නාන්සේලා අල්ලා ගන්නේ 13වෙනි එක. ඇයි? 12වෙනි එක අල්ලා ගත්තොත් තමුන්නාන්සේලාත් ඉන්නවා. ඒකයි ඇත්ත කථාව. Press conferences නම් කීයක් තියන්න ඇතිද මේකට? රූපවාහිනී නාළිකාවලට තමන්ගේ ගුවන් කාලය එක සැරයක්ද දුන්නේ, දෙසැරයක්ද දුන්නේ, press conferences කීයක් තියලා ඇතිද කියලා සොයලා බලන්න මම ගියා. කී දෙනෙකු ඒ ගැන කියලා ඇද්ද? එක්කෙනෙකු නිල් පාට බැනර් එකක් තියාගෙන කියනවා, තව කෙනෙක් දම් පාට බැනර් එකක් තියාගෙන කියනවා, තව කෙනෙක් කහ පාට බැනර් එකක් තියාගෙන කියනවා, තව කෙනෙක් ගෙදර සාලේ මැද ඉඳගෙන කියනවා; පිස්සුවක්. එහෙම මාධ්‍ය සාකච්ඡා තියනවාද? අපි නම් දේශපාලන ව්‍යාපාරයක් විධියට දැනුම් දීලා, අපේ පැලවත්ත කාර්යාලයේ වාඩි වෙලා ඉතා හොඳ මාධ්‍ය සාකච්ඡා කරනවා. ඔබතුමන්ලා එහෙමද? ගෙදර එක්කෙනෙක් කියනවා, හෝටලයේ තව කෙනෙක් කියනවා, පාරේ යනකොට තව කෙනෙක් කියනවා, සිරිකොතේ තව කෙනෙක් කියනවා, තමුන්නාන්සේලාගේ කාර්යාලයේ තව කෙනෙක් කියනවා, පොහොට්ටුවේ කාර්යාලයේ තව කෙනෙක් කියනවා, බොරුවක්; බොරුවක්. බොරුව දැන දැන කියනවා. ඒවායින් ස්වයං තෘප්තියක් ලබා ගන්න පුළුවන්.

මෙහිදී ඇත්තටම සිදු වී තිබෙන්නේ මොකක්ද? ඒ විධියට කන්ටේනර් නිදහස් කිරීම 13 වතාවක් සිදු වී තිබෙනවා. ඒක වරායේ තදබදයක් ඇති වුණාම ඔවුන් කළ practice එකක්. ඒක හොඳද, නරකද කියලා අපි ප්‍රශ්න කරනවා. ඒක හරිද, වැරදිද කියලා බලමු. හැබැයි, ඒක තමයි ඔවුන් උපයෝගී කරගත්ත ක්‍රියාදාමය. ඒ පළමුවෙනි වතාව නොවෙයි, ඊට කලින් 12 වතාවක් සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි 13වෙනි වතාවට අපේ වරාය ඇමතිතුමා මැදිහත් වුණාය, එතුමා ඒක කළාය, අරයාගේ කන්ටේනර් තිබුණාය කිව්වා. ඇත්තටම ඔය කන්ටේනර් අයිති ගොඩක් අය අපි හඳුනන්නේත් නැහැ. කාගේද කියලා නම්වලින් කිව්වාම තමයි අපි ඒ කොම්පැනි ගැන දන්නේත්. මම මේ කියන්නේ ඇත්ත. අපි ඒගොල්ලන් එක්ක එහෙම සමීප නැහැ. අපි ඒගොල්ලන්ට ආර්ථිකය හදන්න දීලා තිබෙනවා, ඊට අවශ්‍ය සහාය දීලා තිබෙනවා. සමාගම මොකක්ද, අයිති කාටද කියලා අපි දන්නේ නැහැ. සමහර විට සමහරුන්ට පාට කිව්වාම කියන්න පුළුවන් සමාගම පිළිබඳව. අපි ඒවා දන්නේ නැහැ. අපට ඒවා වැඩක් නැහැ. හැබැයි, තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? මම මේ කියන්නේ මොකක්ද? ආදායම් පැත්තෙන් ගත්තොත්, ආර්ථිකයේ ඉතාම හොඳ ස්ථාවරයකට අපි ඇවිල්ලා තිබෙනවා. සියලු ක්ෂේත්‍රවල ආදායම් ඉලක්ක ඉක්මවා යන්න අපි සමත් වෙලා තිබෙනවා. පළමු වතාවට මම අද කියලා යන්නම්, අය වැය ලේඛනයෙන් අපේක්ෂා කරන ලද රුපියල් ට්‍රිලියන 4.5ට වඩා වැඩි ආදායමක් ලබා ගැනීම සඳහා අපි පොර බදනවා; එය ලබා ගත හැකියි.

දැනට තිබෙන සංඥා ගත්තොත්, අපි ජූලි මාසය දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දීපු ඉලක්කය සියයට 101කින් වර්ධනය වී තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අපි මාස හතරක ඉලක්කයක් දුන්නා. ඔවුන් ඒ ඉලක්කය අබිබවා ගිහිල්ලා ආදායම් එකතු කරගෙන තිබෙනවා. අපි රේගු දෙපාර්තමේන්තුවට ඉලක්කයක් දුන්නා, ඒ ඉලක්කය අබිබවා සියයට 115ක් -අපි ඉලක්කය දුන්නේ 100යි නම්, 115ක්- ඔවුන් උපයා ගෙන තිබෙනවා. ඒ වාගේම අපි ගනිමු, සුරාබදු දෙපාර්තමේන්තුව. ඔවුන්ට තිබුණේ රුපියල් බිලියන 136ක ඉලක්කයක්. රුපියල් බිලියන 143ක් දක්වා සියයට 105කින් ඔවුන් ආදායම වැඩි කරගෙන තිබෙනවා. ඒ හින්දා මුල් මාස හතෙහි ලංකාවේ පළමු වතාවට ප්‍රධාන බදු ආදායම් ප්‍රභව තුනම අපි ලබා දෙන ලද ඉලක්කයට වඩා වැඩි ඉලක්කයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ නිසා රජයට අවශ්‍ය වන ආදායම් සම්බන්ධ ගැටලුවක් අපට මතු වෙන්නේ නැහැ. අපට ආදායම් උපයා ගත හැකියි.

මම දැක්කා එක්කෙනෙක් මේ සභාවේදී කියනවා, එච්චර ආදායම් තිබෙනවා නම් ඇයි සෙවනගලට සල්ලි බෙදන්නේ නැත්තේ කියලා. ඒ විධියට ගෙවල් බෙදන්න ගිහිල්ලා තමයි මේ ආර්ථිකය වැටුණේ. මතක තියාගන්න කියන්න. එච්චර සල්ලි තිබෙනවා නම් ඇයි බෙදන්නේ නැත්තේ කියලා අහනවා. ගෙවල් බෙදපු හැටි අපි දැක්කා නේ. අදත් ඒ ණය ගෙවා ගන්න බැරිව ඉන්නවා. අද ඒ ගෙවල් ටිකත් නැහැ. සමහර ගෙවල්වල වහලවල් තිබෙනවා, බිත්තිය නැහැ. සූරියවැව, අඩි 100 පාරට ගිහිල්ලා බලන්න. ඒ, ඉතාම වටිනා පාරිසරික පද්ධතියක්. කටු පඳුරු සහිත ලඳු බිම් කියලා අපි ඉගෙනගත් ඒවා ඔක්කෝම විනාශ කර දැම්මා. ඒ ප්‍රදේශවල අලින්ට ඉන්නත් නැහැ, මිනිස්සුන්ට ඉන්නත් නැහැ. බෙදුවා, සල්ලි. සංස්කෘතික අරමුදලක් තිබුණා. බෙදුවා, සල්ලි. නිවාස අරමුදලක් තිබුණා. බෙදුවා, සල්ලි. දැන් අහනවා, සල්ලි තිබෙනවා නම් ඇයි බෙදන්නේ නැත්තේ කියලා. එහෙම නොවෙයි නේ.

සීනි කර්මාන්තයේ අර්බුදයක් තිබෙනවා. අපේ නිෂ්පාදන පිරිවැය වැඩියි. අපේ සේවකයන් ප්‍රමාණය වැඩියි. අපේ කර්මාන්තශාලා ඒ තරමම නවීකරණය වෙලාත් නැහැ. එහෙම නේද? විවිධ හේතු මත, අවස්ථා තුනකදී උක්වල මිල වැඩි කළා. ඒ නිසා සීනි කිලෝවක් නිෂ්පාදනය කරන්න යන පිරිවැය වැඩියි. දැන් මොකක්ද කරන්න තිබෙන්නේ? එක්කෝ, අපි නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් විකුණලා භාණ්ඩාගාරයෙන් එම පාඩුව දරාගන්න ඕනෑ. එහෙම නැත්නම් අපි පිටරටින් ගේන සීනිවලට බද්දක් ගහලා සීනි මිල ස්ථාවර කරන්න ඕනෑ. හැබැයි දැන් බද්දක් ගහන්න එකඟද? එහෙම නම් රුපියල් 50කවත් බද්දක් ගහන්න ඕනෑ. රුපියල් 50ක බද්දක් ගැහුවොත් මොකද වෙන්නේ? *[බාධා කිරීමක්]* නිෂ්පාදනවල VAT එකක් තිබෙනවා, සියයට 18ක. හැබැයි ඒ වාගේම බද්දක් ගහලා තිබෙනවා, ආනයනික සීනිවලටත්. අපි කළේ මොකක්ද? එක එක ක්ෂේත්‍රවලට තිබෙන බදු අයින් කරන්න කියලා කවුරුවත් ඉල්ලන්න එපා. අපි හැම ක්ෂේත්‍රයකින්ම බදු එකතු කර ගන්නවා. හැබැයි සහනාධාර දිය යුතු තැන්වලට සහනාධාර දෙනවා. ඒ, අපේ ප්‍රතිපත්තිය. සීනිවලට බද්දක් තිබෙනවා. ඒ බද්ද අපි ගන්නවා. දැන් මොකක්ද අපි කරලා තිබෙන්නේ? අපේ ආණ්ඩුව තීරණයක් ගත්තා, ඒ සීනි සමාගම්වලට රුපියල් කෝටි 100ක් ලබා දෙන්න. බද්ද අඩු කළාට වැඩක් නැත්තේ මොකද දන්නවාද? අන්තිමට ඒ බද්දවත් ගෙවලා නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, ඒ බද්දවත් ගෙවලා නැහැ. ඉතින් බද්ද අඩු කළාට මොකුත් වෙනවාද, තිබුණා වගේම නේ. අහන්නකෝ, බදු ගෙවනවාද කියලා. බදු ගෙවලා නැහැ. පඩි ගෙවලාත් නැහැ; බදු ගෙවලාත් නැහැ; උක්වලට ගෙවලාත් නැහැ; ණය ගෙවලාත් නැහැ. මේ, තමුන්නාන්සේලා හදපුවා; විනාශ කරපුවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
පඩි ගෙවන්නේ නැතුව ඇත්තේ ප්‍රථම වතාවට වෙන්න ඇති.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ඔව්, ඉතිහාසයේ ප්‍රථම වතාවට වෙන්න පුළුවන්. හැබැයි, අපි මේ සතියේ සඳුදා ඉඳන් මේ ප්‍රශ්නය විසඳීමේ කටයුත්ත පටන්

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

ගත්තා. අපි ඉතා ඉක්මනින් මෙය විසඳනවා. හැබැයි විසඳන්නේ, තමුන්නාන්සේලා වාගේ අර බෙදීමේ සංස්කෘතියෙන් නොවෙයි. ගොඩනැඟීම් පිළිබඳ සැලැස්මක් ඇත්නම් භාණ්ඩාගාරයෙන් අපට සල්ලි දෙන්න තිබුණා. අපි කිව්වා, අපි සල්ලි දෙන්නම්, ඔයගොල්ලන් සැලැස්මක් ඉදිරිපත් කරන්න කියලා. ඒ සැලැස්ම කොතරම් යථාර්ථවාදී ද කියලා බලමු. නැත්නම් හැමදාම සල්ලි පොම්ප කරන්න ඕනෑ. ඒකට තමුන්නාන්සේලා එකඟද?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු ජනාධිපතිතුමනි, එතනෝල්වල ප්‍රශ්නයක් තිබෙනවා. අරක්කු බෝතලයේ මිල අඩු කරන්න. එතකොට එතනෝල් ටික ඔක්කෝම දෙන්න පුළුවන්.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)

ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේකයි. එතනෝල් අඩු ගණනට දෙන්න පුළුවන්. හැබැයි, අපේ නිෂ්පාදන පිරිවැයත් එක්ක බලපුවාම සීනි කර්මාන්තශාලාවලින් නිකුත් කරන එතනෝල් ලීටරයක් රුපියල් 800ක් වත් විය යුතුයි. හැබැයි, එතනෝල් ලීටරයක් රුපියල් 800යි කිව්වාම මොකද වෙන්නේ? එතනෝල් කියන්නේ අපි හැම කෙනෙක්ම අරගෙන යන දෙයක් නොවෙයි නේ. මේවා ගෙන යන සමාගම් කිහිපයයි තිබෙන්නේ. ඒ නිසා එම සමාගම් කිහිපය පොඩි ඒකාධිකාරයක් හදාගෙන තිබෙනවා. ඔවුන් ඒකාධිකාරයක් හදාගෙන, එතනෝල් ලීටරයක් රුපියල් 800න් අඩු වෙනකම් ගන්නේ නැහැ කියලා තීරණයක් අරගෙන තිබෙනවා. මේකයි මතුවෙලා තිබෙන ප්‍රශ්නය. සමහර අය බඩඉරිඟුවලින් එතනෝල් නිෂ්පාදනය කරනවා. බඩඉරිඟුවලින් නිෂ්පාදනය කරන එතනෝල්වලට tax එකක් ගහන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒකට එකඟයි නේ. බඩඉරිඟුවලින් එතනෝල් නිෂ්පාදනය කරනවා නම් ඒකට අපි tax එකක් ගහනවා. උක්වලින් නිෂ්පාදනය කරන එතනෝල් ටික මාර්කට් එකට යන්න අවශ්‍ය සැලසුම අපි කොහොම හරි හදන්න ඕනෑකම තිබෙනවා. අපි බැලුවා, එතනෝල් ලීටරයක් නිෂ්පාදනය කරන්න බඩඉරිඟු කිලෝග්‍රෑම් කොච්චර අවශ්‍ය ද කියලා. ඒගොල්ලන් කිව්වා, සාමාන්‍යයෙන් එතනෝල් ලීටරයක් නිෂ්පාදනය කරන්න බඩඉරිඟු කිලෝග්‍රෑම් 2.8ක විතර ප්‍රමාණයක් අවශ්‍යයි කියලා. ඒකට අනුව ගළපා අපි බද්ද තීරණය කරන්නම්. ඒ අනුව අපි බඩඉරිඟුවලට බද්දක් ගහන්නම්.

පැල්වත්ත කියන්නේ සීනි කර්මාන්තශාලාවක් විතරක් නොවෙයි. පැල්වත්ත කියන්නේ සීනි සහ එතනෝල් කර්මාන්තශාලාවක්. ඒ දෙකෙන්ම තමයි එම කර්මාන්තශාලාවේ ආදායම රඳා පවතින්නේ. අපි මොකක්ද කියන්නේ? සැලැස්ම, ගිණුම් වාර්තා, ඉලක්ක, හදලා තමයි ආණ්ඩුවක් මේ වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් අපටත් සල්ලි බෙදන්න තිබුණා. බෙදන්න අවශ්‍ය සල්ලි තිබෙනවා කියන්නේ ඇයි? මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, අද වන විට අපේ ආණ්ඩුව සතුව රුපියල් ට්‍රිලියනයක් තිබෙන බව. ඒ කියන්නේ, රුපියල් බිලියන 1,000ක් තිබෙනවා. ඒ මුදල රැස් කරන්න පටන් ගත්තේ පසුගිය ආණ්ඩුව. ඒකට මම ඔවුන්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. රුපියල් බිලියන 650 සිට අපි දැන් එම ප්‍රමාණය රුපියල් බිලියන 1,000 දක්වා වැඩි කරගෙන තිබෙනවා. අද භාණ්ඩාගාර බිල්පත් නිකුත් කළොත්, භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කළොත් අපි තමයි ප්‍රධානම ගැණුම්කරුවා. කවුරු හරි එතැනට ඇවිල්ලා කෘත්‍රිම තත්ත්වයක් නිර්මාණය කරන්න හැදුවොත්, අපි මොකක්ද කරන්නේ? ඉස්සර එහෙමයි වුණේ. භාණ්ඩාගාර බිල්පත්වල පොලිය සියයට 30ට, 33ට ගියා. හොයලා බලන්න, කවුද ඒවා ගත්තේ කියලා. ගත්ත අයගේ ලේඛනය අරගෙන බලන්න. ඒගොල්ලන්ට පුළුවන්කම ලැබුණා, මාර්කට් එකේ කෘත්‍රිම තත්ත්වයක් නිර්මාණය කරන්න. අද තවදුරටත් ඒ විධියට කෘත්‍රිම තත්ත්වයක් නිර්මාණය කරන්න බැහැ. කෘත්‍රිම තත්ත්වයක් නිර්මාණය කරන්න ආවොත්, අපි විසින්ම දාපු භාණ්ඩාගාර බිල්පත් අපිම ගන්නවා. අපි රුපියල් ට්‍රිලියනයක් අතේ තියාගෙන ඉන්නවා. අපි ඒ විධියට මාර්කට් එක පාලනය කරනවා; විකෘතීන් නතර කරනවා. එහෙම තමයි රටක් පාලනය කරන්න ඕනෑ. එම නිසා ආදායම්වලින් ගත්තොත්, අපි ඒ තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා.

ඒ වාගේම අපේ පොලී අනුපාතිකය බලන්න. දැන් අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ අපි තනි ඉලක්කමක පොලී අනුපාතික තියාගෙන ඉන්නවා. ඒක හරිම වැදගත්. අපේ බැංකු පද්ධතිය රුපියල් බිලියන ගණනක විශාල මුදල් ප්‍රමාණයක් පෞද්ගලික අංශයට ණය විධියට ලබා දීලා තිබෙනවා. අපි ඔවුන්ව ගෙන්වා විමසුවා, මේ වාණිජ බැංකු පෞද්ගලික අංශයට කොච්චර ණය දෙනවා ද කියලා. ඒ වාගේම අපි බලන්න ඕනෑ, ඒ අය එලෙස ණය දෙන categories මොනවාද කියලා. සමහර බැංකු කැමැතියි, මහා පරිමාණ ව්‍යාපාරිකයන් දෙදෙනෙකුට, තුන්දෙනෙකුට ණය දීලා බේරෙන්න. එතකොට ඒ අයට ඉන්නේ එක ගනුදෙනුකරුවෙක්. එහෙම වුණාම ගනුදෙනු කරන්න ලෙහෙසියි, මෙහෙයවන්න ලෙහෙසියි. හැබැයි, අපි ප්‍රතිශත ලබා දෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අවම වශයෙන් මෙච්චර ප්‍රතිශතයක් ණය විධියට යන්න ඕනෑ, කෘෂි කර්මාන්තයට මෙච්චර යන්න ඕනෑ කියලා අපි කියනවා. බැංකු ඔවුන්ගේ මූල්‍ය ලාභය පිළිබඳව බලනවා වාගේම මෙහිදී ඔවුන්ට සමාජ වගකීමකුත් තිබෙනවා. ඒ නිසා බැංකු පද්ධතිය තුළ අපි මේ පිළිබඳව සාකච්ඡා කරනවා. *[බාධා කිරීමක්]* වෙන්නේ නැහැ. ඒක හරි. හැබැයි, අපි ඒක සාකච්ඡා කරනවා. මොකද අපට විධායක නියෝග දෙන්න බැහැ නේ, වාණිජ බැංකුවලට. නමුත්, අපි උත්සාහ කරමින් තිබෙනවා. Customersලා දෙදෙනෙකුට, තුන්දෙනෙකුට විශාල ලොට් එකක ණය දෙනවා වෙනුවට, මේ ණය ප්‍රසාරණය කරන්න ඕනෑ, පතුරුවන්න ඕනෑ. අපි බැංකු එක්ක ඒ පිළිබඳව සාකච්ඡා කරමින් තිබෙනවා. රාජ්‍ය බැංකු දෙක දැන් ඒ සඳහා එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. එම නිසා අපි මොකක්ද කරමින් තිබෙන්නේ? ඒ බැංකුවලින් ණය දීමේ ප්‍රමාණය ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, එම මුදල් ආර්ථිකයට ගලාගෙන යමින් තිබෙනවා. දේශීය වශයෙන් ගත්තොත්, අපට සැලකිය යුතු ප්‍රමාණයකින් අපේ සංචිත ප්‍රමාණය ස්ථාපිත කර ගන්නත්, ඒ වාගේම අනෙක් පැත්තෙන් ගත්තොත් අපේ නිෂ්පාදනයට අවශ්‍ය දායකත්වය ලබා දෙන්නත් අපි සමත් වෙලා තිබෙනවා.

ආර්ථිකයක් හොඳද, නරකද කියලා මනින නිර්ණායක ගැන අපි කල්පනා කරලා බැලුවොත්, මේ ආර්ථිකය ඉතාම ශක්තිමත් ස්ථාවරයකට ගෙන එන්න අපි සමත් වෙලා තිබෙන බව මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි. එම නිසා ආර්ථිකයේ බිඳ වැටීමක් හරහා මේ රට වැටේවි කියලා තමුන්නාන්සේලා කල්පනා කරනවා නම්, ඒක සිද්ධ වෙන්නේ නැහැ. එහෙම දෙයක් වෙනවා නම් ඒක වෙන්නේ කොහොමද? එක්කෝ, දේශපාලන අස්ථාවරභාවයක් ඇති වෙන්න ඕනෑ. අපි දැකලා තිබෙනවා, ආණ්ඩු වැටිච්ච ආකාරය. ආර්ථිකයේ ඇති වන පීඩනය නිසා මෑත කාලයේදී ආණ්ඩු වැටුණා. ඊළඟට, දේශපාලන අර්බුද නිසා ආණ්ඩු වැටුණා. මතක ඇති, 2001දී එස්.බී. දිසානායක, ජී.එල්. පීරිස් ඇතුළු මන්ත්‍රීවරුන් 11දෙනෙක් තමුන්නාන්සේලාගේ පැත්තට ආපු නිසා එවකට පැවති ආණ්ඩුව වැටුණු බව. *[බාධා කිරීමක්]* ඔව්, මන්ත්‍රීවරුන් 16ක්. මුලින්ම මන්ත්‍රීවරුන් 11දෙනෙක්

ආවා. ඊට පස්සේ එක එක්කෙනා ආවා. පස්සේ රවුෆ් හකීම් මහත්මයාත් ගියා නේ. ඒකෙන් නේ මන්ත්‍රීවරුන් 16ක් වුණේ. නැත්නම් ඉස්සෙල්ලාම ගියේ මන්ත්‍රීවරුන් 11දෙනායි. මට මතකයි. එහෙම ගියා. ගියාට පස්සේ මොකක්ද වුණේ? එදා ආණ්ඩුව වැටුණා. ඒ විධියට පාර්ලිමේන්තුව ඇතුළේ ආණ්ඩු වට්ටලා තිබෙනවා. මහජනයා පාරට ඇවිල්ලා ආණ්ඩු වට්ටලා තිබෙනවා. එහෙම නැත්නම් මැතිවරණවලදී ආණ්ඩු වැටිලා තිබෙනවා. මම කියන්නේ, ඔය ආකාර තුනෙන්ම මේ ආණ්ඩුව වැටෙන්නේ නැහැ කියලායි. ඒක හොඳට මතක තියාගන්න. *[බාධා කිරීමක්]* මේ ආණ්ඩුව මැතිවරණයකින් වැටෙනවා නම් අපි ඒක පිළිගන්නවා. *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපි කියලා නැහැ නේ, වැටෙනවා කියලා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
නැහැ, නැහැ. කවුද දන්නවා ද මේ කියන්නේ? එහෙම නම් දෙසැම්බර්වල ජනාධිපති වෙනවා කියලා කියන්නේ කොහොමද? ඒ කියන්නේ වෙන ආණ්ඩුවක් හදාගෙන ද? *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, මම මේ අහන්නේ එතකොට දෙසැම්බර්වල ජනාධිපති වෙන්නේ වෙන ආණ්ඩුවක කෙනෙක්ද? *[බාධා කිරීමක්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අපි කියලා නැහැ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ආ, හරි, චාමර සම්පත් මන්ත්‍රීතුමා කියලා නැහැ.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
දෙසැම්බර්වල.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
කවදා හරි දෙසැම්බර්වල! ඒ කියන්නේ, කබීර් හෂීම් මන්ත්‍රීතුමා "දෙසැම්බර්වල සජිත් ප්‍රේමදාස ජනාධිපතිවරයා" යැයි කියපු ප්‍රකාශයේ ඇත්ත හරය, කවදා හෝ දෙසැම්බර්වලය කියන එක. ඒක නේ? *[බාධා කිරීමක්]* හොඳයි, හොඳයි. ඒ නිහතමානීත්වය ගැන මම ආඩම්බර වෙනවා. *[බාධා කිරීමක්]* තව කෙනෙක් හිටියා, අගෝස්තු කියපු. අගෝස්තු නම් දැන් ඇවිල්ලා. ඊළඟට කියනවා, ඊළඟ මාර්තු කියලා. මතක තියා ගන්න, එහෙම සිද්ධ වෙන්නේ නැහැ කියන එක. හැබැයි, මෙතැන වෙනත් අරමුණක් තිබෙනවා. මම ඒ අරමුණ පැහැදිලි කරන්නම්. තමුන්නාන්සේලා ඒ අරමුණ තේරුම් ගන්න. තමුන්නාන්සේලා අහු වෙන්න එපා, ඒ අරමුණට.

අපේ රටේ නීතියේ විධානය, ආධිපත්‍යය තහවුරු කළ යුතුයි කියලා අපි කවුරුත් විශ්වාස කරනවා. හැබැයි, අපේ රටේ මතයක් තිබෙනවා. සමහර අය ඉන්නවා, ඒගොල්ලන්ට කවදාවත් නීතිය ළඟා වෙන්නේ නැති වෙයි කියලා හිතන. ඒගොල්ලන්ට අපරාධ කරන්න පුළුවන්. හැබැයි, ඒගොල්ලන්ට හොඳ මහත්වරු හැටියට ඉන්නත් පුළුවන්. ඇයි, ඒ? නීතිය ඒගොල්ලන්ට ළඟා වෙන්නේ නැහැ. ඒගොල්ලන් හිතනවා, නීතියට ඒගොල්ලන්ට ළඟා වෙන්න බැරි තරමේ රැස් වළල්ලක් තිබෙනවාය කියලා. එහෙම හිතනවා නේ. හැබැයි, මොකද කරන්නේ? නීතියට ළඟා වෙන්න බැරි කිසිදු පුද්ගලයෙක් ඉතුරු නොවන රටක් අපි හදනවා. හැබැයි, අපේ රටේ සම්ප්‍රදායයක් තිබෙනවා, "එයාට නම් අත තියන්නේ නැහැ ඔය කවුරු ආවත්" කියලා හිතන. බලාගෙන ඉන්න, මොකද වෙන්නේ කියලා. කිසිවෙකුගෙන් පළිගැනීමේ චේතනාවක් නැහැ. කිසිවෙකුට දඬුවම් දීමේ චේතනාවක් නැහැ. හැබැයි, අපට අවංක චේතනාවක් තිබෙනවා. ඒ, මොකක්ද? නීතියට හැම පුරවැසියාටම ළඟා විය හැකි රටක් හදන්න. තමන් හදා ගන්නා පවුල් පරම්පරාවේ බලයෙන්, තමන් හදා ගන්නා ධනයේ බලයෙන්, තමන් හදා ගන්නා රැස් වළල්ලේ බලයෙන් නීතියට තමන්ට ළඟා වෙන්න බැහැ කියලා හිතන්න බැහැ කවුරුවත්. හැබැයි, එහෙම මතයක් මේ රටේ තිබෙනවා. නීතියට ළඟා වෙන්න බැරි පුරවැසියන් ඉන්න රටක නීතිය ළඟා වෙන පුරවැසියන්වත් නීතියට යටත් වෙන්නේ නැහැ. ඒ නිසා රට ගොඩනඟන්න නම්, යළි නීතියේ විධානය, ආධිපත්‍යය පිළිබඳව තහවුරුව ඇති කළ යුතුයි. හැබැයි, ඒ තහවුරුව ඇති කරනකොට කවදාවත් තමන්ගේ රශ්මි කදම්බය හමුවේ නීතිය තමන් වෙත ළඟා වෙන්නේ නැහැ කියලා කල්පනා කරපු අයට නීතිය ළඟා වෙනවා. අපි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහාය දීලා තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අවශ්‍ය වන යටිතල පහසුකම් අපි හදා දීලා තිබෙනවා. අපි බලය දීලා තිබෙනවා. වැඩ කරන්න දීලා තිබෙනවා. නීතිය අපරාධකරුවන්ගේ පිටුපස එනවා. මම දැක්කා, හිටපු නාවික හමුදාපතිවරයෙක් අත්අඩංගුවට ගන්නවා. ඒකට මාධ්‍ය සාකච්ඡාවක් තියලා කියනවා, ධයස්පෝරාව විසින් දීපු ඔත්තුවක්ය කියලා. ඒක අධිකරණයෙන් දීපු තීන්දුවක් බව මතක තබා ගන්න.

ඊළඟට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට යන්න පෙර අත්අඩංගුවට ගත යුතුයි. හැබැයි, අධිකරණයේ තීන්දුවටත් ගරු කරන්නේ නැති රාජ්‍යයක් තිබුණා. ඒක වෙනම දෙයක්. හිටපු නාවික හමුදාපතිවරයා අත්අඩංගුවට ගන්න කියලා අධිකරණයෙන් නියෝගයක් දීලා තිබෙනවා නම්, ඔහුව ගන්න ඕනෑ නැද්ද? අත්අඩංගුවට ගන්න ඕනෑ. හැබැයි, මාධ්‍ය සාකච්ඡාවක් තියලා කියනවා, කොටි ධයස්පෝරාව සනසන්න ගන්නවා ලු, ආණ්ඩුව. අපිට කවුරුවත් සනසන්න ඕනෑකමක් නැහැ. ඒක මතක තියා ගන්න. අපි සනසන්නේ මේ රටේ ජනතාව. සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව සනසන ආණ්ඩුවක්, මේ ආණ්ඩුව. ඒ නිසා නීතිය ළඟා වෙනවා. එතකොට මොකද වෙන්නේ? අද අපරාධකාරයා දන්නවා, නීතිය තමන්ට කිට්ටු වෙමින් ඉන්න බව. අපරාධයට හවුල් නොවුණු කෙනා ඒ බව දන්නේ නැහැ. ඔහු දන්නේ ප්‍රවෘත්තිවල යන දේවල්. එහෙම නේද? හැබැයි, අපරාධකරුවා ඒ ගැන දන්නවා. පෞද්ගලික ලේකම් සාක්ෂියට කැඳවනකොට කොතැනටද එන්නේ කියලා දන්නවා. දන්නේ නැද්ද?

තමන්ගේ ලේකම්වරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවනකොට ඕනෑම නීතිඥ මහත්මයෙක් දන්නවා, ඊළඟට කාටද එන්නේ කියලා. දන්නවා නේ. ඊළඟට කාටද එන්නේ කියලා දන්නවා. එතකොට හදන්න ඕනෑ අවිනිශ්චිතතාවක්. තමන් ළඟට නීතිය ළඟා වෙන්න කලින් රට තුළ අවිනිශ්චිතතාවක් හදනවා, මේ ආණ්ඩුව වැටෙනවා, මේ ආණ්ඩුව වට්ටනවා කියලා. එතකොට මොකද වෙන්නේ? නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් යම් ප්‍රමාණයකට තිගැස්සෙනවා. එහෙම තිගැස්සුණු ඉතිහාසයක් තිබෙනවා. 2019දී ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව බලයට ඇවිල්ලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ 700දෙනෙකුට විදෙස් ගමන් තහනමක් පනවපු බව මතක තබා ගන්න. අපරාධ පරීක්ෂණ

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

දෙපාර්තමේන්තුවේ 700දෙනෙකුගේ විදෙස් ගමන් තහනම් කළා, තමන්ගේ ආණ්ඩුවට විරුද්ධව පරීක්ෂණ කළාය කියලා. නිශාන්ත සිල්වා පොලිස් නිලධාරියා හොරෙන් පැනලා ගිහිල්ලා ජීවිතය බේරා ගත්තා. ශානි අබේසේකර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා මාස 11ක් හිරේ හිටියා. ඇයි, ඒ? සාධාරණ පරීක්ෂණයක් පැවැත්වීමේ වරදට. දැන් එළියෙන් මතයක් හදනවා. ඒ, මොකක්ද? "ඔන්න ආණ්ඩුවෙන් දෙනවා, ආණ්ඩුවෙන් දෙනවා" කියලා. එතකොට අරගොල්ලන් හිතනවා, ආයෙත් විදෙස් ගමන් තහනමක් වැටෙයි, ආයෙත් රට පැනලා ජීවිතය බේරා ගන්න වෙයි, ආයෙත් හිරේ යන්න වෙයි, ඒ නිසා අත පුච්චා ගන්නේ නැතුව වැඩ ටික කරමු කියලා.

හැබැයි මට සතුටුයි, අපේ නිලධාරින්ට අපි ඒ නායකත්වයත්, පෞරුෂයත්, බලයත් දීලා තිබෙනවා වාගේම ඕනෑම වෙලාවක ඔවුන් ආරක්ෂා කරන බවටත් සහතිකයක් දීලා තිබෙන එක ගැන. අපි ආණ්ඩුවේ ඉන්න පුළුවන්. අපි ආණ්ඩුවෙන් එළියේ ඉන්න පුළුවන්. අද අපේ රටේ නීතිය ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන සෑම නිලධාරියෙක්ම ආණ්ඩුවක් ලෙසත් අපි රකිනවා. ආණ්ඩුවෙන් එළියේ හිටියත් පුරවැසියන් ලෙසත් අපි ඒ නිලධාරින්ව රකින බව සහතික කරනවා. අද ඒ බිය හදන්නයි මේ හදන්නේ. හෙට වැටෙනවා, අනිද්දා වැටෙනවා කියන්නේ මොකද? වැටෙන්න එක සාධකයක්වත් නැහැ නේ. පාරට බහිනවා කිව්වා නේ. ඊයේ පාරට බැස්සා නේ. පොල්දූව හන්දියේ තත්ත්වය මම දැක්කා. මම පැලවත්තේ ඉඳලා යනකොට මගේ ආරක්ෂක අංශයේ නිලධාරින් මගෙන් ඇහුවා, "පොල්දූව හන්දියේ උද්ඝෝෂණයක් තිබෙනවා, ඒ නිසා වෙන පාරකින් යමුද?" කියලා. මම කිව්වා, ඒකත් බලාගෙන එතැනින්ම යමු කියලා. කවුරුවත් නැහැ. එක් කෙනෙක්වත් නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, තැන් තුනක් කිව්වා. පොල්දූව, ගෝල්ෆේස් සහ මහරගම. පොල්දූවට එක කට්ටියක් යන්න සැලසුම් කළා. මහරගමට තව කට්ටියක් යන්න සැලසුම් කළා. එහෙම නේද? හැබැයි, ගියේ නැහැ. එහෙම එන්නේ නැහැ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒවා හැදුවේත් ආණ්ඩුව. නැත්නම් එහෙමවත් එන්නේ නැහැ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ඔව්, එහෙමවත් එන්නේ නැහැ. ඒක හරි. එහෙමවත් එන්නේ නැහැ. ඒක ඇත්ත.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු ජනාධිපතිතුමා, ඒකේ ඇත්ත කථාව තමයි, කවුරු හරි කෙනෙකුට එහෙම එන්න වුවමනාවක් තිබුණත්, එන්න කට්ටිය හිටියේ නැති එක.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ඔව්, ඕනෑකමක් තිබුණේ නැහැ. ඒක නේ ඇත්ත. ඒ කියන්නේ, එන්නේ නැහැ. ඒක මතක තබා ගන්න.

දැන් මොකක්ද වෙන්නේ? තමුන්නාන්සේලා දැන් කියනවා, ආණ්ඩුව වැටෙනවා කියලා. ආණ්ඩුව වැටෙනවා, වැටෙනවා කියන අයගෙන් මම මේ කාරණය අහනවා. එහෙම කියන අයගේ හෘදය සාක්ෂිය ඇත්ත දන්නවා. අඩුම ගණනේ ආණ්ඩුව වැටෙන්න ක්‍රමයක් කියන්නකෝ. එක සිද්ධාන්තයක් කියන්න, ජනතාවට පොඩ්ඩක් තේරුම් ගන්න. කිසිම සිද්ධාන්තයක් නැහැ. කිසිම සිද්ධාන්තයක් නැතුව ආණ්ඩුව වැටෙනවා, වැටෙනවා කියනවා. මේ ආණ්ඩුව වැටෙන්නේ නැහැ. මම කියන්නේ තමුන්නාන්සේලා ඊට වඩා හොඳ දේශපාලනයක් තෝරා ගන්න කියන එකයි. මේ ආණ්ඩුව අසාර්ථක නම් තමුන්නාන්සේලා මේ රටට අවශ්‍ය බව පෙන්වන programme එකකට යන්න. "මේ ආණ්ඩුව හොරකම් කරන්නේ නැහැ. අපි හොරකම් කරන්නේම නැහැ." වාගේ එකක්. එතකොට තමුන්නාන්සේලාට යන්න පාරක් තිබෙනවා. "මේ ආණ්ඩුව විදෙස් සංචිත ශක්තිමත් කර ගන්නවා. අපි මේ වාගේ දෙගුණයකින්, තුන් ගුණයකින් ශක්තිමත් කර ගන්නවා" කියන්න. එතකොට යන්න පාරක් තිබෙනවා. එහෙම නැතුව තමුන්නාන්සේලා දේශපාලනයෙන්,- අන්න එහෙම දේශපාලන සංවාදයකට අපි කැමැතියි. අපි කරමින් තිබෙන දේ සංවර්ධනය සඳහා, වර්ධනය සඳහා ප්‍රමාණවත් නැත්නම් ඒ සඳහා කරුණු කියන්න. හැබැයි, අපි කරන දේ තමයි වැරැදි කියලා කියන එක හොඳ නැහැ. මේක තමයි මේ මොහොතේ කළ යුතු දේ. මීට වඩා සුදුසු දෙයක් තිබෙනවා නම් කවුරු හරි නැඟිටලා මට කියන්න. මීට වඩා මොකක්ද කරන්න තිබෙන්නේ?

අපට ලැබිලා තිබෙන්නේ මොකක්ද? මීට පෙර හැම ආණ්ඩුවකටම සැලකිය යුතු ප්‍රමාණයකින් දුවන රටක් ලැබුණා. අපට ලැබුණේ නතර වුණු රටක්. දුවන රටක් අල්ලාගෙන යන්න ඊළඟට එන ආණ්ඩුවට ලෙහෙසියි. නමුත්, අපට ලැබෙන විට නතර වුණු රටක් තිබුණේ. මීරිගම-කඩවත අධිවේගී මාර්ගයේ වැඩ නතර වෙලා, Katunayake Airport එකේ වැඩ නතර වෙලා, මහනුවර දිගන ප්‍රදේශයේ ජල ව්‍යාපෘතිය නතර වෙලා. ඒවා විදෙස් ආධාරවලින් පටන් ගත් ඒවා. නතර වුණු ව්‍යාපෘතියක් ආණ්ඩුවක් ආපු ගමන්ම පටන් ගන්න බැහැ. චීනයේ එක්සිම් බැංකුවෙන් තමයි අපට ණය දෙන්නේ, මීරිගම-කඩවත අධිවේගී මාර්ගයේ කොටස වෙනුවෙන්. ඒක හදන්නේ චීන සමාගමක්. අපේ රට බංකොලොත් වුණා, ණය දෙන එක නතර වුණා. හැබැයි, සමාගම තමයි කොන්ත්‍රාත්කාරයා. සමාගමත් එක්ක අපට agreement එකක් තිබෙනවා. අපි සමාගමට නිසි පරිදි මුදල් ගෙවලා නැහැ. ඔවුන්ගේ වාහන, යන්ත්‍ර සූත්‍ර දිරාපත් වෙලා. ඔවුන් සැපයුම් මාර්ගයක් හැදුවා. ඒ සැපයුම් මාර්ගය කඩා වැටිලා. දැන් ඔවුන් කියනවා, අපේ කොන්ත්‍රාත් එකේ කටයුතු යළි ආරම්භ කරන්නම්, අපට කොච්චර ගෙවනවාද කියලා තීරණය කරන්න කියලා. වන්දි ගෙවන්න ඕනෑ. වන්දි ගෙවීම එක දවසකින් කරන්න බැහැ. ඒ පිළිබඳ වාර්තා ඒගොල්ලන් ඉදිරිපත් කරලා තිබෙනවා. අපිත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වැඩකටයුතු නැවත පටන් ගන්න නම් අපි වන්දි සමාලෝචනයක් කරන්න ඕනෑ. හැබැයි, දුවමින් තිබුණු ආර්ථිකයක් නම් දුවගෙනම යනවා. නමුත්, අපට ලැබුණේ නතර වුණු එකක්. එදා චීනයේ එක්සිම් බැංකුවෙන් ඒ මාර්ගය හදන්න දුන් ණය දැන් ප්‍රමාණවත් නැහැ. ඊට වඩා වැඩි ණය මුදලක් දැන් අපට අවශ්‍යයි. ඒ නිසා නැවත ඒ ගැන සාකච්ඡා කරන්න ඕනෑ. අපි කියන්න කැමැතියි, චීනයේ එක්සිම් බැංකුව යුවාන්වලින් ඉතාම සහනදායී පොලියකට ණයක් දෙන්න එකඟතාව පළ කළ බව. ලබන සඳුදා අපි ඒක කැබිනට් මණ්ඩලය තුළ අනුමත කරනවා. එතකොට අපට ඒ ණය ලබා ගන්න පුළුවන්. ඊට පස්සේ කොන්ත්‍රාත්කරුවාගේ දීමනාව තීරණය කරලා නැවත වැඩ පටන් ගන්න අපට පුළුවන්.

මේක නතර වුණු රටක්. දුවමින් තිබුණු රටක් වාගේ අපට මේවා කරන්න බැහැ. ඒ සඳහා කාලය ගත වනවා. Katunayake Airport එකේ වැඩ නතර වෙලා තිබෙන්නේ. ජපානයේ JICA එකෙන් ණය දුන්නා. හැබැයි, දැන් ඒ ණය මුදල අරගෙන බැලුවාම, ඒ මුදලින් ව්‍යාපෘතියෙන් සියයට 30 කරන්න පුළුවන්. ඒ

නිසා ණය මුදලේ ප්‍රමාණය තව වැඩි කර ගන්න ඕනෑ. සාමාන්‍යයෙන් විදෙස් රාජ්‍යයකින් ණයක් ගන්නකොට ඒ සඳහා වන සාකච්ඡා අවුරුදු එකහමාරක්, දෙකක් ඇදෙනවා. අපි ඊට වඩා ඒක ඉක්මන් කර ගන්න try කරනවා. එහෙම තමයි විදෙස් ණයක් සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නේ. කඩා වැටුණු ව්‍යාපෘති අපි නැවත පටන් ගන්නවා. ඒ ව්‍යාපෘති ඔක්කෝම අපි මේ අවුරුද්දේ පටන් ගන්නවා. Katunayake Airport එකේත්, අධිවේගී මාර්ගයේත් වැඩ පටන් ගන්නවා. ඒ වාගේම ගලගෙදර-මහනුවර අධිවේගී මාර්ගයේ වැඩ ආරම්භ කරන්නත් අපි සැලසුම් කරලා තිබෙනවා. අපි උපරිම උත්සාහ කරනවා, ඒ සඳහා විදේශ ණය මුදලක් හොයා ගන්න. ඒ උත්සාහය අසාර්ථක වුණොත් දේශීය සල්ලිවලින් ඒ මාර්ගය හදන්න පටන් ගන්නවා ලබන අවුරුද්දේ.

අපි දන්නවා, බලශක්ති ක්ෂේත්‍රයේ අර්බුදයක් තිබෙනවා කියලා. අපි පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑ. අපි එකඟ වෙලා තිබෙනවා, 2030දී සියයට 70ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් ගෙනෙනවා කියලා. අපි බලාගාර පටන් ගන්නවා. සියඹලාණ්ඩුව බලාගාරයට අපි මුල් ගල තියනවා මේ එන සැප්තැම්බර්වල. සාම්පූර් බලාගාරය සඳහා එකඟතාව ඇවිල්ලා එය සමාගම්වලට දෙන්න ගිවිසුම් අත්සන් කරලා එහි කටයුතු කරන්න පුළුවන්. මන්නාරමේ wind power plant එකක් පටන්ගන්නවා. හඳුනාගත් තව ප්‍රදේශවල wind power plantවලට අපි අවස්ථාව දීලා තිබෙනවා. ඒ හරහා බලශක්ති ක්ෂේත්‍රය වර්ධනය වෙනවා.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව තුළ අපිට විශාල ධාරිතාවක් නැහැ. අපි කොළොන්නාවේ අලුතෙන් තෙල් ටැංකි 6ක් හදනවා. එහි වැඩ පටන්ගන්නවා. ධාරිතාව වැඩි කරන්න ඕනෑ. අපට මෙට්‍රික්ටොන් ලක්ෂ 10ක තෙල් සංචිතයක් තිබෙන්නේ. දින කිහිපයකට ප්‍රමාණවත්, සති තුනකට වාගේ ප්‍රමාණවත් තෙල් සංචිතයක් තමයි අපිට තියාගන්න පුළුවන්. එහෙම රටක් ඉතාම අනතුරුදායකයි. ඒ නිසා තෙල් ටැංකි ටික අපි හදනවා. ත්‍රිකුණාමලයේ දශක ගණනාවක් තිස්සේ අඩපණ වෙලා තිබෙන, තෙල් සංස්ථාවට අයත් තෙල් ටැංකි ටික ප්‍රතිසංස්කරණය කරන්න පටන්ගත්තා. දැන් දෙකක වැඩ අවසන් වෙමින් තිබෙනවා. අපි ඒවායේ නළ පද්ධති එළනවා. ඒවා තමයි වැඩ කියන්නේ. වෙන මොනවාද වැඩ කියන්නේ? බලශක්ති ක්ෂේත්‍රය ස්ථාවර කර ගැනීම වැදගත්. අපි ඒ සඳහා වන කටයුතු වෙනුවෙන් ටෙන්ඩර් කැඳවා තිබෙනවා. ඩීසල්වලින්, නැප්තාවලින් විදුලිය නිපදවනවා, කෙරවලපිටිය, කැලණිතිස්ස විදුලි බලාගාරවල. ඒක වසර ගණනාවක් තිස්සේ අධික මිලක් වැය කරලා කරපු දෙයක්. එතැනට LNG plant එක එන්න ඕනෑ. 2013 වසරේ ඉඳන් LNG plant එක ගැන කථා කරනවා. හැබැයි තවමත් එය සිදු වී නැහැ. එතැන අපි තවමත් ඩීසල්වලින් හදන නිසා අලුතෙන් LNG plantsවලින් හදන්න ඕනෑ නැහැ. හැබැයි ඩීසල්වලින් හදන එක අපි LNG plant එකකට convert කළොත්, අපිට මිල අඩුවීමක් තිබෙනවා. කැලණිතිස්ස සහ කෙරවලපිටියේ ඩීසල් බලාගාර තිබෙනවා, නැප්තා බලාගාර තිබෙනවා. අපි කෙරවලපිටිය විදුලි බලාගාරය හදලා තිබෙන්නේ, 2013දී විවෘත කරන්නේ, ඩීසල්වලින් තාවකාලිකව ක්‍රියාත්මක කරවන්න. හැබැයි අවුරුදු 12ක් ඒක ඩීසල්වලින් ක්‍රියාත්මක වෙනවා, තාවකාලිකව. තවම එතැන LNG plant එක හදාගන්න බැරි වුණා.

රනිල් වික්‍රමසිංහයි, මෛත්‍රීපාලයි අතර පළමු ගැටුම ඇති වුණේ මොකක් නිසාද කියලා තමුන්නාන්සේලා දන්නවා. මොකක්ද පළමු ගැටුම? LNG plant එක හදන්න දෙන්නේ කොයි සමාගමටද කියන එක. එතැනින් තමයි මෛත්‍රීගෙයි, රනිල්ගෙයි ගැටුම පටන්ගත්තේ. කරන්න දුන්නේ නැහැ. එක්කෙනෙක් කොරියානු සමාගමක් ගේන්න ඇහුවා. අනෙක් කෙනා ජපන් සමාගමක් ගේන්න ගියා. එහි ප්‍රතිඵලයක් හැටියට LNG plant එක හදන එක සිද්ධ වුණේ නැහැ. දෙපැත්තට ඇද ඇද හිටියා. ඊට පස්සේ ටෙන්ඩර් call කළා; ටෙන්ඩරය open කරන්න තියෙද්දී, බැසිල් රාජපක්ෂ ඇවිල්ලා ඇමෙරිකාවේ නිව් ෆෝට්‍රස් එනර්ජි සමාගමට ටෙන්ඩරයක් නැතුව දෙන්න ගියා, නතර වුණා. මේ ඔක්කෝම ගනුදෙනු හරහා අදටත් අවුරුදු 12ක්, 13ක් තිස්සේ පුරවැසියන් වැඩියෙන් විදුලි බිලක් ගෙවනවා, තමුන්නාන්සේලාගේ ගනුදෙනු බේරාගන්න බැරි වෙච්ච එකේ ප්‍රතිඵලය නිසා. මෛත්‍රීටයි, රනිල්ටයි බේරාගන්න බැරි වුණා, කොයි සමාගමටද දෙන්නේ කියලා. කොයි සමාගමෙන්ද තමන්ට ලැබෙන්නේ කියන එකයි බැලුවේ. ඒකයි ඇත්ත. තමුන්නාන්සේලා දන්නවා මේ සිද්ධි. හැබැයි අපි අද ඒ සඳහා ටෙන්ඩරය කැඳවලා තිබෙනවා. ප්‍රදානය කරන්න ආසන්න අවස්ථාවේ තිබෙනවා. අපේ බලශක්ති ඇමතිතුමා මේ සභාවේ ඇති. එහෙම අපි වැඩ කරනවා. මොකක්ද වැඩ නොකරනවා කියන්නේ? මේ, වැඩ කරමින් තිබෙන ආණ්ඩුවක්.

ගරු කථානායකතුමනි, මම එක දෙයක් පිළිගන්නවා. අපි ආර්ථිකයේ, බලශක්ති ක්ෂේත්‍රයේ ස්ථාවරයන් හැදුවාට විතරක් ප්‍රමාණවත් නැහැ. ඒවායේ ප්‍රතිලාභ ජනතාවට ගලාගෙන යන්න ඕනෑ. ඒක තවම වෙලා නැහැ. මම ඒක පිළිගන්නවා. ජනතාවගේ ජීවිත උසස් වෙන්න ඕනෑ. ජනතාවට හොඳ රැකියා අවස්ථා හැදෙන්න ඕනෑ, තමන්ගේ ජීවන තත්ත්වය පහසු වෙන්න ඕනෑ. ඒක ඇත්ත. ඒක හදන්න ඕනෑ. හැබැයි ඒක හදන්න බැහැ, ආර්ථිකය ඉහළ ස්ථාවරයකට ගෙනෙන්නේ නැතුව. ඒ නිසා අවුරුද්දකට ආසන්න කාලයක් මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව ඇතුළු අපි හැමදෙනාම විශාල ලෙස පොර බැදුවේ මොකකටද? ආර්ථිකය ස්ථාවර කරගන්න ඕනෑ, ආර්ථිකයේ අත්‍යවශ්‍ය සාධක සම්පූර්ණ කරගන්න ඕනෑ. අපේ මූල්‍ය වෙළෙඳ පොළේ යළි කිසිදු අවිනිශ්චිතතාවක් ඇති නොවිය යුතුයි. එක සැරයක් මූල්‍ය වෙළෙඳ පොළ කඩා වැටිලා නැවත වතාවක් කඩා වැටෙනවා කියලා සංඥාවක් ආවොත්, අර්බුදය පළමු සැරේ වාගේ දෙගුණයක් වෙනවා කියන එක මතක තියාගන්න. පළමුවැනි සැරේ වාගේ දෙගුණයක් වෙනවා, දෙවැනි සැරේ මේ අර්බුදය ආවොත්. ඒ නිසා පාලකයන්, තමුන්නාන්සේලා අපි කාටත් වගකීමක් තිබෙනවා. අපේ මාතෘ භූමිය, අපේ රටේ ජනතාව දෙවැනි වටයකින් මේ අර්බුදයට මුහුණ නොදෙන්න ඕනෑ. දෙවැනි වටයකින් මේ අර්බුදයට මුහුණ නොදෙන්න නම් අපි ආර්ථිකය ඉතා හොඳින් ශක්තිමත් ලෙස ස්ථාවර කරගන්න ඕනෑ. එසේ ස්ථාවර කරගන්නේ මට ප්‍රතිලාභ ගන්නද? අපේ අමාත්‍ය මණ්ඩලයට ගන්නද? තමුන්නාන්සේලාට ගන්නද? නැහැ, තමුන්නාන්සේලාට දෙන ඒවා කපනවා. රුපියල් ලක්ෂ දහයේ insurance එක ලක්ෂ දෙකහමාරට අඩු කරනවා. විශ්‍රාම වැටුපත් අයින් කරනවා. දැන් මම දැක්කා සජබයේ කට්ටිය කියනවා, ඒක වැරදියි කියලා. හැබැයි මම දැක්කා, ඒ යෝජනාව ගෙනාවේ තමුන්නාන්සේලාගේ ඇඹිලිපිටියේ මන්ත්‍රීතුමා නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හේෂා විතානගේ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
එතුමා යෝජනාව ගෙනාවට ඒක ගේනකොට හිතුවේ නැහැ, ඇත්තටම වෙනවා කියලා. ඔය මුළාව. යෝජනාව ගෙනැල්ලා මම දැක්කා පක්ෂය press conferences තියලා කියනවා, විශ්‍රාම වැටුප කපන එක වැරදියි කියලා. හැබැයි තමුන්නාන්සේලාගේ මන්ත්‍රී කෙනෙක් යෝජනාව ගේනවා. හේෂා,- *[බාධා කිරීම්]* තමුන්නාන්සේත් ගෙනාවා එකක්. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
රවි ගෙනාවා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
රවිත් ගෙනාවා. හේෂා ගෙනාවා. හේෂා ගෙනාවා, මට මතක විදියට. කපන්න ඕනෑ නේ. *[බාධා කිරීම්]* එහෙම නම්, කෑගල්ලේ සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා තමුන්නාන්සේලාගේ පක්ෂයේ නොවෙයිද?*[බාධා කිරීම්]* ඒක තමයි පක්ෂයට වෙලා තිබෙන්නේ. පක්ෂය කියනවා, මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් කපනවාට එකඟයි කියලා. හැබැයි, සුජිත් මාධ්‍ය සාකච්ඡාවක් තියලා කියනවා, මේක එපා කියලා. *[බාධා කිරීම්]* ලක්ෂ දෙකහමාරයි. *[බාධා කිරීම්]* ඔව්, ලක්ෂ දෙකහමාරයි. ලක්ෂ දහය, ලක්ෂ දෙකහමාරට අඩු කරමු, පළමු වටයේ. ඒත් හොඳට හැසිරෙන්නේ නැත්නම් ඒ දෙකහමාරත් කපන්නම්. ඒත් හොඳ නැත්නම් -*[බාධා කිරීම්]* මම මේ කියන්න හදන්නේ මොකක්ද? *[බාධා කිරීමක්]* මම කියන්නේ විශ්‍රාම වැටුප ගන්න අය ටිකක් කෑ ගහන එක තේරෙනවා නේ අපට. මොකද, ඒගොල්ලන්ට ලැබෙන එකක් අහිමි වෙනවා. මේ ඉන්න අය කෑ ගැහුවේ මොකටද? *[බාධා කිරීමක්]* මාධ්‍ය සාකච්ඡාවක් තිබුණා, සුජිත්ගේ. *[බාධා කිරීමක්]* ඒක තමයි කියන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ජනාධිපතිතුමනි, ඒක ලැබුණ මන්ත්‍රීවරුන්ට, ඒ අයට ඒක තියන්න. *[බාධා කිරීම්]* අපට බලපාන්නේ නැති විධියට වැඩකටයුතු කරන්න. *[බාධා කිරීම්]* සමහර මන්ත්‍රීවරු, ඔබතුමන්ලාගේ පක්ෂයේ කට්ටියත් අපට කථා කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නැහැ, නැහැ. බොරු කියන්න එපා.*[බාධා කිරීම්]*

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
නැහැ, නැහැ. *[බාධා කිරීම්]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අහිංසක කට්ටිය,- *[බාධා කිරීම්]* ඒ යෝජනාව ගෙනාවේ මේක අද ඉන්න කට්ටියට නැති කරන්න.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ඔබතුමා කියන එකේ ඇත්තක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒ කියන්නේ, මේක තිබිය යුත්තේ මෙහෙමයි. "අපේ හිටපු" කියලා කිව්වා නම් හරි. අපේ දැන් නැහැ, ඒගොල්ලෝ. ඉන්නවා නම්, ඔහොම කියන්නෙත් නැහැ. නැති හින්දා නේ. ඒගොල්ලන් කොච්චර රවුම් ගැහුවාද? දැන් මම දන්නවා, සිරිකොතේ ඉන්නවා, දෙන්නෙක් විතර. ඔය වැහැරුණු කට්ටියක් ඉන්නවා. මට ආසයි, ඒ අයගේ පෝස්ටර් එකට තියලා press conference එකක් කරන්න. ඒකට පොඩි කැමැත්තක් තිබෙනවා. *[බාධා කිරීමක්]* මම ආවා. මම ආවේ මොකටද දන්නවාද? අර කිරි හරක් ගෙනැල්ලා හොරකම් කරපු file එක භාර දෙන්න. *[බාධා කිරීම්]* මොකද, එතැන නේ, තිබුණේ දූෂණ පිළිබඳ කටයුතු කරන මධ්‍යස්ථානය. ඒ වාගේම තව ආවා. තව ආව අය කියන්නද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලේකම්තුමාත් ඉන්නවා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ඔව්, ඔව්, එයාව තමයි ඇවිල්ලා හම්බ වුණේ. ඇවිල්ලා දීලා ගියා. ඒවාට අපි ඇවිල්ලා තිබෙනවා. ආයේ නැහැ කියන්න ඕනෑ නැහැ. ඇවිල්ලා අපි උපරිම උත්සාහ කළා. මතක තබා ගන්න. මම කියන්නම්, තමුන්නාන්සේලා ඒ කථාව කියපු නිසා. 2015දී තමයි රන් වරම හම්බ වුණේ දූෂිතයන්ට දඬුවම් දෙන්න. හැබැයි තමුන්නාන්සේලාගේ නීතිඥවරු මොනවාද කළේ? මම කියන්නම්. දූෂණ විරෝධී සාකච්ඡාවේ ඉන්නවා, නීතිඥයා. හවසට ගිහිල්ලා, වූදිතට telephone call එකක් දීලා නඩුව භාර ගන්නවා. කැතයි හලෝ, ඔයගොල්ලන්ගේ කට්ටිය. මම මේ දන්නවා, සමහර අය ගැන. ඒ ගොල්ලන්ගේ නීතිඥ සමාගම් නඩු භාර ගත්තා. මෙහෙමයි සිද්ධ වුණේ. *[බාධා කිරීමක්]* මාරපන කියලා නමක් හොයා ගන්නකෝ. ඇද්ද? *[බාධා කිරීමක්]* එයා ඇමතිකමෙන් ඉල්ලා අස් වුණේ අර ඇවන්ට්-ගාර්ඩ් වෙනුවෙන් පෙනී හිටින්න ගිහිල්ලා. මතක තියා ගන්න, මේ ඉතිහාසය. ඔව්, අපි ගිහිල්ලා තිබෙනවා. අපි උපරිම උත්සාහ දැරුවා. 2015දී තමයි රන් වරමක් ලැබුණේ දූෂිතයන්ට දඬුවම් දෙන්න. අලුත් දූෂණය, අලුත්. මිග් ගනුදෙනුව වුණේ 2006දී. 2015 වෙනකොට අවුරුදු 9යි. අද වෙනකොට අවුරුදු 19යි. ඉතින් අමාරුයි, යටගියාව හොයන්න ඒ තරම්. හැබැයි, තමුන්නාන්සේලාට තමයි අවස්ථාව ලැබුණේ. කළේ නැහැ. අපි ගියා නම් අරලිය ගහ මන්දිරයට, ඒ සඳහා පොලඹවන්න ගියා; දෙන්න ගියා, අවස්ථා කිහිපයක්. මතක තියා ගන්න. ඒක නැහැ කියන්නේ නැහැ. වැරදිද ඒක? හෙටත් තමුන්නාන්සේලා කවර හෝ දූෂිතයෙකුගේ file එකක් අරගෙන එනවා නම් අපේ කාර්යාල ඔක්කෝම විවෘත බව මතක තියා ගන්න. හැබැයි, ජීවිතේට අරගෙන එන්නේ නැහැ. බොරු කිය කියා ඉන්නවා. අරගෙන එන්නේ නැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ජනාධිපතිතුමා, මම complain කරලා දැන් මාස දෙකක්. තවම inquiry එකක් නැහැ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
මොකටද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Jaffnaවල hospital එකේ වංචාව ගැන.*[බාධා කිරීමක්]*

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
හරි. ඔව්, ඔව්. එතුමා කියන එක ඇත්ත. රෝහල් පද්ධතියේම ඉදිකිරීම්වල විශාල වංචා, දූෂණ වෙලා තිබෙනවා. ගොඩක් ඒවා. කලබල වෙන්න එපා. තව කාලය තිබෙනවා. මේ පරීක්ෂණ ඔක්කෝම සිද්ධ කරන්නම්. හැබැයි, කාලය දෙන්න. මොකද, අපි ළඟ විශාල ප්‍රමාණයක් ගොඩගැහිලා තිබෙනවා. අපි එකක්වත් ප්‍රමුඛතාවට අරගෙන නැහැ. සමහර ඒවායේ වෙලා තිබෙන දේ තමයි, ඉක්මනින්ම විසඳිය හැකි ඒවා තමයි ඉක්මනින්ම අහු

වෙන්නේ. එහෙම නැතුව තෝරලා නොවෙයි. ඉක්මනින්ම සාක්ෂි එකතු කර ගන්න පුළුවන්, ඉක්මනින්ම ලියකියවිලි එකතු කර ගන්න පුළුවන් නඩු ඉක්මනින් සිද්ධ වෙනවා. සාක්ෂි එකතු කර ගන්න අමාරු, ඉක්මනින් කර ගන්න අමාරු ඒවා ප්‍රමාද වෙනවා. මේ එකක්වත්-*[බාධා කිරීමක්]* හරි. හැබැයි, එතුමා කට උත්තරයක් දෙන්න ඕනෑ, CID එකට විස්තරය දීලා. *[බාධා කිරීමක්]* හරි. එතකොට වෙන වෙන ඒවා කියන්න එපා. "පාර්ලිමේන්තු වරප්‍රසාද මගේ උල්ලංඝනය කළා" එහෙම කියන්න එපා, දැන් තමුන්නාන්සේ මෙතැන කිව්වා නම්. *[බාධා කිරීමක්]* මම කියන්නේ එතුමා එක්ක පැටලෙන්න නොවෙයි. එතුමා ඉතා බරපතළ කථාවක් කිව්වා නේ, කන්ටේනර්වල අවි ආයුධ ආවා කියලා. එතකොට මම කියන්නේ ඒ වාගේ එකක් ඇත්ත නම්, මම නම් පාර්ලිමේන්තුවේ කියන්නේ නැහැ. ගිහිල්ලා රහස් පරීක්ෂක දෙපාර්තමේන්තුවට රහසේ ඔත්තුවක් දෙනවා, මෙහෙම වැඩක් වෙලා තිබෙනවා කියලා. බොරු නම් පාර්ලිමේන්තුවේ කියනවා. *[බාධා කිරීමක්]* ඔක තමයි ඇත්ත, ඇත්ත history එක.*[බාධා කිරීමක්]* මම ගොඩක් පැටලෙන්න යන්නේ නැහැ. මම මේ කියන්න හදන්නේ මේකයි. මේ ආණ්ඩුවේ අවිනිශ්චිතතාව නිර්මාණය කරන්නේ, නීතිය තමන්ගේ ළඟට එන බව දන්නවා, දැන්. කලින් කට උත්තරයට කැඳවනකොට ඊළඟ පියවර කවුද කියන්න දන්නවා. දන්න අය දැන් විවිධ දේවල් කියන්න පටන් අරගෙන තිබෙනවා. නීතියේ විධානයේ ආධිපත්‍යය විශ්වාස කරන රටක් අපට අවශ්‍යයි. තමුන්නාන්සේලා ඕනෑ තරම් දේශපාලනය කරන්න. හැබැයි, මේ දූෂිතයන් සඳහා දඬුවම් දෙන ක්‍රියාමාර්ග අඩපණ කරන්න නම් හීනෙකින්වත් හිතන්න එපා. එහිදී අපට සහාය දෙන්න. මොකද, ඒක අත්‍යවශ්‍ය වැඩක්.

මම වෙලාවක ගෙනැල්ලා තමුන්නාන්සේලාට පෙන්වන්නම්, මේ රටේ ප්‍රසිද්ධ සමාගම් රාජ්‍ය බැංකුවලට කොච්චර පොලු තියලා තිබෙනවාද කියලා. ලංකාවේ තිබෙන ප්‍රධානම හෝටල්වල ලැඟුම් ගන්නා, අධිපරිභෝජනවාදී, luxury ජීවිතයක් ගත කරන, බැලුවාම "මහා කර්මාන්ත හිමියෙක්", "මහා ව්‍යවසායකයෙක්" කියලා ආරූඪ කරගෙන ඉන්න සමහරු රාජ්‍ය බැංකුවලට බිලියන ගණන් පොලු තියලා තිබෙනවා. එහෙමයි, වෙලා තිබෙන්නේ. ඒ ආරූඪ කර ගත්තු ජීවිත ගැන හෙළිදරව් කරන්න ඕනෑ නැද්ද? මේ රට යළි ප්‍රතිෂ්ඨාපනය කරන්න ඕනෑ. අපි ආරම්භ කරලා තිබෙනවා ඒ සඳහා වන ව්‍යායාමය. අපේ ආණ්ඩුවේ මේ ඉන්න කිසිම කෙනෙකු -මම, අපේ අගමැතිතුමිය, අපේ ඇමතිවරුන්, අපේ මන්ත්‍රීවරුන්- කිසිදු පුද්ගලික අපේක්ෂාවක් සඳහා මේ දේශපාලනය තෝරාගත්තු මිනිස්සු නොවෙයි; කිසිදු පුද්ගලික වරදානයක් සඳහා මේ දේශපාලනය තෝරාගත්තු මිනිස්සු නොවෙයි. මා නැවත නැවත එය කියනවා. අද ජාතිකවත්, ජාත්‍යන්තරවත් ඕනෑම කර්මාන්තකරුවෙක්, ඕනෑම ව්‍යාපාරිකයෙක්, ඕනෑම ව්‍යවසායකයෙක්, ඕනෑම රාජ්‍ය තාන්ත්‍රිකයෙක් එක දෙයක් පිළිගන්නවා. ඒ තමයි, ලංකාවේ වත්මන් දේශපාලන අධිකාරිය හොරකම් කරන්නේ නැහැ කියන එක. ඒ පිළිගැනීම, ලංකාවේ පළමු වතාවටයි. ඒක වැදගත්, ආයෝජනයන් සඳහා. ඒක වැදගත්, යහපත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවන් සඳහා. ඒක වැදගත්, අපේ රට ලෝකය ඉස්සරහා දීප්තිමත් රාජ්‍යයක් බවට පත් කිරීම සඳහා. අපේ රට තිබුණේ, කළු රටක් ලෙස. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කොමිසමේ ලියැවුණා, අපේ රටේ මානව හිමිකම් උල්ලංඝනය වෙන්න අපරාධ බලපෑවා, ආර්ථික කඩා වැටීම් බලපෑවා කියලා; ආර්ථිකය කඩා වැටෙන්න වංචා, දූෂණ හේතු වුණා කියලා. ජාත්‍යන්තර වශයෙන් එහෙම කළු චිත්‍රයක් තිබෙන රටක්, අපේ රට. එහෙම රටක් දෙස කවුද බලන්නේ? එහෙම රටකට වීසා දෙන්නේ කවුද? එහෙම රටකට අභිමානයක් තිබෙන්නේ කොහේද?

ලෝකයේ පිළිගන්නා විවිධ ජාත්‍යන්තර සංවිධාන ඇතුළේ අපේ රට ගැන කථා කරනවා. කෙන්යාවේ පාර්ලිමේන්තුව තුළ කථා කළා; ශ්‍රී ලංකාවට වෙච්ච දේ වෙන්න දෙන්න ඕනෑ නැහැ කියලා කිව්වා. එංගලන්තයේ මහාධිකරණයේ විභාගයක් පැවැත්වුණා, airbus ගනුදෙනුව පිළිබඳව. ඒකෙන් එළියට ආවා, ලංකාවේ කපිල චන්ද්‍රසේන කියන නම. ඇමෙරිකාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට මිල දී ගැනීමක් කරන කොට තානාපතිවරයා පගා ගහලා කියලා ඇමෙරිකාවේ පරීක්ෂණයක් පැවැත්වුණා. මහින්දගේ මස්සිනා. එහෙව් රටක්, මේක. මම මේක කියන්න නොවෙයි හිටියේ. මේක එහෙමට තිබුණු රටක් බව මතක තබාගන්න. මේක පිරිසිදු කරන්න ඕනෑ නැද්ද? අපි ඉඳලා මැරිලා යයි. හැබැයි, අපේ රටේ දරුවන්ට මීට වඩා හොඳ විශ්වාසදායක අනාගතයක් පෙන්නුම් කරන, ලෝකය ඉස්සරහා මහත් අභිමානයෙන් ජීවත් වෙන්න පුළුවන් රටක් බවට මේ රට පත් කරන්න ඕනෑ. ඒ සඳහා කළ යුත්තේ මොනවාද? එක, නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කිරීම. දෙක, ආර්ථික සමෘද්ධිය තහවුරු කිරීම. තුන, මොකක්ද? මම දන්නවා, තැන තැන ගිනි අවි පත්තු වෙනවා කියලා. ප්‍රශ්නයක් තිබෙනවා තමයි. මම එය තේරුම් අරගෙන ඉන්නේ.

අද තැන තැන ගිනි අවි පත්තු වෙනවා. හැබැයි, මේකේ ඇතුළාන්තය හොඳට බලන්න. ඒ කාරණය සම්බන්ධයෙන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා, පොලිස් නිලධාරින්; අත්අඩංගුවට අරගෙන තිබෙනවා හමුදාවේ අය. සමහරු හමුදාවේ කැම්ප් එකෙන් එළියට ඇවිල්ලා shooter හැටියට වෙඩි තියලා යනවා; කුලියට මිනී මරනවා. හමුදා කැම්ප්වල තිබුණු අවි ආයුධ; ටී-56 ගිනි අවි 73ක් පාතාලය අතට ඇවිත් තිබෙනවා. ඒ ටී-56 ගිනි අවිවලින් 35ක් අත්අඩංගුවට ගත්තා. තවත් 38ක් පාතාලයෝ ගාව තිබෙනවා. එහෙම රටක්, මේ රට. බන්ධනාගාරය ශුද්ධ කරනකොට බන්ධනාගාරයේ ඉන්න සිරකරුවන් ගාව මංචු තිබිලා හසු වුණා. මංචු හතක් තිබුණා, මාතර බන්ධනාගාරයේ සිරකරුවන් ගාව. යතුරු 27ක් තිබුණා, සිරකරුවන් ගාව. තමුන්නාන්සේලා හිතන රාජ්‍යය නොවෙයි මේ තිබෙන්නේ. නීතිය, පරිපාලන ව්‍යුහය උඩින් පෙන්නුම් කළාට අපරාධ රාජ්‍යයක් ද තිබෙනවා. ඒ අපරාධ රාජ්‍යයටත් අර සබඳතා ජාලය ඒ විධියටම තිබෙනවා. ඒගොල්ලන්ට පාස්පෝට් කාර්යාල තිබෙනවා, පාස්පෝට් හදලා දෙන්න. ඒගොල්ලන්ට RMV එකක් තිබෙනවා, වාහනයේ ලියාපදිංචිය හදලා දෙන්න. ඒගොල්ලන්ටත් ආයුධ දෙන අය ඉන්නවා; කුලී හමුදාවන් ඉන්නවා. මෙහෙමයි කටයුතු සිද්ධ වෙලා තිබෙන්නේ. අපි ඒවාත් එක්ක හැප්පෙන බව මතක තබා ගන්න. මට තව ටික කාලයක් දෙන්න. අපේ රටේ පාතාලය, සංවිධානාත්මක අපරාධ, කුඩු ව්‍යාපාරය ආදිය ඔක්කොම එකට ගැටගැහිලා තිබෙන බව අපි දන්නවා. මේ ව්‍යසනය මැඩ පැවැත්විය යුතුයි. හැබැයි, එය මැඩ පවත්වන්න ඕනෑ කලබලයෙන් නොවෙයි. අපි ඉවසීමෙන්, සැලසුම් සහගතව කටයුතු කරනවා. අපි අපේ බුද්ධි අංශ කෙරෙහි විශ්වාසය තබනවා. අපි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කෙරෙහි විශ්වාසය තබනවා. ඒ නිලධාරින් තමන්ගේ ජීවිත පවා අවදානමට ලක් කරගනිමින් පරීක්ෂණ කරනවා. අපේ රටේ අපරාධවලට සම්බන්ධ, විදේශගතව සිටින අපරාධකරුවන් විශාල ප්‍රමාණයක් අපි අපේ රටට ගෙනාවා. මොන තරම් විහිළුවකටද, මේ රට පත් වෙලා තිබෙන්නේ!

හිටපු Senior DIG කෙනෙක් පාතාලයේ මැරයා ලෙස තර්ජනය කිරීම් කරනවා. එයා තමුන්නාන්සේලාගේ මැතිවරණ වේදිකාවේත් හිටියාද මන්දා? නැහැ නේද? මොකක්ද මේ වෙලා තිබෙන්නේ? Senior DIGsලා මිනිස්සු භය කරනවා, කුලියට මිනිස්සු අරගෙන telephone calls දීලා. එහෙම රටක් මේක. එහෙම රටක් තමයි හැදුණේ. අපි හදන්නේ මේ රට ශුද්ධ කරන්න. අපි පාතාලය මර්දනය කරනවා. නීතිය, ආර්ථික තත්ත්වය, සමාජ ජීවිතය, පොදු පුරවැසියන්ගේ ජීවිත, දරුවන්ට හොඳ

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

අධ්‍යාපනයක්, හොඳ සෞඛ්‍ය සේවයක් අපි හදනවා. අපේ සෞඛ්‍ය ඇමතිතුමා සෞඛ්‍ය සේවය දියුණු කිරීමේ කටයුත්ත පටන් ගන්නවා. අපි පුරවැසියන් 10,000කට එක ප්‍රාථමික වෛද්‍යවරයෙකු බැගින් දෙනවා. සාමාන්‍යයෙන් ගත්තොත්, පුද්ගලයන් බිලියන 60ක් අවුරුද්දකට OPD එකෙන් බෙහෙත් ගන්නවා. ඒ කියන්නේ, පුද්ගලයන් ලක්ෂ 600ක් අවුරුද්දකට OPD එකෙන් බෙහෙත් ගන්නවා. ජනගහනය ඉන්නේ ලක්ෂ දෙසියවිස්සක් වාගේ ප්‍රමාණයක්. නමුත්, ලක්ෂ 600ක් ආණ්ඩුවේ රෝහල්වල බාහිර රෝගී අංශයට යනවා. ඇයි ඒ? අපට නැහැ, හොඳ ප්‍රාථමික සෞඛ්‍ය සේවයක්. අපි ආරම්භ කරනවා, පුරවැසියන් 10,000කට පවුලේ වෛද්‍යවරයෙකු බැගින් හැදීමේ කටයුත්ත. ආරම්භයේදී 100ක් පටන් ගන්නවා, මේ අවුරුද්දේ. ඕනෑම පුරවැසියෙක් ඉස්සෙල්ලා තමන්ගේ ප්‍රාථමික වෛද්‍යවරයා ළඟට යන්න ඕනෑ. ඒ වෛද්‍යවරයා නියම කරයි, කොහේටද බෙහෙත් ගන්න යන්න ඕනෑ, කොත්තමල්ලි බීලා ඉන්න ඕනෑද, ගෙදර ගිහිල්ලා ටිකක් විවේක ගන්න ඕනෑද කියලා. අපේ ප්‍රාථමික සෞඛ්‍ය සේවයේ දැනට තිබෙන මේ සංස්කෘතිය වෙනස් කළ යුතුයි. ඒ වාගේම, අධ්‍යාපනය, පොදු ප්‍රවාහන පද්ධතිය, කෘෂි කර්මාන්තය, වාරි ක්ෂේත්‍රය, මාර්ග පද්ධතිය ආදි ඔක්කොම අපි හදනවා. මකලා තිබෙන රට අපි ගොඩ නඟන බව මතක තබාගන්න.

ඉතා ස්ථාවරව, ශක්තිමත්ව මේ රට ඉදිරියට යමින් තිබෙනවා. මා නැවත කියන්නේ, කවුරුවත් කකුල් වෙට්ටු දමන්න කල්පනා කරන්න එපා කියලායි. නීතිය තිබෙනවා. නීතිය තිබෙන බව මතක තබා ගන්න කියලා මම හැම දෙනාටම කියනවා. මම දැකලා තිබෙනවා, මොන වාගේ විකෘති කථා කියනවාද කියලා. හාන්ස් විජේසූරිය මැතිතුමා ඉන්දියාවෙන් සල්ලි ගන්නවා කියලා කියනවා. මම එතුමාත් එක්ක ඊයේ කථා කළා. එතුමා කිව්වා, "ඒකට නඩු දමන්න ඕනෑ නැහැ, කියපු මිනිහා සතේකට ගණන් ගන්නේ නැහැ" කියලා. නැත්නම්, දමනවා නඩු. එතුමා ස්වේච්ඡාවෙන් සේවය කරන්නේ. ඒ, මිලියන ගණන් පඩි ගත්තු මිනිස්සු. එතුමා ලෝකයේ ප්‍රධාන සමාගමක වැඩ කරපු ප්‍රධාන විධායක නිලධාරියෙක්. ඒ ඔක්කොම දාලා ඇවිල්ලා එතුමා රටට වැඩ කරන්න හදනවා. එහෙම කරන කෙනාට කියනවා, ඉන්දියාවෙන් රුපියල් ගන්නවා කියලා. මොනවාද මේ කථා?

අපි රාජ්‍ය ආයතන ගොඩ නඟලා තිබෙනවා. මම කියන්න කැමැතියි, ඒ ගැනත්. එයාර්ලංකා එක ගැන විවාදයක් තිබෙනවා. හැබැයි, ඒක විකුණුවාට ගන්නේ නැහැ, කවුරුවත්. ඒක අඩුම තරමින් විකුණන තත්ත්වයට හදන්න ඕනෑ ඉස්සෙල්ලා. අපි ඒක හදනවා. මාර්තු මාසයේ 31වැනි දා වනකොට එයාර්ලංකා එකේ මෙහෙයුම් ලාභය බිලියන 29 යි. ඒ කියන්නේ, කෝටි 2,900ක මෙහෙයුම් ලාභයක් තිබෙනවා. හැබැයි, අතීත පව් තිබෙනවා. Airbus මිල දී ගැනීමේදී, ණය ගැනීමේදී ගහපු agreements ගැන කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා. SMS එක ආවේ "Do it" කියලා. මතකද? එච්චේ, රත්වත්තේට අනෙක් රත්වත්තේ. මාමායි, පුතායි ද මන්දා. ඒ airbus ගනුදෙනුව cancel කරන්න **කථා වුණා.** කැබිනට් එකේ සංවාදයක් ගියා එය cancel කරන්න ඕනෑද නැද්ද කියලා. අරහෙන් ඇහුවා, cancel කරන්නද කියලා. SMS එක යැව්වා, "Do it" කියලා. එහෙමයි ඩොලර් මිලියන 117ක් අහිමි වුණේ, එයාර්ලංකා එකට. එහෙමයි ගනුදෙනු සිද්ධ වුණේ. හැබැයි, අපි නැවත ඒවා ගොඩ නඟනවා. ඒ නිසා තමයි එයාර්ලංකා එකේ මෙහෙයුම් ලාභය හැටියට බිලියන 29ක් ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු ජනාධිපතිතුමා, ඔබතුමාගේ පුතා මෙච්චර කාලයකට එළියට ඇවිල්ලාත් නැහැ; කාටවත් ජනාධිපති පාට් දාලාත් නැහැ. හැබැයි, ඔබතුමාගේ පුතා හරහා ඔබතුමා ගාවට එනවා arrears එකක් ගන්න, එයාර්ලංකා එකෙන්. ඒක මතක තබාගන්න.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)

කවුරුවත් ඇවිල්ලා නැහැ තවම. නිල unions එක්ක අපි සාකච්ඡා කළා. නිල union එකේ ප්‍රශ්නයක් තිබෙනවා. මොකක්ද? 2019දී cabin crew එකට දීපු ආහාර දීමනාව කපලා තිබෙනවා. ඒගොල්ලන්ගේ ආහාර දීමනාව ඉල්ලනවා. 2019 අර්බුදය නිසා කෙටි කාලයකට ඒ දීමනාව කපනවා කියන තීරණය තමයි අරගෙන තිබෙන්නේ. හැබැයි, අවුරුදු ගණනාවක් තිස්සේ ඒක ගෙවීම කරලා නැහැ. ඒ නිසා unionsවල ඉල්ලීමක් තිබෙනවා, ඒ ගෙවීම කරන්න කියලා. මමත් හිතනවා, ඒක සාධාරණ ඉල්ලීමක් කියලා. ඒ නිසා ඒ ඉල්ලීමට අදාළ මුළු ප්‍රමාණයම නොවුණත් යම් කොටසක් ලබා දෙන්න අපි එකඟතාව පළ කරනවා, unionsවලට. *[බාධා කිරීමක්]* එය කරන්නේ, වෙනත් කිසි හේතුවක් නිසා නොවෙයි. Union එකේ සභාපතිතුමා එක්ක අපි සාකච්ඡා පැවැත්වූවා. සියලු වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කළා.

වරායේ මෙහෙයුම් ලාභය සියයට 66කින් වැඩි වෙලා තිබෙනවා. කඩා වැටිලා තිබුණු මිල්කෝ ආයතනය ගොඩ නඟලා තිබෙන බවත් මතක තබා ගන්න. මම තමුන්නාන්සේලාට කියන්නම්, පසු ගිය කාලයේ මේ රටට කරලා තිබෙන විනාශය. ඩෙන්මාර්කයෙන් ණයක් අරගෙන බඩල්ගම කිරි factory එකක් හැදුවා, බැසිල් රාජපක්ෂ. ධාරිතාව කිරි ලීටර් ලක්ෂ 4 යි. හැබැයි, දැනුත් මිල්කෝ එක ගන්නේ කිරි ලීටර් 280,000 යි. ඒ කිරි ලීටර් 280,000ත් දිගන factory එකට යවන්න ඕනෑ, අඹේවෙල factory එකට යවන්න ඕනෑ, පොළොන්නරුව factory එකට යවන්න ඕනෑ. එහෙම යැව්වාම කිරි ලීටර් 50,000යි ඉතිරි වෙන්නේ. හැබැයි, **බඩල්ගම** factory එකේ ධාරිතාව කිරි ලීටර් ලක්ෂ 4 ලු. එහි වැඩ අවසන් කරලා නැහැ. අපි ඒ ගැන විගණනයක් කරනවා; අපි ඒ ගැන පරීක්ෂණයක් කරනවා. ඒක විනාශ කරලායි තිබෙන්නේ. අපේ ප්‍රතිපත්තිය මෙකයි. අපි අපේක්ෂා කරනවා, මිල්කෝ ආයතනය බඩල්ගමට ගෙනිහිල්ලා - සේවකයෝ කලබල වෙ යි- ඉතා නූතන factory එකක් ලෙස ස්ථාපිත කරන්න; ඒ කියන අර්බුද ඔක්කොම විසඳන්න. එළඹෙන අය වැය ලේඛනයෙන් කොච්චර සල්ලි ඕනෑද කියලා අපි ඇහුවා. මොකද, ගෙනාපු යන්ත්‍ර සූත්‍ර ඔක්කොම දිරාපත් වෙමින් තිබෙනවා. බඩල්ගමට ගිහිල්ලා බලන්න. එහෙව් අපරාධකාරයෝ මේ රට පාලනය කළේ. ඉතින් ඒවා ගොඩ නඟන්න ඕනෑ. ඒ නිසා කිරි ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම ගැනත් අපි කල්පනා කරනවා.

අපේ රටේ නිෂ්පාදනය කළ හැකි හැම ක්ෂේත්‍රයකටම අපි සහාය දෙනවා. අපි මෙවර අය වැය ලේඛනය සකස් කරන කොට රටේ සියලුම sectors - එක් එක් ක්ෂේත්‍ර - කැඳවන්න කල්පනා කරනවා. ඔවුන්ට තිබෙන ගැටලු මොනවාද කියලා සොයා බලා අපි උපරිම වශයෙන් උත්සාහ කරනවා ඒ ගැටලුවලට විසඳුම් දෙන්න. මේ රට යළි ප්‍රබෝධවත් රාජ්‍යයක් බවට පරිවර්තනය කළ යුතුයි. කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රබෝධයක්, ජනතාවගේ මනසේ ප්‍රබෝධයක්, නීතියේ ප්‍රබෝධයක්, ප්‍රබෝධවත් ජාතියක් හැදිය යුතුයි. ප්‍රබෝධවත් රාජ්‍යයක් බවට මේ රාජ්‍යය පරිවර්තනය කරන්න පුළුවන්. ඒ සඳහා තිර අදිටනින් යුතුව අපි වැඩ කරමින් ඉන්නවා. ඒ අතරේ තමුන්නාන්සේලාට නිකම් ඉන්නත් බැහැ නේ.

ගමට ගිහිල්ලා පොඩි රැස්වීමක් තියන්න. කමක් නැහැ. මිනිසුන්ට කථා කරන්න. කමක් නැහැ. තමුන්නාන්සේලා සංවිධානය වෙන්න, ජනතාව දැනුවත් කරන්න. ඒ අයිතිය මම දෙන්න ඕනෑ දෙයක් නොවෙයි. ඒක තමුන්නාන්සේලාගේ අයිතිවාසිකමක්.

කිසි කෙනෙකුගේ ඒ අයිතිවාසිකමට බාධා වෙන්නේ නැහැ. හැබැයි, කුමන්ත්‍රණ කරන්න ලෑස්ති නම්, රටේ අරාජිකත්වයක් නිර්මාණය කරන්න ලෑස්ති නම් ඒවාට ඉඩ තබන්නේ නැහැ. මම තමුන්නාන්සේලාට කියන්නම්. අපි ටී-56ක් අත්අඩංගුවට ගත්තා කිරිබත්ගොඩදී. ඒ පිළිබඳ තොරතුරු හඹාගෙන ගියා. ඒ හඹාගෙන යනකොට වවුනියාවේදී අත් බෝම්බ ප්‍රමාණයක් සොයා ගත්තා. අත් බෝම්බ 80ක් ටැංකියක තිබී සොයා ගත්තා. ඒ අත් බෝම්බ 80ම කොළඹට ගෙනෙන්න සැලසුම් කරපු බවක් තිබෙනවා. කුමක්ද මේ කරන්න හදන්නේ? ඒ නිසා කවුරු කොතැනක කුමන්ත්‍රණ කළත් ඒවාට ඉඩ තබන්නේ නැහැ. ඒක පාතාලය උපයෝගී කරගෙන වෙන්න පුළුවන්. පැරදුණු කණ්ඩායම් යම් කුමන්ත්‍රණයක යෙදෙනවා නම්, දේශපාලන කුමන්ත්‍රණයක යෙදෙනවා නම්, මතක තබා ගන්න ඒවාට ඉඩ තබන්නේ නැහැ. මේ රට ගොඩනැඟීම සඳහා සද්භාවයෙන් යන ගමනට බාධා කරන්න කිසි කුමන්ත්‍රණකරුවෙකුට ඉඩ දෙන්නේ නැහැ. නීති මදි නම් නීති හදනවා. මොකද, මේ රට ගොඩගන්න ඕනෑ. හැබැයි, පරාජිත දේශපාලකයන් තමන්ට අහිමි වුණු වරප්‍රසාද නිසා, තමන්ට දඬුවම් ලැබෙයි කියලා තමන්ගේ හොරකම් සඟවා ගන්න, තමන්ගේ අපරාධ සඟවා ගන්න රටක කුමන්ත්‍රණයක ගොදුරු බවට පත් වෙන්න ඕනෑ නැහැ. ඒකට තමයි ආණ්ඩු හදලා තිබෙන්නේ. අනෙක් ආණ්ඩු කුමන්ත්‍රණවලින් අල්ලන්න පුළුවන්. ඇල්ලුවා නේ. 2001 ආණ්ඩුව වැටුණේ කුමන්ත්‍රණයකින්. 2018 ආණ්ඩුව ඇල්ලුවේ කුමන්ත්‍රණයකින්. 2022දී නම් ජනාධිපති පා වෙලා පත් වුණේ. ඒක කුමන්ත්‍රණයකින් කියලා මම නම් කිසිසේත්ම හිතන්නේ නැහැ. සමහර අය කියනවා නේ ඒක කුමන්ත්‍රණයකින් කියලා. නැහැ. එතුමා පා වෙලා ඇවිල්ලා ජනාධිපති බවට පත් වුණේ. කුමන්ත්‍රණයකින් නොවෙයි. හැබැයි, අපේ ඉතිහාසයේ කුමන්ත්‍රණ තිබිලා තියෙනවා. ආණ්ඩු වැඩ කරනකොට ආණ්ඩුවට එරෙහිව කුමන්ත්‍රණ හදලා තිබෙනවා. ඒවා අපි හඳුනාගෙන තිබෙනවා.

පාතාලයෙන් තැන තැන කරන පිපිරීම් පිළිබඳව අපි ඉතා හොඳ පරීක්ෂණයක් කරනවා. මහරගම මෑත කාලයේ කිසිදු පිපිරීමක්, වෙඩි තැබීමක් සිද්ධ වුණේ නැහැ. හැබැයි, ඊයේ රෑ සිද්ධ වෙලා තිබෙනවා. ඒ කොහොමද සිද්ධ වෙන්නේ? මොකක්ද මේ කරන්න හදන්නේ? එම නිසා කවුරු හරි නිලධාරියෙක් රාජ්‍ය ඇතුළේ ඉඳගෙන හෝ රාජ්‍යයෙන් එළියේ ඉඳගෙන, ඒ වාගේම කවුරු හරි දේශපාලනඥයෙක් පාර්ලිමේන්තුවේ ඇතුළේ ඉඳගෙන හෝ පාර්ලිමේන්තුවෙන් එළියේ ඉඳගෙන මේ රට ගොඩනැඟීම සඳහා යන මේ ගමන කුමන්ත්‍රණකාරී ලෙස බිඳ වට්ටවන්න උත්සාහ කරනවා නම් එයට ඉඩ දෙන්නේ නැහැ. රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති තරම් තිබෙනවා. මාධ්‍යයෙන් ඕනෑ තරම් දේවල් කථා කරන්න. අපි මාධ්‍යයට මොකුත් කරන්නේ නැහැ. ඕනෑ තරම් ලියන්න. අපිමොකුත් කියන්නේ නැහැ. තමුන්නාන්සේලා ඕනෑ තරම් මාධ්‍ය සාකච්ඡා තියන්න. අපි මොකුත් කියන්නේ නැහැ. ගම්වලට ගිහින් ඕනෑ තරම් සංවිධානය වෙන්න, ජනතාව දැනුවත් කරන්න. තමුන්නාන්සේලාගේ දේශපාලන ව්‍යාපාර ගොඩනඟා ගන්න. ඒවාට කිසි බාධාවක් කරන්නේ නැහැ. හැබැයි, කිසි කෙනෙක් කොතැනක හෝ ඉඳගෙන රාජ්‍යයට එරෙහිව කුමන්ත්‍රණ කරන්න ලෑස්ති නම් ඒ කුමන්ත්‍රණ පරාජයට පත් කිරීම සඳහා ගත හැකි හැම පියවරක්ම ගන්නවා. මා එය කියන්නේ වෙන මොකුත් නිසා නොවෙයි. කාදිනල් උන්වහන්සේ ගැන කරපු ප්‍රකාශයක් තිබෙනවා. ව්‍යංගයෙන් ඒ කියන්නේ මොකක්ද? උන්වහන්සේ එදින පාස්කු පූජාවට සම්බන්ධ නොවුණේ ප්‍රහාරයක් සිදු වන බව දැනගෙන ද කියලා සැකක් හදනවා. මම දැක්කා උන්වහන්සේගේ පැත්තෙන් ඒකට මාධ්‍ය සාකච්ඡාවක් තියලා තිබුණා. මොකක්ද මේ කියන්න හදන්නේ? "ඒ ප්‍රහාරය සිද්ධ වන බව කාදිනල් උන්වහන්සේ දැනගෙන සිටියාය" කියලා. ඒ, කුමන්ත්‍රණ. ඒවා නිකම් වචන නොවෙයි. ඒ වචන කථා කරන මහත්වරුන්ට මම අවධාරණය කරනවා. ඒ හැම වචනයකම වගකීම ඔවුන් ගන්න ඕනෑ.

උදය ගම්මන්පිල ප්‍රකාශයක් කරලා තිබෙනවා, "ආණ්ඩුව විසින් තමයි නාවික හමුදාපතිවරයා එල්ටීටීඊ සාක්ෂියක් මත අත්අඩංගුවට ගත්තේ" කියලා. නාවික හමුදාපති අත්අඩංගුවට ගත්තේ අධිකරණ නියෝගයක් නිසා. ඒ නිසා විකෘති හදන්න එපා කියන්න. අපට ඒවා තේරෙනවා. ඒ බව මතක තබා ගන්න. අපි දොරේ සද්දෙත් බෙරේ සද්දෙත් දෙකම හඳුනනවා. කොහොමද දොරට ගහනකොට, කොහෙමද බෙරේට ගහනකොට කියලා අපි හඳුනනවා. එම නිසා මම නැවත කියනවා, සිතුවිල්ලක් හෝ තිබෙනවා නම් කොතැනක හරි කුමන්ත්‍රණයක් කරන්න, ඉඩ දෙන්නේ නැහැ. ආර්ථික පැත්තෙන් තවත් පැතිවලින් ඔබතුමන්ලා දේශපාලනය කරන්න. මොකද, රට ඉතාමත් හොඳ පීල්ලකට අපි අවතීර්ණ කරලා තිබෙනවා. ඒ කාර්යය අපි අවසන් කරනවා. මේ රටේ ජනතාවත් මේ රටත් මේ පත් වෙලා තිබෙන අපකීර්තියෙන්, මේ පත් වෙලා තිබෙන ඉතාම අසීරුතාවෙන් මේ රට මුදා ගැනීමේ වුවමනාව විතරයි අපට තිබෙන්නේ. අන්න ඒ වෙනුවෙන් අපි වැඩ කරනවා. ඒ සඳහා අපේ අමාත්‍ය මණ්ඩලය, -අපේ කැබිනට් මණ්ඩලය- අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, රාජ්‍ය නිලධාරින් වැඩ කරනවා. විපක්ෂයත් සද්භාවයෙන් සහාය දෙන්න. මේක තමයි කාර්යය. වෙන මොකක්ද කරන්න තිබෙන්නේ? වෙනසක් වනවා නම් ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඇමතිකමක් ලැබෙයි. ඊට වඩා වෙනසක් වෙන්නේ නැහැ. මතක තබා ගන්න. රට ගොඩ නැඟීම තමයි කළ යුතු වැඩේ. මීට වඩා වැඩක් තිබෙනවා නම් කියන්න. හැබැයි, හොඳ දෙයක්. ඕනෑ කෙනෙක් අපට එවැනි යෝජනාවක් ඉදිරිපත් කරන්න, අපි ලෑස්තියි. හැබැයි, කිසි කෙනෙක්-

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
DCB සල්ලි දුන්නේ නැහැ නේ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
DCB එකේ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. මම ඒක ඊළඟ අය වැයේදී විසඳන්නම්. අපි ඇත්තටම වෙන් කළේ දිස්ත්‍රික්කවලට. දිස්ත්‍රික්කවලට පොදුවේ වෙන් කළේ. මන්ත්‍රීවරු සංඛ්‍යාව බලලා වෙන් කළා. ඇත්තටම දිස්ත්‍රික්කයෙන් සිදු විය යුතු කාර්යයක් තිබුණා. ඒ තමයි, ඒ මුදල්වලට සරිලන යෝජනා ප්‍රමාණයක් හැම මන්ත්‍රීවරයාගෙන්ම ගත යුතුව තිබුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
යෝජනා ඉල්ලුවා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
මම දන්නේ නැහැ සමහර තැන්වල- *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපේ යෝජනා දීලා තිබෙන්නේ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
එහෙම සිද්ධ වෙලා තිබෙනවා නම්, ඒක නිවැරදි කරන්නම්. මම ඒක පිළිගන්නවා.

අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට අපේ අපේක්ෂාව වුණේ හැම මන්ත්‍රීවරයාටම මේ ප්‍රතිපාදන ලැබිය යුතුයි කියන එක. ඒ ගැන මා අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට කිව්වා. දිස්ත්‍රික්කයට මුදල් ප්‍රමාණය ගියාට පස්සේ ඒ මුදල්වලට සරිලන යෝජනා ප්‍රමාණයක් ඒ දිස්ත්‍රික්කයේ හැම මන්ත්‍රීවරයකුගෙන්ම ගත යුතුව තිබුණා. නමුත්, සමහර තැන්වල එය බිඳ වැටී තිබෙන බව මටත් වාර්තා වුණා. සමහර තැන්වල එය සිද්ධ වෙලා තිබෙනවා. ඊළඟ අවුරුද්දේ එහෙම සිද්ධ වෙන්න දෙන්නේ නැහැ. ඒක මම සහතික කරන්නම්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ජනාධිපතිතුමනි, ඒ චක්‍රලේඛය වැරදියි.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
Double කරන්නත් අපි try එකක් දෙන්නම්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ජනාධිපතිතුමනි, ඒ චක්‍රලේඛය වැරදියි. අපට අවස්ථාව දුන්නා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ඒ නිර්ණායකවලට අනුව දෙන්න අමාරුයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නමුත්, ඒ චක්‍රලේඛය වැරදි නිසා ඒක කරගන්න බැරි වුණා. ඒ නිසා කරුණාකර ඒක වෙනස් කරන්න.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
සමහරවිට එහෙම ඇති. අපි කථා කරලා ඒ නිර්ණායක වෙනස් කරන්න ඕනෑ නම් වෙනස් කරමු. ඒවාට අපි එකඟයි. ඒ නිර්ණායක වෙනස් කරන්න ඕනෑ නම් අපි වෙනස් කරමු.

අනික් එක, මෙතැන ප්‍රශ්නයක් මතු වුණා. අපි අය වැය ලේඛනය pass කළේ මාර්තු 21වන දා. ඒ විගසම පළාත් පාලන ඡන්දය කැඳෙව්වා. මැයි 06වන දා තමයි පළාත් පාලන ඡන්දය අවසන් වුණේ. එතකොට අර ව්‍යාපෘතිවලට යන්න, මනින්න මැතිවරණ කොමිසමෙන් බාධා තිබුණා. එතකොට මැයි 06වන දායින් පස්සේ තමයි අපට මේ ව්‍යාපෘති ආරම්භ කරන්න සිද්ධ වෙන්නේ. එතකොට තිබෙන කාලය කෙටියි. මොකද, දෙසැම්බර් මාසයේ 31වන දා වෙනකොට මේ ව්‍යාපෘති අවසන් කරගන්න ඕනෑ. ඒ නිසා සමහරවිට යෝජනා ගන්නකොට සමහර මන්ත්‍රීවරු අත් හැරෙන්න ඇති. මොකද, මැයි මාසයෙන් පසුව තමයි අපට ඒ වැඩ පටන්ගන්න සිද්ධ වුණේ. අපේ රටේ අමාත්‍යාංශයට මුදල් වෙන් වුණාම තමයි ක්‍රියාකාරකම් පටන්ගන්නේ. ඒක සාධාරණයි, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු පැත්තෙන්. ඇයි? ඉස්සර අය වැයෙන් මුදල් වෙන් කළාට දෙන්නේ නැහැ. හැබැයි, අපි මේ සැරේ අය වැයෙන් 2025ට වෙන් කරපු මුදල් ඔක්කොම දෙනවා. අද අපට මුදල් දෙන්න පුළුවන්, අර වැඩකටයුතු යම් ප්‍රමාණයක් ප්‍රමාද වෙලා තිබෙනවා. ඒ නිසා තවදුරටත් අය වැය ලේඛනයෙන් වෙන් වන මුදල් ප්‍රමාද වෙනවාය කියන සාකච්ඡාවක් ලංකාවේ කවදාවත් වෙන්නේ නැහැ. 2026 අය වැය ලේඛනය අපි පාස් කළ විගස ජනවාරි මාසයේ ඉඳන් පටන්ගන්න පුළුවන් විධියට මුදල් ලැබෙනවා. අපි එහෙම ප්‍රතිපත්ති හදලා තිබෙනවා. මොකද, මේ මුදල් ලබා නොදීම විසින් ප්‍රමාද වීම් ඇතිවෙලා තිබෙන බව මා දන්නවා. මා හිතන්නේ මෙතැන විශේෂ ප්‍රශ්නය ආවේ, මැයි 06න් පසුව ව්‍යාපෘති ආරම්භ කරන්න අපට සිද්ධ වුණු එක. එතකොට කලබලේට දිස්ත්‍රික් සංවර්ධන කමිටුවලින් ඉක්මනින් යෝජනා ටික අරගෙන එවන්න ඇති. ලබන අවුරුද්දේ එහෙම වෙන්නේ නැහැ. හැම මන්ත්‍රීවරයකුටම වෙන් කරන මුදල් ප්‍රමාණයට සරිලන යෝජනා ප්‍රමාණයක් හැම දිස්ත්‍රික්කයෙන්ම ලබා ගැනීමට අපි අවස්ථාව හදලා දෙන්නම්. මේ ගොල්ලන්ට මුදල් දෙන්න ඕනෑ නැහැ කියන විධියේ එහෙම දේශපාලනයක් අවශ්‍ය නැහැ. එහෙම දේශපාලනයක් අපි කරන්නේ නැහැ. මන්ත්‍රීවරු නම් කාටත් මන්ත්‍රීවරු හැටියට සලකනවා.

ඒ විතරක් නොවෙයි. මම කියන්න කැමැතියි, එළැඹෙන අය වැය ලේඛනයෙන් මන්ත්‍රී ධුර කාලයට පාවිච්චි කරලා ආපසු ලබා දෙන්නට යම් සහන වාහනයක් ලබා දෙන්න අපි අපේක්ෂා කරනවා. *[බාධා කිරීමක්]* ඔව්, ඒ ටික තමයි අපි දැන් දිස්ත්‍රික් සංවර්ධන කමිටුවල කථා කරන්නේ. අපි දන්නවා, මැයි මාසයෙන් පස්සේ අපට ඒ වැඩ ආරම්භ කරන්න සිද්ධ වුණු නිසා ප්‍රමාදයක් තිබෙනවා. අපි සෑම දෙපාර්තමේන්තුවකින්ම ආයතනයකින්ම තොරතුරු කැඳවනවා. වැඩියෙන් මුදල් වෙන් කරපුවා කැඳවලා අපි ඒකට උත්සාහ කරමින් ඉන්නවා.

ඉතාම හොඳ ගමනකට අපි අඩිතාලම දමා තිබෙනවා. ඉතින්, මම තමුන්නාන්සේලාගෙන් අවසන් වශයෙන් ඉල්ලන්නේ මේකයි. මේ ගමන තමයි අපට යන්න තිබෙන්නේ. වෙන පාරක් නැහැ. තමුන්නාන්සේලා වෙනස් දේශපාලන පක්ෂ හැටියට ඉන්න, බලය සඳහා අරමුණින් වැඩ කරන්න. ඒක හොඳයි. ඒක නරක නැහැ. බලය ලබා ගැනීම සඳහා අරමුණින් වැඩ කරන්න. හැබැයි, කුමන්ත්‍රණවල යෙදෙන්න එපා; අස්ථාවරභාවයක් නිර්මාණය කරන්න එපා; ආර්ථිකය පිළිබඳ අවිනිශ්චිතතාවක් හදන්න එපා. නේද, හර්ෂ? අර කියපු විධියට වුණා නම් ඇමෙරිකානු බද්ද සියයට 44යි අද 07වැනි දා වෙනකොට. *[බාධා කිරීමක්]* ඇයි, අර කිව්වේ, SL VLOG එකේ. මේ යන විධියට ගියොත් බද්ද සියයට 44 වෙයි කිව්වා නේ. කිව්වා, හර්ෂ ඒක. මම බලනවා ඔබතුමාගේ ඒවා ටිකක් වැඩියෙන්, මොනවාද මේ කියන්නේ කියලා. ඔබතුමා සියයට 44 වෙයි කිව්වා. එතකොට අපට සියයට 30ට තිබුණේ. මේ යන විධියට සියයට 30 නොවෙයි, 44 වෙයි කිව්වා. ඉන්දියාව සියයට 15ට, 20ට අඩු කරගනියි. මේක record කරගන්න කිව්වා. දැනුත් ඉන්දියානු නියෝජිත කණ්ඩායමක් එක්සත් ජනපදයේ ඉන්නවා කිව්වා. අපේ අය මේවා onlineවලින් කථා කර කර ඉන්නවා කිව්වා. මේක සිද්ධ වුණොත්, -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම ඔබතුමාට thank කළා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ඒ පස්සේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මාව බයිට් එකට ගත්ත නේ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
නැහැ, නැහැ. *[බාධා කිරීමක්]* කියන්න, කියන්න. මට ඇහෙනවා. අපි අවසන් කරන්නයි හදන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට විනාඩියක් ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මෙහෙම නේ, ගරු ජනාධිපතිතුමනි. අපට ඔබතුමා බයිට් එකට ගන්න බැහැ නේ. ඔබතුමා ජනාධිපතිතුමා නේ. ඉතින්, අපි ගෞරවය දීලා අහගෙන ඉන්නවා. කමක් නැහැ. හැබැයි, ඔබතුමා හමු වුණු අවස්ථාවේදී අපි කළ යුතු දේ කුමක්ද කියන එක ඔබතුමාට පැහැදිලිව ඉදිරිපත් කළා. අපි කැමැතියි, ජනාධිපතිතුමා, වෙච්ච වැඩේට අපි කැමැතියි. අපිත් මේ රටට ආදරෙයි. දේශපාලනය කරනකොට අපි පොඩි පොඩි දේවල්, ඒවා මේවා කියනවා. ඔබතුමාත් කිව්වා. නැහැ කියන්න එපා. Lobby එකේ වාඩිවෙලා අපි කොච්චර කථා කළාද, ආණ්ඩුවට ගහන්න.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
පොඩි පොඩි ඒවා කියන එක ඉතින් පොඩි පොඩි අයගේ වැඩ නේ. මට ඒ පොඩි පොඩි ඒවා කියන එකේ කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ පොඩි අය. පොඩි අය කොහොමත් පොඩි පොඩි ඒවා කිය කියා ඉන්න ඕනෑ නේ. පොඩි නැහැ. හොඳයි, හොඳයි, ආචාර්යතුමා. මම මේ කියන්න හදන්නේ ඒක නොවෙයි. මම මේ කියන්න හදන්නේ මේකයි. හැබැයි, අරක පොඩි නැහැ හර්ෂ. SL VLOG හෝ මොකක් හෝ YouTube වැඩසටහනක ඔබතුමා කියනවා -මේක සිද්ධ වුණේ 05 වාගේ දිනයක, මට මතක විධියට- මේ තිබෙන විධියට. එතකොට අපි සියයට 30 සිටියේ. දැන් මේ අසාර්ථකභාවය, හොඳ කණ්ඩායමක් හිටියේ නැහැ, හරියට උපදෙස් ගත්තේ නැහැ, මේ වැඩේ කරලා සියයට 44 වෙච්, ඉන්දියාව 15 දක්වා අඩුවෙයි,

එතකොට අපට මොකුත් නැහැ, ඉතිරි වෙන්නේ නැහැ කියලා කිව්වා. ඔබතුමා කියපු විධියට අද වෙනකොට රට වැටෙන්න ඕනෑ. අද වෙනකොට ඒ tax එක ක්‍රියාත්මක වෙනවා නේද? එහෙම නම් අද වෙනකොට රට වැටෙන්න ඕනෑ. එහෙම වුණේ නැහැ නේ. ඒ නිසා ඒවා පොඩි නැහැ. ඒවා ආර්ථිකය පිළිබඳ අවිනිශ්චිතතාව.

මම විශේෂයෙන්ම ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාගෙනුයි ඉල්ලන්නේ. වාහන ගෙන්වන කොට, එහෙම වාහන ගෙන්වන්නේ නැහැ කිව්වා. එහෙම ආදායමක් එන්නේ නැහැ කිව්වා. එහෙම සැක ම කරන්න එපා. අපි වාහන වෙළෙඳ පොළ විවෘත කළා. මම දැනුත් කිව්වේ. දැනට ඩොලර් මිලියන 1,268ක LCs open වෙලා තිබෙනවා. අපි අපේක්ෂා කරනවා මිලියන 1,500ත්, මිලියන 1,800ත් අතර ප්‍රමාණයක් දෙසැම්බර් වෙනකොට open වෙයි කියලා. එතකොට අපි ඩොලරය වැටෙන එකට ඔරොත්තු දෙන්න ඩොලර් ප්‍රමාණය හොයා ගන්න ඕනෑ. ඒකට අපි සැලසුම් ගණනාවක් හදලා තිබෙනවා.

අපි අවසන් වශයෙන් කියන්නේ වෙන මොකුත් නොවෙයි. මේ රට අපට ස්ථාවර කර ගන්න පුළුවන්. ඒ සඳහා වැඩ ගොඩක් කරලා තිබෙනවා. හැබැයි, ජනතාවගේ ජීවිතය වර්ධනය කර ගන්න, ජනතාවගේ එදිනෙදා කටයුතුවල - ආර්ථිකය, ආහාරපාන, අධ්‍යාපනය, සෞඛ්‍ය, මහාමාර්ග, සේවාවල - යම් දුරස්ථභාවයක් තිබෙනවා. අපි ඊළඟ අය වැය ලේඛනය සකස් කරන්නේ ඒ ශක්තිමත්භාවය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන්. ඒ බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමනි. මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Kathiravelu Shanmugam Kugathasan. You have 16 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[பி.ப. 1.45]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற இலங்கையின் தற்போதைய பொருளாதார நிலைமை பற்றிய ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் எனது கருத்துகளை எடுத்துரைக்க விழைகின்றேன்.

நடுத்தர வருமானம் கொண்ட நாடான இலங்கையானது, விவசாயம், கைத்தொழில் மற்றும் சேவைத்துறைகளை அடிப்படையாகக் கொண்டுள்ளது. இது பெருந்தோட்ட உற்பத்திகள், ஆடைகள், சுற்றுலா, கட்டுமானம், வெளிநாட்டுப் பண வரவு முதலிய துறைகளைப் பெரிதும் நம்பியுள்ளது. 2020ஆம் ஆண்டைத் தொடர்ந்து இலங்கையானது நிதிப் பற்றாக்குறை, கடன் மற்றும் கட்டமைப்பு சிக்கல்களோடு போராடியது. 2022ஆம் ஆண்டில் வரலாற்றுப் பொருளாதார நெருக்கடியொன்றைச் சந்தித்தது. இது கடன் சுமை, அந்நிய நாணய மாற்றுப் பற்றாக்குறை, பணவீக்கம் மற்றும் பொது அமைதியின்மை முதலியவற்றால் வெளிப்படுத்தப்பட்டது.

2023, 2024 மற்றும் 2025ஆம் ஆண்டுகளில் இலங்கையின் பொருளாதாரத்தில் ஏற்பட்ட முதன்மையான மாற்றங்களை

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

இங்கு ஒப்பீட்டு அடிப்படையில் எடுத்துரைக்க முனைகின்றேன். மேற்படி மூன்று ஆண்டுகளும் இலங்கையின் பொருளாதாரத்தைக் காப்பாற்றும் போராட்டக் காலமாக அமைந்தது. கொள்கை மறுசீரமைப்பு, பன்னாட்டு ஒத்துழைப்பு மற்றும் மக்களின் பங்களிப்புமூலம் நாடு மீட்புப் பாதையில் பயணிக்கத் தொடங்கியுள்ளது. 2023ஆம் ஆண்டில் வணிகப் பொருள் ஏற்றுமதி மூலமான வருமானம் 11 பில்லியன் அமெரிக்க டொலராகக் காணப்பட்டது. முதன்மை ஏற்றுமதிகளான தேயிலை, இறப்பர் மற்றும் ஆடைக் கைத்தொழில்கள் வளர்ச்சி குன்றிக் காணப்பட்டன. உரப் பற்றாக்குறையால் விவசாயமும், எரிபொருள் பற்றாக்குறையால் தொழிற்றுறையும் பாதிக்கப்பட்டன. சேவைகள் துறை குறிப்பாக, சுற்றுலாத்துறை தொடர்ந்து சோர்வாகவே இருந்தது.

பொருளாதாரச் சீர்திருத்த நடவடிக்கைகள் மற்றும் உள்நாட்டு உற்பத்தி ஊக்கம் காரணமாக 2024ஆம் ஆண்டில் வணிகப் பொருள் ஏற்றுமதி வருமானம் சற்று உயர்ந்து 12.7 பில்லியன் அமெரிக்க டொலரை எட்டியது. சேவைகள் துறையில் சுற்றுலா மற்றும் தகவல்தொழிநுட்ப சேவைகள் ஓரளவுக்கு வளர்ச்சி பெற்றன. 2025ஆம் ஆண்டில் வணிகப் பொருள் ஏற்றுமதி வருமானம் 14 பில்லியன் அமெரிக்க டொலரைத் தாண்டுமென எதிர்பார்க்கப்படுகின்றது. சிறிய மற்றும் நடுத்தரத் தொழில்கள், மீன்வளத்துறை, வெளியகச் சேவைகள் முதலியன புதிய வளர்ச்சித் தளங்களை உருவாக்கியுள்ளதை அவதானிக்கக்கூடியதாக உள்ளது.

கட்டுமான நடவடிக்கைகளில் நீடித்த விரிவாக்கமானது, 2025ஆம் ஆண்டின் நடுப்பகுதியில் மிகவும் ஊக்கமளிப்பதாக உள்ளது. கட்டுமானத்துக்கான கொள்முதல் குறியீடு 2023ஆம் ஆண்டில் 52.7ஆகவும், 2024ஆம் ஆண்டில் 57.2 ஆகவும் 2025ஆம் ஆண்டு யூன் மாதத்தில் 58.6 ஆகவும் காணப்பட்டது. இது கட்டுமான நடவடிக்கைகளில் தொடர்ச்சியான விரிவாக்கத்தைக் காட்டுகின்றது. இந்தக் கட்டுமான நடவடிக்கைகளால் உருவாக்கப்பட்ட மீட்சியானது, பரந்த பொருளாதார வளர்ச்சியின் முக்கிய உந்துதலாக இருந்து வருகின்றது.

2024ஆம் ஆண்டில் அடையப்பட்ட 5 சதவீத மொத்த உள்நாட்டு உற்பத்தி வளர்ச்சிக்குக் கட்டுமானத்துறை கணிசமாகப் பங்களித்துள்ளது. 2024ஆம் ஆண்டில் இலங்கையின் மொத்த ஏற்றுமதி வருமானம் 12.8 பில்லியன் அமெரிக்க டொலராகவும் மொத்த இறக்குமதி செலவினம் 18.8 பில்லியன் அமெரிக்க டொலராகவும் காணப்பட்டது. இந்தச் சூழலில், வர்த்தக நிலுவைப் பற்றாக்குறை 6 பில்லியன் அமெரிக்க டொலராக உள்ளது. 2025ஆம் ஆண்டில் இலங்கையின் மொத்த ஏற்றுமதி வருமானம் 18.2 பில்லியன் அமெரிக்க டொலராக அதிகரிக்குமென எதிர்பார்க்கப்படு கின்றமை குறிப்பிடத்தக்கது.

உள்நாட்டுப் பிரதேச வர்த்தக ஏற்றத்தாழ்வுகளை நிவர்த்தி செய்யாவிடின், இலங்கை அதன் சென்மதி நிலுவை மற்றும் வெளிநாட்டு நாணய இருப்பில் தொடர்ச்சியான அழுத்தத்தை எதிர்கொள்ளும் அபாயம் உள்ளது. வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களின் ஏற்றுமதி பங்களிப்பை வலுப்படுத்துவது இதற்கு இன்றியமையாததாகும்.

2023ஆம் ஆண்டில் வெளிநாட்டுப் பண வரவு 6 பில்லியன் அமெரிக்க டொலராக இருந்தது. இதற்கு புலம்பெயர் தொழிலாளர்களின் எண்ணிக்கை குறைதல் மற்றும் நாட்டு நிதி நிறுவனங்களின் நம்பிக்கை இழப்பு ஆகியன காரணமாக அமைந்தன. 2024ஆம் ஆண்டில் அரசாங்கம் மேற்கொண்ட நம்பிக்கை மீட்பு நடவடிக்கைகள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புகள் மேம்பாடு காரணமாக வெளிநாட்டுப் பண வரவு 6.5 பில்லியன் அமெரிக்க டொலராக உயர்ந்தது. இதே தொடரில் வளர்ச்சி ஏற்பட்டு, 2025ஆம் ஆண்டில் வெளிநாட்டுப் பண வரவு 7 பில்லியன் அமெரிக்க டொலரைத் தாண்டுமென எதிர்பார்க்கப்படுகின்றது. இது வெளிநாட்டு நாணய வருவாயில் ஒரு முதன்மையான விடயமாகும். இலங்கையின் பொருளாதார மீட்சியில் மிகவும் குறிப்பிடத்தக்க முன்னேற்றமானது, விலை நிலைத் தன்மையையும் பணவாட்டத்தையும் அடைவதாகும்.

2024ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் தொடக்கம் முதன்மைப் பணவீக்கம் எதிர்மறையாகவே உள்ளது. 2025ஆம் ஆண்டு பெப்ருவரி மாதத்தில் 4.2 எதிர்மறை சதவீதத்தை எட்டியது. இது 2022ஆம் ஆண்டின் மிகைப் பணவீக்க நிலைமைகளிலிருந்து ஓர் அசாதாரணத் திருப்புமுனையாகக் காணப்படுகின்றது. அண்மைக்கால மாதாந்த தரவுகள் தொடர்ச்சியான விலை நிலைத்தன்மையைக் காட்டுகின்றன. பணவீக்கமானது, 2025ஆம் ஆண்டு மே மாதத்தில் 0.70 எதிர்மறை சதவீதத்திலிருந்து 2025ஆம் ஆண்டு யூன் மாதத்தில் 0.60 எதிர்மறை சதவீதமாகக் குறைந்துள்ளது. இந்த நீடித்த பணவாட்ட சூழல், நுகர்வோருக்கு நிவாரணம் வழங்கும் அதேவேளையில், பணவியல் கொள்கை நடவடிக்கைகளின் வெற்றியையும் மேம்படுத்தப்பட்ட விநியோக நிலைமை யையும் பிரதிபலிக்கின்றது.

2023ஆம் ஆண்டில் நுகர்வுப் பணவீக்கம் 50 சதவீதத்துக்கும் அதிகமாக இருந்தது. மக்களின் வாழ்க்கை மிகவும் கடுமையாகப் பாதிக்கப்பட்டது. 2024ஆம் ஆண்டில் சர்வதேச நாணய நிதியத்தின் ஒத்துழைப்போடு மேற்கொண்ட சீர்திருத்தங்கள் காரணமாக பணவீக்கம் குறைக்கப்பட்டது. மொத்த உள்நாட்டு உற்பத்தி வளர்ச்சி 5 சதவீதமாக இருந்தது. இது இலங்கையின் பொருளாதாரம் வலுவாக மீண்டுள்ளதைக் காட்டுகின்றது. 2024ஆம் ஆண்டில் பொருளாதாரம் 5 சதவீத வளர்ச்சியைப் பதிவு செய்துள்ளமையானது, சர்வதேச நாணய நிதியத்தின் 4.5 சதவீதக் கணிப்பை விஞ்சியுள்ளது. இந்தக் குறிப்பிடத்தக்க மீட்சியானது, தொழிற்றுறை மற்றும் சேவைகள் துறைகளில் வலுவான செயற்றிறனால் உந்தப்பட்டுள்ளது. இது நாடு கடுமையான அந்நிய நாணயமாற்று பற்றாக்குறையை எதிர்கொண்ட 2022ஆம் ஆண்டின் நெருக்கடியின் ஆழத்திலிருந்து ஒரு வியத்தகு திருப்புமுனையையே காட்டுகின்றது.

2018ஆம் ஆண்டு தொடக்கம் 2023ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் இழந்த பொருளாதார உற்பத்தியில் பாதியை வெறும் 18 மாதங்களில் இலங்கை மீட்டெடுத்துள்ளது. இந்த வளர்ச்சி எதிர்பார்த்ததைவிட வேகமாக உள்ளதென்றும், நுண்பாகப் பொருளாதார நிலைப்படுத்தல் குறுகியகாலக் கண்ணோட்டத்தை மேம்படுத்துகிறதென்றும் உலக வங்கி தெரிவித்துள்ளது. ஆசிய அபிவிருத்தி வங்கியானது, 2025ஆம் ஆண்டில் மொத்த உள்நாட்டு உற்பத்தி வளர்ச்சி 3.9 சதவீதமாகவும் 2026ஆம் ஆண்டில் 3.4 சதவீதமாகவும் இருக்குமென கணித்துள்ளது. இது தற்போதைய உயர் மட்டங்களிலிருந்து மிதமாக இருந்தாலும் நிலையான பொருளாதார உந்துதலையே குறிக்கின்றது. அரசாங்கக் கடனானது, 2023ஆம் ஆண்டில் மொத்த உள்நாட்டு உற்பத்தியில் 111.7 சதவீதமாக இருந்தது. அது 2024ஆம் ஆண்டில் 99.4 சதவீதமாகக் குறைந்தது. அது மறுசீரமைப்பு மற்றும் வளர்ச்சி காரணமாக 2025ஆம் ஆண்டில் 96 சதவீதமாகக் குறைந்தது.

2023ஆம் ஆண்டில் நாணய ஒதுக்கம் 4.4 பில்லியன் அமெரிக்க டொலராக இருந்தது. சர்வதேச நாணய நிதியம் மற்றும் உலக வங்கி உதவியுடன் 2024ஆம் ஆண்டில் நாணய ஒதுக்கம் 6 பில்லியன் அமெரிக்க டொலராக உயர்ந்தது. 2025ஆம் ஆண்டு யூன் மாதத்தில் வெளிநாட்டு நாணய ஒதுக்கம் 6.2 பில்லியன் அமெரிக்க டொலரைத் தாண்டி வலுவாக உள்ளது. 2024ஆம் ஆண்டில் 40 மில்லியன் அமெரிக்க டொலராக இருந்த தங்க ஒதுக்கம், 2025ஆம் ஆண்டு யூன் மாதத்தில் 50 மில்லியன் அமெரிக்க டொலராக உயர்ந்துள்ளது. இந்த வெளிப்புற இருப்புகளில் ஏற்பட்ட மேற்படி முன்னேற்றம் எதிர்காலப் பொருளாதார அதிர்ச்சிக்கு எதிராக முதன்மையான பாதுகாப்பை வழங்குகிறது. மேலும், இலங்கையின் பொருளாதார மேலாண்மையினை மீட்டெடுக்கும் நம்பிக்கையை இது உறுதி செய்கின்றது.

நாட்டின் வேலை இன்மையானது, 2023ஆம் ஆண்டில் 4.7 சதவீதமாகக் காணப்பட்டது. இது 2024ஆம் ஆண்டில் 4.4 சதவீதமாகக் காணப்பட்டது. 2025ஆம் ஆண்டின் தொடக்கத்தில் 3.8 சதவீதமாகக் குறைந்துள்ளது. இது வலுவான தொழிலாளர் சந்தையை எடுத்துக்காட்டுகிறது. 2023ஆம் ஆண்டில் ஆள்வீத வருமானம் 3,800 அமெரிக்க டொலராகக் காணப்பட்டது. மனித வள அபிவிருத்திச் சுட்டி வளர்ச்சி இல்லாமல் இருந்தது. வறுமை அண்ணளவாக 26 சதவீதமாகியது. நுகர்வுச் சுட்டி, வீழ்ச்சி அடைந்திருந்தது. நிதி உதவிகள் மற்றும் சீர்திருத்தங்கள் காரணமாக, 2024ஆம் ஆண்டில் ஆள்வீத வருமானம் 4,500 அமெரிக்க டொலராக உயர்ந்ததுடன், மனித வள அபிவிருத்திச் சுட்டியும் சீரான வளர்ச்சியைக் கண்டது. வறுமை 24 சதவீதமாகக் குறைந்தது. 2025ஆம் ஆண்டில் ஆள்வீத வருமானம் 4,600 அமெரிக்க டொலருக்கு மேல் இருக்குமெனவும், வறுமை 22.7 சதவீதமாகக் குறையுமெனவும் கணிக்கப்பட்டுள்ளது. மேலும், நுகர்வுச் சுட்டி மேலேறும் எனவும் எதிர்பார்க்கப்படுகின்றது.

2025ஆம் ஆண்டின் அண்மைக் காலத் தரவுகள் முதன்மையான பொருளாதாரக் குறிகாட்டிகளின் நீடித்த முன்னேற்றத்தைக் காட்டுகின்றன. இது மக்களது வாழ்க்கைத் தரம் மேம்பட்டு வருவதைச் சுட்டிக்காட்டுகின்றது. எனினும், இவ்வாண்டில் அமெரிக்கா முன்மொழிந்துள்ள வரி விதிப்பானது, 44 சதவீதத்திலிருந்து 20 சதவீதமாகக் குறைக்கப்பட்டாலும், அது ஆடை ஏற்றுமதியைக் கடுமையாகப் பாதிக்கும். இது இலங்கையின் பொருளாதாரத்தில் தாக்கத்தை ஏற்படுத்தும். இலங்கையின் மொத்த ஏற்றுமதியில் அண்ணளவாக 24 சதவீதமானவை ஐக்கிய அமெரிக்காவுக்கு ஏற்றுமதி செய்யப்படுகின்றமை குறிப்பிடத்தக்கது.

வினைத்திறனுள்ள தொழிலாளர் மற்றும் மூளைசாலிகளின் வெளியேற்றம், திறன் பொருத்தமின்மை, குறைந்த பணியாளர் பங்கேற்பு முதலியன உற்பத்தித் திறனைப் பாதிக்கும். எனவே, இலங்கையானது மரபுசார் ஏற்றுமதிகளில் தொடர்ந்தும் தங்கியிருக்காமல், ஏற்றுமதிகளைப் பல்வகைப்படுத்துவதோடு குறுகிய சந்தைகளைச் சார்ந்திருப்பதைக் குறைத்தலும் வேண்டும். மேலும், திறமையற்ற அரச தொழில் முயற்சியாண்மைகளை மறுசீரமைத்து வருவாய் தரக்கூடியவைகளாக மாற்றுவதோடு, அரச - தனியார் கூட்டுடமை முயற்சிகளை ஊக்குவித்தலும் வேண்டும். அதேபோன்று, சமூகப் பாதுகாப்பை வலுப்படுத்துவதோடு கல்வி, சுகாதாரம் மற்றும் ஊட்டச்சத்து முதலியவற்றை மேம்படுத்தி மனித மூலதனத்தை அபிவிருத்தி செய்தலும் வேண்டும்.

இறுதியாக, இன்றைய உலக ஒழுங்குக்கு ஏற்ப எண்ம மாற்றம், செயற்கை நுண்ணறிவுப் பயன்பாடு, பசுமை முதலீடுகளை அதிகரித்தல் முதலியனவும் மேற்கொள்ளப்பட வேண்டும். இலங்கையின் பொருளாதாரம் இப்பொழுது மீட்பு நிலை நோக்கிப் பயணிக்கிறது. எனினும், கொள்கைப் பின்வாங்கல், கடன் சுமை, வறுமை, வேலைவாய்ப்புப் பற்றாக்குறை முதலியன இன்னும் தீரவில்லை. அடுத்த இரண்டு ஆண்டுகள் முதன்மையானவை ஆகும். நாடு முன்னேறும்பொழுது பொருளாதார உறுதிப்பாட்டை சமூக சமத்துவத்தோடு சமநிலைப்படுத்துவதிலும், சீர்திருத்தத்துக்கான அரசியல் ஒருமித்த கருத்தைப் பேணுவதிலுமே இந்த மீட்சி நீண்ட காலத்துக்கு நிலையானதாக இருக்குமா, இல்லையா? என்பதை முடிவு செய்யும். குறுகிய கால மீட்சியை நீண்ட கால மீட்சியாக மாற்றுவதற்கு உறுதியான சீர்திருத்தங்கள் மற்றும் அனைத்துப் பிராந்தியங்களையும் உள்ளடக்கிய கொள்கைகள் பன்னாட்டு ஆதரவோடு மேற்கொள்ளப்பட வேண்டும். இவை இல்லையெனில், இந்த மீட்பு தற்காலிகமாகவே முடிவடையும்.

இலங்கையின் பொருளாதார மீட்சியின் வெற்றியானது, நிதி ஒருங்கிணைப்பு, பணவியல் கொள்கையைச் சீர்செய்தல், பேரண்டப் பொருளாதார நிலையான தன்மையைப் பேணுதல் முதலியவற்றில் தங்கியுள்ளது. கட்டமைப்புச் சீர்திருத்தங்களைத் தொடர்ந்து செயற்படுத்தல், நடுத்தர மற்றும் நீண்ட கால வளர்ச்சித் திறனை உயர்த்துவதற்கு இன்றியமையாததாக இருக்கும் என்று உலக வங்கி வலியுறுத்துகிறது. பொருளாதார மீட்சி இன்னும் சமூகத்தின் அனைத்துப் பிரிவுகளுக்கும் சென்றடையாத சூழலில், வாழ்க்கைத் தரம் சிறப்பானதாக மாற்றப்பட வேண்டுமானால், வறுமைக் குறைப்பு முயற்சிகள் விரைவுபடுத்தப்பட வேண்டும்.

இலங்கையின் பொருளாதார மீட்சியின் நிலைத்த தன்மையானது, சமூகத் தேவைகளை நிறைவு செய்யும்பொழுது சீர்திருத்த முயற்சியைப் பராமரித்தல், வெளிப்புற சார்பு நிலையைக் குறைத்தல், பொருளாதார அடித்தளத்தைப் பல்வகைப்படுத்துதல், சமூகத்தின் அனைத்துப் பிரிவுகளுக்கும் பயனளிக்கும் வகையில் வளர்ச்சியை உறுதிசெய்தல், எதிர்காலப் பொருளாதார அதிர்ச்சிகளுக்கு எதிராகத் திட்டங்களை உருவாக்குதல் எனப் பல காரணிகளைச் சார்ந்துள்ளது. மேலும், அரசியல் ஆய்வாளர் யதீந்திரா கூறுவதுபோல, சிறந்த பொருளியல் கொள்கைகள் மட்டும் இலங்கையைப் பொருளாதார நெருக்கடியில் இருந்து மீட்டெடுக்கும் என்று நம்புவது நூறு சதவீதம் பொருத்தமானது அல்ல.

ஒத்திசைவான வெளியுறவுக் கொள்கை பொருளாதார வளர்ச்சிக்கு இன்றியமையாததாகும். இது இல்லாவிடின் நீடித்த அபிவிருத்தியை அடைய முடியாது. எடுத்துக்காட்டாக, இலங்கையின் பொருளாதாரம் பெரும் நெருக்கடிக்குள் சென்ற வேளையில், இந்தியாவைத் தவிர வேறு எந்த நாடும் உண்மையான நண்பனாகச் செயற்படவில்லை. இந்தியா எவ்வித முன்நிபந்தனைகளும் இன்றி, உதவியாக 4 பில்லியன் அமெரிக்க டொலர்களுக்கு மேல் வழங்கியது. இது பன்னாட்டு நாணய நிதியத்தின் 48 மாத பிணை எடுப்பு நிதியான 3 பில்லியன் அமெரிக்க டொலர்களைவிட அதிகமானது. இப்போது இந்தியா இலங்கைக்கு ஒரு பில்லியன் டொலர் கடன் வசதியை ஓராண்டுக்கு நீட்டித்துள்ளது. இந்த நடைமுறை விடயங்களைக் கருத்திற்கொண்டு, இலங்கையின் உறுதித் தன்மைக்கான பாதை இந்தியாவின் நெருக்கமான ஒத்துழைப்போடு கட்டமைக்கப்பட வேண்டும்.

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

இந்தியாவோடு இணைந்து பணியாற்றுவது பிராந்திய நலன்களைச் சமநிலைப்படுத்தும் அதேவேளையில், அமெரிக்காவின் எதிர்பார்ப்புகளை நிறைவுசெய்வதற்கும் இலங்கையை நெருக்கமாகக் கொண்டுவரும். வான், கடல், எரிசக்தி, வணிகம், மக்கள் தொடர்பு முதலிய ஆழமான இணைப்புக்கான முன்மொழிவுகள் ஏற்கெனவே மேசையில் உள்ளன. 2023ஆம் ஆண்டு யூலை மாதத்தில், அன்று குடியரசுத் தலைவராக இருந்த ரணில் விக்கிரமசிங்ஹ அவர்களும் இந்தியப் பிரதமர் நரேந்திர மோடி அவர்களும் ஒத்துழைப்புக்கான ஒரு கட்டமைப்பைக் கோடிட்டுக் காட்டினர். புதிய அரசாங்கம் கொள்கையளவில் அதைச் செயற்படுத்த ஒப்புக்கொண்டாலும், இவ்விடயம் தொடர்பிலான முன்னேற்றம் மெதுவாகவே உள்ளது. இந்த முயற்சிகளைச் செயற்படுத்துவதற்கான பேச்சுவார்த்தைகளுக்குப் புதிய அரசாங்கம் முன்னுரிமை அளிக்க வேண்டும்.

பொருளாதார மற்றும் தொழில்நுட்ப ஒத்துழைப்பு ஒப்பந்தம், திருகோணமலை எண்ணெய்க் குதம், காங்கேசன்துறை துறைமுகம், நிலநெய் குழாய் திட்டம் முதலியன விரைவாகச் செயற்படுத்தப்பட வேண்டும். இவை இலங்கையின் பொருளாதார மாற்றத்துக்கு உண்மையான நம்பிக்கையை வழங்குமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Chathuranga Abeysinghe. You have 12 minutes.

[2.00 p.m.]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

Hon. Deputy Speaker, I think it is a very important Debate that we have today. After nine months of governance, the new Government is reviewing and explaining to the country how the economy has been moving from stability to growth.

About the economy, the Hon. President clearly articulated and told the Opposition, "Tell us a particular indicator that is going in the wrong direction." So, when we talk about the economy, basically it is explained and reviewed through indicators  and those indicators are mostly in economic terms. There are also social and environmental indicators, matrices which tell us whether the economy is moving forward in the right direction. But, what we know is, for the last 40 years, all those indicators have been moving away from their targets. So, I need to iterate a little bit to make the experts in front of me understand what kind of a country that we have been making over the last 30 to 40 years, where we have already made 30 per cent of our population poor or to be below the poverty line. Then, on an annual basis, we had a widening trade gap as big as eight billion US Dollars. That is because of the industrial policies and strategies they conducted  and we also had a continuingly increasing fiscal deficit, which led us to a lot of debts and the crisis we have been facing for the last few years. And, we, as a country, have the highest interest cost in the world compared to government revenue and has one of the highest number of people who cannot repay at these interest rates. So, these are the indicators we have been left with over the past few years and we were among the lowest tax collecting nations. The tax collection as a percentage of GDP was 8.5 per cent in 2019 and even now, we use indirect taxes to collect these revenues.

That is the root cause for the issues we faced as a country and the parties responsible for that are in front of us, giving advice to us today.

If you really look at what the Opposition said before the elections, you would see that they claimed or blamed the NPP for several things, especially with regard to the handling of the economy. They went on stage and said that the NPP basically does not have the skill, the experience and the expertise to run the economy. They also said that foreign investors would run away when the NPP comes into power because our flag  is red. Then, they thought that there would be another crisis within a few months of the Government coming into power. Some in the Opposition said that within six months, this Government would collapse and the people would come on to the streets. At the same time, the economic experts on the other side said that we have no capability to deal with the IMF and that the IMF programme would collapse. Those are the things that they used to say on stage to convince that the NPP is not capable of handling the economy. Also,  they engaged in  fearmongering, saying that when the NPP comes in to power, it would take over private assets and would nationalize all the companies in the country. Those are the lies they told. Not only that, after the Government was formed, when we were striving to fix or stabilize the economy, they used various statements to put fear back into the people to destabilize this economy. Now, what we understand is that everything they have been preaching has been proven wrong by this Government.

Sir, if you want to really look at the fundamentals needed for a country's economic growth, we need to take lessons from countries like Singapore. I was lucky enough to meet Dr.  Kishore Mahbubani last week and to share some thoughts. He is famous in the economic sphere and says that the rule of law, meritocracy and discipline are the base for a country's economic growth. And, what we are trying to showcase is that this Government is following that path and those traits. We really need to ask the Opposition, "Have you ever been able to exercise meritocracy?" If you really look at their advisers to the Government and the CEOs of the State-owned institutions, were they of that calibre who could run the institutions with no interest in or with no affiliation to politics?

As you can see, the Hon. (Dr.) Anil Jayantha is leading the front as the Deputy Finance Minister and (Dr.) Harshana Suriyapperuma has been doing his part,

both as Deputy Minister of Finance then and now, as the Secretary to the Ministry of Finance. They are examples of meritocracy and you can also see that we, as a Government, have given merit and the credit to the Central Bank Governor and the people who have been handling this process earlier. So, all that was done on merit. We have never had this experience in the history of our country, where the governing party have given people responsibilities on merit.

Very recently, I was fortunate to be part of a research finding forum conducted by Verité Research. At that forum, they explained how Sri Lanka is faring based on the assumptions of the Debt Sustainability Analysis of the IMF. It is very interesting to note that, as a country, we are doing far better than what was predicted for the country, and especially with regard to government revenue, we are doing better than what was expected with this year's revenue collection being 18 per cent more that that of the previous year. And the primary balance is better than what was expected and public debt, as a percentage of GDP, has been coming down continuously and we say we will work to better the predictions for 2029. The only indicator that is moving away from the original forecast is the interest cost, which is a little high. But, if you look at exchange rate stability, the inflation interest rates, the current account surplus and the official reserves, we have beaten the targets that were given to us. So, that is why we keep on asking anyone to tell us an indicator which indicates that Sri Lanka would derail again, that Sri Lanka would fail again. These are the fears you all have in your minds, you all dream in your dreams for this Government to fail and for you all to come to power. That is not going to happen, we would say.

Also, there were certain social indicators that we need to look at like poverty, employment and real wages. Yes, we understand that those have not been improving. They cannot be improved in a year. This is a systematic failure that you all brought about over and over again over the decades. So, it will take some time for these benefits to trickle down to the people, and we are pretty sure that the poverty indicator and the rest of the social indicators will improve over a period of time.

At that same Forum, economist Ms. Subhashini Abeysinghe shared very interesting findings about how small nations in the world could prosper. She took up examples from small nations like Sri Lanka to say that there were two main factors for an economy to thrive. One particular factor which I heard being discussed for the first time in an economic forum is that good governance and hygiene are a must or have to be the base for a country to prosper, and I am happy to say that for the last nine months, we have been putting things in place. We have been bringing in digital technology and have been driving for good governance. moving up in Corruption Perceptions Index, Ease of Doing Business Index and the Innovation Index. Digital penetration of this country will improve, giving us the necessary environment for businesses to come up, investors to come in and to make a level playing field for business to thrive in the Sri Lankan economy.

The second factor she mentioned was, access to market. It was discussed that all these small nations have greater access to markets through bilateral and multilateral agreements. Sometimes, it is funny to hear the Opposition pushing us now for that. But, while they were ruling, they had no ability to balance those or to ensure that we get into trade agreements and that our domestic industries are made strong and competitive to fight with those goods and services on the international market. So, what we are doing now is, parallely, supporting the industry to become efficient and productive so that we could open up our markets and getting into trade agreements, both regionally and globally. I think those two factors will ensure that Sri Lanka moves forward.

Another thing that we need to understand is that though we have moved from crisis to stability, in achieving economic growth, the IMF programme is restrictive in certain ways on Government expenditure. So, with that, we are trying to prioritize our expenditure to support our industries. We are also trying to support the marginalized communities, ensuring that we are within the growth trajectory, which we see from the data that was produced today.

So, what do we have today? We have the Government expenditure, which is the largest consumer or the spending of the economy, close to Rs.4 trillion with Rs.1.3 trillion in Capital Expenditure. That is the biggest investment which has happened during the last few years and which is going to grow the economy at a faster rate than what we are having today. Then, in terms of exports, we have reached an 8.7 per cent increase. So, exports are increasing in a positive way and not in a generic way because market diversification is happening today. Exports to Europe, Africa and East Asia are improving at a higher rate than anybody anticipated, which is over 20 per cent. Then, the manufacturing index of the country is moving at a higher rate, and I am pretty sure that the Ministry of Industries and the Export Development Board are doing the right thing to ensure that we have a growth of more than 9 per cent in manufacturing. If you take private borrowings, they growing at a rate of 16 per cent, which is something that the Opposition never dreamed of. So, those are the results that we are seeing today with the way the NPP economic and the industrial teams managing the economy. And, if you really take bond yields, the long-term and the short-term bond yields are converging, which gives confidence to the investors and shows that this country has secured economic stability because the Government has a two-thirds and is doing the right thing to ensure that the economy thrives.

The next issue is, misinformation about foreign direct investments. We have enough foreign direct investments coming in. We had Inquiries for investments for over US Dollars 4.6 billion and we have already secured US Dollars 536 million of foreign direct investments, which is a growth of about 100 per cent compared to last year. Also, under the Ministry of Industries, we have given approval to start 78 factories, which will be started during this year and in the first half of next year.

[ගරු චතුරංග අබේසිංහ මහතා]

So, I am going to wind up saying that the country is moving forward, taking the economy from stability to growth and here, the request for the Opposition is to be part of this journey because Sri Lanka is transforming. Sri Lanka is transforming with reforms to the legal structure, changing the bad political culture and the Government going after the people who wasted public money.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chathurange Abeysinghe, your time is up.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Sir, please give me ten seconds.

Finally, what we are trying to say is, while the country is moving in the right direction, do not try to pull us back by the leg and make statements which are false and which could create fear among the investors and the business community. We are doing all this in a very honest way, and also, we need the support of the Opposition to take Sri Lanka towards growth since we are on the right trajectory.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Leader of the Opposition Sajith Premadasa.

[අ.භා. 2.13]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ ආර්ථිකය පිළිබඳව මේ උත්තරීතර සභාවේ පුළුල් සාකච්ඡාවක් පැවැත්වෙන මේ අවස්ථාවේ ඇත්ත වශයෙන්ම අපි අදහස් කළේ, බලාපොරොත්තු වුණේ ආර්ථිකයේ වර්තමාන තත්ත්වය, මුහුණ දෙන අභියෝග, ඉදිරි ගමන් මාර්ගය, මාර්ග සිතියම, ඉලක්ක සපුරාලීම, අධීක්ෂණය සහ monitoring and evaluation ගැන බොහොම විද්‍යාත්මක පරිණත සාකච්ඡාවක්. මීට පැය කිහිපයකට පෙර අපට දැන ගන්න ලැබුණා ගරු ජනාධිපතිතුමාත් පාර්ලිමේන්තුවට එනවා කියලා. එතුමා ඇවිල්ලා දීර්ඝ කථාවක් කළා. ඇත්ත වශයෙන්ම මට නම් හිතුණේ ඒක එතුමා බොහොම නරක හීනයක් දැකලා මේ සභාවට ඇවිල්ලා කළ කථාවක් විධියට. එතුමා කථා කළා කුරිරු සිහින ගැන, දෙසැම්බර් මාසයේ හෝ ඊට තදාසන්නව සිදු වෙන කුමන්ත්‍රණ ගැන සහ තීරු බදු ප්‍රශ්නය පිළිබඳව විපක්ෂයේ කුරිරු සිහිනය උදා කර ගන්නට උත්සාහ දරන්නේ කොහොමද කියන එක ගැන.

ට්‍රම්ප් ජනාධිපතිවරයාගේ ප්‍රතිවාරක තීරු බදු ප්‍රශ්නය ආපු විගසම රටක් හැටියට අපි එකමුතු වන්නට ඕනෑ කියලා විපක්ෂයේ අනෙකුත් දේශපාලන පක්ෂත් සමඟ අත්වැල් බැඳගෙන, ජනාධිපති ලේකම් කාර්යාලයට ගිහිල්ලා ජනාධිපතිවරයාට අපි ප්‍රකාශ කළේ මොකක්ද? දේශපාලන වාද භේද කුමක් වුණත් මේ ප්‍රශ්නයේදී අපි එකට හිටගෙන රටක් හැටියට මේ ගැටලුවට මුහුණ දෙනවා කියන එකයි. මේ රජය බලයට පත් වුණු විගසම ගත යුතු ක්‍රියාමාර්ග තිබුණා, අපි ඒවා පෙන්වා දුන්නා. ඒවා මොනවාවත් ගත්තේ නැහැ. ඒ අඩු පාඩුකම් පෙන්වලා දීලා, අපි එළියේ කිව්වේ මොකක්ද? රට වෙනුවෙන් අපි ඉන්නවා කියලා. ඊයේ රාත්‍රියේද කොහේද ජනාධිපතිවරයා මහා නරක හීනයක් දැකලා ලොකු පීඩනයකින්, ලොකු ආතතියකින් මේ සභාවට ඇවිල්ලා කථා කළේ. ඇත්ත වශයෙන් මම දැක්කේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරයකුගේ කථාවක්. අපි බලාපොරොත්තු වුණේ වඩාත් විධිමත්, විචාරාත්මක, හොඳ පරිශීලනාත්මක ඉදිරිපත් කිරීමක්. මේ ප්‍රතිවාරක තීරු බදු සියයට 20ට අඩු වෙනකොට -සියයට 44 ඉඳලා 30ට අඩු වුණා, 30 ඉඳලා 20ට අඩු වෙනකොට- මම ඉදිරිපත් කළ tweet එක මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

එහි මෙසේ සඳහන් වෙනවා: "Glad US cut tariffs to 20 per cent for Sri Lankan goods. Puts us with Vietnam and Bangladesh while India pays 25 per cent. We should aim under 15 per cent to give our exporters real lift. We should have a team of trade economists and lead negotiators to keep pushing"; "ශ්‍රී ලංකාවේ භාණ්ඩ සඳහා ඇමෙරිකාව විසින් තීරු බදු සියයට 20 දක්වා අඩු කිරීම සතුටට කරුණක්. මෙමඟින් අප රට වියට්නාමය සහ බංග්ලාදේශය සමඟ සම තත්ත්වයක තැබෙන අතර ඉන්දියාව සියයට 25ක තීරු බදු අනුපාතයක් ගෙවන තත්ත්වයක පසු වෙයි. අපේ අපනයනකරුවන්ට සැබෑ තල්ලුවක් ලබාදීම සඳහා අප සියයට 15කට වඩා අඩු මට්ටමකට ඉලක්ක කර ගත යුතු වේ. අඛණ්ඩව අවශ්‍ය එකී බලපෑම ලබා දෙනු පිණිස වෙළෙඳ ආර්ථික විශේෂඥයන්ගෙන් සහ ප්‍රධාන සාකච්ඡාකරුවන්ගෙන් යුත් කණ්ඩායමක් අප සතු විය යුතුය."

මම අහන්න කැමැතියි, කොහේද කුරිරු සිහිනයක් තිබෙන්නේ? කොතැනද තිබෙන්නේ, විපක්ෂය මේ අමාරු අවස්ථාවේ ජනතාවගේ අවශ්‍යතා, රටේ අවශ්‍යතා අමතක කරලා කුරිරුභාවය කේන්ද්‍ර කරගෙන, කුරිරු සිහින නිර්මාණය කරගන්න හදනවා කියලා? ඒක සම්පූර්ණයෙන්ම වැරදි කථාවක්. මොනවා හරි ආරංචි අනුව කියනවාද මා දන්නේ නැහැ, ජනාධිපතිවරයාගේම කථාවේදී කිව්වා, 2025 දෙසැම්බරයේ වෙනසක් වෙනවාලු, ඊට ඉස්සෙල්ලා වෙනසක් වෙනවාලු, ඊට පහුවෙලා වෙනසක් වෙනවාලු කියලා. ඇත්ත වශයෙන් වෙනසක් වෙන්න ඕනෑ, ජනතා මතය තුළ ජනතා ඡන්දයකින්. එහෙම නැතිව සභා ගර්භය තුළ ඔළු ගෙඩි මාරුවීම්වලින් නොවෙයි.

හැබැයි, මම එකක් කියන්නට ඕනෑ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාත් බලයට පත් වෙලා හිතාගෙන හිටියා, සදාකාලිකවම බලයේ ඉන්නවා කියලා. ජන මතයට සවන් නොදෙනකොට, ජනතා අභිලාෂ ඉෂ්ට සිද්ධ නොකරනකොට අනිවාර්යයෙන්ම ජනතාව කුපිත වෙනවා; නැඟී සිටිනවා. ඒවා ස්වාභාවිකව වෙන්නේ. දැන් බලන්න, 2022 අරගළය සංවිධානාත්මක අරගළයක් නොවෙයි නේ. ඒක ස්වාභාවික - organic අරගළයක්. ඒ නිසා මේ දෙසැම්බරයේ ජනාධිපතිවරයා වෙනස් වෙනවාද, ආණ්ඩුව වෙනස් වෙනවාද, කුමන්ත්‍රණ සිද්ධ වෙනවාද කියන ඒවා නොවෙයි අපි මේ විවාදයේදී

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

බලාපොරොත්තු වුණේ. විශ්ලේෂණාත්මක, දත්ත කේන්ද්‍රීය, පර්යේෂණ කේන්ද්‍රීය, තොරතුරු කේන්ද්‍රීය, සත්‍ය කේන්ද්‍රීය ආර්ථික ඉදිරිපත් කිරීමක් අපි බලාපොරොත්තු වුණේ. ජනාධිපතිවරයා කුමන්ත්‍රණයක් ගැන කථා කරනවා.

එක කුමන්ත්‍රණයක් නම් තිබෙනවා. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" නිර්මාණය කරනවා කියලා රටේ ජනතාවට අසීමිත පොරොන්දු දීලා, බලාපොරොත්තු දීලා ඒවා ඉටු නොකරන කුමන්ත්‍රණය නම් අද තුනෙන් දෙකක බලයෙන් ක්‍රියාත්මක කරනවා. ඔව්, ඒ කුමන්ත්‍රණය ක්‍රියාත්මක වෙනවා. ජනතාව රවට්ටපු කුමන්ත්‍රණය, ජනතාව අන්දවපු කුමන්ත්‍රණය, ජනතාව මංමුළා කරපු කුමන්ත්‍රණය, කොටින්ම කියනවා නම් ටොන් පවවලින් රටේ ජනතාව වශී කරපු කුමන්ත්‍රණය. ඒ කුමන්ත්‍රණය දැන් ඉවරයි නේ. ඒ කුමන්ත්‍රණය කරලා තුනෙන් දෙකත් අරගෙන ඉවරයි. ඒ නිසා පැහැදිලිවම කියන්නට ඕනෑ, විපක්ෂයේ අපි -සමගි ජන බලවේගයේ, සමගි ජන සන්ධානයේ අපි- හැම විටම කටයුතු කරන්නේ පොදු ජනතාවත් එක්ක පොදු ජනමතයට අනුවයි කියන එක. එහෙම නැතිව ඔළු ගෙඩි මාරුවලින්, පාර්ලිමේන්තුව ඇතුළේ සෙල්ලම්වලින්, ඡන්දවලින් බැහැර දේශපාලන කුමන්ත්‍රණවල නිරතවෙන කණ්ඩායමක් නොවෙයි අපි. ඒ නිසා ජනාධිපතිවරයාගෙන් අපි ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ රටේ ජනතාවට කරපු බොරුව නිවැරදි කරන්න, මේ කුමන්ත්‍රණය පිරිසිදු කරගන්න කියලා.

විශේෂයෙන් මේ අවස්ථාව උපයෝගී කරගෙන අපේ රට මුහුණ දෙන බරපතළ අභියෝග පිළිබඳව කථා කරන්න මම කැමැතියි. අපේ රටට අභියෝග රැසක් තිබෙනවා. අපේ රටට වේගවත් ආර්ථික වර්ධනයක් ඕනෑ. අපේ රටට වේගවත් අපනයන වර්ධනයක් ඕනෑ. ජනාධිපතිවරයා අපොහොසත් වුණා, ආර්ථික වර්ධන වේගය ඉහළ නංවන්නේ කෙසේද කියන එක ගැන කරුණු ඉදිරිපත් කරන්න; අපනයනය වර්ධනය කරන වේගය ගැන ඒ ක්‍රමෝපායික සැලැස්ම මේ සභාවට ඉදිරිපත් කරන්න. ඒවායි අපි බලාපොරොත්තු වුණේ. රජයත්, ජනාධිපතිවරයාත් මේ ගැන දන්නවාද දන්නේ නැහැ, අද දුප්පත්කම බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. Centre for Poverty Analysis එක ඇතුළු තවත් විශේෂඥ සංවිධාන රැසක් දත්ත කේන්ද්‍රීයව ඉදිරිපත් කරලා තිබෙනවා, දුප්පත්කම මුළු රටම වෙළාගෙන හමාරයි කියලා. ග්‍රාමීය, නාගරික වතු ඇතුළු භූගෝලීය වශයෙන් බැලුවොත් පළාත් නවයෙහිම විසිරුණු බරපතළ බෙදාවචකයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ රටේ සියයට 45කට ආසන්න ප්‍රමාණයක් දුප්පත් යැයි කියන එක මේ කණ්ඩායම් සොයා ගෙන තිබෙනවා. අද මේ දුප්පත්කම තුරන් කරන්නට මේ රජය වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා නැහැ. රජයම කියනවා දැන් පවතින අස්වැසුම වැඩසටහන විසඳුමක් නොවෙයි කියලා. දුප්පත්කම තුරන් කරන්නට අස්වැසුම වැඩසටහනත් විසඳුමක් නොවෙයි නම්, මොකක්ද විසඳුම? එයට උත්තර නැහැ. අපේ රටට ඍජු විදේශ ආයෝජන ගෙන එන්නට රජය ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද? මාර්ග සිතියම මොකක්ද? කාලසටහන මොකක්ද? ඒ කරුණු කාරණා ඉදිරිපත් වුණේ නැහැ. අපි දැක්කේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කරන දේශපාලන කථාවක්. මම එතුමාට කියන්න ඕනෑ, එතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් නොවෙයි, රටේ විධායක ජනාධිපතිතුමා. ආර්ථිකය පිළිබඳව වැදගත් සාකච්ඡාවක් තිබෙන කොට අපි බලාපොරොත්තු වනවා, ඒ ආර්ථිකය පිළිබඳව නිර්මාණය වී තිබෙන අභියෝගවලට, ගැටලුවලට උත්තර, විසඳුම්.

දිනෙන් දින විරැකියාව වැඩි වෙනවා. කර්මාන්තශාලා වැහෙනවා. වැඩ කරපු ජනතාව මහ පාරට ඇද වැටෙනවා. මොකක්ද, මේ තරුණ පරම්පරාවට දෙන උත්තරය. ආර්ථික වර්ධනය වේගවත් කරන්නට, අපනයන වර්ධනය වේගවත් කරන්නට, දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන, ඍජු විදේශ ආයෝජන ලබා ගැනීමේ වැඩසටහන වේගවත් කරන්නට, විරැකියාව තුරන් කරන්න විසඳුම් ලබා දෙන්නට මේ ආණ්ඩුවට බැරි නම් මම අහන්න කැමැතියි, 2028දී විදේශ ණය ටික ගෙවන්නේ කොහොමද කියලා. ජනාධිපතිවරයාට තිබුණා සංඛ්‍යාත්මකව කරුණු ඉදිරිපත් කරන්න. 2028 වසරේ ඉඳලා ඇමෙරිකානු ඩොලර් බිලියන 5.5ක් අපි අවුරුදු පතාම ගෙවන්නට ඕනෑ. එතකොට ඒ ඉෂ්ට සිද්ධ කිරීම සඳහා අවශ්‍ය ආර්ථික වර්ධන වේග ඉලක්ක ටික අපි සම්පූර්ණ කරලා තිබෙනවාද? මම දන්නේ නැහැ, විවිධ ජාත්‍යන්තර මූල්‍ය ආයතන කියනවා, ආර්ථික වර්ධන වේගය වාර්ෂිකව සියයට 5ක් වෙන්න ඕනෑ කියලා, 2028 ණය ගෙවීම ක්‍රියාත්මක කරන්න. මේ අවුරුද්දේ ඒ සියයට 5 ඉලක්කයට යනවාද? යනවා නම් හොඳයි. යනවා නම් අපිත් සතුටුයි. නමුත්, සමහර ජාත්‍යන්තර මූල්‍ය ආයතන කියනවා, මේ අවුරුද්දේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5යි කියලා. ලබන අවුරුද්දේ එය සියයට 3.1යි කියලා පුරෝකථනය කරනවා. ඒක අපේ ප්‍රාර්ථනාව නොවෙයි. අපේ ප්‍රාර්ථනාව එය සියයට 5ටත් එහා යන්නට ඕනෑ කියලායි. මොකද, මහ ජනතාවගේ දුකින්, කඳුළින්, වේදනාවෙන්, බලය ලබා ගැනීමේ පහත්, නින්දිත චින්තනයක සිටිමින් අපි ළතැවෙන්නේ නැහැ. අපේ උත්සාහය, මතවාදීව, රටට වැදගත් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා, එයට රටේ ජනතාවගේ ආකර්ෂණය දිනාගෙන බලය ලබා ගැනීමයි. රටේ ජනතාවගේ දුක මතින්, කර පිටින්, හිස මතින්, ඒ දුක වර්ධනය කරලා, ඒ පීඩාව ව්‍යාප්ත කරලා, අසහනය වැඩි කරලා, ඒ තුළින් බලය ලබා ගන්නා වූ අර කුහක දේශපාලනයේ අපි නිරත වෙන්නේ නැහැ. අපි අහන්න කැමැතියි, 2028දී පටන් ගෙන අමෙරිකානු ඩොලර් බිලියන 5.5ක් වාර්ෂිකව ගෙවන්නේ කොහොමද කියලා. මොකද, 2028 සිට ණය ගෙවීම පටන් ගන්නවා. ඊට අවශ්‍ය වන ආර්ථික වර්ධන වේගය දැන් හරිද? අපනයන වර්ධන වේගය හරිද? මේ එන ඍජු විදේශ ආයෝජන ප්‍රමාණය ඒ සඳහා ඇතිද? මේ දුප්පත්කම වැඩිවීමට විසඳුමක් නැද්ද? මෙන්න මේවාට උත්තර තමයි අපි බලාපොරොත්තු වුණේ.

අනෙක් කාරණාව, ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා. ඇත්තටම අපි එය ප්‍රවර්ධනය කර ගන්නට ඕනෑ. අපි පිළිගන්නවා, අමාරු තත්ත්වයක් තිබෙනවා කියන එක. අමාරු තත්ත්වයක්, අවිනිශ්චිතතාව ව්‍යාප්ත වුණු තත්ත්වයක් තුළ ඇමෙරිකාවේ ජනාධිපතිවරයාගේ ප්‍රතිවාරක බදු ප්‍රතිපත්තිය සහ යම් යම් අවස්ථාවලදී කාලානුරූපීව ඔහු ගන්නා තීන්දු තීරණ සමඟ අමාරු ගමනක් මේ යන්නේ. එය ලෙහෙසියි කියලා අපි කියන්නේ නැහැ. එම තීරුබදු ප්‍රතිශතය සියයට 44 ඉඳලා සියයට 30ට බැස්සා; සියයට 30 ඉඳලා සියයට 20ට බැස්සා. ඇත්ත වශයෙන්ම අපි ඒ ගැන සතුටු වෙනවා; අවංකවම සතුටු වෙනවා. හැබැයි, එසේ සතුටු වෙන අතරතුර ඉතාම වැදගත් කාරණාවක් මම පෙන්වන්න කැමැතියි.

ඔහු කියනවා, මේ ප්‍රතිශතය ලබා දුන්නේ යම් යම් කොන්දේසි මතයි කියන කාරණාව; meaningful trade and security understandings -අර්ථාන්විත වෙළෙඳ සහ ආරක්ෂක බැඳීම් - security arrangements. අපේ රටට සියයට 20ක ප්‍රතිවාරක බදු ලැබීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඇත්ත වශයෙන්ම අපි ප්‍රාර්ථනා කරනවා, එය තවත් අඩු වෙන්න කියලා. සියයට 15 වෙන්න කියලා; පුළුවන් නම් සියයට 10ට අඩු වෙන්න කියලා; පුළුවන් නම් ඒක තවත් අඩු වෙන්න කියලා. මොකද, ඒකෙන් තමයි අපේ අපනයන ක්ෂේත්‍රයට ලොකු හයියක් එන්නේ. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමා හිනා වුණාට මම අවංකවයි මෙය කියන්නේ, වංකව නොවෙයි, අවංකවයි කියන්නේ; හදවතින්ම කියන්නේ. හැබැයි, අපි දැනගන්න කැමැතියි, ඒ එකඟ වුණු වෙළෙඳ කොන්දේසි මොනවාද කියලා; එකඟ වුණු ආරක්ෂක එකඟතා මොනවාද කියලා. ACSA

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

එකඟතාව ගැන කථා කළාද? SOFA -Status of Forces Agreement - එකඟතාව ගැන කථා කළාද? *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, trade and security -වෙළෙඳ සහ ආරක්ෂක- කියන අංශ. මේවා මගේ වචන නොවෙයි, ට්‍රම්ප් ජනාධිපතිවරයා නිකුත් කරපු නිවේදනයේයි මේවා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* අපේ විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා වෙළෙඳ කටයුතු ඇමතිතුමා ළඟින් ඉන්න නිසා මේ ගැන ගරු ඇමතිතුමාව දැනුවත් කළා නම් හරි. That is about trade and security. අපි අහන්න කැමැතියි, Status of Forces Agreement – SOFA - ගැන, ඒ වාගේම ACSA ගිවිසුම ආදිය ගැන කථා කළාද කියලා. මොකද, මම මතක් කර දෙන්න කැමැතියි, 2020දී ජනතා විමුක්ති පෙරමුණ SOFA සහ ACSA එකඟතා සම්පූර්ණයෙන්ම අහෝසි කරන්න කියලා එවකට ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කළ බව.

අපි දන්නේ නැහැ ඒවා ගැන. ඔබතුමන්ලා කියන්න ඕනෑ, මොනවාද ඒ කොන්දේසි; මොනවාද ආරක්ෂක කොන්දේසි, මොනවාද වෙළෙඳ කොන්දේසි කියලා. මේවා පිළිබඳව අපි දැනුවත් වෙන්නට ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, මොන යම් හෝ කොන්දේසියකට එකඟ වුණා නම් ඒක රටේ ජනතාව දැනගන්නත් ඕනෑ, මේ මැති සබය තුළ ඒවා ඉදිරිපත් කරන්නත් ඕනෑ කියලා. කොන්දේසිවලට එකඟ වෙලා, බැරි වෙලාවත් තීන්දු කළොත් කොන්දේසි ක්‍රියාත්මක නොකරනවා කියලා, ඒවායේ ඵල විපාකත් අපේ රටට අත්පත් වන්නට ඉඩ තිබෙනවා. ඒ නිසා මේ කාර්යභාරය පිළිබඳව, මේ ක්‍රියා පටිපාටිය පිළිබඳව විනිවිදභාවයක් තිබීම ඉතාම වැදගත්.

ගරු ජනාධිපතිතුමාගේ කථාවේදී කියැවුණා, ප්‍රධාන සාර්ව ආර්ථික ඉලක්කයන් මේ රජය සම්පූර්ණ කර තිබෙනවා කියලා. එතුමා ආර්ථික වර්ධන වේගය ගැන කථා කළා; විරැකියා ප්‍රශ්නය, ගෙවුම් ශේෂය, වෙළෙඳ ශේෂය, සංචිත ආදි කරුණු කාරණා රැසක් ගැන කථා කළා. නමුත් හිතලා බලන්න, ඔය කථා කරන සංඛ්‍යා ලේඛන පිළිබඳව රටේ ජනතාව මොකක්ද කියන්නේ කියලා. හොඳ යැයි, සුබවාදී යැයි කියන ඔය සංඛ්‍යා ලේඛන පිළිබඳව ජනතාව මොකක්ද කියන්නේ? ඇහුවොත් බොහෝ දෙනෙක් කියන්නේ, ජීවත් වෙන්නේ බොහොම අමාරුවෙන්; ජීවිතය ගැට ගසාගන්නේ බොහොම අමාරුවෙන්; බඩු මිල වැඩියි, දරු පවුල් රැකගන්න එක අභියෝගාත්මක දෙයක් කියලායි. ඕකයි ජනතාව කියන්නේ. ජනාධිපතිතුමා ඇවිල්ලා සාර්ව ආර්ථික විචල්‍යයන් - macroeconomic indicators- පිළිබඳව කථා කළා. ඒක බොහොම හොඳයි. හැබැයි මතක තබාගන්න, සාර්ව ආර්ථික විචල්‍යයන්වල - macroeconomic indicatorsවල- සංඛ්‍යා ලේඛන වැඩක් නැහැ, ක්ෂුද්‍ර ආර්ථිකයේ -microeconomy එකේ- ජීවත් වන පුද්ගලයන්ට - individualsලාට - එය දැනෙන්නේ නැත්නම්. එම පිරිසට අයත් වන්නේ, ගෘහ ඒකක - households - businesses and enterprises. මා ඒ තුන විතරක් සඳහන් කරන්නේ සාමාන්‍යයෙන් microeconomy කියන්නේ, ඔය තුන් කොටස විතරක් වන නිසා. තවත් කොටස් ගණනාවක් තිබෙනවා. ගොවි, ධීවර, කම්කරු, ස්වයං රැකියා, කර්මාන්ත යනාදි වශයෙන් ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. ඒ අයගේ ඇඟට පතට, බඩට කටට, හදවතට, මුදල් පසුම්බියට දැනෙන්නේ නැත්නම් ඔය සංඛ්‍යා ලේඛනවලින් ඵලක් තිබෙනවාද කියා මම අහන්න කැමැතියි.

විශේෂයෙන්ම රට මුහුණ දෙන අභියෝග ගැන කථා කරන මේ අවස්ථාවේදී විපක්ෂය හැටියට අපි කැමැතියි විසඳුම් යෝජනා කරන්න. විරැකියාවට විසඳුමක් අනිවාර්යයෙන්ම අවශ්‍යයි. කර්මාන්තශාලා වැසී යැම තුළ ආදායම් මාර්ග අහිමි වෙනවා; ජන ජීවිත කඩා වැටෙනවා; දුප්පත්කම නිර්මාණය වෙනවා; බරපතළ සමාජ ව්‍යසනයක් නිර්මාණය වෙනවා. ඒ නිසා විරැකියාව තුරන් කරන්නට, අවම කරන්නට පැහැදිලි වැඩ පිළිවෙළක් අවශ්‍යයි; කර්මාන්තශාලා ආරක්ෂා කරගන්නට වැඩ පිළිවෙළක් අවශ්‍යයි. අපට මතකයි, ඇඟලුම් කම්හල් 200 වැඩසටහන. එදා ඉතාම පීඩාකාරී තත්ත්වයක් තුළ Multi-Fiber Arrangement එක බොහොම අමාරුවෙන් ක්‍රියාත්මක වන මොහොතේ අපේ රටට වැඩිපුර quotas අරගෙන කර්මාන්ත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වුණා. ඒ නිසා අපි රජයට යෝජනා කරනවා, පළමුවෙන්ම කර්මාන්තශාලා වැඩසටහනකට යොමු වෙන්නට ඕනෑ කියලා. ඒවා අපනයන කේන්ද්‍රීය කර්මාන්තශාලා වාගේම දේශීය ඉල්ලුමට, නිෂ්පාදන සහ සේවා සැපයුම් ක්‍රියාත්මක කරන කර්මාන්තශාලා විය යුතුයි. ඒ වාගේම ආර්ථික වර්ධන වේගය අනිවාර්යයෙන්ම වේගවත් කරන්නට ඕනෑ. පොඩ්ඩක් හිතලා බලන්න, macroeconomy එකේ සහ microeconomy එකේ ආර්ථික යන්ත්‍රණය ගැන. සියයට 5 වර්ධන ඉලක්කයට යන්නට තරම් අද මේ ආර්ථික යන්ත්‍රණය ශක්තිමත් වෙලා නැහැ. ඒක වේගවත් කරන්නට ඕනෑ. ඒකට දර්ශනයක් තියෙන්නට ඕනෑ. ඒකට වැඩ පිළිවෙළක් තියෙන්නට ඕනෑ. ව්‍යවසායකයන් වෙනුවෙන් විශේෂිත වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ, වේගවත් ආර්ථික වර්ධනයකට අවශ්‍ය සැලසුම් ඉදිරිපත් කරන්න මේ මොහොත වෙනකම් මේ රජයට හැකි වෙලා නැහැ කියලා. ඒ නිසා අපේ දෙවැනි යෝජනාව හැටියට අපි යෝජනා කරනවා, ආර්ථික වර්ධන වේගය වේගවත් කරන්නට පැහැදිලි වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා.

මේ රටේ සියයට 45ක් දැන් දුප්පත්. Centre for Poverty Analysis ඇතුළු විශේෂඥයන් ගණනාවක් කියනවා, එයට විසඳුම අස්වැසුම නොවෙන බව. ඉතිරි කිරීම, පරිභෝජනය, ආයෝජනය, නිෂ්පාදනය, අපනයනය කියන මේ පස් වැදෑරුම් ක්‍රියාවලිය කේන්ද්‍ර කරගත් දුප්පත්කම තුරන් කිරීමේ විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අවශ්‍යයි කියලා. සදාකාලික සහනාධාර ලබා දීම නොවෙයි, කාලවකවානු සහිතව ඒ ශක්තිය ලබා දීලා ඒ අය සවිබල ගන්වන්නට ඕනෑ. ඒ අය ආර්ථික සවිබලගැන්වීමකට ලක් කරලා දුප්පත්කමින් මුදවන්නට ඕනෑ - use economic empowerment to alleviate poverty. ඒ අනුව තුන්වැනි කාරණාව දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන. ඒක අපේ තුන්වැනි යෝජනාව.

හතරවනි වැඩසටහන විධියට අපනයන ප්‍රවර්ධනය කරන වේගවත් වැඩසටහනක් අවශ්‍යයි. Export Development Board එක ඇතුළු මේ වර්තමාන ආයතනවලට ඒ දේ කළ නොහැකියි. හොඳට කියවලා බලන්න, 60 දශකයේ, 70 දශකයේ ජපානය කොහොමද අපනයන ක්ෂේත්‍රය ඉහළ ම මට්ටමකට ගෙනාවේ කියලා. Ministry of Economy, Trade and Industry - METI - කියන ආයතනය බොහොම වේගවත් අපනයන ප්‍රවර්ධන වැඩසටහන්වලට යොමු වුණා. එවන් වැඩ පිළිවෙළක් අද අපේ රටට අවශ්‍යයි. ඒ අනුව අපේ හතරවැනි යෝජනාව අපනයන ප්‍රවර්ධන වැඩසටහන ශක්තිමත් කිරීම.

ඒ වාගේම, අපි නිදහස් වෙළෙඳ ගිවිසුම්වලට ප්‍රවේශ වෙන්නට ඕනෑ. Free Trade Agreementsවලට ප්‍රවේශ වෙන්නට ඕනෑ. ඉවක්බවක් නැතුව නොවෙයි. අපේ රටට සාපේක්ෂ වාසියක් - comparative advantage එකක්- ලැබෙන FTAsවලට අපි යන්නට ඕනෑ. විශේෂයෙන්ම අපේ අපනයන ගත්තාම, අද අප්‍රිකා බල ප්‍රදේශයේ සියයට 2.7යි, Oceania - ඒ කියන්නේ Australia, New Zealand සියයට 2යි, Latin America සියයට 2.39යි. මෙන්න අපට වෙළෙඳ පොළවල් තිබෙනවා අපේ නිෂ්පාදනවලට, භාණ්ඩ හා සේවාවලට ආක්‍රමණය කරන්න. We must exploit those markets; we must promote trade and exports. ඒ වාගේම, නිදහස් වෙළෙඳ ගිවිසුම්වලට ප්‍රවේශ වන්නට අපි

කිසිසේත්ම පැකිළෙන්න හොඳ නැහැ. හැබැයි ඒ නිදහස් වෙළෙඳ ගිවිසුම් තුළින් අපේ රටටත් සාපේක්ෂ වාසියක් ලැබෙන ආකාරයට ඒ වෙළෙඳ ගිවිසුම් ක්‍රියාත්මක කරන්නට අපි කටයුතු කරන්නට ඕනෑ. ඒක තමයි අපේ පස්වැනි යෝජනාව.

හයවැනි යෝජනාව මෙයයි. අපේ රටේ ආර්ථික වර්ධන වේගය වේගවත් කරන්න අපට පුළුවන්ද? දළ දේශීය නිෂ්පාදිතයට -GDP එකට- සියයට 50ක ශක්තිය ලබා දෙන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත අපේ ඇස් ඉදිරිපිටම කඩා වැටෙනකොට ආර්ථික වර්ධන වේගය වැඩි වෙනවාද? 2028 ඇමෙරිකානු ඩොලර් බිලියන 5.5ක් ගෙවන්නට නම් සියයට 5ක ආර්ථික වර්ධන වේගය නඩත්තු කරන්නට ඕනෑ. සියයට 5ක ආර්ථික වර්ධන ඉලක්කය කරා යන්න පුළුවන්ද, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් කඩා වැටෙනකොට? ඒවායෙන් ලක්ෂ 40කට රැකියා සපයනවා. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 50ක් ම මේ MSME කියන කොට්ඨාසය. මේකට තිරසර විසඳුමක් නැහැ. එක කට්ටියක් ජනාධිපතිවරණය ඉලක්ක කරගෙන පරාටේ නීතිය අත්හිටෙව්වා. ඒක අත්හිටවපු එක හොඳයි. අනෙක් අය පාර්ලිමේන්තු මැතිවරණය සහ පළාත් පාලන මැතිවරණය ඉලක්ක කරගෙන පරාටේ නීතිය අත්හිටෙව්වා. ඒක අත්හිටවපු එක හොඳයි. හැබැයි අපි එදා කිව්වේ මොකක්ද? ඒක අත්හිටුවනවාත් සමඟම මේ අයගේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළට යා යුතු බවයි. අඩුම ගාණේ පොලියේ යම් කප්පාදුවකට, ණය කප්පාදුවකට යා යුතුමයි. Debt එක restructure කරන්නට ඕනෑ. නමුත් ඒ Debt එක restructure කළේ නැහැ. ඒ ණය ප්‍රතිව්‍යුගතකරණය කළේ නැහැ. මෙච්චර ණය ගත්තු අයට මේ මොහොතේ පරාටේ නීතිය ක්‍රියාත්මක වෙනවා, සැප්තැම්බර් මාසය වෙනකොට තවත් කණ්ඩායමකට ඒ නීතිය ක්‍රියාත්මක වෙනවා, දෙසැම්බරය වෙනකොට තවත් කණ්ඩායමකට ඒ නීතිය ක්‍රියාත්මක වෙනවා. ක්‍රම ක්‍රමයෙන් ඔවුන්ගේ වරදක් නැතිව මේ MSME කොට්ඨාසය විනාශ මුඛය කරා යනවා. එසේ වන්නේ ත්‍රිත්ව බේදවාචකය නිසා. පාස්කු ප්‍රහාරය, කොවිඩ්-19 වසංගත ප්‍රශ්නය සහ රට බංකොලොත්වීම කියන ප්‍රධාන කරුණු තුන නිසා තමයි මේ MSMEs කඩා වැටුණේ. ඒකට මේ රජයට විසඳුමක් ලබා දෙන්නට බැහැ. අපේ 6වැනි යෝජනාව හැටියට මම කියනවා, මේ MSME කොට්ඨාසය දියුණු කරන්නට, ශක්තිමත් කරන්නට ඒ අය සඳහා restructuring වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්නට ඕනෑ කියලා.

7වැනි යෝජනාව - අපනයන විවිධාංගීකරණයකට අපි යොමු වෙන්නට ඕනෑ. Asia-Pacific, Middle-East, Africa, Latin America මෙන්න මේ marketsවලට අපට මේවා ගෙනියන්න පුළුවන්. Information technology services, processed foods and beverages, tourism services and hospitality management ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. Information Technology - IT- වැනි මේ ක්ෂේත්‍රවලින් අපට ලොකු ගමනක් යන්නට පුළුවන්. ඉතින් අපි ඒ දේ කරන්නට ඕනෑ. ඒ දේ කරන වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. අපේ අපනයන ගමනාන්ත ඇමෙරිකාව, යුරෝපා හවුල, එක්සත් රාජධානිය පමණක් වුණාට හරියන්නේ නැහැ. We must spread our risk diversification. We must diversify our exports in order to reduce the risk. මොකද, ලෝකයේ බොහොම අස්ථාවරභාවයක් තිබෙන්නේ. ඒ අස්ථාවරභාවය තුළ අපි රටක් හැටියට ආරක්ෂා වෙන්නට ඕනෑ.

ඒ වාගේම පොඞ්ඩක් හිතලා බලන්න, මේ සා විශාල බදු බරක් පටවලා අපේ රටට වර්ධනයක් ඇති කර ගන්න පුළුවන් ද කියලා. බදු පිට බදු ගහනවා. මැද පන්තිය ඉවරයි. බදු ගෙවන්නන් ඉවරයි. සාමාන්‍ය මනුස්සයාට, බදු ගෙවන මනුස්සයාට හැම අතකින්ම පීඩනය. සෘජු බදු විතරක් නොවෙයි, වක්‍ර බදුත් එහෙමයි. වක්‍ර බදු කියන්නේ මොකක්ද? Regressive taxes. ඒක දුප්පත්-පොහොසත් භේදයකින් තොරව හැමෝටම බලපානවා. ඔබට තිබුණා, IMF එක කියන කියන පදේට නටන්නේ නැතිව, මේ ඔබට ලැබුණු වරමට අනුව, "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව ඔබට තිබුණා, Debt Sustainability Analysis - DSA - එක වෙනස් කර ගන්න. නමුත්, ඔබතුමන්ලා කළේ මොකක්ද? ඔබතුමන්ලාත් තිබුණු ආණ්ඩුවම ගිය පාරේ යන්නට කටයුතු කිරීම නිසා අද හැම පුද්ගලයෙකුටම මහා විශාල බදු කන්දකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ජන සමාජයේ සිටින පුංචිම මනුස්සයාගේ ඉඳලා, කුඩා දරුවාගේ ඉඳලා, ගෘහනියගේ ඉඳලා, ස්වයංරැකියාලාභින්, ත්‍රීරෝද රථ රියැදුරන්, ගොවි, ධීවර, කම්කරු, සාමාන්‍ය ජනතාව, වෘත්තීයවේදීන්, මැද පන්තිය ඇතුළු හැමෝම මේ බදු බර නිසා ඉතා බරපතළ ව්‍යසනයකට මුහුණ දීලා තිබෙනවා.

විශේෂයෙන්ම මම මේ කාරණයත් කියන්න කැමැතියි. ජනාධිපතිතුමා කථා කරපු කුමන්ත්‍රණය ගැන. ආණ්ඩු පෙරළීමේ කුමන්ත්‍රණය නොවෙයි, පොරොන්දු ඉටු නොකිරීමේ කුමන්ත්‍රණය ගැන. "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක නොකිරීමේ කුමන්ත්‍රණය තමයි අපි හිතන කුමන්ත්‍රණය. අපට අපේ පැත්තෙන් කියන්න පුළුවන්, මොනම හේතුවකටවත්,-

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම ඔබතුමාට original පොතක් ගෙනත් දෙන්නයි හැදුවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමන්ලාගේ original පොත් මොනවා වුණත්, ඔබතුමන්ලා කරන්නේ duplicate වැඩ නේ. ඔබතුමන්ලා duplicate වැඩ කරන නිසා මම duplicate පොතක් පෙන්නුවේ. ඒ නිසා විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, මේකයි කුමන්ත්‍රණය කියන එක. මේක ජනතාව දුන්නු වරම අමු අමුවේ උල්ලංඝනය කිරීමක්. මේක ජනතාවට දුන්නු පොරොන්දු ටික සම්පූර්ණයෙන්ම උල්ලංඝනය කිරීමක්.

දැන් එහා පැත්තෙන් කියනවා මට ඇහෙනවා, එකක් කියන්න කියලා. මම කියන්නම් එකක්. දැන් ඕනෑ නම් ඔබතුමන්ලාට බලන්න පුළුවන්, ජනාධිපතිතුමා - මේ මම නොවෙයි. ජනාධිපතිතුමා - අපේක්ෂකතුමා හැටියට කිව්වාද නැද්ද, විදුලි බිල සියයට 33කින් අඩු කරලා රුපියල් 9,000 විදුලි බිල රුපියල් 6,000ක් කරනවාය; රුපියල් 3,000 විදුලි බිල රුපියල් 2,000ක් කරනවාය කියලා? දැන් අපට අද කියනවා, ඒක ගැන විද්‍යාත්මකව හිතන්න ඕනෑ, සමීක්ෂණය කරන්න ඕනෑ, ගවේෂණය කරන්න ඕනෑ, පසු විපරම් කරන්න ඕනෑ කියලා. ඉතින්, අර රුපියල් 9,000ක බිල රුපියල් 6,000ත්; රුපියල් 3,000ක බිල රුපියල් 2,000ත් කරනවාය කියන කථාව කියන්න ඉස්සර වෙලා ඔය සමීක්ෂණය, ගවේෂණය, අධීක්ෂණය, පසු විපරම කරන්න තිබුණා නේ. *[බාධා කිරීමක්]* මොකක්ද? ඒ කියන්නේ පොතේ නොතිබ්බ එක ජනාධිපතිතුමා කියපු එක වරදක් කියලාද ඔබතුමා කියන්නේ? අන්න, පොතේ කොහේද තිබෙන්නේ කියලා අහනවා අපේ නියෝජ්‍ය ඇමතිතුමා. ඒ කියන්නේ නම නොකියා කියනවා, ජනාධිපතිතුමා කළේ වරදක් කියලා. ඉතින්, මම නොවෙයි නේ වේදිකාවට ගිහිල්ලා රුපියල් 9,000ක බිල රුපියල් 6,000ක් කරනවාය, රුපියල් 3,000ක බිල රුපියල් 2,000ක් කරනවාය කියලා කිව්වේ. ඒක ඔබතුමා ජනාධිපතිතුමා එක්ක බේරා ගන්න, "ඔබතුමා මේ පොතේ නොතිබ්බව එකක් කිව්වේ ඇයි" කියලා අහලා. ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ නිසා මම අවසාන වශයෙන් මේ අවස්ථාවේ දී කියන්න කැමැතියි, කරුණාකරලා පොදු ජනතාවගේ හද ගැස්ම හඳුනා ගන්න. පොදු ජනතාව අතරට යන්න. ඔබට ජීවත් වෙන්න පුළුවන්ද, ඔබට ලැබෙන ආදායම ප්‍රමාණවත්ද, දරුවන්ට කිරි පිටි ටික ගන්න, ආහාර ටික ගන්න ලැබෙන ආදායම ඇතිද, ලැබෙන සොච්චමෙන් ජීවත් වෙන්න පුළුවන්ද, ඔබගේ දුප්පත්කමේ ප්‍රමාණය කොපමණද කියලා, ජනතාව අතරට ගිහිල්ලා හොයලා බලන්න. අපි රජයක් හැටියට මේකට මැදිහත් වෙලා උදව් කරන්නේ කොහොමද කියලා බලන්න. ඉතින් මම කියන්නේ, මේ සභාවට ඇවිල්ලා නිකම් පොර ටෝක් දීලා වැඩක් නැහැ නේ. සංවේදී වෙන්නට ඕනෑ. මනුෂ්‍යත්වයක් තිබෙන්නට ඕනෑ. මානුෂීයභාවයක් තිබෙන්නට ඕනෑ. සඳලු තලයේ ඉන්නේ නැතුව මහ පොළොවට පය ගහලා, ජනතාවගේ සිතුම් පැතුම් අවබෝධ කරගෙන වැඩ කටයුතු කරන්නට ඕනෑ. ඒ නිසා ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයට මම කියන්න කැමැතියි, කිසිම දේශපාලන කුමන්ත්‍රණයකට ප්‍රගතිශීලී විපක්ෂයේ අපි සම්බන්ධ වෙන්නේ නැහැ කියන එක. එහෙම කුමන්ත්‍රණවලට අපි සම්බන්ධ වෙලාත් නැහැ.

හොඳට මතක තියා ගන්න, මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, මට අගමැතිකම භාර ගන්න කියලා 61 වතාවක් කිව්වා. 61 වතාවක්! *[බාධා කිරීමක්]* මොකක්ද, හඳුන්නෙත්ති මැතිතුමා කියන්නේ? *[බාධා කිරීමක්]* මොකක්ද කියන්නේ? *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉංග්‍රීසියෙන් කියන්න කෝ. *[බාධා කිරීමක්]* හරි, කමක් නැහැ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න කෝ, කෑ ගහන්නේ නැතුව. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් කෑ ගහන්නේ නැතුව ඉන්න. ඒ නිසා මම කියන්න කැමැතියි, කිසිම අවස්ථාවක අපි දේශපාලන කුමන්ත්‍රණ කරන්නේ නැහැ. අපේ බලය ලබා ගැනීමේ ප්‍රයත්නය තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළ හරහා පමණයි.

බොහොම දරුණු හීනයක් දැකලා, උදේ පාන්දරම නැඟිටලා කඩිමුඩියේ මේ මැති සභයට ඇවිල්ලා අපේ ජනාධිපතිතුමා කරපු කථාව අහලා මම අද පුදුම වුණා. මම පුදුමයට පත් වුණා. අපි බලාපොරොත්තු වුණේ එතුමාගෙන් ජනාධිපතිවරයා හැටියට කථාවක්. ආර්ථිකයේ ඉදිරි ගමන් මාර්ගය කොහොමද, වර්තමානය මොකක්ද, අපි අභියෝග ජයග්‍රහණය කරන්නේ කොහොමද කියන කාරණා පිළිබඳව. ඒ හැම අභියෝගයක්ම ජයග්‍රහණය කරන්නට අපි අපේ සහයෝගය ලබා දෙනවා. හැබැයි අපි සහයෝගය ලබා දෙන්නේ, ජනතාවාදී ඉලක්ක සම්පූර්ණ කරන්න පමණයි. ඒ නිසා "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" තුළින් ජනතාවට දුන් පොරොන්දු ටික ඉෂ්ට කරන්නේ කවදාද කියලා කාල වකවානු සහිතව රටට කියන්නය කියලා මම යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Wasantha Samarasinghe. You have 13 minutes.

[අ.භා.3.08]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා කථා කරලා ඉවර වෙච්ච වෙලාවේම කථා කරන්න හම්බ වෙච්ච එක හොඳයි. එතුමා මේ කථාව පුරාවට කියන්න උත්සාහ කළා, ජනාධිපතිතුමා ඇවිල්ලා තොරතුරු නැතුව, දත්ත නැතුව කරුණු කිව්වාය කියලා. මට මතක් වුණා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගම්වලත් ඉන්නවා ඔය වාගේ කට්ටිය. ඒ කියන්නේ, කවුරුත් නැති වෙලාවේ ඇවිල්ලා පාට් දානවා වගේ කථා කියන්නේ. අපිත් මෙතැන සිටියා. මොකද, එතුමා හොරාට කථාව අහගෙන ඉඳලා තිබෙනවා. හැබැයි, මේ සභාවට ආවේ නැහැ. කමක් නැහැ, කොහොම හරි එතුමා කථාව අහගෙන සිටියා නේ. එතුමා කථාව අහගෙන ඉඳලා පසුව මෙතැනට ඇවිල්ලා කියනවා, ජනාධිපතිතුමා මොකුත් කිව්වේ නැහැ කියලා. හත්වලාමේ! එතුමා සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරමින් ඒ දේවල් කිව්වා නේ. කබීර් හෂීම් මැතිතුමා එහෙම ඒ වෙලාවේ මේ සභාවේ සිටියා නේ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒ වෙලාවේ මොකක්ද කියන්නත් හැදුවා. අපි ආපු මාස හත - අට ඇතුළේ අපේ රටේ ආර්ථිකය ගෙනාපු තැන ගැන ජනාධිපතිතුමාගේ කථාව ඇතුළේ තිබුණා නේ. මේ රට මෙතෙක් කල් පාලනය කරපු අය මේ රට මෙතැනට වට්ටපු විධිය ගැන කිව්වා. හැබැයි, එතුමා තව ටිකක් කිව්වේ නැහැ. නමුත්, හොරු අල්ලන හැටි, හොරා කාපු හැටි, නාස්තිය කොහොමද, දූෂණ කටයුතු කරපු හැටි කොහොමද කියලා ජනාධිපතිතුමා කිව්වා. *[බාධා කිරීමක්]* ඒවා කිව්වේ නැහැ.

**ගරු ඩී.වී.චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
රොකට් එක ගැන කිව්වේ නැහැ නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔච්චරම තමයි කියන්න තිබෙන්නේ. වෙන කියන්න කිසිවක් නැහැ නේ. කියන්න වෙනත් කිසි දෙයක් නැහැ. රොකට් එක ගැනත් කියලා තිබෙනවා, පොඩ්ඩක් ඉන්න. මම රොකට් එක ගැන කියලා දෙන්න තමයි හදන්නේ. මොකද, ඔබතුමා යවපු රොකට් එකක් තවම හොයාගන්න බැරුව තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමා කථාව කළේ සංඛ්‍යා දත්ත ඇතුවයි කියන එකයි මට කියන්න වුවමනා වුණේ. එම නිසා විපක්ෂ නායකතුමා සිහින සංකල්පයක ඉඳගෙන තමයි කථා කළේ. මම හිතන විධියට මෙතුමාගේ කථාව ලියලා තිබෙන්නේ, ජනාධිපතිතුමා අද කථා කරන්න කලින්. මෙතුමා ඒ කථාව අරගෙන ඇවිල්ලා දැන් මේ සභාවට ඉදිරිපත් කළා. ජනාධිපතිතුමාගේ කථාව ඇතුළේ ඇති තරමට සංඛ්‍යා දත්ත සහ ලේඛන තිබුණා නේ. ආර්ථිකය වර්ධනය වෙලා තිබෙන හැටි කිව්වා, අපනයන වර්ධනය වෙලා තිබෙන හැටි කිව්වා. අප්‍රිකානු කලාපයේ රටවල කීයද, යුරෝපීය කලාපයේ රටවල කොච්චරද කියලා කිව්වා. එතුමා කියපු කථා පැත්තක තියලා තමයි විපක්ෂ නායකතුමා මේ කථාව කියන්න හැදුවේ. විපක්ෂ නායකතුමා ජනාධිපතිතුමාගේ කථාව හොරාට හරි අහගෙන හිටපු එක ගැන අපි සතුටු වෙනවා. මොකද, රටේ ආර්ථිකය හදලා මේ රට ඉදිරියට ගෙනයන ගමන ගැන ජනාධිපතිතුමා කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කථාවක් අහලා තිබෙනවා නේ, වතුර අදින්න අපට කලය හරියට අවශ්‍යයි කියලා. ණය ගෙවාගන්න බැරිව, ලෝකයේ වෙනත් රටක බැංකුවකින් LC එකක් open කරන්න බැරිව, ලංකාවේ තිබෙන විශාලතම බැංකුවට පවා LC එකක් open කරන්න බැරි තරමට මේ රට බංකොලොත් කරලා තිබුණේ. අටු කොටු පිරිලා උතුරලා ගිහිල්ලා, භාණ්ඩාගාරය ඉතිරිලා, යන එන ගමනුත් තෙල් ටිකක් ගහගෙන යන්න පුළුවන්, අර සංස්කෘතික අරමුදලේ සල්ලි බෙදාගෙන යන්න පුළුවන් වාගේ තත්ත්වයක් මේ රට තුළ තිබුණේ නැහැ. මේ රටේ ආර්ථිකය වැටිලා තිබුණේ. වැටුණු ආර්ථිකය ගොඩනඟන්න අපි දැන් කටයුතු කරමින් ඉන්නවා. අපි ඒ පාරේ තමයි මේ යන්නේ. ඒ නිසා "පොහොසත් රටක්, ලස්සන

ජීවිතයක්" පිළිබඳව වන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පෙන්නලා මේ අය බොරු කියනවා. ඒ ප්‍රකාශනය ඇතුළේ තිබෙන වැඩ ටික අපි කරමින් ඉන්නවා. එම නිසා අපි ජනතාවගේ ජීවිත වඩාත් තෘප්තිමත් ජීවිත බවට පත් කරන්න වැඩ කරන අතරේ, අපි මේ රට ඉස්සරහට ගෙන යන ගමන ගැන විපක්ෂයට හැමදාම බොරු කියමින් තමයි ඉන්න වෙන්නේ.

එම නිසා මේ රට ඉස්සරහට ගෙන යන ගමන ගැන බොරු කියමින් ඉන්න උත්සාහ කරන විපක්ෂය ඇතුළේ, එක් ගරු මන්ත්‍රීවරයෙක් රැකියා වියුක්තිය වැඩි වෙලා කියලා කියනවාත් අපි දැක්කා. කොහොම වුණත්, 54,000කට රැකියා ලබා දීම සඳහා මේ වන විට අපේ කැබිනට් මණ්ඩලය අවසර දීලා තිබෙනවා. "උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු," කියලා කොහේ හරි කියනවා, ඔබතුමා දැක්කාද? නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි එහෙම රැකියා දෙන්නේ නැහැ. අපි එහෙම රැකියා දෙන්න යෝජනා කරන්නේ නැහැ; කථා කරන්නේ නැහැ. මේ රටේ උපාධිධාරීන්ට රැකියා ලබා දීම සඳහාත්, අනෙකුත් තරුණ තරුණියන්ට රැකියා ලබා දීම සඳහාත් අවශ්‍ය පුරප්පාඩු ගැන සොයා බලනවා. රජයේ පුරප්පාඩු ටික පුරවන්නේ කොහොමද, අන්න ඒ සඳහා තරග විභාග පවත්වලා, සියලුදෙනාට සාධාරණ වන විධියට රැකියා දෙන්න කටයුතු කරනවා මිස, "උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු" විධියට රක්ෂා දෙන ප්‍රතිපත්තියක් අපේ ආණ්ඩුවේ නැහැ. එම නිසා අපි ආණ්ඩුවක් හැටියට මේ වැඩේ කරනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
විපක්ෂ නායකතුමා එහෙම තමයි රැකියා දෙන්න හැදුවේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
දෙන්න හැදුවා. හැබැයි, එතුමාට දෙන්න බැරි වුණා. ඒකයි වුණේ. එම නිසා මේ රට ඉස්සරහට ගෙන යන්න, මේ රට පොහොසත් රටක් බවට පත් කරන්න කටයුතු කරමින් යන අපේ ආණ්ඩුව පිළිබඳව බොරු කියන එක හැරුණාම විපක්ෂයට විකල්පයක් නැහැ. ජනාධිපතිතුමා යෝජනා කරපු විධියට දැන් ක්‍රමයක් තෝරා ගන්න. නැත්නම් හැමදාම ඉන්න වෙන්නේ ඔහොම තමයි. අගමැති වෙන්න 61 වතාවක් calls දුන්නා ලු. මට හිතෙන විධියට විපක්ෂ නායකකමේ ඉන්න කියලා තව කී වතාවක් calls එයිද දන්නේ නැහැ. ඕක තමයි ඊට පස්සේ වෙන්න තිබෙන්නේ. ඊළඟ වතාවේ ඉඳලා ඒ සඳහා තව කට්ටියක් බලමින් සිටියා. මම හිතන විධියට දැන් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මේ සංවාදය ඇතුළේ - මේ සාකච්ඡාව ඇතුළේ - ඔබතුමාගේ අවධානයට තව විශේෂ කාරණයක් අරගෙන එන්න ඕනෑ. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් රොකට් එකක් ගැන ඇහුවා නේ. එතුමා රොකට් එක ගැන ඇහුවා. ඊයේ ඒ රොකට් එකේ කථාව අහපු වෙලාවේ, -

**ගරු ඩී.වී.චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
අගමැතිතුමිය කියපු කථාව කියන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අගමැතිතුමිය කියපු කථාව ගැන තමයි මම මේ කියන්න හදන්නේ. කලබල නැතුව පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ. කලබලයි නේ. ඇත්ත කියන්න යනකොට කලබල වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික සමාගමක් පිළිබඳව අගමැතිතුමියගෙන් ප්‍රශ්නයක් අහලා තිබුණා. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පොඩි පුතා විවී, ඒ කියන්නේ රෝහිත රාජපක්ෂ යවපු රොකට් එක ගැනත් එම පෞද්ගලික සමාගම සම්බන්ධ ප්‍රශ්නය ඇතුළට ගෙනැල්ලා තිබුණා. මට හිතෙන්නේ රොකට් එක පාට කරන්න ගිය අය තමයි මේ ගැන අහන්නේ. ඒ වෙලාවේ අගමැතිතුමියට එවලා තිබුණු උත්තරයේ තිබුණු විස්තර අරගෙන ඊයේ හවස ඉඳන් මේ කථාව හදනවා, විවීගේ රොකට් එකෙන් ඩොලර් බිලියන එකහමාරක් හොයලා, බිලියන 3,200ක් හොයලා කියලා. එතුමිය ඒ වෙලාවේම කිව්වා, "මේ, මට දීලා තිබෙන තොරතුරු" කියලා. මොකද, මේකට තොරතුරු දෙන්නේ BOI එක. මොකද, BOI එක යටතේ තිබෙන සමාගමක් පිළිබඳවනේ ප්‍රශ්නය තිබෙන්නේ. ඒක නිසා ඒ තොරතුරු ලබා දෙනකොට, ඒ සමාගමේ තොරතුරු සටහන් කිරීමේදී සංඛ්‍යා ලේඛන සටහන් කිරීමේ වැරැද්දක් වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. ඒ වැරැද්ද දැනගෙන හරි, නොදැන හරි කියපු කථාවක් තිබුණා. සමහර විට උත්තරය කලින් ලැබුණාද දන්නේත් නැහැ. කොහොම හරි දැනගෙන හරි, නොදැන හරි කිව්ව කථාවක් තිබුණා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ සුප්‍රීම් සැට් කථාව මතු කරපු එක බොහොම හොඳයි. යට යන්න ගිය රහසකුත් ඒ නිසා එළිවෙනවා. ඒකත් කියන්න එපා යැ. ඔබතුමා ප්‍රශ්නය ඇහුවේ සමහර විට වෙන අදහසකින් වෙන්න ඇති. කොහොම හරි දැන් මේ කථාව ඔබතුමා අහපු එක හොඳයි කියලා මම ඔබතුමාට කියනවා. මොකද ඉතිහාසයේ වැලි තලාව විසින් යට යන්න ගිය සමහර කථා එළියට එනවා, මේක ඇතුළේ. ඒ මොකද?

ඊයේ අගමැතිතුමිය දුන් උත්තරයේ තිබෙනවා, සුප්‍රීම් සැට් සමාගම ආයෝජනය කරලා තිබෙනවා කියලා රුපියල් මිලියන 12,104ක්. ඒ ආයෝජනය කරලා තිබෙනවා කියන්නේ කවද්ද, 2013/2014 කාලයේ. ඒ අනුව 2013/2014 කාලයේ රුපියල් මිලියන 12,104ක් ආයෝජනය කළා කියලා කියනවා. ඒ අනුව මේ satellite එකෙන් ආදායම් ඉපයුවාද කියලා අහනවා. මේ උත්තරයේ කියන්නේ, "ආයෝජන මණ්ඩලය සතු වාර්තාව අනුව ශ්‍රී ලංකාවට මූල්‍ය ප්‍රතිලාභ ලෙසත්, සුප්‍රීම් සැට් සමාගම විසින්...", Satellite එකෙන් නොවෙයි. "සුප්‍රීම් සැට්" කියලා සමාගමක් තිබෙනවා. ඒක සමාගම් මැදුරේ ලියාපදිංචි සමාගමක්. ඒ සමාගමේ අධ්‍යක්ෂවරු ලෙස දැන් ඉන්නේ, තාත්තයි, පුතයි. ඒ සමාගමට අදාළ රූපවාහිනී චැනල් එකක් කරන තවත් සමාගමක් තිබෙනවා, Supreme Global Holdings කියලා. මේවා ඒකාබද්ධව තිබෙන ඒවා. මේවායේ ආදායම් හැටියට තිබෙන්නේ කොපමණ මුදලක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහි ආදායම හැටියට අගමැතිතුමියට තොරතුරු දීලා තිබුණේ රුපියල් මිලියන 19.617යි කියලා. අගමැතිතුමියට මේ උත්තරය දෙනකොට මේක හදලා දීලා තිබෙන අය හරියට පැහැදිලිව මේක හදලා දීලා තිබුණේ නැහැ. ඒක නිසා 2015/2016 රුපියල් මිලියන 19.167යි, 2016/2017 රුපියල් මිලියන 28.133යි, 2017/2018 රුපියල් මිලියන 29.1යි, 2018/2019 රුපියල් මිලියන 34.1යි, 2019/2020 රුපියල් මිලියන 42.9යි, 2020/2021 රුපියල් මිලියන 62යි, 2021/2022 රුපියල් මිලියන 87යි, 2023දී half එකක් තිබෙනවා, රුපියල් මිලියන 39.5ක. මේ සියල්ලේ එකතුව රුපියල් මිලියන 342යි. ඒ නිසා YouTube එකේ, Facebook එකේ මේ සම්බන්ධව විස්තර දාපු අයට අද මේක ආපහු නිවැරැදි කරන්න වෙනවා. මේක තමයි ගණන. ගරු මන්ත්‍රීතුමා කියපු ගණන නොවෙයි.

**ගරු ඩී.වී.චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

නැහැ, නැහැ, ඒ, මම කියපු ගණනද, ඔබතුමන්ලාගේ අගමැතිතුමිය කිව්වේ?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

අහගෙන ඉන්න. ඒ වෙලාවේ බොහොම උජාරුවට මේක කියන්න හැදුවානේ. මම බැලුවා, ඔබතුමන්ලා යවපු SupremeSAT satellite එක කෝ කියලා. අන්තර්ජාලයේ හොය හොයා යනකොට චීනයේ Aerospace ආයතනය satellite එකක් යවපු විස්තර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සුප්‍රීම් සැට් කොම්පැනිය ලංකාවේ BOI එකත් එක්ක agreement එක ගහලා තිබෙන්නේ 2012 මැයි මාසයේ. හැබැයි, satellite එකක් යැව්වා කියන්නේ 2012 නොවැම්බර් මාසයේ. කථාව තිබුණා නේ, යවපු satellite එක ගිය තැනක් හොයාගන්න නැහැ කියලා. ඒ ගිය තැනක් හොයා ගන්න නැති එක හරි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද මේ satellite එකට වියදම් වුණා කියලා තිබෙනවා, ඩොලර් මිලියන 320ක්. මේ satellite එකට වියදම් කරපු සල්ලි දුන්නේ කවුද කියන එක තමයි දැන් හොයන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුප්‍රීම් සැට් සමාගම කියනවා, 2012දී ඒගොල්ලන්ගේ ගිණුම් වාර්තාවල රුපියල් බිලියන 12.14ක් - රුපියල් මිලියන 12,104ක්- asset හැටියට තිබුණා කියලා. 2012දී තමයි ඒ satellite එක යවන්නේ. 2012දී තමයි කොම්පැනිය හදලා තිබෙන්නේ. එතකොට 2012ට ගිණුම් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සමාගමේ වත්කම් හා වගකීම් පරීක්ෂා කරද්දී 2013/2014 ගිණුම්වල තමයි තිබෙන්නේ, රුපියල් මිලියන 12,000කට ආසන්න වගකීමකුත් තිබෙනවා කියලා. ඒක මොකක්ද කියලා හොයාගෙන යනකොට කියනවා, lease-based satellite එකකට තමයි මේක තිබෙන්නේ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි, අරුමය සහ පුදුමය මෙයයි. 2013/2014 ගිණුම්වල තිබෙනවා, රුපියල් මිලියන 12,000ක් තිබෙනවා කියලා. Asset එකක් හැටියටත් මේ ආයෝජනයේ වටිනාකම රුපියල් මිලියන 12,000කට ආසන්න මුදලක් වනවා. Liability එකක් හැටියට අනෙක් පැත්තේ තිබෙනවා, රුපියල් මිලියන 11,700ක්, creditorsලාගෙන් හම්බ වෙච්ච පහසුකමක් කියලා.

හැබැයි, අරුමය කියන්නේ 2014/2015 ගිණුමේ එහෙම එකක් නැහැ. මට හිතෙන විධියට, satellite එක ගිය තැන හොයා ගන්න නැතුව ඇති. ගිණුම්වලින් අයින් කරන්න ඇති, මන්ත්‍රීතුමා. ඒ satellite එක ගිහිපු යෑම කියන්නේ ගිණුම්වලින්ම අයින් කරලා. Satellite යවපු අය කොහේටද ඒ satellite එක යැව්වේ? දැන් BOI එක අහන්න එපා යැ, satellite එකේ ආයෝජනය කෝ කියලා. ඔබතුමන්ලාගේ කාලයේදී අහලා තිබෙනවාද? නැහැ. මේ දෙවැනි අවුරුද්ද. 2014/ 2015, 2016/2017, 2018/2019 ගිණුම් වාර්තා බැලුවාම අනේ අපොයි, මේ company එක තිබෙන්නේ යන එන මං නැතුව වාගේයි. Satellite එක කෝ? ගිහිපු තැනක් හොයා ගන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යවපු satellite එක ගිහිපු තැනක් හොයා ගන්න බැහැ. *[බාධා කිරීමක්]* යවපු අය හොයා ගන්නත් බැහැ. මම අපේ පොලීසිය භාර ඇමතිතුමාගෙන් මේක ගැන ඇහුවා. එතුමාත් කිව්වා, CID සාක්ෂි දීලා තිබෙනවා කියලා. එයා ඒ ගැන දන්නවාද? දන්නේ නැහැ. CID සාක්ෂි දීලා තිබෙනවා, මම මේක දන්නේ නැහැ, මම කළේ දේශපාලන වැඩක් කියලා. සාක්ෂිය පස්සේ බේරාගනිමු. නඩුව තිබෙනවා නේ, ඒක පස්සේ බේරාගනිමු.

මොකද, මේ සමාගම BOI එකේ ලියාපදිංචි සමාගමක් ලෙස පළමුවෙනි අවුරුද්දේ තමන්ගේ ගිණුම් වාර්තා ලබා දෙද්දී, රුපියල් මිලියන 12,104ක ආයෝජනයක් කළා, lease-based එකට ගත් satellite එකකට ගෙවීමක් කළා කියලායි මේ කියන්නේ. එතකොට වත්කම හැටියට ඒක තිබෙනවා. ණයකරුවන්ගෙන් මේ සඳහා ණය පහසුකමක් ලබා ගත්තා කියනවා. මේ තොරතුරු 2015/2016 වෙනකොට නැහැ, අතුරුදහන්. Satellite එක ගිය තැන හොයා ගන්න බැරිව වෙන්න ඇති, SupremeSAT ගිණුමෙන් මේක අයින් කරලා තිබෙන්නේ. මේ වෙලාවේ මේ satellite එක ගැන කථාව මතු වූ නිසාම කියන්න ඕනෑ, දැන් මේක හොයන්න වෙනවා කියන එක. ඇයි? රුපියල් මිලියන 12,000ක් ආයෝජනය කළා කියලා පෙන්වනවා. චීනයේ බැංකු දෙකක් පිළිබඳව සඳහන් වෙනවා, ණය ලබා දුන්නා කියලා. මේ කථාව පිටුපස තව අපූරු කථාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකත් කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ තාක්ෂණය දියුණුවීමත් එක්ක, satellite තාක්ෂණය එක්ක, තොරතුරු බෙදා හැරීමේ ක්‍රියාවලියත් එක්ක තොරතුරු බෙදා හැරීම සඳහා මේ space එකට satellite එකක් යැවීමේ අයිතිය ලංකාවටත් තිබෙනවා. එහෙම satellite එකක් යැවීමට තිබෙන අයිතියට තමයි, 2012දී තිබුණු ආණ්ඩු බලය පාවිච්චි කරලා මේ වැඩේ කරලා තිබෙන්නේ. එතකොට ඒකට තමයි මේ කොම්පැනිය මෙහේ ලියාපදිංචි කරන්නේ. එහෙම නම් ඒ යැවූ satellite එක කෝ දැන්? කොම්පැනිය කරපු ආයෝජනය කෝ දැන්? අර හිටපු ජනාධිපතිතුමාගේ පුත්‍රයා කිව්වේ, Space Engineering කරලා ආවේ කියලා. මම විභාග සහතික ඉල්ලන්න යන්නේ නැහැ. ඔහු ඉගෙන ගත් විශ්වවිද්‍යාලය මොකක්ද කියලා මම කියන්න යන්නේ නැහැ. මොකද, ඔය කොම්පැනිය ගිහිල්ලා කියන්න එපා යැ, මේ පුද්ගලයාට EPF ගෙවලා තිබෙනවා, සේවකයෙක් කියලා කියනවා, මේ පුද්ගලයා අපේ කොම්පැනියේ හිටියා කියලා කියනවා. නමුත් මේ පුද්ගලයා ගිහිල්ලා කියනවා, "නැහැ, මම කොම්පැනියක හිටියේ නැහැ" කියලා. මෙතැන උභතෝකෝටික ගොඩයි නේ. චානක මන්ත්‍රීතුමා මේ ගැන අහපු එක හොඳයි. දැන් පරීක්ෂණ නැවත පටන්ගත හැකියි. *[බාධා කිරීමක්]* ඒ පරීක්ෂණත් එනවා. ඒවාත් එනවා. භය වෙන්න එපා. අර දුව පාරේ ඉඩම් ගත්තේ රුපියල් කෝටි 74කට. ආං ඒ ගෙයි දාලා තියෙන බල්ලෝ ටිකත් එක්කම අල්ලා ගන්නවා. භය වෙන්න එපා. *[බාධා කිරීමක්]* ඒ පරීක්ෂණ එනකොට භය වෙලා තමයි දැන් මේ හොයන්නේ. ඒ නිසා මේ satellite එක හොයන්න කියලා පාර පෙන්වන්න ආපු විපක්ෂයට දැන් අපි පාර පෙන්වනවා, satellite එක හොයා ගන්න. *[බාධා කිරීමක්]* ඒ නිසා කලබල වෙන්න එපා. දැන් satellite එක හොයා ගන්න පාර පෙන්වනකොට ඇවිල්ලා බලාගන්න පුළුවන්, මොකද වෙන්නේ කියලා. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ satellite එකේ කථාව කියලා ලොකු advantage එකක් ගන්න හැදුවා. බලන්නකෝ, මේ satellite එක යවලා දැන් රුපියල් බිලියන 300ක්, 400ක් ආදායම් ඇවිල්ලා නේ කියලා කියන්න හැදුවා. මට කියන්න වුවමනාව තිබෙන්නේ, මේ යවපු satellite එක හොයන්න දැන් විපක්ෂයෙන් දෙන්නෙක් විතර යවන්න වෙනවා කියන එකයි. නැත්නම් මේක හොයා ගන්න වෙන්නේ නැහැ නේ. මොකද, මේ සමාගම 2022න් පස්සේ ගිණුම් දීලාත් නැහැ, BOI එකට. මේ satellite කථාව ඇදලා ගත්තේ වැඩකට වෙන්න ඇති. ඒ නිසා දැන් අපි වැඩේ පටන් ගනිමු. මොකද, මේ satellite එකට ඩොලර් මිලියන 320ක් වියදම් වුණා කියලා කියනවා නම්, ඒ ඩොලර් මිලියන 320න්, 285කට, 290කට වඩා බැංකුවකින් ණය ගත්තා කියන කථාවකුත් තිබෙනවා. ඒ කථාවත් තහවුරු කර ගන්න ඕනෑ. ඒ වාගේම දේශීය සමාගමක් ඒකට ආයෝජනය කළාය කියනවා. ඒ ආයෝජනය කරපු මුදල රුපියල් මිලියන 12,000ක් නම් අන්න ඒ රුපියල් මිලියන 12,000 කවුද දැම්මේ කියලාත් හොයන්න ඕනෑ. දෙවැනි අවුරුද්ද වෙනකොට ඒ රුපියල් මිලියන 12,000 නැති වුණේ කොහොමද? ඒවා ගිණුමේ තිබෙන්න එපා යැ. අවසාන

වාර්තාවල තිබෙන්න එපා යැ. ඒ රුපියල් මිලියන 12,000 කොහොමද ගිණුම්වලින් ඉවත් වුණේ? Asset එකත් ඉවත් වෙලා, වගකීමත් ඉවත් වෙලා. දෙපැත්තෙන්ම ඉවත් වෙනවා, එකක් ඉවත් වුණාම. නමුත් ඉවත් වෙච්ච විධිය තිබෙන්න ඕනෑ. මේ අයගේ ආදායම අඩුම තරමින් වියදම් පියවන්නවත් මදි. පාඩු පිට කරගෙන යන්නේ. අගමැතිතුමියට යොමු කරන ප්‍රශ්න සඳහා උත්තරය ලබා දෙනකොට එය හරියට තිබෙන්න ඕනෑ. මොකද, මේ ආයතන මේ උත්තර එවනකොට ඒවාට වග කියන්න ඕනෑ. අගමැතිතුමිය නම් උත්තර දෙන්නේ, ඒක හරියට බලලා, ඒ තහවුරුව අරගෙන එය කියන්න ඕනෑ. ඒ නිසා උත්තරය ලබා දීමේදී නිලධාරින් විසින් වැරැද්දක් කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
BOI එක වැරැද්දක් කරලා තිබෙනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
කරලා තිබෙනවා. ඒ වැරැද්ද නිවැරදි කරන්න ඕනෑ. ඔබතුමා හිටපු නැති වෙලාවේ මම හරියටම ගණන් කිව්වා. රවී කරුණානායක මන්ත්‍රීතුමනි, අවුරුදු 8කටම කොම්පැනියේ ආදායම තිබෙන්නේ රුපියල් මිලියන 342යි. රුපියල් බිලියන 342 නොවෙයි, රුපියල් මිලියන 342යි. යවපු satellite එක දැන් හොයා ගන්න නැහැ. පළමුවෙනි අවුරුද්දේ ගිණුම් වාර්තාවල satellite එක ගැන තිබෙනවා. නමුත් යවපු satellite එක හොයා ගන්න නැහැ. දෙවෙනි අවුරුද්දේ ඉඳන් ගිණුමේ වත්කම් වගකීම් දෙපැත්තම අත් හැරලා. ඒ නිසා අගමැතිතුමියගේ ප්‍රකාශයෙන් advantage එකක් ගන්න හැදුවා නම්, sorry. ඒ වැරදි නිවැරදි කිරීම අපි කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ප්‍රශ්න අහන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ වෙලාවේදී කථා කරන්න. ඒ වැරැද්ද නිවැරදි කරගන්න අපි අවස්ථාව ලබා දුන්නා.

මේ satellite යැවීම ගැන විතරක් නොවෙයි, මේ රටේ මහජන ධනය හොරා කාපු මිනිස්සු ගැනත් පරීක්ෂණ පැවැත්වෙනවා. ඒ වාගේම ඒ පරීක්ෂණ ටිකක් වේගවත් කරන්න කියාත් සමහරු ඉල්ලනවා. *[බාධා කිරීමක්]* කලබල වෙන්න එපා, අපි ඒවා නීතියට භාර දීලා තිබෙනවා. ඒ අනුව satellite එක ගිය තැනත්, satellite එක යවන්න සල්ලි දුන්නේ කවුද කියන එකත්, ඒවාට අදාළ ක්‍රියාමාර්ග ටිකත් හොයා ගත්තාම මාලයක් නොවෙයි, අත් දෙකටත් දෙකක් දමාගෙන ඔබතුමාටත් ඉන්න පුළුවන්. ඒ නිසා භය නැතුව ඉන්න. ඒ වෙනුවෙන් අපි ආණ්ඩුවක් හැටියට වැඩ කරනවා කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ravi Karunanayake. You have 12 minutes.

[අ.භා. 3.08]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Thank you, Hon. Deputy Speaker, for giving me this time to speak on this important topic. අපි රටේ ආර්ථිකය ගැන කථා කරන මේ අවස්ථාවේදී පසු විපරමක් වශයෙන් මේ අවුරුද්ද තුළ වෙලා තිබෙන දේවල් සම්පිණ්ඩනය කරලා කථා කළ යුතුයි. අද රටේ ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා කථා කළාට පසුව ඒ කථාව තව ලෙහෙසි වෙනවා. මොකද, සැබෑ ගමනක් ආරම්භ කරලා තිබෙනවාද, නැද්ද කියන එක තමයි අපට ජනතාවගෙන් අහන්න අවශ්‍ය වෙන්නේ. පාර්ලිමේන්තුවේ මීට මාස හයකට, හතකට ඉස්සෙල්ලා ඉදිරිපත් කරපු අය වැය තුළින් ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් බිලියන 1,420ක මුදලක් වෙන් කරලා තිබුණත්, මේ කථා කරන මොහොත වනවිට රුපියල් බිලියන 310යි වියදම් කරලා තිබෙන්නේ. හෙට ආදායමක් ලබා ගන්න නම් අද වියදම් කරන ප්‍රාග්ධන වියදම් තුළින් තමයි ඉදිරියට ගමන් කරන්න අවශ්‍ය වෙන්නේ. ඒ නිසා අපි ප්‍රාග්ධන වියදම් අනිවාර්යයෙන්ම කළ යුතුයි. රටට ආදායමක් ලැබුණත් පුනරාවර්තන වියදම විතරක් වියදම් කරනවා නම් ඒකෙන් හෙට දින ආදායමක් ලබා ගන්න බැහැ කියන එක සම්බන්ධයෙන් අපි -සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාත්, අපේ වසන්ත සමරසිංහ මැතිතුමාත්- කථා කළ යුතුයි. මේ අවස්ථාවේදී අනිල් ජයන්ත මැතිතුමාත් සභාවට එනවා. මේවා තමයි බැරෑරුම් දේවල්, ගරු ඇමතිතුමනි.

මේ අවස්ථාවේදී මම මේ කාරණයත් මතක් කරන්න අවශ්‍යයි. මම මීට පෙර ලාල් කාන්ත මැතිතුමා මේ සභාවේ ඉන්න අවස්ථාවේදී කිව්වා, ජනාධිපතිවරුන්ට ආරක්ෂාව සපයන්න ඕනෑ, හෙලිකොප්ටර්වල යන්න ඕනෑ කියන ඒවා ගැන කථා කරලා වෙලාව නාස්ති කරන්න එපා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු කථානායකතුමාගේ නිල නිවස මගේ ගෙදර අසළ තිබෙන්නේ. නමුත්, අද ඒක පාළු කනත්තක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. නිල නිවසක් තිබෙනකොට ඩේවිඩ්සන් රෝඩ් එකෙන් ගෙයක් ගන්න අවශ්‍ය වෙන්නේ මොකටද? තව අවුරුදු පහකින් අහයි, වත්කමක් තිබෙනකොට ඒ වත්කම පාවිච්චි කරන්නේ නැතුව තව තැනකට මුදල් නාස්ති කළේ ඇයි කියලා. නිල වශයෙන් නිවසක් තිබෙනකොට ඒක පාවිච්චි කිරීම අත්‍යවශ්‍යයි. නැත්නම් ඒකට නිකරුණේ ප්‍රාග්ධන වියදමක් දරන්න සිද්ධ වෙනවා. එතකොට කියන්න පුළුවන්, ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා, නමුත් ඒ මුදල් පාවිච්චි කරලා නැහැ කියලා. හැබැයි, ඒ නිල නිවස පාවිච්චි කරන්නේ නැත්තේ ඇයි කියලා කවුරු හරි පෙත්සමක් ඉරිපත් කළොත්, ඒ අවස්ථාවේදී ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. ඔය වාගේ දේවල් සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක විය යුතුයි. මේවා රටේ ආර්ථිකය සම්බන්ධයෙන් නිල වශයෙන් කරන්න තිබෙන දේවල්. මේවා හැංගී හොරා කරන්න අවශ්‍යතාවක් නැහැ. ඒ විතරක් නොවෙයි, අප ආර්ථිකය ඉදිරියට ගෙන යා යුතුයි. එහි පසු විපරම විය යුත්තේ, ව්‍යාපාරිකයෝ නැති කරන එක නොවෙයි, ව්‍යාපාරිකයන් දිරිගන්වන්න කටයුතු කරන්නේ කොහොමද කියන එකයි.

ආණ්ඩුව business කරන්න එපා. සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, ඔබතුමා සෙවනගල, පැල්වත්ත, ඇතිමලේ සහ හිඟුරාන කර්මාන්තශාලා නඟාසිටුවන්න බොහොම වෙහෙස මහන්සියක් දරන බව අපට පෙනෙනවා. මේවාට වෙලාව නාස්ති කරන්නේ නැතුව ඔබතුමා නායකත්වය දීලා ගන්න කෙනෙකුට ගන්න දෙන්න, වැඩ කරන අයට වැඩ කරන්න දෙන්න. ඒකෙන් බදු ටික ගත්තොත් ආණ්ඩුවත්, අනිල් ජයන්ත ඇමතිතුමාත් බොහොම සතුටු වෙයි. මොකද, මේක වෙනම දෙයක්. ඔබතුමාගේ වෙලාව වෙන් කරන්න ඕනෑ, වහලා තිබෙන එකක් පවත්වාගෙන යන්න නොවෙයි, රටේ සමස්ත ආර්ථිකය ගැන කථා කරන්නයි. මම හිතන විධියට මේක තමයි කළ යුතු දේ සහ කරන්න අවශ්‍ය වෙන දේ. මේ සම්බන්ධයෙන් ප්‍රාග්ධන වියදම අත්‍යවශ්‍යයි කියන එකයි මම කිව්වේ.

[ගරු රවි කරුණානායක මහතා]

ජනාධිපතිතුමා අද කිව්වා, මන්ත්‍රීවරුන්ගේ pension එක අහෝසි කරන එක ගැන. ඒ යෝජනාව ගෙනාවේ මම. ජනතාව තුළ විශ්වාසයක් තිබෙනවා, දේශපාලනඥයන්ගේ විතරක් pension එක නැති කරනවා කියලා. ඒකට ඇඟුම්කන් දීලා අපි ඒ යෝජනාව ගෙනාවා.

ඒ වාගේම තමයි, මන්ත්‍රීවරුන්ගේ රක්ෂණය. මේ සභාවේ මන්ත්‍රීවරු 225දෙනෙක් සිටිනවා. මම මේ කථා කරන්නේ අපි විපක්ෂයක් වශයෙන් ජනතාවගේ විශ්වාසය නැවත තහවුරු කිරීමටයි. රුපියල් ලක්ෂ 10 රක්ෂණාවරණය අඩු කළා, රුපියල් 250,000ට. 225දෙනාටම ඔය රක්ෂණය ගෙව්වත් ඒ සඳහා වැය වෙන්නේ රුපියල් මිලියන 56යි. මේකත් ගන්නකෝ, ඔය දැවැන්ත සංවර්ධනයට. අපට මොකටද? මේ වාගේ සොච්චමක් දීලා අපව සුව කරන්න පුළුවන් කියලා හිතුවාට එහෙම නැහැ. ඒ රුපියල් 250,000ත් රටේ සංවර්ධනයට ගන්න. විපක්ෂය හැටියට අපි මේ කියන්නේ, ජනතා විශ්වාසය තහවුරු කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් පිළිබඳවයි. ඒ රුපියල් 250,000න් ජීවත් වන්න පුළුවන්ද? එම නිසා ඒ රුපියල් 250,000ත් රටේ සංවර්ධනයට ගන්න කියන යෝජනාව මම ඉදිරිපත් කරනවා. මම හිතන විධියට, විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු එම යෝජනාවට එකඟ වෙයි. මොකද, රුපියල් 250,000ක් කියන්නේ, මාසයකට රුපියල් 20,000යි. ඒ වාගේ දෙයක් පසුපස යනවාට වැඩිය ජනතා විශ්වාසය දිනා ගන්න එක වටිනවා. අනිල් ජයන්ත ඇමතිතුමනි, කරුණාකරලා ඔබතුමන්ලා එම යෝජනාව කරන්න. මම ඒකයි ජනාධිපතිවරයා ඉන්න වෙලාවේම ඒ ගැන කිව්වේ. ඒ රුපියල් 250,000ත් රටේ සංවර්ධනයට ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අද ගරු සභාවට ආවේ ගම්පහ ඉඳලා. මාලබේ, අතුරුගිරිය පාරෙන් තමයි මම ආවේ. කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන එම පාර හදන්න මාස හයකට ඉස්සෙල්ලා රුපියල් බිලියන 5ක් වෙන් කළා, මාර්ගයේ පළල අඟල් 6ක් වැඩි කරලා premix කරන්න. අද එනකොට මම දැක්කා, පාරේ අඩි තුනක් කපලා තිබෙනවා. ජල නළ එළන්න නැවත එම පාර කඩාගෙන යනවා. එදා කිව්වේ එහෙමද? එදා කිව්වේ, අපි තිරසාර සංවර්ධනයක් ඇති කරනවා, අවුරුදු හයකට, හතකට, අටකට තිරසාර වැඩ පිළිවෙළක් සකස් කර සැලසුම් සහගතව වැඩ කරනවා කියලායි. ඔබතුමන්ලා බලයට ආවේ මීට මාස හයකට ඉස්සෙල්ලා. පාරට තාර දමනවා. දැන් ඒවා කඩනවා. ඒවා අපරාධ නොවෙයිද? මේවා සම්බන්ධයෙන් කවුරු හෝ පෙත්සමක් යැව්වොත් මොකද වෙන්නේ? මොකද, අද හැම දෙයක්ම පෙත්සම් තුළින් නේ සිදු කරන්නේ. එතකොට අහයි, "ඊයේ නේ, මේක හැදුවේ, අද නැවත පාර කඩනවා. මේක මහජන මුදල් අවභාවිත කිරීමක්" කියලා. ඇත්ත. මොකද, මේ මාස හය තුළ බදු ගෙවපු අයගේ බදු මුදල් තමයි ඒවාට වියදම් කරන්නේ. සියයට 18ක VAT එකක් ගන්නේ ජොලි කරන්න නොවෙයි. දැන් නැවත පාර කඩනවා, වතුර ගන්න ජල නළ එළන්න.

මම expressway එකෙන් එළියට එනකොට දැක්කා, අතුරුගිරියේ exit වන ස්ථානයේ machines තුනක් සහ enter වන ස්ථානයේ machines තුනක් තිබෙනවා. හැබැයි, මේවායෙන් වැඩ කරන්නේ එකයි. අපි digitalization ගැන කථා කරනවා. නමුත්, අපරාදේ මිනිසුන්ගේ වෙලාව නාස්ති කරනවා, ටිකට් එකක් දෙන්න. ඇයි ඒවා ETC කරන්නේ නැත්තේ? ඒ අයව රටේ සංවර්ධනය වෙනුවෙන් වූ වැඩවලට යොදවන්න. Expresswaysවල මීට වඩා සංවර්ධනාත්මක වැඩ පිළිවෙළක් ඇති කරන්න. PR service එකක් ඇති කරන්න. රටේ සැබෑ සංවර්ධනයක් අවශ්‍ය නම් එවැනි වැඩ පිළිවෙළක් තුළින් තමයි ගමන් කරන්න අවශ්‍ය වෙන්නේ.

ඊළඟට මම කියන්න ඕනෑ cyber security ගැන. අද බැංකු හතරකට cyber attack කර තිබෙනවා. මම එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමාට කථා කරලා ඒ ගැන අහනකොට එතුමා කිව්වා, Cyber Security Authority එකක් ගෙනෙන්න ඕනෑ කියලා. මම ඒක අගය කරනවා. අනිවාර්යයෙන් එය කළ යුතුයි. එය වහාම කරන්න. Cyber Security Bill එකක් ගෙනැල්ලා, Cyber Security Authority එකක් ඇති කරලා නිල වශයෙන් ආයතන ආරක්ෂා කිරීමක් කරන්න අවශ්‍යයි. මොකද, අපි digitalization කරගෙන යනකොට බැරි වෙලාවත් මේ වාගේ cyber attack එකක් ආවොත් ඇමෙරිකාවේ වුණා වාගේ, බංග්ලාදේශයේ වුණා වාගේ අපට ඉතා බැරෑරුම් තත්ත්වයක් ඇති වනවා.

මේ මාස 10ක පමණ කාලය තුළ මට ඇහිලා තිබෙනවා, මන්ත්‍රීවරු කථා කරපු විධිය. අවුරුදු 76ක ශාපයක් ගැන කථා කරනවා. වරදාන ගත්තා, වරප්‍රසාද ලැබුණාය කියනවා. මේක කුහක දේශපාලනයක් කියනවා. ඒ වාගේම මැතක ඉඳන් පටන් ගත්තේ මජර දේශපාලනයක් කියනවා. මේ ඔක්කෝම කථා ගත්තාම පාර්ලිමේන්තුව තුළ අපට කථා කරන්න අවශ්‍ය වුණේ, මේ තිබෙන බැරෑරුම් තත්ත්වය මත ජනතාවට අදට වඩා හෙට හොඳ ජීවිතයක් ගත කරන්න පුළුවන් ගමනක් හදන්නේ කොහොමද කියන එකයි. අවුරුදු 76ක ශාපයක් ගැන කියමින් බැණලා වැඩක් නැහැ. මොකද, එදා ඉඳන් අද වනතාක් කල් වෙනසක් නැහැ. මා හිතන විධියට, අපි සියලුදෙනාම ඒක රාශි වෙලා, ඉලක්කයක් ඇතුව රට සංවර්ධනය කරන ගමන ආරම්භ කරන්න ඕනෑ. ඉතින් දැන්වත් ඉතිහාසයට බැණ බැණ ඉන්නවාට වඩා, පොරොන්දු ඉටු කරන්න. ඒවා මතක් කරන්න පුළුවන්. නමුත්, ඒක තුළ ගමන් කරමින් ඔබතුමන්ලා දුන් පොරොන්දු ටික ඉටු නොකිරීම තුළින් ලැබෙන ප්‍රතිවිපාකය මොකක්ද? එම නිසා ඉතිහාසයට බැණ බැණ එලෙස කටයුතු කරන්න එපාය කියන එක මම ඉතා ඕනෑකමින් කියනවා.

රටේ ආර්ථිකය දෙදරන තත්ත්වයක තමයි අද තිබෙන්නේ. හිතන්න එපා, අපේ ආදායම වැඩි වෙලා තිබෙනවාය කියලා. හැබැයි, රටේ ආදායම වැඩි වෙලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා ඒ නිර්භීත තීන්දු එදා ගත්ත නිසායි. එතුමා එදා ඒ තීන්දු ගත්තේ මැතිවරණයක් දිනන්න නොවෙයි, රටේ ආර්ථිකය ජයග්‍රහණය කරවන්න. එම ජයග්‍රහණයේ ප්‍රතිවිපාකය නිසා තමයි එතුමා අද ගෙදර සිටින්නේ. නමුත්, අද ආර්ථික වශයෙන් හොඳ අඩිතාලමක් හදලා තිබෙනවා. ආර්ථිකය සවිශක්තිමත් කිරීම තුළින් තමයි අපට රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ. රට ඉදිරියට ගෙන යන ගමනේදී පසුගිය ආණ්ඩුවලට බැණ බැණ ඉන්නවාට වඩා අපි එක්සත්ව රට හදන්න පුළුවන් අඩිතාලම දමන එක තමයි අත්‍යවශ්‍ය වන්නේ.

දැන් පෙනෙනවා, ආණ්ඩුව කන බොන මට්ටමට වැටෙනවා. එක වතාවටම ඇහෙනවා, ගුවන් තොටුපළෙන් එළියට එනකොට PSD එකේ නිලධාරින් ගිහිල්ලා duty-free shopsවල ප්‍රශ්නයක් ඇති කරගෙන කියලා. මම ඒ ගැන අහන්නේ තෘප්තියක් ලබා ගන්න නොවෙයි. ඔන්න, කන බොන ලෙවල් එකේ ආණ්ඩුවක් බවට පත් වෙලා තිබෙන එක ගැන දැන් කියන්න. මේවා තමයි සාමාන්‍යයෙන් වෙන්නේ. දැන් ඒක කිව්වාම අපි කියන්න ඕනෑ නැහැ ඇමතිතුමා හොරා කියලා. මේවා තමයි එදාත් වුණේ. නමුත්, ඒ ඔක්කොම දැන් මෙතැන දේශපාලන අධිකාරියට එනවා. මේ රටේ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. වැරදි කරන දේශපාලනඥයින් ඉන්නවා. නමුත්, ඒවායින් සියයට 98ක් විතර රජයේ නිලධාරින් තුළින් ඇතිවන දේවල් කියන එක ඔබතුමන්ලාට දැන්වත් පිළිගන්න වෙනවා. මම ඇයි එහෙම කිව්වේ? මහ බැංකුව ගැනකථා කරනකොට මම හැම අවස්ථාවකදීම කියපු කාරණාවක්

තිබෙනවා. මේ, පෞද්ගලික දෙයක් ගැන නොවෙයි කියන්නේ. මම මේ අවස්ථාවේදී මතක් කරනවා, රජයේ ඇමතිවරුන් හැම අමාත්‍යාංශයෙන්ම එවා තිබෙනවා ප්‍රාග්ධන වියදම් කරන්න එපා, කාර් එහෙම ගන්න එපාය කියලා. ගන්න එපා කිව්වාට මහ බැංකුව ඒ අයට ස්වාධීනත්වය තිබෙනවා කියාගෙන කටයුතු කරනකොට, ඒ අය මේ චක්‍රලේඛ පිළිගන්නේ නැහැ. මිලියන 171ක් මාස 3කට ඉස්සරවෙලා අරගෙන තිබෙනවා. BYD Sealion cars 9ක් අරගෙන තිබෙනවා, තමාගේ Deputy Governorsලාට. ඒ Deputy Governorsලා නවදෙනාට මේ සම්බන්ධයෙන්,- දැන් මම මේ වාර්තා ඉදිරිපත් කරන්නේ මේ නිසායි. මහ බැංකුවේ සාමාන්‍යයෙන් දෙනවා petrol allowance එකක්. දැන් මාස 2, 3ක් claim කරලා තිබෙනවා, පෙට්‍රල්වලට. හැබැයි, මේවා electric cars. මෙන්න, මේක තමයි තිබෙන ප්‍රශ්නය. ලෝකයට පෙන්වන්න හදනවා, මහ බැංකුව කොච්චර සුදනෙක්ද කියලා. මම මේ කියන මොහොතේ ෆයිල් ඔක්කොම හංගන්න පටන් ගනියි. අපි duplicates අරගෙන තිබෙනවා petrol allowance අරගෙන තිබෙන එක ගැන. ඉතින්, රට හදන තැන මේ වාගේ දේවල් හදනකොට අනිවාර්යයෙන්ම නිවැරදි කරන්න අවශ්‍ය වෙනවා. මට කියන්න අවශ්‍ය වන්නේ, කරුණාකර අපි රට හදන ඉලක්කයක් එක්ක වැඩ කරමු කියලායි.

ඒ වාගේම තමයි කාර් සම්බන්ධයෙන් ගත්තාම. මම මේ අවස්ථාවේදී මේ කාරණය පෙන්වා දෙන්න අවශ්‍ය වෙනවා. කාර් 7,700ක් හම්බන්තොට වරායේ තිබෙනවා, 772ක් කොළඹ වරායේ තිබෙනවා. මෙහිදී මුදල් හිරවෙලා තිබෙනවා, බදු සම්බන්ධයෙන් ගත්තාම. මේකේ තිබෙනවා cross-border LC ප්‍රශ්නයක්. Cross-border LCs කිව්වාම, LCs අරිනවා එක රටකින් තව රටකට. පුතෙක් ඉන්නවා නම් කටාර්වල, ඔහු LC අරිනවා තමන්ගේ තාත්තාට හෝ අම්මාට කාර් එකක් දෙන්න ජපානයට. ඒ අරින LC එක ලංකාවෙන් ඇරුණු නිසාම ඒක cross-border LC එකක් වෙනවා. ඒකට පුතාට බැණලා වැඩක් නැහැ. LC එක ඇරියේ කටාර්වලින් ලංකාවට පරිත්‍යාග කරනවා කියලා. ඒ සම්බන්ධයෙන් administrative, ඒ කියන්නේ පරිපාලනමය වශයෙන් තීන්දුවක් දීලා, ඒකට fine එකක් දීලා කරන්න පුළුවන්. ඒක එච්චර ප්‍රශ්නයක් නොවෙයි. ඒ සම්බන්ධයෙන් පුළුවන් තරම් ඉක්මනට ආණ්ඩුව තීන්දුවක් ගන්න අවශ්‍යයි ඒක හරිද, වැරදිද කියලා. මේ ඔක්කොම උසාවි තුළින් කරන්න ඕනෑ නැහැ. මේ ගැන තීන්දු ගන්න අවශ්‍ය වෙන්නේ ඔව් ද, නැද්ද කියන එකයි.

ඊට පස්සේ වෙනම එකක් තිබෙනවා BYD සම්බන්ධව. ඒ ගැන උසාවියට ගිහින් තිබෙන නිසා, යම් ප්‍රශ්නයක් තිබෙන නිසා, තරගකරුවන් ගිහින් තිබෙන නිසා, ඒ අයට යම් විධියකින් ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙන නිසා, ඒක අර්ථකථනය කරන්න අවශ්‍ය වෙනවා. ඒ කියන්නේ motor capacity එක 100, 150 කියන ප්‍රශ්නය නිසා. මම හිතන්නේ නැහැ ඒ ගැන මෙතැන අපි කථා කළ යුතුයි කියා. මොකද, ඒ සම්බන්ධයෙන් උත්තරයක් බොහොම ළඟදීම ලැබෙන නිසා. හැබැයි, තරගකරුවන්ට ඒ අවස්ථාවම ලබා දුන්නාම, ඒ අය වැරැද්දක් කළා නම් මෙලහකට ඒකේ අධ්‍යක්ෂවරු සිර භාරයට යනවා. නමුත්, මම හිතන හැටියට ඇයි මෙතැන විතරක් ප්‍රශ්නයක් තිබෙන්නේ කියන එක ගැන ප්‍රශ්න කරන්න අවශ්‍යයි. මොකද, එක්කෙනෙකුට එක් තීන්දුවකුත්, මහා ලොකු කොම්පැනිවලට වෙනත් තීන්දුවකුත් දෙන්න බැහැ. මෙතැන නිවැරදි ස්වරූපයක් ගෙනයන්න. ඒක තමයි ගන්න අවශ්‍ය වන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, your time is up.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I will just take two more minutes.

තරගකරුවන් අපට ඉදිරිපත් කළා මේ වාගේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මොකද, ජෝන් කීල්ස් කියන්නේ බොහොම හොඳ කොම්පැනියක්. ඉතින්, ඒ සම්බන්ධයෙන් අපි ලිව්වා, Public Finance Committee එකට. ජූනි 12වැනි දා හර්ෂ මැතිතුමායි, අපියි කථා කරලා, මේ සම්බන්ධයෙන් ගෙනැල්ලා අපට පෙන්නුවා මේකේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඉතින්, ප්‍රශ්නයක් කොහොමද නිවැරදි කරන්නේ කියලා ඒ ස්වරූපයෙන් කටයුතු කරන එක තමයි තිබෙන්නේ. ඒ නිසා cross-border LC එක සම්බන්ධව, මේ වාගේ electric vehicles සම්බන්ධව තීන්දු ගන්න අවශ්‍යයි.

ඊට වඩා භයානක දෙයක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ අගමැතිතුමිය උත්තර දුන්නා මේ රටේ තරුණ පරපුර ගැන. අපට පෙනෙනවා, 2019දී පළමු ශ්‍රේණියට 290,000ක් ඇතුළත් වෙනකොට, 2030දී එම ප්‍රමාණය 190,000කට අඩු වෙනවා කියා පුරෝකථනය කර තිබෙනවා. මේක භයානක දෙයක්. We are an ageing society. When we are an ageing society, we would not have a younger generation to pick up the legacy that have been created by our forefathers. මේක භයානක දෙයක් නිසා මේ ගැන අපි කථා කරන්න අවශ්‍යයි. රට සංවර්ධනය වෙලා වැඩක් නැහැ, ඉදිරි අනාගතය භාරගන්න පුළුවන් තරුණ, තරුණියන් මේ රටට බිහි වුණේ නැත්නම්. ඉතින්, ඒ සම්බන්ධයෙන් අපි කථා කරන්න අවශ්‍යයි. මොකද, අපට යුද්ධයක් තිබුණා. තරුණ අසහනයක් තිබුණා. ප්‍රශ්න ඇති වුණාම අපේ growth rate එක නැහැ. සාමාන්‍යයෙන් ඉන්දියාවේ ඉතාම තරුණ සමාජයක් බිහි වේගෙන යනකොට ඒ අවස්ථාව,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, your time is up. Would you please wind up?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I know that you have a sense of humour and that you give in to our requests. I will just take two extra minutes to make the most important point, about the IMF.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You have already taken two minutes more than your allotted time.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, IMF එක සම්බන්ධයෙන් අපි එදා ඉඳන් කිව්වා. IMF එක මේ රටේ අපනයනයට අදාළ ඒ බදු විරාම සම්පූර්ණයෙන් නැති කළාම අපි 2028දී ණය ගෙවන්නේ කොහොමද? බංග්ලාදේශය, කාම්බෝජය, වියට්නාමය, මුරුසිය, ඉන්දියාව යන රටවල බදු සහන දෙනකොට, අපේ ලංකාව යම් විධියකින් බංකොලොත් වෙලා තිබී එයින් එළියට එනකොට අපිට සියයට 10ක්, 15ක් අවුරුද්දකට

[ගරු රවි කරුණානායක මහතා]

ආයෝජනය කරන්න අවශ්‍යයි. මේකට දිරි ගැන්වීම් දුන්නේ නැත්නම් කවුද මේ රටට එන ආයෝජකයෝ? ලංකාවේ ආයෝජකයා මේ රටේ ආයෝජනය කරන්නේ නැත්නම්, සුද්දා මේ රටට එන්නේ මේ රටට තිබෙන ආදරයට ද? ඒගොල්ලන් මේකෙන් යම් විධියකින් ප්‍රතිලාභයක් ලබා ගන්න කැමැතියි. ඉතින් ඒ නිසා ඒකට IMF එක ඇවිල්ලා කියනවා නම් දෙන්න එපා කියලා, ඒගොල්ලන් අපිව බංකොලොත් කිරීමේ ගමනක් තමයි ගෙනියන්න හදන්නේ. අපේ රජයේ නිලධාරින් මේ සම්බන්ධව සටන් කරන්න අවශ්‍ය වන්නේ, ඇයි අපිට ආයෝජන ගෙනෙන්න ඉඩ දෙන්නේ නැත්තේ කියන එකටයි. ඉතින් ඒකට, they must have qualifying payments and ensure that tax holidays are given. Ensure that it is done on expenditure, not on getting down vehicles duty-free, which are basically needed for a luxurious living. Therefore, get that done. Sir, I know that time is against us.

මේ අවස්ථාවේ දී අපි මාස 11ක කාලය තුළ සිද්ධ වූ සංවර්ධනය ගැන කථා කරනවා. රටේ ශීඝ්‍ර සංවර්ධනයක් ඇති කරන ගමනක් තමයි අපට අවශ්‍ය වෙන්නේ. මේ තිබෙන සියලු දේවල්වලින් හොඳ ඒවා ආණ්ඩුව අරගෙන, සියලු නරක දේට විපක්ෂයට බැණ බැණ ඉන්න එක නොවෙයි අවශ්‍ය. මොකද, මාස 11කින් මේ වාගේ ආර්ථිකයක් හැදෙන්නේ නැහැ, මීට පෙර නිවැරදි මාර්ගයට ගෙනිච්චේ නැත්නම්. එක්සත් ජාතික පක්ෂය එදා මහවැලි සංවර්ධනය ඇති කළා. ලලිත් ඇතුලත්මුදලි මහත්මයලා වරාය වැඩිදියුණු කිරීම වාගේම මහපොළ ශිෂ්‍යත්ව අරමුදල ඇති කළා. ගාමිණී දිසානායකලා වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ ජලාශ ව්‍යාපෘති කළා. මේ සියල්ල තුළින් අපේ ගමන ඉදිරියට ගෙනියමු කියලා කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රට ස්ථිරසාර සංවර්ධනයක් කරා ගෙනියන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළකට අඩිතාලම දමමු කියලා කියන්න කැමැතියි. ආණ්ඩුවද, විපක්ෂය ද කියලා බැණ බැණ ඉන්නේ නැතිව එකට එක්ව රට හදමු. මේ රට කොළ, නිල්, රතු, කහ, දම්පාට නොවෙයි. එකට එක්ව කටයුතු කරන ශ්‍රී ලංකාවක් හදමු කියලා කියමින් මම නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sunil Handunnetti. You have 20 minutes.

[අ.භා. 3.25]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මේ ආර්ථිකය ගැන, ආර්ථිකයේ කාලීන තත්ත්වය ගැනයි සාකච්ඡා කරන්නේ. මේක වැදගත් සංවාදයක්, වැදගත් මාතෘකාවක්. මෙහිදී අර සදාකාලික විපක්ෂ නායක, අපේ හිතවත් සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ කථාවෙන් පස්සේ මට මතක් වෙච්ච කථාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පොඩි කාලයේ ටීවී එකේ යන කාටූන් වැඩසටහන් බලද්දී -කාටූන් වැඩසටහන් ආපුම කාලයේ- හොඳ කාටූන් එකක් තිබුණා, "දොස්තර හොඳ හිත" කියලා. ඒකේ එක චරිතයක් ඉන්නවා "වච් වච්" කියලා. ඒ වච් වච්ගේ චරිතයේ තිබෙන්නේ කොයි වෙලාවෙත් මොන දේ කිව්වත්, මොන හොඳ කිව්වත් "නෑ, බෑ, නෑ, බෑ" කියන එක. අන්න, ඒක තමයි අපේ සදාකාලික විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහත්තයාගේ අද පෙනෙන්න තිබුණේ.

එතුමා වැදගත් එක දෙයක් කිව්වා. මේ සංඛ්‍යා දත්ත, ලේඛන ඔක්කෝගෙන්ම මොනවත් පෙනෙන්නේ නැහැ කිව්වා. මේකේ මාර්ග සිතියමක් නැහැ කිව්වා; වැඩ පිළිවෙළක් නැහැ කිව්වා; දැක්මක් නැහැ කිව්වා. ඒ, වච් වච් වාගේ. නෑ, බෑ, නෑ, බෑ. ඊට පස්සේ ටික වෙලාවක් ගිහිල්ලා ඒක අමතක වෙලා ආයෙත් මැද හරියේදී කියනවා මේකේ දත්ත තිබුණා ලු; සංඛ්‍යා තිබුණා ලු; වැඩ පිළිවෙළක් තිබුණා ලු. හැබැයි, ඒ වුණාට ගමට ගිහිල්ලා බලන්න ලු, ජනතාව මොකද කියන්නේ කියලා. මුලින් කිව්වා මොනවත් නැහැ කියලා. ටිකක් වෙලා ගියාම ඒක අමතකයි. ඊට පස්සේ කියනවා මේකේ සංඛ්‍යා දත්ත, තර්ක, ආර්ථික වර්ධනය, අපනයන ගැන තිබුණා ලු හැබැයි, ජනතාවට ඒක දැනෙන්නේ නැහැයි ලු. නෑ, බෑ, නෑ, බෑ. වච් වච් වාගේ තමයි. ඒ නිසා ජනතාව මොකක්ද දන්නවාද කියන්නේ? "සජිත් ප්‍රේමදාස ඉන්නකල් ඔයගොල්ලන් ආණ්ඩුවේ" කියන එක. ජනතාව කියන ප්‍රධාන කාරණාව තමයි "සජිත් ප්‍රේමදාස ඉන්නකල් ඔයගොල්ලන්ට රජයේ ඉන්න පුළුවන්; බලයේ ඉන්න පුළුවන්" කියන එක. අන්න ඒක නම් ජනතාව හැම තිස්සේම කියනවා. ඒක කියන බව අපි විතරක් නොවෙයි විපක්ෂයේ ඉන්න අපේ හිතවත් මන්ත්‍රීවරුත් අපට කියනවා. ඒක තමයි ඇත්ත කථාව. ජනතාව කියන පළමු දේ ඒක. වැදගත්ම දේ තමයි ඒක. හැබැයි සජිත් ප්‍රේමදාස මහත්තයාට විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු ඒක කියනවාද දන්නේ නැහැ. ජනතාව කියන පළමු දේ තමයි "සජිත් ඉන්නකල් අනුර ජනාධිපති. ඒ විතරක් නොවෙයි, සජිත් ඉන්නකල් ඔයගොල්ලන් හැම දාම ආණ්ඩුවේ" කියන එක. අපි ඉන්න මේ පැත්ත සදාකාලික ආණ්ඩුව. අර පැත්තේ සදාකාලික විපක්ෂ නායක. සදාකාලික විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස. ඒක නිසා මම හැමදාම කියන්නේ, "අපේ හිතවත් සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා" කියලා. එතුමා ඉන්නකල් අපට කිසි ප්‍රශ්නයක් නැහැ.

විපක්ෂ නායකතුමා අද කරපු කථාවේදී රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ role එකටත් පොඩ්ඩක් බැස්සා. එතුමා ස්වයංව ආතල් එකක් ගන්නවා නේ, යම් යම් දේවල් කියලා. ඒවාට එතුමාට විතරක් හිනා යනවා; අපට හිනා යන්නේ නැහැ. ඒ වාගේ ඒවාත් දෙකතුනක් අද විපක්ෂ නායකතුමාගේ කථාවේදී කිව්වා. කොහොම වුණත්, විපක්ෂ නායකතුමා කියන ප්‍රධාන දෙයක් තමයි, ජනාධිපති අනුර දිසානායක සහෝදරයා හීනෙන් බය වෙලා වාගේ, එක පාරටම අවතාරයක් දැක්කා වාගේ කලබල වෙලා ඇවිල්ලා කථාවක් කළා කියන එක. නැහැ, අනුර දිසානායක සහෝදරයාගේ කථාවට බය වුණේ, අපේ සදාකාලික විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහත්මයා. මොකද, සජිත් ප්‍රේමදාස මහත්මයාට ඒ කථාව ඇහුවාම කල්පනා වෙනවා, ආයෙත් මේ කපේදී නම් ජනාධිපති පුටුවක් කිට්ටුවටවත් යන්න බැහැ කියලා. ඒක නිසා එතුමාට මතක් වුණා, 61 වතාවක් එතුමාට අගමැති වෙන්න ඉල්ලීම් කළ එකක් ගැන. ඒ කියන්නේ ෂුවර් එකටම සජිත් ප්‍රේමදාස මහත්මයා මොකක්ද දන්නවාද කරලා තිබෙන්නේ? එතුමාට අගමැති වෙන්න කියලා කවුරු හරි -ගමේ පොඩි එකෙක් හරි- කියපු ගමන් ගෙදර ගිහිල්ලා කාඩ් එකේ mark කර තිබෙනවා, 32යි කියලා. රැස්වීමකට ගියාම කවුරු හරි කිව්වොත් එහෙම, "ඔබතුමා තමයි අගමැති වෙන්න සුදුසු" කියලා, ගෙදර ගිහිල්ලා ඒකත් mark කර තිබෙනවා, 33යි කියලා. අනේ! එහෙම හරි, එතුමාට අගමැති වෙන්න කියලා ඔය පක්ෂයේ -සමගි ජන බලවේගයේ- 61දෙනෙකු විතරයි නේ කියලා තිබෙන්නේ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා එහෙම කිව්වේ නැහැ; හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා එතුමාට අගමැති වෙන්න කිව්වේ නැහැ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වේ නැහැ නේද, එතුමාට අගමැති වෙන්න කියලා? 61දෙනායි එහෙම කියලා තිබෙන්නේ. ඒ

කියන්නේ සජිත් ප්‍රේමදාස මහත්මයාට අගමැතිකම භාර ගන්න කියලා සමගි ජන බලවේගයේ ඉන්න 61දෙනායි කියලා තිබෙන්නේ එතුමා ගෙදර ගිහිල්ලා කාඩ් එකේ ඒවා mark කරලා; එකයි, දෙකයි, තුනයි කියලා mark කරලා. එහෙම කරලාත්, අගමැති වෙන්න කියලා තිබෙන්නේ 61 දෙනායි. ඒක නිසා කියන්න තිබෙන එකම දේ, ෂුවර් එකටම එතුමා සදාකාලික විපක්ෂ නායක කියලායි. ඒ ගැන මට කියන්න තිබෙන්නේ එච්චරයි.

එතුමා අපේ මාර්ග සිතියම ගැන ඇහුවා, කාල සටහන ගැන ඇහුවා, ආර්ථික වර්ධන වේගය ගැන ඇහුවා. අපේ නම්, "ආර්ථික වර්ධන වේගය". එතුමා බලාපොරොත්තු වෙනවා, ශීඝ්‍ර වර්ධන වේගයක්. ඒකෙන් මොකක්ද කියන්නේ? එතුමා පිළිගන්නවා, දැන් ආර්ථික වර්ධන වේගයක් තිබෙනවා කියලා. හැබැයි, ඒ වර්ධන වේගය එතුමාට මදි. ශීඝ්‍ර වර්ධන වේගයක් ඕනෑ ලු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශීඝ්‍ර ආර්ථික වර්ධන වේගයක් ගන්න තිබුණා, අපේ රට ජපානය වුණා නම්, වියට්නාමය වුණා නම්, දකුණු කොරියාව වුණා නම්. මේගොල්ලෝ මේ රට කම්බස් කරලා, කාබාසිනියා කරලා, විනාශ කරලා, ආර්ථික වර්ධන වේගය සෘණ කරලා, රුපියල අර්බුදයකට යවලා, ණය අර්බුදයක රට හිර කරලා, පොලී අනුපාතය ඉහළ නංවලා, උද්ධමන අනුපාතය ඉහළ නංවලා තිබුණේ. එක් අවස්ථාවක අපේ රටේ ආහාර උද්ධමන අනුපාතය ඉහළ ගිහින් තිබුණා, සියයට 73ක් දක්වා. එහෙම රටක්, මේක. එහෙම රටක් මේ උස්සලා ගන්නේ. ඒක එකවර කරන්න බැහැ. සදාකාලික විපක්ෂ නායකතුමා සතුටු වුණේ නැති වුණාට මේ රටේ ජනතාව දන්නවා, රට ආර්ථික වශයෙන් හරි පීල්ලට ඇවිල්ලා තිබෙන බව. රට සමාජමය වශයෙන් හරි පීල්ලට ඇවිල්ලා තිබෙනවා, සංස්කෘතිකමය වශයෙන් හොඳ ගමනක් යන්න පටන් අරගෙන තිබෙනවා, නීතියේ ආධිපත්‍යය පිළිවෙළට පිහිටලා තිබෙනවා, වංචා හා දූෂණවලට විරුද්ධව කටයුතු කරනවා, රට දැන් හරි ගමනක් යනවා කියලා ජනතාව දන්නවා. ඒ ගැන අපි සතුටු වෙන්න ඕනෑ. රටේ ජනතාව ඒ ගැන සතුටු වෙයි. නමුත්, රට හරි ගමනක් යනකොට සජිත් ප්‍රේමදාස, අපේ සදාකාලික විපක්ෂ නායකතුමා බය වෙන එක අහන්න දෙයක් නැහැ.

දැන් එතුමා කාරණා පහක් කිව්වා නේ. ඒවායෙන් එක කාරණාවකට මම දැන් උත්තර දෙනවා. අපනයන කේන්ද්‍රීය කර්මාන්ත පටන්ගන්න ඕනෑ කිව්වා. දේශීය කර්මාන්ත පටන්ගන්න ඕනෑ කිව්වා. අන්න, එතුමාගේ මාර්ග සිතියම. එවැනි කර්මාන්ත පටන්ගන්න ඕනෑ කියන එක නම් අපි කවුරුත් පිළිගන්නවා නේ. මම බලාගෙන හිටියා, ඒවා පටන්ගන්න මොකක්ද කරන්න ඕනෑ කියා එතුමා කියයි කියලා. අපනයන කේන්ද්‍රීය කර්මාන්ත පටන්ගන්න ඕනෑ ලු; කර්මාන්ත පටන්ගන්න ඕනෑ ලු. හරි ඉතින්, ඒවා පටන්ගන්න විධිය ගැන එක යෝජනාවක්වත් කියන්න එපායැ, මෙන්න පියවර එක, දෙක, තුන කියලා. එහෙම එකක් නැහැ එතුමාට. සජිත් ප්‍රේමදාස මහත්මයාගේ වැඩ පිළිවෙළ මොකක්ද? කර්මාන්තශාලා පටන්ගන්න ඕනෑ කියන එකයි. ඉතින්, ඒවා පටන්ගන්න ඕනෑ නැහැ කියලා කවුරුවත් කියන්නේ නැහැ නේ. අපි කියනවාද, කර්මාන්තශාලා පටන්ගන්න ඕනෑ නැහැ කියලා? ඒගොල්ලෝ එහෙම කියනවාද? නැහැ. කර්මාන්තශාලා පටන්ගන්න ඕනෑ. හැබැයි අපි කියන්නම්, පටන්ගන්නා විධිය.

අපේ කර්මාන්ත සංවර්ධන අංශයෙන් අපේ කර්මාන්ත අමාත්‍යාංශය විතරක් වාලච්චේන කර්මාන්තපුරයේ අක්කර 50ක් අපි වෙන් කරනවා, සම් හා සම් ආශ්‍රිත කර්මාන්ත නිෂ්පාදනයට. එය මිශ්‍ර කර්මාන්තයක්. බලාපොරොත්තු වන ආයෝජනය මිලියන 900යි. ඒ, දැනට යෝජිත ආයෝජනය. දැනට එය මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙනවා; පාරිසරික ඇගැයීම් කරලා තිබෙනවා. 2025දී එය අවසන් කරන්න නියමිතයි.

ඉංගිරිය කර්මාන්තපුරය අක්කර 350යි. රථ වාහන කොටස් නිෂ්පාදන කර්මාන්ත, රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත, ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ඇතුළු මිශ්‍ර කර්මාන්ත අපි එහි ආරම්භ කරනවා. ආයෝජනය මිලියන 3,000යි. මේ දක්වා වියදම මිලියන 2.138යි. එහි වට මැනුම් අවසන් කරලා තිබෙනවා, මොරටුව විශ්වවිද්‍යාලයට ශක්‍යතා අධ්‍යයනය භාර දීලා තිබෙනවා, යටිතල පහසුකම් ඉංජිනේරු සේවා සමාගමට භාර දීලා තිබෙනවා. එය 2027දී අවසන් කිරීමට නියමිතයි.

කටුනායක කර්මාන්තපුරය අක්කර 100යි. රථ වාහන එකලස් කිරීම් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ආරම්භ කරනවා. යෝජිත ආයෝජනය රුපියල් මිලියන 1,500යි.

දැනට වියදම මිලියන 7.276යි. වට මැනුම අවසන් කරලා තිබෙනවා. එය 2026දී අවසන් කරන්න නියමිතයි. එහි ඉදිකිරීම් ගොඩනැඟිලි සංස්ථාවට, ශක්‍යතා අධ්‍යයන වාර්තාව හදන්න කාර්මික තාක්ෂණ ආයතනයට භාර දීලා තිබෙනවා.

හතරවැනි එක, දඹුල්ල කර්මාන්තපුරය. අක්කර 64යි. ආහාර සැකසුම් නිෂ්පාදන කර්මාන්ත සඳහා යෝජිත ආයෝජනය මිලියන 1,200යි. අපි දැනට වියදම් කරලා තිබෙනවා, මිලියන 46.327ක්. වට මැනුම් හා වැට ඉදි කිරීම අවසන්. කාර්මික තාක්ෂණ ආයතනයට - ITI - පාරිසරික ඇගයීම් වාර්තාව ලබා ගැනීමට ඉදිරිපත් කර තිබෙනවා. අපි ඒ කර්මාන්තපුරයේ වැඩ 2025දී අවසන් කරනවා.

සඳමල්ගම, රඹෑව කර්මාන්තපුරය අක්කර 16යි. මිශ්‍ර ආයෝජනයක් තිබෙන්නේ. යෝජිත ආයෝජනය මිලියන 70යි. දැනට වට මැනුම අවසානයි; ඉදිකිරීම් අවසානයි; ඉඩම සකස් කරලා අවසානයි; ජල සැපයුම දීලා තිබෙනවා; විදුලිබල සැපයුම්, ප්‍රවේශ මාර්ගවලට ඇස්තමේන්තු කැඳවා තිබෙනවා. 2026දී එය අවසන් කරනවා.

දිවුලපිටියේ, අළුතැපොළ කර්මාන්තපුරය අක්කර 7.899යි. ඒක මිශ්‍ර ආයෝජනයක්. ආයෝජනය මිලියන 150යි. අපි දැනට විදුලි සැපයුම ලබා දීලා තිබෙනවා. අභ්‍යන්තර මාර්ග පද්ධතිය සකස් කරලා තිබෙනවා. සියලු කටයුතු අවසන් කරමින් තිබෙනවා. ඉදිරි මාස දෙකේදී නව කර්මාන්තපුරයේ වැඩ ආරම්භ කරනවා.

සූරියවැය කර්මාන්තපුරය අක්කර 20යි. ඒක මිශ්‍ර ආයෝජනයක්. මිලියන 340යි, ආයෝජන බලාපොරොත්තුව. ප්‍රවේශ මාර්ග ඉදිකර අවසන්. ජලය, විදුලිය පහසුකම් දීලා තිබෙනවා. අභ්‍යන්තර මාර්ග පද්ධතියේ වැඩ අවසන්. ඉදිරි මාස දෙකේදී එය ආරම්භ කරනවා.

රයිගම් කර්මාන්තපුරය අක්කර 24යි. ආයෝජනය මිලියන 1,353යි. මේ දක්වා මිලියන 929ක් වියදම් කරලා තිබෙනවා. ඉඩම් කට්ටි කිරීම්, ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, ජලය, විදුලිය සැපයීම අවසන් කරලා තිබෙනවා. ඉදිරි මාස දෙකේදී අපි එහි වැඩ ආරම්භ කරනවා.

සදාකාලික විපක්ෂ නායකතුමනි, අන්න එහෙමයි කියන්න තිබුණේ. යෝජනා මෙන්න, තැන මෙන්න, මෙන්න මේක කරන්න කියලායි කියන්න ඕනෑ. දිවයින පුරා ක්‍රියාත්මක කර්මාන්තපුර 19ක් සඳහා අලුතින් ආයෝජනය කරනවා. ඒකට කර්මාන්ත ව්‍යාපෘති 38ක්, ඉඩම් අක්කර 24යි, රූඩ් 1යි, පර්චස් 12.04ක් වෙන් කර දීලා අමාත්‍ය මණ්ඩල අනුමැතිය දීලා තිබෙනවා. ඒ කර්මාන්තවල මිලියන 2,548ක පෞද්ගලික ආයෝජනයක් අපි බලාපොරොත්තු වෙනවා. අපේක්ෂිත රැකියා

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

උත්පාදනය 1,159යි. මෙන්න වැඩ! මේ, කර්මාන්තපුරවල ඒවා විතරයි. ඉතින් කොහොමද විපක්ෂ නායකතුමා කියන්නේ, රස්සා නැති වුණා කියලා? රැකියා නැති වෙලා ලු. ඒක හරියට "දොස්තර හොඳ හිත" කාටූන් එකේ "වච් වච්" කියනවා වාගේ කථාවක්. රැකියා නැති වෙලා ලු, පාරට වැටිලා ලු, බිත්තුවට බැහැලා ලු. නව කර්මාන්තපුර ආරම්භ කරන්න අපි සාකච්ඡා කරනවා. අදත් දිස්ත්‍රික්ක 25ම දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ සාකච්ඡාවක් තිබුණා. අපි දිස්ත්‍රික් ලේකම්වරුන්ට ඉලක්කයක් දීලා තිබෙනවා, වගා කරන්නේ නැති, සංචාරක කර්මාන්තයට යොදවා ගන්නේ නැති, ජනතාවගේ විනෝදාස්වාදයට යොදා ගන්නේ නැති - parks වාගේ දේවල් හදන්නේ නැති - කර්මාන්තවලට සුදුසු ඉඩම් පිළිබඳ database එකක් හදලා අපට දෙන්න කියලා. අපේ රටේ කර්මාන්ත සඳහා යොදා ගන්න සුදුසු ඉඩම් සියල්ල අපි කර්මාන්තකරණයට යොදවා ගන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු ජනාධිපතිතුමා ඒ වෙනුවෙන් අපට සැලැස්මක් දීලා තිබෙනවා; ඉලක්කයක් දීලා තිබෙනවා. ඒ තමයි ඩිජිටල්කරණය. රාජ්‍ය සේවය ඩිජිටල්කරණය කරනවා වාගේම විශේෂයෙන් අලුත් කර්මාන්ත - start-ups - ආරම්භ කරන අයට ඩිජිටල්කරණය යටතේ අපි පහසුකම් සපයා දෙනවා. එතුමා එතුමාගේ කථාවේදී ඉතා පැහැදිලිව කිව්වා වාගේ අපි කරන්නේ, පහසුකම් සපයා දීම, facilitation. අපි ඒක හරියට කරනවා. අපි පහසුකම් - ජල පහසුකම්, විදුලිය පහසුකම්, මාර්ග පද්ධතිය, ඉඩම් කට්ටි කිරීම ආදිය - සපයා දෙනවා. අපේ ලැයිස්තු නැහැ. ඒ එකකවත් අපේ ලැයිස්තු නැහැ. සමහර ඒවා තිබෙනවා, විපක්ෂයේ අයගේ නාම යෝජනා තමයි ඇවිල්ලා තිබෙන්නේ. මිල්ලනියේ කර්මාන්තපුරය උදාහරණයක්. ඒකට ප්‍රශ්නයක් නැහැ. ඒගොල්ලන්ට කර්මාන්ත ආරම්භ කිරීමේ හැකියාව තිබෙනවා නම්, ඒවා ආරම්භ කරන්න අපි අවස්ථාව දෙනවා.

මම ඊයේ පරිසර ඇමතිතුමාත් එක්ක GSMB එක, මධ්‍යම පරිසර අධිකාරිය, BoI එක, සංචාරක මණ්ඩලය, ඉඩම් කොමසාරිස් ජනරාල් ද ඇතුළුව අනෙකුත් ආයතන ඔක්කොම පාර්ලිමේන්තුවට කැඳෙව්වා. ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේ රැස්වීම ඉවර වෙලා හවස 5.30ට විතර ගියා. අපි ගියේ රාත්‍රි 8.30ට විතර. අපි සාකච්ඡා කළේ මොනවාද? ලංකාවේම තිබෙන mineralsවල, ඛනිජ වැලිවල තත්ත්වය ගැන. ලංකා සිතියම අරගෙන බැලුවාම, මුළු ලංකා සිතියමේම ඇඟිල්ලක් ගහන්න ඉඩක් නැහැ; හැම තැනම බෙදලා දීලා ඉවරයි. මොකටද? ඛනිජ සම්පත් ගවේෂණයට. ඒ සඳහා බලපත්‍ර දීලා. පොඩි තීරු දෙකතුනක්, පොඩි තැන් දෙකතුනක් විතරක් තිබුණා හිස් ඉඩම් විධියට, අම්පාර පැත්තේ, ලාහුගල පැත්තේ, මුහුද අයිනට කිට්ටු වෙන පැත්තේ. මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂතුමාගෙන් මම ඇහුවා, "මේ හිස් ඉඩ තිබෙන්නේ කොහේද" කියලා. ඒ හිස් ඉඩ තිබෙන්නේ මොකද දන්නවාද? ඒවා වන සංරක්ෂිත කලාප. ඒ කලාප නොවුණා නම් ඒවාත් අල්ලනවා. ඔක්කොටම ගවේෂණ බලපත්‍ර දීලා. හැබැයි, මේ අවුරුදු හතටම අපේ ඛනිජ සම්පත්වලින් ඇවිත් තිබෙන්නේ, ඩොලර් මිලියන 60යි. ඇයි හේතුව? ගවේෂණ බලපත්‍ර අරගන්න කට්ටිය ඒක තමයි බිස්නස් කරන්නේ. ඒ කොළේ ගෙනිහිල්ලා හැමෝටම බෙදා දෙනවා. එක්කෙනෙක් ළඟ එකක් තිබෙනවා ටික දවසක්. එයාගේ කොම්පැනිය කොටස් වෙළෙඳ පොළේ නග්ගා ගන්නවා. ඊළඟ කෙනා ගන්නවා, එයාගේ කොටස් වෙළෙඳ පොළ මිල නග්ග ගන්නවා. එයා අනෙක් කෙනාට දෙනවා. අවසානයේ ඒ බලපත්‍ර තිබෙනවා. අපි සොයලා බලනකොට දැනට ලංකාවේ කොම්පැනි 58ක් තිබෙනවා, ගවේෂණ බලපත්‍ර ගත්ත. කල්පනා කරලා බලන්න. ඒවායින් මොකුත් කරලා නැහැ. ඒ නිසා ලබන අගෝස්තු 20 වෙනකොට අපට වාර්තාවක් දෙන්න කියලා තිබෙනවා. මොකද, මේවා ශුද්ධ කරන්න ඕනෑ. වැඩ කරන්නේ නැති, ඒ බලපත්‍රවලින් වැඩක් ගන්නේ නැති ඔක්කෝම අවලංගු කරන්න ඕනෑ, අවලංගු කරන්න කැබිනට් මණ්ඩලයෙන් තීරණයක් ගන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි ගරු මන්ත්‍රීතුමා. අපි guideline එකක් ගැසට් කරනවා, ඛනිජ වැලිවලට අයෝජකයෙක් එනවා නම්, පටන් ගන්න ඕනෑ කොතැනින්ද සහ ඉවර කරන්න ඕනෑ කොතැනින්ද කියලා. සමහරු මධ්‍යම පරිසර අධිකාරියෙන් ලයිසන් එක අරගෙන අපි ළඟට ඇවිල්ලා කියනවා මෙන්න මධ්‍යම පරිසර අධිකාරියේ ලයිසන් එක තිබෙන නිසා අපට දෙන්න කියලා. තව කෙනෙක් කොම්පැනියෙන් ලයිසන් එක අරගෙන එනවා. තව කෙනෙක් GSMB එකෙන් අරගෙන එනවා. අවසානයේ lawyersලා තමයි පෝසත් වෙන්නේ. ඇයි? ඒ එකිනෙකා නඩු කියා ගන්නවා. අපේ රටේ ඛනිජ වැලිවලට තිබෙන්නේ නඩු විතරයි. අරුවක්කාරුවල,- *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඇමතිතුමා, ඒකට value addition එකක් දාන්න ඕනෑ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

අනිවාර්යයෙන් අපි ඒක කරනවා. Value additionවලට definition එක තවම නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, ඒක මම කරනවා.

අපේ සදාකාලික විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහත්මයා කර්මාන්ත ගැන කිව්වා නේ. සිමෙන්ති සංස්ථාවේ අවුරුදු 26ක නඩුවක් තිබෙනවා. ඒ මොකටද දන්නවාද? හර්ෂ මැතිතුමනි, මේක අහගන්න සදාකාලික විපක්ෂ නායකගේ අප්පොච්චි කළ වැඩක් නිසා. මුලින්ම අරුවක්කාරුවල සිමෙන්ති සංස්ථාව හොල්සිම් එකට දීලා තිබෙනවා. සිමෙන්ති සංස්ථාව පැවරුවා හොල්සිම් එකට. ඒ පවරපු ගනුදෙනුවේදී සංස්ථා නමත් එක්කම දුන්නා. ඉන් පස්සේ "ඉන්සි" කියන ආයතනයක් ඒක කරගෙන යනවා. ඊට පස්සේ ඒ ඉඩමම PIL කියන තව කොම්පැනියකට දුන්නා. PIL එක ගවේෂණ කරගෙන යනකොට ඒක එහෙමම තිබියදී චාමර සම්පත් ඒ ඉඩම ම දුන්නා Asha Minerals (Pvt.) Limited එකට. දැන් එකම ඉඩමට දෙන්නයි. දැන් නඩු. ඒවාට කැබිනට් අනුමැතියක් නැහැ, unsolicited. ඔක්කෝම අවසාන වෙන්නේ කොහොමද දන්නවාද? සිමෙන්ති සංස්ථාවට විරුද්ධව එක්කෙනෙක් නඩු කියනවා, GSMB එකට විරුද්ධව තව එක්කෙනෙක් නඩු කියනවා. එහෙට මෙහෙට නඩු. අවසානයේ පොහොසත් වෙලා තිබෙන්නේ lawyersලා. ඒ කර්මාන්ත නැහැ අවුරුදු 26ක්. දැන් මම මැදිහත් වෙලා තිබෙනවා ඒක විසඳන්න. අපි ක්‍රියාමාර්ග ගන්නවා අනිවාර්යයෙන්ම.

මේක ඛනිජ සම්පත්වලින් දියුණු කරන්න පුළුවන් රටක්. රට වටේම ඛනිජ සම්පත් තිබෙනවා, ඉල්මනයිට්, රුටයිල්, සර්කෝන් ඔක්කෝම තිබෙනවා. මොනොසයිට්, titanium flakes හදන්න පුළුවන්. මේ ඔක්කෝම තිබෙනවා. නමුත් වැඩක් නැහැ. අවුරුදු 26කට පස්සේ අපි පසුගිය කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා. එප්පාවල පොස්පේට් එකට අවුරුදු 20 ගාණක් තිස්සේ නඩුවක් තිබුණා, බුවනෙක නඩුව කියලා. අපි ඒක අවසන් කළා. ඒක අවසන් කරලා ඒ ඇගැයීම් වාර්තා ගැසට් කරලා දැන් අපි කැබිනට් මණ්ඩලයේ අවසර ගත්තා. ලබන සතියේ අපි EoIs call කරනවා, එප්පාවල single superphosphate හදන්න. අපි ඒක පටන් ගන්නවා. අපි එප්පාවල single superphosphate හදනවා. ඒ වාගේම කහටගහ ග්‍රැෆයිට්වලට අපි value additionවලට යනවා. ඒ value addition කරන්න අපි දැන් EoIs call කරලා තිබෙනවා.

සෙවනගල පැල්වත්තේ සංචාරක විභවතාවක් තිබෙනවා. අපි හෙක්ටෙයාර 500ක් වෙන් කරලා තිබෙනවා සංචාරක කර්මාන්තයට. මොකද එතැන සැඟෙන වැදගත් තැනක් සංචාරක කර්මාන්තය දියුණු කරන්න. අපි එතැනට EoIs call කරනවා, 11වෙනි දා කැබිනට් මණ්ඩලයට ඒ යෝජනා ගේනවා. අන්න වැඩ! සදාකාලික විපක්ෂ නායකතුමා "ඤැක්, ඤැක්" ගානවා, "බැහ්, බැහ්" ගානවා. භය වෙන්න එපා. මේ ඔක්කෝම කරනකොට අපි සාමූහික කණ්ඩායමක් හැටියට වැඩ කරන්නේ. ඒක මතක තියා ගන්න. කණ්ඩායමක සාමූහික වැඩක් මේක. ආවාට ගියාට නොවෙයි, සැලැස්මක් ඇතුව වැඩ කරන්නේ. ඔබතුමන්ලා බලාපොරොත්තු වෙන ශීඝ්‍ර වර්ධන වේගය අවුරුදු 76කට ඔබතුමන්ලාට ගේන්න බැරි වුණා. මොකද, ආණ්ඩු මාරු වුණාට ප්‍රතිපත්ති මාරු වුණේ නැහැ. හොරකම, නාස්තිය, දූෂණය, වංචාව තමයි ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති වුණේ. ඒවා වෙනස් කළේ නැහැ. අද ඒවා නැහැ. අද ඒවායින් එක ප්‍රතිපත්තියක් අපේ ළඟ නැහැ. අද ජනාධිපතිතුමා කථා කරන වෙලාවේ ඔබතුමන්ලාට තිබුණා චෝදනාවක් තිබෙනවා නම් නැඟිටලා කියන්න. එහෙම චෝදනා නැහැ. අපි එක සැලැස්මකට වැඩ කරනවා. අන්තර් අමාත්‍ය අපනයන සංවර්ධන සභාව - EDCM එක - ජනාධිපතිතුමා පිහිටෙව්වා. ඒක පිහිටුවීමේ පළමුවෙනි ප්‍රතිඵලය තමයි, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය Airport එකේ VAT refund centre එක පටන් ගැනීම. අද සංචාරකයෙක් ආවාම, සංචාරකයා වෙළෙඳ පොළෙන් භාණ්ඩ මිලදී ගන්නකොට, එයා දන්නවා Airport එකට යනකොට එයාට VAT එක return වෙනවා කියලා. ඒ වාගේම ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය බිමල් රත්නායක මැතිතුමා Airport එකේදීම ලයිසන් එක දෙන්න පටන් ගත්තා; තාවකාලික බලපත්‍රයක්. වෙන දා සංචාරකයෙක් ලංකාවට ආවාම එයා දවස් දෙකක් වේරහැර පගාව දීගෙන රස්තියාදු වෙන්න ඕනෑ. දැන් ඒ රස්තියාදු නැහැ, Airport එකෙන්ම තාවකාලික ලයිසන් එක අරගෙන එන්න පුළුවන්. අර සදාකාලික විපක්ෂ නායකට මේ මොකුත් පේන්නේ නැහැ.

ඊළඟට මම කියන්න ඕනෑ ව්‍යවසායකත්වය ගැන. එතුමා කිව්වා නේ ව්‍යවසායක වැඩසටහන් නැහැ, ව්‍යවසායක සැලැස්මක් නැහැ කියලා. තනි පිටුවක තිබෙන අපේ මේ උපාය මාර්ගික සැලැස්ම - Strategic Plan එක - මම සභාගත කරන්නම්. මේ Strategic Plan එකට අනුව අපි පාසල් 10,000ක ළමයි මිලියන 5ක්, පවුල් මිලියන 6ක්, විශ්වවිද්‍යාල 17ක සිසුන් 40,000ක් වාගේම ව්‍යවසායකයන් සංවර්ධනය කරන්නත් "Entrepreneurial Mindset and Education Programme" එකක් හදනවා. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක අපි සාකච්ඡා කර තිබෙනවා. අපි දැනටමත් පාසල්වල ව්‍යවසායක සමාජ හදලා තිබෙනවා. මට කියන්න ආඩම්බරයි, පසුගිය දවසක ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ - RDB - 40 වෙනි සංවත්සරය තිබුණා, BMICH එකේ. අපි හදපු ව්‍යවසායකත්ව කවවලින් - Circlesවලින් - ආනන්ද විද්‍යාලයේ, නාලන්ද විද්‍යාලයේ, තර්ස්ටන් විද්‍යාලයේ, දේවි බාලිකා විද්‍යාලයේ ළමයි ඇවිල්ලා ව්‍යාපාරික stalls පවත්වා ගෙන ගියා. ඒගොල්ලන් exhibition stalls පැවැත්වූවා. දේවි බාලිකා පාසලේ දූවරු ඇවිල්ලා කේක් හදලා exhibit කළා. අන්න වැඩ! ගිහිල්ලා බලන්න, අද BMICH එකේ තිබෙනවා, චීනය, ඉන්දියාව, තායිලන්තය, මලයාසියාව, ඉන්දුනීසියාව ඇවිල්ලා කරන ජාත්‍යන්තර මට්ටමේ අපනයන exhibition එකක්. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය - JAAF එක - එකතු වෙලා ඒ කටයුත්ත කරන්නේ. මේක එක හැඟීමක්. මේක, හදන්න ඕනෑ එක හැඟීමක්. ඒ වාගේම අද අපි විශ්වවිද්‍යාල තුළ සමාජ ව්‍යවසායකත්වය ආරම්භ කර තිබෙනවා, ව්‍යවසායකත්ව කව ආරම්භ කර තිබෙනවා. අපි ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඉලක්කයක් දීලා තිබෙනවා, හැම ගමකම ඉන්න අපනයන සංවර්ධන නිලධාරින් සම්පත්දායකයන් - resource persons - බවට පත් කරන්න කියලා. ඒ අය DOsලා නොවෙයි. DOsලා තමයි, ඊකියාවෙන්. හැබැයි ඒගොල්ලන් දැන් resource personsලා බවට පත් වෙනවා. ඒ හැමකෙනෙකුම ආයෝජකයන්ට, අලුතින් ව්‍යාපාර ආරම්භ කරන අයට උපදෙස් දෙන, ණය දෙන, පහසුකම් දෙන අය බවට පත් වෙනවා. අපි හැම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම කර්මාන්ත අංශයක් ආරම්භ කරනවා. මේ රටේ ජනතාවට ගිහිල්ලා ණය පහසුකම් ගන්න පුළුවන් ක්‍රමය හැම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම අපි හදලා තිබෙනවා. ඒකට යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන් ක්‍රමය හදලා තිබෙනවා.

විපක්ෂ නායකතුමා ණය ගැන, පරාටේ නීතිය ගැන කිව්වා නේ. මම මේ මාස හයට බැංකුත් එක්ක සාකච්ඡා කරලා විසඳපු ණය යෝජනා ක්‍රම සියල්ල ඇතුළත් ලේඛන කිහිපයක් සහ උපාය මාර්ගික සැලැස්ම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ, අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ණය යෝජනා ක්‍රම. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ණය යෝජනා ක්‍රමවලින් කොච්චර ණය පහසුකම් ලබා දී තිබෙනවාද කියලා බලන්න. පසුගිය ආර්ථික අර්බුදය නිසා, කොරෝනා තත්ත්වය නිසා හෝ තමන්ගේ වරදකින් තොරව කවුරු හරි අපහසුතාවට පත් වුණා නම් ඒ හැම පුද්ගලයෙක් වෙනුවෙන්ම අපි පෞද්ගලිකව ගිහිල්ලා බැංකුත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. බැංකුත් එක්ක සාකච්ඡා කරලා ඔවුන්ට ලබා දෙන්න පුළුවන් උපරිම සහන, පහසුකම් ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා.

අපේ සදාකාලික විපක්ෂ නායකතුමාගේ යෝජනා මොනවාද? ව්‍යවසායකයන්ට වැඩසටහනක් හදන්න ඕනෑ ලු. හැබැයි, වැඩසටහනක් ගැන නැහැ; ඒ යෝජනා නැහැ. තව යෝජනාවක් තිබුණා, දූප්පත්කම තුරන් කළ යුතුයි කියලා. එතුමාගේ අප්පොච්චිගෙ කාලයේ ඉඳලාම ඒක කළා. හැබැයි දූප්පත්කම තුරන් වුණේ නැහැ. නම විතරයි. නමට කියනවා, දූප්පත්කම තුරන් කරමු කියලා. ඉතින්, මොනවාද කරන්න ඕනෑ? මෙතැනට යෝජනා පහක් කියලා යන්නකෝ, දෙකක් කියලා යන්නකෝ, නිකම් ඒක විතරක් කියලා යන්නේ නැතුව.

ඒ වාගේම කිව්වා, අපනයන වර්ධනය කරන තැනට ගේන්න ඕනෑ ලු. ඉතින් ගේනවා තමයි මේ. ගේන්න තමයි මේ වැඩ කරන්නේ. මේ අවුරුද්දේ අපේ ඉලක්කය බිලියන 18ක්. අපි ඒක අනිවාර්යයෙන්ම සම්පූර්ණ කරනවා. බිලියන 18ක් කියන්නේ, ලංකා ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, මුදල් අමාත්‍යාංශය සහ අපි එකට වැඩ කරලා ඒ ඉලක්කය සම්පූර්ණ කරනවා. ඒ වාගේම free trade agreements හදන්න ඕනෑ ලු. සාපේක්ෂ වාසි ගන්න ඕනෑ ලු. ඔව්, ගන්නවා. ඒකට තමයි Port City එක සංවර්ධනය කරලා තිබෙන්නේ. ඒකට තමයි අපි ගිවිසුම්වලට යන්නේ. අපි ඉන්දියාවත් එක්ක ගිවිසුම්වලට යන්න බලාපොරොත්තු වෙනවා. සිංගප්පූරුව සමඟ ඇති කරගත් ගිවිසුම තවම තිබෙනවා. ඉන්දියාවේ ගිවිසුම අපි පුළුල් කරන්න ඕනෑ. මොකද, අපට ඉන්දියාවෙන් quota එක වශයෙන් හම්බ වෙන්නේ eight million pieces විතරයි. මේස් ඇරියත් ඒක ඉවරයි; eight million pieces විතරයි. ඉන්දියාවේ ආනයනවලින් සියයට 4යි අපට හම්බ වෙන්නේ, ඇඟලුම් quota එක. අපි මෝදි අගමැතිතුමාගෙන් පවා ඉල්ලීම් කළා, ඒක දෙගුණයක් කරන්න කියලා. අපි ඔවුන්ට යෝජනා කරලා තිබෙනවා, ලංකාවට රෙදිපිළි ගෙනැල්ලා ඒගොල්ලන්ගේ නිෂ්පාදන ලංකාව තුළ ආරම්භ කරන්න කියලා. ඒ වෙනුවෙන් අපි

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

වාලච්චේනේ කර්මාන්තපුරයක් හදනවා. ඒගොල්ලන් GSP Plus සහනය ගත්තාට අපට කමක් නැහැ, අපේ අපනයන වර්ධනය වෙනවා. අපි රටවලට ආරාධනා කරලා තිබෙනවා. මොකද, අපි GSP Plus සහනය තිබෙන රටක්. ඒ වාසිය - advantage එක - අපි ගන්න ඕනෑ. ඒක අපි අනිවාර්යයෙන්ම ගන්නවා.

ඒ වාගේම ආර්ථික වර්ධන වේගය වෙනස් කරන්න ඕනෑ ලු. ඒකට SME sector එක දියුණු කරන්න ඕනෑ ලු. ඉතින්, අපි කරනවා. සජිත් ප්‍රේමදාස අපේ සදාකාලික විපක්ෂ නායකතුමා කියන්නකෝ ඒකට යෝජනාවක්, දෙකක්, තුනක් මෙන්න මේ මේ ඒවා කරන්න කියලා. 61දෙනෙක් 61 වතාවක් එතුමාට අගමැතිකම යෝජනා කළා වාගේ තමයි, හැමදාම එකම කථාව. අඩු තරමින් ඉගෙන ගෙන මෙන්න මේක කියලා මොකක් හරි අදහසක්, අලුතින් යෝජනාවක් ඉදිරිපත් කරන්න ඕනෑ. එතුමා හැමදාම කියන්නේ, දුප්පත්කම තුරන් කරන්න, ආර්ථික වර්ධන වේගය වැඩි කරන්න, ව්‍යවසායකත්වය දියුණු කරන්න, අපනයන දියුණු කරන්න කියලායි. ඒවා තමයි මේ කරන්නේ. අපි ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා. සාමූහික කණ්ඩායමක් හැටියට අපේ පළමුවැනි මාස 9 අති සාර්ථක වෙලා තිබෙනවා. මේ අවුරුද්ද අවසාන වෙනකොට ඉතා පැහැදිලි ලෙසම අපි අපේ ඉලක්කවලට යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

I wish to welcome the Members of the Delegation of the Young Political Leaders of South and Southeast Asia now present at the Speaker's Gallery.

Next, the Hon. (Mrs.) Hemali Weerasekara. You have eight minutes.

[අ.භා. 3.49]

**ගරු හේමාලි වීරසේකර මහත්මිය (නියෝජ්‍ය කාරක සභාපතිතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. (Mrs.) Hemali Weerasekara - Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ආර්ථිකය අද තිබෙන්නේ කොතැනද, අපි ගමන් කරමින් සිටින්නේ කොහේටද කියන එක ගැන පැහැදිලි, සත්‍ය වාර්තා සහ සංඛ්‍යා ලේඛනවලින් වාගේම ජනතාව මුහුණ දෙන එදිනෙදා යථාර්ථයන් අනුව කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි බංකොලොත්භාවය නිසා බිඳ වැටුණු ආර්ථිකයක සිට ක්‍රමානුකූලව ස්ථාවර ආර්ථිකයක් කරා රට ගොඩනගාගෙන යනවා. ඒ අනුව රට යථා තත්ත්වයට පත් වෙමින් තිබෙනවා. ඒ, වාසනාව නිසාවත්, අහම්බයක් නිසාවත් නොවෙයි. තීරණාත්මක ප්‍රතිපත්ති මත ගත්ත තීන්දු-තීරණ හා ජනතාවගේ කැපකිරීම්, දරාගැනීම් තුළින් තමයි මේ තත්ත්වයන්ට ළඟාවෙන්න පුළුවන් වුණේ.

අපි ආණ්ඩුව ගන්න කලින් මේ විපක්ෂයේ කණ්ඩායම් කියපු දේවලුත් මම පොඩ්ඩක් මතක් කරගෙන යන්නම්. පෙට්ටි කඩයක්වත් කරලා අත් දැකීම් නැතිව රටක් කරන්නේ කොහොමද කියලා ඇහුවා. අපි ආවොත් ආර්ථිකය වැටෙනවා කියලා කිව්වා. අපිට විදේශ සම්බන්ධතා නැහැ කියලා කිව්වා. අපි ලෝකයේ හුදෙකලා රාජ්‍යයක් බවට පත්වෙනවා කියලා අනාවැකි කිව්වා. නමුත් ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් සියයට 44ක තීරුබදු ගහද්දි අන්න ඒ බද්ද සියයට 30 දක්වාත්, ඉන් පස්සේ සියයට 20 දක්වාත් අඩු කර ගැනීමට අපේ රටේ ජනාධිපතිතුමා ප්‍රමුඛ කණ්ඩායම සමත් වෙලා තිබෙනවා. මේ කරන විවේචන රටේ සංවර්ධනයට දායක වන සාධනීය විවේචන නම් ඒවා පිළිගන්න පුළුවන්. නමුත් අදටත් විපක්ෂය දිගින් දිටගම පාර්ලිමේන්තුව ඇතුළේත්, එතැනින් එළියේත් ආර්ථිකය පිළිබඳ අසත්‍ය කරුණු පතුරුවමින් ඉන්නවා.

2025 පළමුවැනි කාර්තුවේදී දළ දේශීය නිෂ්පාදිතය IMF ඉලක්ක ඉක්මවා යන වර්ධනයකට ළඟා වෙලා තිබෙනවා. ඒ වාගේම, එහි ඉහළම දායකත්වයක් දක්වන්නේ අර පසුගිය කාලය පුරාම කඩා වැටෙනවා කියපු කර්මාන්ත පද්ධතිය. ඒ කර්මාන්ත අද සියයට 9.7ක වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි අපි රට භාර ගන්නකොට ඉස්පිරිතාලයෙන් බෙහෙත් ටික, පැනඩෝල් පෙති දෙක ඔතාගෙන යන්න කොළ කැල්ලත් ගෙදරින් ගේන්න කියපු තත්ත්වයක් තිබුණේ. ඒ වාගේම තමයි සියයට 70, 80 මට්ටමේ තිබුණු උද්ධමනය. සමහර වෙලාවට හවස කඩේට ගිහිල්ලා ගත්ත සබන් කැල්ලේ මිල නොවෙයි, පහුවෙනිදා උදේ කඩේට ගිහිල්ලා සබන් කැල්ල ගන්නකොට තිබුණේ. දරුවාට දෙන කිරිපිටි එකේ අද බලනකොට තිබෙන මිල නොවෙයි හෙට තිබෙන්නේ. අන්න එහෙම තත්ත්වයකට තිබුණු උද්ධමනය මේ වෙනකොට අපි පාලනය කරලා තිබෙනවා. 2025 සෑම මාසයකම රාජ්‍ය ආදායම ඉලක්ක කරන මට්ටම ඉක්මවා ගොස් තිබෙනවා. සාමාන්‍යයෙන් නම් පළමු මාස 6හි රාජ්‍ය ආදායම ඉලක්කයට වඩා අඩුයි. ඊළඟ මාස 6 තුළ තමයි වාර්ෂික ඉලක්කය සපුරාගන්නේ. හැබැයි මේ වසරේ ඒක උඩු යටිකුරු වෙලා තිබෙනවා. සමස්ත බදු ආදායමෙන් සියයට 55ක් මේ මාස 6 තුළ එකතු වෙලා තිබෙනවා. ඒ වාගේම බිම් මට්ටමේ ජනතාව දෙස බැලුවොත්, වෙනදාට පළාත් පාලන ආයතනවලින් වරිපණම් බදු ගෙවන්න, ගෙවන්න කියලා ඔවුන්ට නිවේදන පිට නිවේදන නිකුත් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි ජනතාව මේ වනකොට සමහර පළාත් පාලන ආයතන තුළින් වරිපනම් බදු ගෙවන්න ජංගම සේවා පවත්වන්න, ඒ වාගේම වරිපනම් අංක නැති අයට වරිපනම් බදු ගෙවන්න අංක ලබා දෙන්න කියලා ඉල්ලමින් සිටිනවා.

2025 පළමු භාගයේදී අපනයන ආදායම පසුගිය වසරට සාපේක්ෂව සියයට 7කින් වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ තුළින් අපේ විදේශ වෙළෙඳ පොළ පුළුල් කර ගැනීමට පුළුවන් වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, යුරෝපයට කළ අපනයනය හේතුවෙන් 2024 ජුනි මාසයට වඩා 2025 ජුනි මාසයේ සියයට 23ක වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. බ්‍රිතාන්‍යයෙන් සියයට 20ක වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. 2024 සැප්තැම්බර්වල ඉඳලා මේ වෙනකොට ආයෝජන මණ්ඩලය හරහා ඩොලර් මිලියන 1,100ක ආයෝජන යටතේ නව ව්‍යාපෘති රැසක් ඇවිල්ලා තිබෙනවා. 2025 විතරක් ගත්තොත්, ඩොලර් මිලියන 500ක විදේශ ආයෝජන ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම බ්ලූම්බර්ග් ආයතනය කියනවා, මේ යන විධියට ගියොත් 2018, ඒ කියන්නේ කොවිඩ්-19 ව්‍යසනයට පෙර පැවැති තත්ත්වයට 2026 වෙද්දි අපේ ආර්ථිකය ගෙන යන්න පුළුවන් කියලා. අපේ රටේ විපක්ෂය මේක සාධනීයව දකින්නේ නැති වුණාට, ජාත්‍යන්තරය අපි අත්පත් කරගනිමින් සිටින ස්ථාවරත්වය අගය කරමින් පවතිනවා.

එපමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විදෙස්ගත ප්‍රජාව තුළ ආණ්ඩුව කෙරෙහි තිබෙන විශ්වාසය වර්ධනයවෙලා තිබෙනවා. එම නිසා විදේශ ප්‍රේෂණ බිලියන 3.7 දක්වා වැඩිවෙලා තිබෙනවා. මේ දර්ශක නිකම්ම නිකම් ඉලක්කම් නොවෙයි. ආර්ථික ස්ථාවරත්වය, ඒ වාගේම අපේ රටේ අනාගතය පිළිබඳ විශ්වාසය ගොඩ නැඟීම මේ හරහා පෙන්නුම් කරනවා. දේශීය ව්‍යවසායකයන් නැවත ආයෝජනය කරමින් ඉන්නවා. දූෂණය, අස්ථාවර ආර්ථිකය නිසා අපෙන් ඈත් වෙමින් තිබුණු විදෙස් ආයෝජකයන් නව උනන්දුවකින් ප්‍රතිචාර දක්වනවා. ඔවුන් දන්නවා, තවදුරටත් එකිනෙකාට 10 per cent, 20 per cent වාගේ කොමිස් දෙන්න ඕනෑ නැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Mrs.) Hemali Weerasekara, you have only two more minutes.

**ගරු හේමාලි වීරසේකර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர)
(The Hon. (Mrs.) Hemali Weerasekara)

මෙවැනි තත්ත්වයකදී දේශපාලන වෙනස්කම් නොසලකා හැරලා මේ වාගේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යන්න විපක්ෂය සහයෝගය දෙන එකයි කළ යුත්තේ කියලා මම විශ්වාස කරනවා. රාජ්‍ය අංශයේ අවම මූලික වැටුප රුපියල් 24,250 ඉඳන් රුපියල් 40,000 දක්වා වැඩි කරලා තිබෙනවා. පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප රුපියල් 30,000 දක්වා ඉහළ නැංවීමේ පනතට පසුගිය මාසයේ අපේ කථානායකතුමා විසින් අත්සන් කරනු ලැබුවා. රාජ්‍ය සේවකයාගේ හා පෞද්ගලික අංශයේ සේවකයාගේ අතේ මුදල් ගැවසෙනවා කියලා කියන්නේ එදිනෙදා වැඩ කරන ශ්‍රමිකයාගේත්, ව්‍යාපාරිකයාගේත් අත මිට සරු වෙනවා කියන එකයි.

ඒ වාගේම සවිබල ගැන්වීමට අවශ්‍ය ඉලක්කගත ප්‍රජාවන් වෙනුවෙන් ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක වෙනවා. "අස්වැසුම" ප්‍රතිලාභීන්ට එම ආධාර මුදල වැඩි කරලා දීලා තිබෙනවා. ඒ වාගේම ආයතනගත රැකවරණයේ සිටින දරුවන්ගේ සුභසාධනය සඳහා මාසිකව රුපියල් 5,000ක් ලබා දෙන "අර්ථ" වැඩ සටහන පසුගිය මාසයේ අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වුණා. පසුගිය කාලයේ මේ වාගේ වැඩ සටහන් ඡන්ද ගුණ්ඩු විධියට පාවිච්චි කළා. හැබැයි, අපි "ප්‍රජා ශක්ති" වාගේ වැඩ සටහන්වලින් සුභසාධනය ලබන ප්‍රජාවන් ඒ තත්ත්වයෙන් එළියට ගැනීමේ උත්සාහයක නිරත වෙනවා.

මේ කිසිවක් හුදකලා උත්සාහයන් නොවෙයි. සියල්ල අන්තර්ගත වූ, ඒ වාගේම සියලුදෙනා ප්‍රතිලාභ ලබන ආර්ථිකයක් නිර්මාණය කිරීමයි ආණ්ඩුවේ අධිෂ්ඨානය. තවමත් අපි ඉදිරියේ විශාල අභියෝගයක් තිබෙනවා. නමුත්, මේ කෙටි කාලය තුළ අපි රටක් විධියට ඊට නොබියව, ශක්තිමත්ව මුහුණ දෙමින් සිටිනවා. දේශීයවත්, ජාත්‍යන්තරවත් විශ්වාසය නැවත ගොඩ නැඟෙමින් තිබෙනවා. මේ ආණ්ඩුව තවත් අවුරුදු 5කට ආපු සාමාන්‍ය ආණ්ඩුවක් නොවෙයි. මේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ජනතාවාදී ආණ්ඩුවක් විධියට ජනතා අභිලාෂයන් ඉටු කරමින් ජනතා සහභාගීත්වයත් සමඟ එක මිටට "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන වැඩ පිළිවෙළ ඔස්සේ මේ රට ඉදිරියට ගෙන යමින් සිටිනවා. ඒ නිසා මම විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමන්ලා ඇත්තටම ජනතාව ගැන සැලකිලිමත් නම්, අපේ රටේ ජනතාවට ආදරෙයි නම්, මේ සිදුවෙමින් පවතින ආර්ථික පරිවර්තනය පිළි ගෙන එය ශක්තිමත් කිරීමට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියලා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. D.V. Chanaka. You have seven minutes.

[අ.භා. 3.58]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සතුටු වෙනවා, මේ මොහොතේ ගරු සභාවේ අග්‍රාමාත්‍යතුමිය හෝ අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමා හිටියා නම්. මොකද, අගමැතිතුමිය දවස් 2කදී දීපු උත්තර පිළිබඳව අද වසන්ත සමරසිංහ ඇමතිතුමා දීර්ඝ පැහැදිලි කිරීමක් කළා. මට තිබෙන පළමුවන ප්‍රශ්නය මේකයි. එතුමා මාව quote කළේ, මම රොකට් එක ගැන කථා කළා කියලා. නැහැ, මම ඒ ගැන කථා කළේ නැහැ. මම රටේ දෙවැනි පුරවැසියා වන අග්‍රාමාත්‍යතුමියගෙන් ඇහුවා, මේ සුප්‍රීම් සැට් එකට රජයේ මුදල් යොදවා තිබෙනවාද, මේකෙන් යම් කිසි ලාභයක් රටට ඇවිල්ලා තිබෙනවාද කියලා. හරි සරල ප්‍රශ්න දෙකක් මම ඇහුවේ. එකක්, ලංකාවේ මුදල් යොදවා තිබෙනවාද කියන එක. අනෙක, මේකෙන් ලංකාවට ප්‍රතිලාභයක් ඇවිල්ලා තිබෙනවාද කියන එක. ඒ, හරිම සරල ප්‍රශ්න දෙකක්. එතුමිය ඒකට පිළිතුරු ලබා දුන්නා, ලංකාවේ එක රුපියලක්වත් වැය වෙලා නැහැ කියලා. වසන්ත සමරසිංහ ඇමතිතුමාත් සඳහන් කළා, එක රුපියලක්වත් වැය වෙලා නැහැ කියලා. චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ අවස්ථාවේ එහා පැත්තේ වාඩිවෙලා හිටියා. අග්‍රාමාත්‍යතුමිය ඊට අදාළ පිළිතුර ලබා දෙන අවස්ථාවේ කිව්වා, අවුරුද්දකට රුපියල් මිලියන 80,000ක ආදායමක් ලැබී තිබෙනවා කියලා. වසන්ත සමරසිංහ ඇමතිතුමා කිව්වා, "නැහැ. මිලියන 80,000ක් නොවෙයි ලැබී තිබෙන්නේ. රුපියල් මිලියන 300ක -ලක්ෂ 3,000ක- ආදායමක් ලැබී තිබෙනවා" කියලා. මේක ඔබතුමන්ලා බේරා ගන්න ඕනෑ ප්‍රශ්නයක්. මේ හරහා රටට ලැබුණේ රුපියල් මිලියන 80,000ක්ද, 300ක්ද කියන එක ඔබතුමන්ලා බේරා ගන්න. මම අහපු ප්‍රශ්නය තමයි, මෙහිදී රජයේ මුදල් නාස්ති වුණාද කියන එක. මොකද, අරගළය කාලයේ 100,000,000,000ක් ලෙස සඳහන් කරපු බෝඩ් අල්ලාගෙන හිටියේ, රොකට් යවන්න විවී මෙච්චර ගණනක් වියදම් කළාය කියලායි. නමුත් අද මේ දෙදෙනාම කියනවා, එක රුපියලක්වත් වැය කරලා නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හිටපු ආණ්ඩු පැවති කාලයේ නම්, - මම දන්නේ නැහැ, දැන් system වෙනස් වෙලාද කියලා -අග්‍රාමාත්‍යතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවාම ඉස්සෙල්ලාම එම ප්‍රශ්නය යොමු කරන්නේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ලේකම්තුමාට. ලේකම්තුමා අදාළ අමාත්‍යාංශයේ ලේකම්තුමාට එය යවනවා. මේ ප්‍රශ්නය අනුව නම්, මේක යොමු කළේ මුදල් අමාත්‍යාංශයට. එතකොට මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා මේක අදාළ ආයතනයට යවනවා. එතකොට ඒ අදාළ ආයතනයෙන් දෙන උත්තරය මුදල් අමාත්‍යාංශයේ Additional Secretary කෙනෙක් හෝ Secretary හෝ හොයා බලා, අධ්‍යයනය කරලා, screen කරලා තමයි අග්‍රාමාත්‍ය කාර්යාලයට එවන්නේ. ඊට පසුව අග්‍රාමාත්‍ය කාර්යාලයේ Additional Secretary කෙනෙක් හෝ Secretary හෝ Director කෙනෙක් හෝ එය අධ්‍යයනය කරලා තමයි අග්‍රාමාත්‍යතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට එය ලබා දෙන්නේ. ඊට පසුව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ එතුමියගේ පෞද්ගලික ලේකම් ඒක check කළාට පසුව තමයි අග්‍රාමාත්‍යතුමිය පාර්ලිමේන්තුවට එය ඉදිරිපත් කළ යුත්තේ. දැන් මොකක්ද මේ කියන්නේ? අග්‍රාමාත්‍යතුමිය ඒ ලියා දෙන එක

[ගරු ඩී.වී. චානක මහතා]

ගිරව්යක් වාගේ කියනවා කියලාද, මේ වසන්ත සමරසිංහ ඇමතිතුමා කියන්නේ? කිසිම තහවුරු කිරීමකින් තොරව දේවල් කියනවා කියලාද කියන්නේ? මේ ආණ්ඩුවට කිසිම වැඩක් බැහැ කියලා ඒක තමයි අපිත් කිව්වේ. දැන් ඔබතුමන්ලාමත් ඒක කියනවා නේ.

හැබැයි, වසන්ත සමරසිංහ ඇමතිතුමා සහ අග්‍රාමාත්‍යතුමිය ගැන අපට මැනීම් දෙකක් තිබෙනවා. එතුමිය ආචාර්යවරියක්. ඒ වාගේම එතුමියගේ වැඩ පිළිවෙළ ගැන යම් කිසි පැහැදීමක් තිබෙනවා. එදා ඔවුන් ජාතික ලැයිස්තුවෙන් හරිනි අමරසූරිය මැතිනිය වෙනුවට වසන්ත සමරසිංහ මැතිතුමා ගෙනාවා නම්, අදටත් සියයට තුන තමයි තිබෙන්නේ. අද එතුමා ඇවිල්ලා මගේ නම කිය කියා අග්‍රාමාත්‍යතුමියට දිගටම පහර එල්ල කළා. හැබැයි, මේ කරුණු දුන්නේ කොහෙන්ද? කරුණු දුන්නේ මුදල් අමාත්‍යාංශයෙන්. මුදල් අමාත්‍යාංශයේ ප්‍රධානියා කවුද? රටේ ජනාධිපතිතුමා. රටේ ජනාධිපතිතුමාගේ අමාත්‍යාංශයෙන් අග්‍රාමාත්‍යතුමියට ලබා දුන් තොරතුරක් එතුමිය කිව්වාම, මාලිමාවේ හරිනි අමරසූරිය අග්‍රාමාත්‍යතුමියගේ පිළිතුර වැරදියි කියලා ජේවීපී එකේ වසන්ත සමරසිංහ ඇමතිතුමා ඇවිල්ලා දිගින් දිගටම ප්‍රහාර එල්ල කරනවා.

මම දැක්කා, වසන්ත සමරසිංහ ඇමතිතුමා රෝහිතගේ සුදුසුකම් ටික පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මම හිතන විධියට පාර්ලිමේන්තුවට ඇවිල්ලා උත්තර දෙන්න බැරි කෙනෙකුගේ තොරතුරු එසේ ඉදිරිපත් කරන්න බැහැ. හැබැයි, මම වසන්ත සමරසිංහ ඇමතිතුමාගේ සුදුසුකම් පිළිබඳ සහතික ඉල්ලන්න යන්නේත් නැහැ. මොකද, රන්වල මහත්තයාට වෙච්ච දේ වසන්ත සමරසිංහ ඇමතිතුමාට වෙනවාට මම කැමැති නැහැ. ඒක නිසා මම එතුමාගෙන් ඒවා ඉල්ලන්න යන්නේ නැහැ. ඉල්ලා වැඩකුත් නැහැ. හැබැයි, ඉල්ලන්න යන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මේ සම්බන්ධයෙන් ඔප්පු කරන්න තිබුණේ කාරණා දෙකයි. රටට ආයෝජන එද්දි හැම දාම ඔබතුමන්ලා බොරු කිව්වා. මේකට එක රුපියලක් වියදම් කරලාත් නැහැ. නමුත් රටට ආදායමකුත් ඇවිල්ලා. හරි ගණන කිව්වේ හරිනි අමරසූරිය අග්‍රාමාත්‍යතුමියද, වසන්ත සමරසිංහ ඇමතිතුමාද කියලා ඔයගොල්ලන් බේරා ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා කථා කරද්දි අපට තේරිච්ච දෙයක් තිබෙනවා. 2022දී තිබුණු රට තමයි අපි භාර ගත්තේ වාගේ හැඟීමක් මෙතුමන්ලා දැන් අපට දෙනවා. එතුමන්ලා කියන මේ reserves ගැන කථා කළත්, ආර්ථික වර්ධන වේගය ගැන කථා කළත්, ඩොලරය ගැන කථා කළත්, මේ මොනවා ගැන කථා කළත් මෙතුමන්ලා හැසිරෙන්නේ 2022දී වාගේයි. අනේ, එහෙම රටක් නොවෙයි ඔබතුමන්ලා භාර ගත්තේ. ඔබතුමන්ලා මේ රට භාර ගන්නකොට අන්තිම කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 5.3යි. ඊට පස්සේ reserve එක තිබුණා, ඩොලර් බිලියන 6ක්. ඒ වාගේම කෘෂි වර්ධන වේගය 0.9යි. ඒ වාගේම කාර්මික වර්ධනය තිබුණා, 11.2ක්. ඒ වාගේම පොලී අනුපාතය එක digit එකකට ඇවිල්ලා තිබුණේ. ඒ වෙලාවේ මේ රට LC අරින්න බැරිව තිබුණු රටක් නොවෙයි. ඒ වෙලාවේත් තෙල් ගෙනාවේ LCවලින්. ඒක නිසා ඔබතුමන්ලා මේ වාගේ බොරු කියන්න එපා. ඔබතුමන්ලා මේ රට භාර ගත්තාම මොකක්ද වුණේ? 5.3ට තිබුණු ආර්ථික වර්ධන වේගය අද 4.8ක් දක්වා කඩා වැටිලා තිබෙනවා. එය දශම 5කින් අඩු වෙලා. ඔබතුමන්ලා මේ රට භාර ගත්තාට පසු මේ අවුරුද්දේ පළමුවැනි කාර්තුවේම ආර්ථික වර්ධන වේගය දශම 5කින් අඩු වෙලා. කෘෂි වර්ධන වේගය plus තිබුණේ, positive තිබුණේ; 0.9ක් තිබුණා. අද කෘෂි කර්මාන්තය විනාශ කරලා තිබෙන්නේ. පොහොර ටික වෙලාවට දෙන්නේ නැතිව, සල්ලි ටික වෙලාවට දෙන්නේ නැතිව, මේවා පරක්කු කරලා අද කෘෂි කර්මාන්තය සෘණ තත්ත්වයට ගිහිල්ලා. අද කෘෂි අංශයේ වර්ධන වේගය සෘණ 0.7යි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතැනට තමයි ඔබතුමන්ලා මේ රට අරගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ගරු ජනාධිපතිතුමාත් කියනවා මම දැක්කා, පාර්ලිමේන්තුවේ චෝදනා එල්ල කරනවාට වඩා, කියන දෙයක් CID එකට ගිහිල්ලා කියන්න කියලා. හැබැයි, කන්ටේනර් වංචාව ගැන CID එකට පැමිණිලි දාලා තිබෙනවා. ඒ ගැන අද වෙනකම් කිසිම විභාගයක් නොවෙන්නේ ඇයි? අද ඒ ගැන පාර්ලිමේන්තුවේ කථා කරන අය, එහෙම නැත්නම් එළියේ කථා කරන අය, ඒගොල්ලන් CID එකට ගෙන්වා ප්‍රශ්න කරනවා. නමුත්, අදටත් ඒක භාර ගත් නියෝජ්‍ය ඇමතිතුමාගෙන්, ගේට්ටුවට උපදෙස් දීපු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් එක වචනයක් අරගෙන නැහැ, නිලධාරින්ගෙන් එක වචනයක් අහන්නේ නැහැ. බැඳුම්කර වංචාව වෙච්ච වෙලාවේත් මේ වාගේම දෙයක් තමයි වුණේ. බැඳුම්කර වංචාව වෙලාවේත් හදිසියක් හැදුවා. කන්ටේනර් වංචාවේත් හදිසියක් හැදුවා. බැඳුම්කර වංචාව වෙච්ච වෙලාවේත් මොකක්ද කළේ? ඒක CID එකට ගෙනියනවා වෙනුවට, එහෙම නැත්නම් Bribery Commission එකට ගෙනියනවා වෙනුවට මොකක්ද කළේ? ඒ වෙනුවෙන් කමිටු පත් කළා, ජනාධිපති කොමිෂන් සභා පත් කළා. කන්ටේනර් වංචාවේදී මොකක්ද වෙලා තිබෙන්නේ? ඒක සම්බන්ධවත් CID එකේ පරීක්ෂණ වෙන්නේ නැහැ. මේ දෙකේම වුණේ එක වාගේ දෙයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. D.V. Chanaka, your time is up.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව තත්පර 30ක් දෙන්න.

Bribery Commission එකෙන් කිසිම පරීක්ෂණයක් වෙන්නේ නැහැ. ඒ වෙනුවට ජනාධිපති කොමිෂන් පත් කරලා මේකේ පරීක්ෂණ එන්න එන්න පරක්කු කරනවා. ඇයි, CID එකේ අධ්‍යක්ෂ ෂුවර් නැද්ද? Bribery Commission එකේ DG ෂුවර් නැද්ද? ඒ උදවියට මේ පරීක්ෂණය භාර නොදෙන්නේ ඇයි? භාර දුන්නොත් මේකට අහුවෙන්නේ ආණ්ඩුව. ඒක නිසා මේක බැඳුම්කර සිද්ධියටත් එහා ගිය වංචාවක්. හැබැයි, ඒක වහන්න ආණ්ඩුව හිතාමතා කටයුතු කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Dilith Jayaweera. You have eight minutes.

Order please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 4.07]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තවශයෙන්ම අද මගේ බලාපොරොත්තුව තිබුණේ මේ පාර්ලිමේන්තුව අමතා වර්තමාන ආර්ථික තත්ත්වය පිළිබඳ සාධනීය සංවාදයකට එළඹෙන්නටයි. නමුත් අද මතු වුණු කරුණුත්, ඒ හා බැඳුණු කාලීන වැදගත්කමක් ඇති අනෙකුත් කරුණු ගැනත් සලකා මම හිතුවා, ඒ සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේදී සඳහන් කරන එක වැදගත් කියලා.

අපේ ජනාධිපතිතුමා වෙනදා වේදිකාවේදී කරනවා වාගේම ව්‍යක්ත දේශනයක් අද පාර්ලිමේන්තුවේදී කළා. එතුමා නිර්ධන පාන්තික දේශපාලනය වෙනුවෙන් පෙනී සිටි පුද්ගලයෙක්. එතුමා අද කථා කරනකොට අපි කල්පනා කළා, දැන් මොකක්ද මේ වෙලා තිබෙන අලකලංචිය කියලා. දැන් එතුමාට සතියකට සැරයක් පාර්ලිමේන්තුවට එන්න සිද්ධ වෙලා තිබෙනවා, මේ කාරණා කියන්න. එතුමා කරුණු කියන අතරේ ඒකට විවිධ සංඛ්‍යාලේඛන, දත්ත ගොඩක් රිංගවන්නට උත්සාහ කළා. ඒක ඇත්තටම දත්ත දාලා ඇත්ත හංගපු කථාවක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි දන්නවා, මේ ලෝකයේ සංඛ්‍යාලේඛන, දත්ත සියල්ලම අපට ඕනෑ විදියකට ගැට ගහන්නට පුළුවන් බව. හැබැයි, යථාර්ථය වන්නේ මොකක්ද? මෙවර අය වැයේ ප්‍රාග්ධන වියදම ලෙස තිබුණු රුපියල් බිලියන 1,410න් දැනට වියදම් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 337යි; සියයට 27යි. මාස 5යි තව ඉතුරු වෙලා තිබෙන්නේ. ඒ දත්තය තිබෙන්නේ කොහේද? ඒක අපේ දළ දේශීය නිෂ්පාදිතයට සෘජුවම බලපාන දත්තයක්. කොහොම වුණත්, එතුමාගේ උත්සාහය අපි අගය කරන්නට ඕනෑ. එතුමා උත්සාහ කරනවා, මේ රට නිවැරදි ආර්ථික ගමනක යනවාය කියන්න. හැබැයි, එතුමාට අමතක වෙනවා, දීර්ඝ කාලයක් එතුමා පෙනී සිටියේ, එතුමා විශේෂයෙන්ම ආමන්ත්‍රණය කළේ, එතුමා ගැන විශ්වාසය තැබුවේ මේ රටේ නිර්ධන පන්තිය, දුප්පත් මිනිස්සු බව. මේ දත්තවල කොහේද තිබෙන්නේ, දුප්පත් මිනිහාට අද වෙච්ච දේ, ඔවුන්ම පුන පුනා කියන හැටියට? මේ හැම කථාවම කිව්වා. ඇති වෙන්න බදු එකතු කරගෙන තිබෙන්නේ කාගෙන්ද? වක්‍ර බදු ගහලා, දුප්පත් මිනිහාගෙන්. අද ගමට ගිහිල්ලා බලන්න, දුප්පත් මිනිහාට අත්වෙලා තිබෙන තත්ත්වය. දුප්පත් මිනිහා කන්නේ බොන්නේ කොහොමද? ඔය බදු ආදායම ගත්තේ කාගෙන්ද? දැන් ඔය ට්‍රිලියන ගණන්වලින් එකතු කර ගත්තේ කාගේ සල්ලිද? මේ රටේ නව ධනයක් උත්පාදනය කරලා, ඒ උත්පාදනය කරපු නව ධනයෙන් ආදායම් බදු ගහලාද? නැහැ. පොඩි මිනිහාට බදු ගහලා; බදු පිට බදු ගහලා; පොඩි එකාගේ පොතට පතට වැට් එක ගහන්නේ නැහැ කියලා පොරොන්දු වුණු ඒවා ඔක්කෝම අමතක කර දමලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි එතුමාට ගරු කරනවා; එතුමාගේ උත්සාහයට ගරු කරනවා. එතුමා කියපු සමහර කරුණුවලට, දූෂණ විරෝධී මාර්ගයක මේ රට ගමන් කරන්නට ඕනෑය කියන ඒ ආඛ්‍යානයට අපි ගරු කරනවා. දූෂණ වෙන්නේ නැහැ කියන එක නොවෙයි මම කියන්නේ. ඒ ආඛ්‍යානය හරි; ඒ කථාව හරි. මේ රටේ දූෂණය නැති කරන්නට ඕනෑ. ඒ සඳහා ගන්න පුළුවන් සියලු ක්‍රියාමාර්ග ගන්නට ඕනෑ. හැබැයි, ඒක මේ රටේ එකම කථාව කරගෙන හැමදාම අපි කථා කරන්නේ දූෂණ විරෝධය ගැන විතර නම් කොහොමද රටක් ඉස්සරහට යන්නේ? අන්න ඒක තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට කියන්නට තිබෙන්නේ.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්නට ඕනෑ. අපේ ජනාධිපතිතුමා පසුගිය වතාවේ මේ සභාවට ඇවිල්ලා මේ රටේ අධ්‍යාපනය ගැන කථා කරලා කිව්වා, ලොකු බාස්ගෙන් අත්වැඩ දෙන අය ඉගෙන ගෙන බාස් වැඩේ කරන්න යනවා, ඒගොල්ලන් මකබාස්ලා කියලා. දැන් ඇත්තටම එතුමාට මේ පාර්ලිමේන්තුවට එන්න වෙලා තිබෙන්නේ, එතුමාගේ ළඟ අත්වැඩ දුන් අය මේ මකබාස් වැඩේ කරන නිසා. එතුමා යම්කිසි උත්සාහයක් ගත්තත්, ඒ මකබාස්ලා නිසා මේ ගොඩනැඟිල්ල හදන්න බැරි බව එතුමාට තේරිලා එතුමා අද ආසන්න වශයෙන් පැය දෙකක් විතර කථා කළා. ඉතින් මට කියන්න තිබෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද අපි මහා සමාජ බෙදවාවකයකට මුහුණ දීලා තිබෙනවාය කියන එකයි. අපේ සභ්‍යත්වය, සංස්කෘතිය, ආගම අමතක කරලා, අපි දේදුනු ගෝලීය පුරවැසියෙක් හදන්නට ඕනෑය කියලා, සර්ව ආගමික පුවරුවක් ඇති කරලා, ඒ තුළින් අපේ රටේ ඉන්න අධ්‍යාත්මික මනුස්සයා, ශ්‍රී ලාංකිකයා මරා දමනවා නම්, ඒ ශ්‍රී ලාංකිකයාගේ ධනාත්මක චින්තනය සම්පූර්ණයෙන්ම නැති කරලා දමනවා නම්, හැමදාම ඒ මිනිසුන්ට සෘණාත්මක දේවල් පමණක් ඔළුවට දමනවා නම්, අපි යන මාර්ගයක් අපට පෙන්වන්නේ නැත්නම්, මේ රටේ ව්‍යවසායකයෙකුට දියුණු වෙන විදියක් පෙන්වන්නේ නැත්නම්, මේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියලා ගෙනෙන ඒවා තුළ අපට අපේක්ෂාවක් ඇති වෙන්නේ නැත්නම්, ඒ තුළ මේ රට ඉස්සරහට යන මාර්ගයක් පෙනෙන්නේ නැත්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමාම යෝජනා කරන ඒ ආඩම්බර, සාඩම්බර ශ්‍රී ලාංකිකයා බිහි වෙන්නේ කොතැනින්ද? අන්න ඒ සාඩම්බර ශ්‍රී ලාංකිකයා බිහි කර ගැනීමට ඔබ යම් සද්භාවමය උත්සාහයක් දරන්නේද, ඒ උත්සාහයට අපි උදවු කරන්න කැමැතියි. නමුත්, ඔබ පසුගිය ආණ්ඩුවලට බැණ බැණ, ඊටත් වඩා ව්‍යාජ දේශපාලනයක යෙදෙනවා නම්, ඊට විරුද්ධව අපි මේ සංවාදය කරන්නට, මේ සංවාදයේ තීව්‍ර බව වැඩි කරන්නට පෙනී සිටින බව සඳහන් කරන්නට ඕනෑ.

ඒ වාගේම මම කියන්නට ඕනෑ, අපේ රටේ මිනිස්සු ආදරයෙන් පෝෂණය කර ගත් මේ රටේ යම් දෙයක් තිබුණා නම්, ඒක නැති කරන්නට මේ හූ දේශපාලනයට අහුවෙලා,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

මට තව තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අපේ රට අද ලොකු හූ දේශපාලනික අභියෝගයකට මුහුණ දෙමින් සිටින බව ඇත්ත. නමුත්, තමන් ඒකේ අන්තේවාසිකයන් වෙලා, IMF උගුල ගලවන්නට ආපු අය ඒකෙම හිරවෙලා තිබෙනවා. දැන් අපි දන්නේ නැහැ, බදුවලින් තොරව ඇමෙරිකාවෙන් වාහන ගේන්න දෙනවාද, නැද්ද කියලා. ඒක අපි දන්නේ නැහැ. ඒ ගැන අපට කියන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේවා ඔක්කෝම ගැන අපි දැනගන්නත් කැමැති බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.14]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද ජනාධිපතිතුමාගේ දේශනය තුළ අපි දැකපු කාරණා කිහිපයක්ම තිබෙනවා. එක කරුණක් හැටියට එතුමා කිව්වා, ආර්ථික වර්ධනයක් තිබෙනවාය කියලා. එතුමා කිව්ව අනික් කාරණය තමයි, ආණ්ඩුව පෙරළන්න කුමන්ත්‍රණයක් තිබෙන බවට එතුමාගේ හිතේ හයක් තිබෙනවාය කියන එක. එතුමා කථාව පටන් ගත්තේ ඉන්දියාවත්, පාකිස්තානයත් අතර ගැටුම ගැන හිතලා. එතුමා හිතුවා ලු, ලංකාවට බෝම්බ දමයි කියලා. අපේ කවුරුවත් කියලා නැහැ, ලංකාවට බෝම්බ දමයි කියලා. එතුමා කල්පනා කරනවා ඇති, "මට දැන් බෝම්බයක් පත්තු වෙයි" කියලා. එතුමා ඊශ්‍රායල - ඉරාන යුද්ධය ගැන කථා කළා. මම දන්නේ නැහැ, එතුමාගේ මානසිකත්වය මොකක්ද කියලා. එතුමා කිව්වා, ආණ්ඩුවක් පෙරළෙන තුන් ආකාරයක් තිබෙනවාය කියලා. එකක් තමයි, ආණ්ඩුව ඇතුළේ කුමන්ත්‍රණයකින්. තවත් එකක් තමයි, එළියේ සිදු වන කුමන්ත්‍රණයකින්. එතුමාගේ හිතේ හයක් ඇති, ආණ්ඩුව ඇතුළේ එතුමාට විරුද්ධව කුමන්ත්‍රණයක් තිබෙනවාය කියලා. එතුමාගේ කථාවේදී මේ කුමන්ත්‍රණය ගැන හතරපස් වතාවක් කියනවා අපි දැක්කා. එතුමා තර්ජනයකුත් කළා. විපක්ෂය එහෙම කුමන්ත්‍රණය කරලාත් නැහැ. ආණ්ඩුව ඇතුළේ ප්‍රශ්න තිබෙන එක ගැන තමයි එතුමා ඒ කිව්වේ.

ජනාධිපතිතුමා ආර්ථික වර්ධනය ගැන කිව්වා. ජනාධිපතිතුමනි, මේ රටේ ආර්ථික වර්ධනයක් තිබෙනවා නම් මේ රටේ ජනතාවට ඒකේ සහනය දෙන්න ඔබතුමාට පුළුවන්කම තිබෙන්න ඕනෑ කියන එක අපි කියනවා. ඒ වාගේම එතුමා කිව්වා, සංචාරක ආදායම වැඩිවෙලා, අපනයන ආදායම වැඩිවෙලා, බදු ආදායම වැඩිවෙලා තිබෙනවා කියලා. එහෙම නම් ඔබතුමා ලබා දුන් පොරොන්දු ඉෂ්ට කරන්න. එතුමා විදුලි බිල ගැන කිව්වා. එතුමන්ලා විද්‍යාත්මකව සහ සංඛ්‍යාත්මකව කල්පනා කරලා විදුලි බිල වැඩි කළාය කිව්වා. මම දන්නේ නැහැ, එතුමා ජනාධිපතිවරණයට ඇවිල්ලා පොරොන්දු දෙද්දී එතුමා ළඟ මේ විද්‍යාත්මකභාවය තිබුණේ නැද්ද කියලා. දැන් ද ඒ විද්‍යාත්මකභාවය තිබෙන්නේ? එතුමා පැහැදිලිවම කිව්වා, සියයට 18ක වැට් එක ළමයින්ගේ පොත් පත්වලින්, ආහාර ද්‍රව්‍යවලින් අයින් කරනවාය කියලා. මේ රටේ ආර්ථිකයේ ශක්තිමත්භාවයක් තිබෙනවා නම් ඇයි ඒ පොරොන්දු ඉෂ්ට නොකරන්නේ කියලා අපි එතුමාගෙන් අහනවා.

ඒ වාගේම කන්ටේනර් සිද්ධිය ගැනත් මම කියන්න ඕනෑ. කන්ටේනර් තුන්සිය ගණනක් හොරෙන් එළියට දාපු එක මේ රටේ බොහොම ප්‍රසිද්ධයි. ජනාධිපතිතුමා කියනවා, ඒක වුණේ දහතුන්වැනි වතාවට කියලා. අපි එතුමාගෙන් අහනවා, තමුන්නාන්සේට වැඩි ඡන්දයක් දීලා පත් කළේ දූෂණය නැති කරන්න නම්, දොළොස් සැරයක් කරපු වැඩේම තමයි දහතුන්වැනි සැරේටත් කරලා තිබෙන්නේ කියලා. ඒකට අදාළ හොරු ටික අල්ලා ගන්න.

ඒ වාගේම ආර්ථික වර්ධනය සහ බඩු මිල ගැනත් එතුමා කථා කළා. රුපියල ශක්තිමත් වෙලා එක තැන තිබෙනවා කියාත් එතුමා කිව්වා. අද ඇමෙරිකානු ඩොලරයක වටිනාකම රුපියල් 300යි. එතුමා කිව්වේ නැහැ, ඩොලරයට සාපේක්ෂව යූරෝ එක ශක්තිමත් වෙනවා, ඩොලරයේ අගය පහතට බැහැලා, සිංගප්පූරු ඩොලරයට සාපේක්ෂව ඇමෙරිකානු ඩොලරයේ අගය පහතට වැටිලා, ඉන්දියානු රුපියලට සාපේක්ෂව, චීනයේ යුවාන්වලට සාපේක්ෂව ඇමෙරිකානු ඩොලරයේ අගය පහතට වැටිලා තිබෙනවාය කියලා. එහෙම නම්, අපේ රුපියලත් පහළට බැහැලා තිබෙනවා. ඒක තමයි අපි කියන්නේ.

එතුමා කථා කළා, සීනි කර්මාන්තය ගැන. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ ආණ්ඩු මේ රටේ ආරම්භ කරපු සීනි කර්මාන්තය කඩා වැටෙන තැනට තමුන්නාන්සේලා කටයුතු කරනවා. මේ රටට අවශ්‍ය සීනි ටොන් 650,000යි. රටේ නිෂ්පාදනය කරනවා, සීනි ටොන් 90,000ක්. අපේ ආණ්ඩු කාලයේ තමයි මේ කර්මාන්තශාලා ඔක්කෝම ආරම්භ කළේ. ගල්ඔය හිඟුරාන කර්මාන්තශාලාව, සෙවනගල, පැල්වත්ත කියන කර්මාන්තශාලා ඔක්කෝම ආරම්භ කළේ දේශීය නිෂ්පාදනයට තැනක් දෙන්න. අපේ රටේ සීනි ආනයනය සඳහා රුපියල් බිලියන 120ක විදේශ විනිමය ප්‍රමාණයක් වැය කරනවා. වැඩියෙන්ම වියදම් වෙන්නේ ඉන්ධනවලට. දෙවනුව සීනිවලට. තුන්වනුව පොහොරවලට; පිටිවලට. මේවා නවත්වා ගන්න ඕනෑ. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අපේ රටේ සීනි නිෂ්පාදනය තිබෙද්දී පළමුවැනි මාස හයට සීනි ටොන් 375,000ක් පිට රටින් ගෙනැල්ලා තිබෙනවා. අද අපේ මිනිසුන්ට සීනි ටික විකුණා ගන්න විධියක් නැහැ. පැල්වත්ත සීනි සමාගමේ තිබෙනවා, සීනි ටොන් 21,000ක්. ගල්ඔය සීනි කර්මාන්තශාලාවේ තිබෙනවා, සීනි ටොන් 10,000ක්. ඇතිමලේ කර්මාන්තශාලාවේ තිබෙනවා, සීනි ටොන් 8,000ක්. සෙවනගලත් තිබෙනවා. තමුන්නාන්සේලා පිට රටින් සීනි ගෙනෙනවා. අපේ ගොවියා දුක්විඳිනවා.

ඒ විතරක් නොවෙයි, එතනෝල් අවශ්‍යතාව ලීටර් මිලියන 25යි. අපි 14ක් නිෂ්පාදනය කරනවා, විකුණා ගන්න විධියක් නැහැ. පිට රටින් පසුගිය කාලයේ ගෙනැල්ලා තිබෙනවා, නීත්‍යනුකූලව හෝ අනීතිකව. කන්ටේනර්වලත් ඒවා තිබුණාද දන්නේ නැහැ. අද ඒවා විකුණා ගන්න බැහැ. රුපියල් 1,200ට තිබුණු එතනෝල් රුපියල් 400ට බැහැලා. රුපියල් 800යි කියනවා, විකුණා ගන්න බැහැ. සීනි ගොඩගැහිලා තිබෙනවා. අපේ ගොවියාගේ සීනිවලට සියයට 18ක VAT එකක් ගන්නවා. සියයට දෙකහමාරක නිෂ්පාදන බද්දක් ගන්නවා. ඉන්දියාවෙන්, පාකිස්තානයෙන්, බ්‍රසීලයෙන් ගෙනෙන සීනිවලට VAT එක ගන්නේ නැහැ. එහේ ගොවියාගෙන් ගන්නේ නැහැ. ලංකාවේ ගොවියාගෙන් VAT එක ගන්නවා. අපි කියනවා, ඒ බදු අඩු කරන්න කියලා. අද වෙනකොට සෙවනගල, පැල්වත්තේ ඇමෝනියා පොහොර කිලෝ එකක්වත් නැහැ. එන අවුරුද්දේ සීනි නිෂ්පාදනය අඩු වෙනවා. ඒ විතරක් නොවෙයි. සෙවනගල සීනි සමාගමේ යන්ත්‍ර සූත්‍ර ඔක්කෝම කැඩිලා. 1988-89 කාලයේ යන්ත්‍ර සූත්‍ර විසිගණනකට ගිනි තිබ්බා. දැන් ඔක්කෝම කැඩිලා. මෙහෙම ගියොත් ගොවියා උක් වගාව අත්හරිනවා. දේශීය නිෂ්පාදනයට තැන දෙනවා කියපු උදවිය අද දේශීය නිෂ්පාදනය විනාශ කරලා තිබෙනවා. අපි කියනවා, තමුන්නාන්සේලා මේකේ පවුකාරයෝ වෙනවා කියලා. විශේෂයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආදායම් මාර්ගයක්, උක් කර්මාන්තය, සීනි කර්මාන්තය. අද මේ ආණ්ඩුව ගල්ඔය ඇතුළු අනෙකුත් සීනි කර්මාන්තශාලා විනාශ වෙන තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඡන්දයේදී කිව්වා වාගේ ජනාධිපතිතුමා මෙතැනටත් ඇවිල්ලා බොරු ගොඩක් කියලා ගියා. ඒ පිළිබඳව අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.21]

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

அஸ்ஸலாமு அலைக்கும்! ஆயுபோவன்! வணக்கம்!

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இச்சபையில் நாட்டின் தற்போதைய பொருளாதார நிலைமை சம்பந்தமாக விவாதிக்கப்படுகின்றது. நாட்டு மக்கள் ஓர் அரசாங்கத்தை உருவாக்கும்போது, அவர்களுடைய சிந்தனையானது, ஆட்சிக்கு வருபவர்கள் தமக்கு நல்வாழ்வை உருவாக்குவார்கள், நாட்டின் பொருளாதாரத்தை வளர்ச்சியடையச் செய்து, நாட்டைக் கட்டியெழுப்புவார்கள், நாட்டைச் சிறந்த முறையில் அபிவிருத்தியடையச் செய்வார்கள், இந்த நாட்டின் சிறுவர்களுக்கு நல்லதோர் எதிர்காலத்தை உருவாக்குவார்கள் என்ற அடிப்படையில்தான் இருக்கும். ஆனாலும், சென்ற 76 வருடங்களாக இந்த நாட்டை மாறி மாறி ஆட்சி செய்த ஆட்சியாளர்கள், நான் மேலே குறிப்பிட்ட விடயங்களைச் செய்தார்களா என்றால், இல்லை என்றுதான் சொல்ல வேண்டும். மாறாக, அவர்கள் மக்கள்மீது அதிக சுமையைத்தான் சுமத்தினார்கள். வெளிநாடுகளிடம் இருந்து அதிக கடன்களை வாங்கி, மக்கள்மீது வரிகளைச் சுமத்தி, அவர்களைக் கஷ்டத்துக்கு உள்ளாக்கி, நாட்டை சீரற்ற நிலைக்கு உள்ளாக்கினார்கள். அதுமட்டுமல்லாமல், நாட்டிலுள்ள அதிகமான தாபனங்களையும், தொழிற்சாலை களையும் வெளிநாடுகளுக்கு விற்பனை செய்தார்கள். அது துறைமுகங்களாக இருக்கலாம், விமான நிலையங்களாக இருக்கலாம், இன்னோரன்ன தாபனங்களாகக்கூட இருக்கலாம்! அவை அனைத்தையும் வெளிநாடுகளுக்கும் தனியாருக்கும் விற்பனை செய்து, மக்களுக்குச் சுமையை ஏற்படுத்தி, இந்த நாட்டின் பொருளாதாரத்தை வீழ்ச்சியடையச் செய்கின்ற செயற்பாடுகளையே அவர்கள் செய்தார்கள். தாங்கள் மாறி மாறி கொண்டுவருகின்ற அரசாங்கங்கள் தங்கள்மீது சுமையைக் கூட்டி, நாட்டின் பொருளாதாரத்தை வீழ்ச்சியடையச் செய்து, நாட்டில் எந்தவித முன்னேற்றத்தையும் ஏற்படுத்தவில்லை என்பதை அறிந்த மக்கள் மூன்றாம் தரப்பைத் தேடிய நிலையில்தான், தேசிய மக்கள் சக்திக்கு ஆதரவாக வாக்களிக்கத் தயாரானார்கள். அப்போது, எதிர்க்கட்சியினர் இந்த நாட்டை மேலும் வங்குரோத்து நிலைக்கு மாற்றுவதற்கான எல்லாச் செயற்பாடுகளையும் செய்தார்கள்.

அவர்கள் தேர்தல் காலங்களில் மக்களிடம் செய்த பிரசாரம் என்னவென்றால், தேசிய மக்கள் சக்தி அரசாங்கம் அமைந்தால், வெளிநாடுகளுடனான தொடர்புகள் நல்ல முறையில் இருக்காது, வெளிநாடுகள் நமது நாட்டுக்கு கடன் கொடுக்காது, டொலரின் பெறுமதி அதிகரிக்கும், பொருளாதாரம் மேலும் வீழ்ச்சியடையும், மக்களுக்கு அதிக கஷ்டம் ஏற்படும், நாட்டில் இனவாதம் அதிகரிக்கும் என்றுதான். இனவாதத்தை வைத்து அரசியல் செய்தவர்கள் சென்ற ஆட்சியாளர்கள்! அவர்கள் எந்தவிதத்திலாவது இனவாதத்தை தூண்டியே அரசாங்கத்தை உருவாக்கினார்கள். இந்த நாட்டில் தேசிய மக்கள் சக்தி அரசாங்கம் உருவாகி ஒரு வருடமாகிறது. எனினும், இந்த நாட்டிலுள்ள எந்தவொரு பள்ளிவாசலும் உடைக்கப்படவில்லை; எந்தவொரு சிலையும் உடைக்கப்படவில்லை; எந்தவொரு முஸ்லிம் - சிங்களப் பிரச்சினையும் ஏற்படவில்லை. இந்த நாட்டில் சீரான, சமத்துவமான நிலையை தேசிய மக்கள் சக்தி அரசாங்கம் உருவாக்கிக்கொண்டு இருக்கிறது. இந்த நாட்டு மக்கள் தேசிய மக்கள் சக்திமீது வைத்த நம்பிக்கை வீண்போகவில்லை.

சென்ற அரசாங்கங்கள் கடன் வாங்கியதுபோல, இந்த அரசாங்கம் கடன் வாங்காமல் வீண்செலவுகளைக் குறைத்து, கஜானாவை நிரப்பிவைத்து இருக்கிறது. இதனால் நாட்டு மக்களுக்கு அதிகமான சேவைகளையும் உதவிகளையும் செய்யக்கூடியதாக இருக்கின்றது. சென்ற அரசாங்கங்களில் இருந்தவர்கள் இந்த நாட்டின் கஜானாவைச் சூறையாடினார்கள். எனினும், தேசிய மக்கள் சக்தி அரசாங்கத்தில் உள்ளவர்கள் கஜானாவைப் பாதுகாக்கக் கூடியவர்களாக, நாட்டுக்கும் நாட்டு மக்களுக்கும் நல்ல விடயங்களைச் செய்யக்கூடியவர்களாக இருக்கின்றார்கள்.

எமது நாட்டிலிருந்து ஏற்றுமதி செய்யப்படுகின்ற பொருட்களுக்கான வரி விதிப்பு குறைக்கப்பட்டுள்ளது. எந்தளவுக்கு என்றால், இலங்கையிலிருந்து அமெரிக்காவுக்கு ஏற்றுமதி செய்யப்படும் பொருட்களுக்கு விதிக்கப்பட்டு இருந்த 44 சதவீத வரி இன்று 30 சதவீதமாகக் குறைக்கப்பட்டுள்ளது.

கடந்த காலங்களில் எமது நாட்டில் அரச ஊழியர்கள் ஓய்வுபெறுவதற்கு மிகவும் பயந்தார்கள். ஏனெனில், அவர்களுக்குக் கிடைத்த சம்பளம் போதாது. அப்போதிருந்த அரசாங்கங்களிடம் அவர்கள் சம்பள உயர்வைக் கோரினார்கள். அதற்காக ஆர்ப்பாட்டங்களையும் செய்தார்கள். எனினும், அவர்களுக்கு கண்ணீர்ப் புகையும் சேற்றுத் தண்ணீரும்தான் கிடைத்ததே தவிர, சம்பள உயர்வு கிடைக்கவில்லை. ஆனால், தேசிய மக்கள் சக்தி அரசாங்கம் அவர்களுக்கு நியாயமான சம்பள உயர்வை வழங்கியிருக்கிறது.

இன்றைய 'தினகரன்' பத்திரிகையில்,

> "கவர்ச்சிகரமான அரச சேவையை உருவாக்குவதில் உறுதி
> அரச ஊழியர்களின் சம்பள உயர்வுக்காக ரூபாய் 11,000 கோடி
> 2026ஆம் ஆண்டு கிடைக்கும் வகையில் ஏற்பாடுகள் துரிதம்
> அரச ஊழியர்களின் சேவையை வலுப்படுத்தத் திட்டமிட்டுள்ளதாக ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க தெரிவிப்பு"

என்ற தலைப்பில் செய்தியொன்று வெளிவந்திருக்கிறது.

இன்று அரச ஊழியர்கள் ஓய்வுபெறுவதை சந்தோசத்துடன் ஏற்றுக்கொள்கிறார்கள். ஏனெனில், அவர்களுடைய சம்பளம் அதிகரிக்கப்பட்டுள்ளது. அவர்களுடைய சம்பளம் 2026ஆம் ஆண்டிலும் அதிகரிக்கும்; அதற்கு அடுத்த வருடத்திலும் அதிகரிக்கும். இந்த நாட்டு மக்களின் வாழ்க்கையையும் இந்த நாட்டின் பொருளாதாரத்தையும் கட்டியெழுப்பக்கூடிய ஒரு நிலைமையை எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் உருவாக்கி வருகின்றது.

கடந்த அரசாங்கங்களில் இருந்த சுற்றுலாத்துறை அமைச்சர்கள் அத்துறையை மேம்படுத்தப் போவதாகக் கூறிக்கொண்டு இருந்தார்களே தவிர, பாரியளவில் ஒன்றும் செய்யவில்லை. எமது தேசிய மக்கள் சக்தி ஆட்சிக்கு வந்த பின்னர், குறிப்பாக கடந்த சனவரி மாதம் முதல் யூலை மாதம் வரையான காலப்பகுதியில் எமது நாட்டுக்கு 12 இலட்சத்துக்கும் அதிகமான வெளிநாட்டு சுற்றுலாப் பயணிகள் வருகைதந்து இருக்கிறார்கள். இதன்மூலம் எமது நாட்டின் அந்நியச்செலாவணி அதிகரித்திருக்கின்றது.

புத்தளம் தொகுதியிலுள்ள கற்பிட்டி பகுதியில் சுற்றுலாத்துறை சார்ந்த இடங்கள் அதிகமாக இருக்கின்றன. தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, அங்கு புதிய

[ගරු මුහම්මද් ෆයිසාල් මහතා]

வேலைத்திட்டங்களை மேற்கொண்டு, சுற்றுலாத்துறையை நல்ல முறையில் அபிவிருத்தி செய்து வருகின்றது. கடந்த கால அரசாங்கங்கள் அப்பகுதியிலுள்ள ஒரு பாதையைக்கூட சரியான முறையில் சீர்செய்யவில்லை. எதிர்வரும் காலங்களில் எமது தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, நாட்டின் பொருளாதாரத்துக்கும் சிறுவர்களின் எதிர்காலத்துக்கும் நல்லதொரு வழியை வகுக்கும் எனக் கூறி, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට තවත් විනාඩි 2ක් දුන්නා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක අපේ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[අ.භා. 4.28]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජනාධිපතිතුමා අද චණ්ඩි කථාවක් කළා, ඇඟිල්ල දික්කරගෙන, පාට් එක දාගෙන. ඒ අතරවාරයේ අපව නිකම් බයිට් එකට ගන්නත් try කළා. *[බාධා කිරීමක්]* ඇඬුවාද? මම දන්නේ නැහැ; මම ඒ කෑල්ල දැක්කේ නැහැ. කමක් නැහැ, පරණ යාළුවා නිසා අපි එතුමාව ජෝක් එකට ගන්නේ නැහැ. මොකද, එතුමා ජනාධිපතිතුමා නිසා අපි එතුමාට ගෞරව කරනවා. ඒක තමයි අපි වැදගත් විධියට එතුමාගේ කථාවට ඇහුම්කන් දීගෙන හිටියේ. අවසානයේදී mike එක ගන්න කිව්වාම, මම පොඩි උත්තරයක් දුන්නා. කමක් නැහැ.

එතුමා ඉදිරිපත් කරපු මේ ආණ්ඩුවේ පළමුවෙනි Budget එක පිළිබඳ විවාදයේදී විපක්ෂයේ පළමු කථාව මමයි කළේ. එම කථාවේ, අයවැය ගැන කරුණු දැක්වීම ආරම්භයේදී මගේ පළමුවැනි වාක්‍යයේ අදහස වුණේ, 'මට පෙනෙන්නේ පල්ලියේ ෆාදර් කෙනෙක්, පන්සලේ බණ කියනවා වාගේ කථාවක් ජනාධිපතිතුමා කළා' කියන එකයි. අද ඒක බොහෝ දුරට ඔප්පු වුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මම කියන්නම්, ඒ ඇයි කියලා. මොකද, තමන්ගේ ideology එකයි, IMF එකේ කොන්දේසියි, පැලවත්තේ අදහසුයි, දැන් කොරන දෙයයි සම්පූර්ණයෙන්ම පටලවාගත්තු ස්වරූපයක් තමයි මම දැක්කේ. මම උදාහරණ කිහිපයක් පමණක් දෙන්නම්.

අද ජනාධිපතිතුමා කිව්වා, කොහොම හරි ණය අරගෙන පාරවල් හදනවා ලු. මම කාර් එකේ ඉඳන් මෙහේට එනකල් ඒ කථාව රේඩියෝ එකෙන් අහගෙන හිටියා. කොහොම හරි ණය ගන්නවා ලු; කොහොම හරි ණය අරගෙන පාරවල් හදනවා ලු. විදුලිබල ක්ෂේත්‍රයේ ආයෝජනය කරනවා ලු. වරාය වැඩිදියුණු කරනවා ලු. දැන් ideology එක මොකක්ද? රජයට අයිතිය තියා ගන්න ඕනෑ; මේවා විකුණන්නේ නැහැ කියන එකයි. රජයේ මන්ත්‍රීවරු ඒක තමයි දිගින් දිගටම කිව්වේ. ජාතික ආරක්ෂාව පවත්වාගන්න ඕනෑ, කුමන්ත්‍රණකාරයන්ගෙන් රට බේරා ගන්න ඕනෑ වාගේ කථාත් කිව්වා. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද අපට අහන්න වෙලා තිබෙනවා, ප්‍රශ්නයක්. කුමන්ත්‍රණය තිබෙන්නේ, JVP එකේද, NPP එකේද කියලා. අර අසරණ අගමැතිතුමියට මොකද කළේ? කෙසේ වෙතත්, කුමන්ත්‍රණයක් එතැන තිබෙනවා වාගේ තමයි අපට පෙනෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් අපි ආයෙත් ප්‍රධාන කාරණාවට එමුකෝ. IMF කොන්දේසි මොනවාද? ඒවා වෙනස් කරනවාමයි කියලා කිව්වා. හැබැයි, ඒවායෙහි වචනයක්වත් වෙනස් කළේ නැහැ. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා එකඟ වෙච්ච ණය ප්‍රතිව්‍යුහගතකරණය එක අකුරක්, එක ඉලක්කමක් වෙනස් කරන්නේ නැතුව, සියයට සියයක්, අනුර කුමාර ජනාධිපතිතුමාත් පිළිගත්තා. හැබැයි, කියන්නේ මොකක්ද? එතුමන්ලා භාර ගත්තේ සම්පූර්ණයෙන්ම වැටිච්ච රටක් ලු; ආර්ථික වර්ධනය ඍණ ලු; Treasury එක හිස් ලු; මහ බැංකුවේ සංචිත තිබුණේ ඩොලර් මිලියනය ලු, දැන් ට්‍රිලියනය ලු; උද්ධමනය සියයට 70ක් තිබුණා ලු. අලි කෙබර! ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2024 අග වන විට ආර්ථික වර්ධනය සියයට 5 යි. Treasury එකේ tax revenue එක සියයට 8 ඉඳලා සියයට 12ට වැඩි වෙලා. Central Bank එකේ reserve එක මිලියන 20 ඉඳලා බිලියන 5ට වැඩි වෙලා. Interest rate එක සියයට 35 ඉඳලා සියයට 8ට අඩු වෙලා. උද්ධමනය සියයට 70 ඉඳලා සියයට 1ට අඩු වෙලා. හිර වෙච්ච රටක් නොවෙයි දුවපු රටක් ඔබතුමා ගත්තේ, අනුර ජනාධිපතිතුමනි. දන්නේ නැති මිනිස්සුන්ට ඕවා කියෙව්වාට දන්නා මිනිසුන් එක්ක ඒ දත්ත එක්ක තර්ක කරන්න ඕනෑම වෙලාවක අපි සූදානම්.

අපි නැවතත් IMF එකේ කොන්දේසි, ගෙවිය යුතු ණය කියන කාරණයට එමුකෝ. මූලික වශයෙන් කාරණා දෙකක් තිබෙනවා. එක, වාර්ෂිකව ගන්න පුළුවන් ණය ප්‍රමාණය - gross financial need - සීමිතයි. අනුර ජනාධිපතිතුමා ඒකට අත්සන් කළා. දළ මූල්‍ය අවශ්‍යතාව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13යි. Foreign loans ගන්න පුළුවන් සියයට හතරහමාරයි. Local loans ගන්න පුළුවන් සියයට අටහමාරයි. "මම කොහෙන් හරි ණය අරගෙන පාරවල් හදනවා" කිව්වාට, එහෙම කරන්න බැහැ. මම පසුව කියන්නම් ඒ ඇයි කියලා.

දෙවැනි කාරණාව, foreign policy loans - විදේශීය ප්‍රතිපත්තිමය ණය - ගන්න නම්, World Bank, ADB, JICA එක්ක එකඟ වෙච්ච විධියට ඒ සහන පොලී ලබා ගන්න ආර්ථික ප්‍රතිසංස්කරණ ඉදිරියට අරගෙන යන්න ඕනෑ. ඒකද ඊයේ කළේ? එතැනට මම එන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ණය හරහා හෝ රාජ්‍ය ආයෝජන හරහා ප්‍රාථමික වියදම සියයට 13ට සීමා කරන්න ඕනෑ. හිතෙන හිතෙන විධියට වියදම් කරන්න බැහැ. කිව්වා නේද, යටිතල පහසුකම් සංවර්ධනය ද ඇතුළුව ප්‍රාග්ධන වියදම්වලට ට්‍රිලියන 1.4ක් වියදම් කරනවා කියලා? ස්ටේජ්වල කෑ ගහමින් ගියා, "ලංකාවේ අවුරුදු 76ක ඉතිහාසයේ අපේ ආණ්ඩුව තමයි මෙච්චර වියදම් කරන්නේ" කියලා. මේ, අගෝස්තු මාසය. අද වෙනකොට සියයට 25ක්වත් වියදම් කරලා තිබෙනවාද කියලා මෙතැන ඉන්න ඇමතිතුමන්ලාගෙන් කවුරු හෝ නැඟිටලා කියන ලෙසට මම challenge කරනවා. කයිවාරු ගහන්න පුළුවන්; ඕනෑම කෙනෙකුට කයිවාරු ගහන්න පුළුවන්. හැබැයි, වැඩේ කරලා පෙන්වන්නයි ඕනෑ.

තුන්වැනි කාරණාව මේකයි. පැලවත්තේ අදහස මොකක්ද? අපි දැක්කා, ඊයේ මේ පාර්ලිමේන්තුවේ වෙච්ච සිද්ධිය. පැලවත්තේ පුබුදු නිරෝෂන්ගේ සංශෝධනය ඊයේ ගෙනාවා, Electricity Act එකට. ඒ හරහා මූලික කාරණා කිහිපයක් ආණ්ඩුව ඊයේ ස්ථාපනය කළා. එක, CEB එකේ සියලු assets සියයට සියයක් රජය සතුව සදාකාලිකව තියාගන්නවා කියලා මෙතැනදී ගිරිය යටින් කෑ ගහමින් කිව්වා. World Bank එක, ADB එක, JICA එක ඒකට විරුද්ධ වුණා. ඒකට හේතුව මොකක්ද? මා කලිනුත් ඒක කිව්වා. ණයවලින් විතරක් මේ රට ගොඩ ගන්න බැහැ. අපි දිගින් දිගටම ණය අරගත්තු නිසා තමයි හිරවෙලා තිබෙන්නේ. ණය ගන්නම ඕනෑ නැහැ, රටක් සංවර්ධනය කරන්න. ණය කියන්නේ, debt. Equity කියන්නේ තමන්ගේ ආයෝජනය. ඒ කියන්නේ, capital එක. Debt සහ equity කියලා දෙකක් තිබෙනවා. එහෙම තමයි weighted average capital cost එක සොයන්නේ. ඒකට තමයි පෞද්ගලික ආයෝජනය අවශ්‍ය වෙන්නේ. ඒකට තමයි දේශීය, විදේශීය සෘජු ආයෝජන ලබාගන්න උත්සාහ කරන්නේ. ඒකට තමයි BoI එක හදලා තිබෙන්නේ. එහෙම නොවෙයි නම්, රට දියුණු කරන්නේ ණයවලින් විතරක් නම් BoI එක වහලා දමන්නකෝ. ඒ point එක වැරැදියි. දැන් ඔය කියන විධියට ඊයේ pass කර ගත්තු සංශෝධන පනත් කෙටුම්පත හරහා කොහෙන්ද ණය ගන්නේ? World Bank එක, ADB එක electricity sector එකේ ඔය transmission line එකට ණය දෙන්නේ නැහැ. පුබුදු නිරෝෂන් කියනවා, ඩොලර්වලින් බිලියන 5ක් ඕනෑ කියලා. හැබැයි, CEB එකට loan එකක් ගන්න නම් සියයට 11ක් ඇමෙරිකානු ඩොලර්වලින් ගෙවන්න සිදු වෙනවා. ඊළඟට, LTL Transformers (Pvt.) Limited එක කොටස් වෙළෙඳ පොළේ ණය වෙනුවට ආයෝජන ලබා ගන්න ලංකාවේ ලොකුම IPO එක - රුපියල් බිලියන 20ක - කරන්න ලෑස්ති වෙලා ඉන්න කොට ඔබතුමන්ලා ඒක හිර කරපු නිසා එය නැවැත්තුවා. ඒ හරහා LTL Transformers (Pvt.) Limited එක රජයට පවරා ගත්තා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ලංකාවේ ආර්ථිකයේ ළබැඳියාවන්ගේ විශාලම ගැටුම ඊයේ නිර්මාණය කළා; conflict of interest එකට, දූෂණයට දොර ඇරියා. ලොකුවට කථා කරලා 'සහස්දනව්' විදුලි බලාගාරය සඳහා PPA එකක් අත්සන් කළා, විදුලිය ඒකකයක් රුපියල් 20ට ගන්නවා කියලා. කැබිනට් එක එය pass කළා. හැබැයි ඒ, ඩොලරය රුපියල් 183ක් ලෙස ගණනය කරලායි. මම දැක්කා, ඊයේ විෂය භාර ඇමතිතුමාත් නැඟිටලා මොනවාදෝ තේරෙන්නේ නැති දෙයක් කියනවා. හැබැයි, අවසානයේදී PPA එක අත්සන් කළේ රුපියල් 45ටද කීයටද කියලා අපි අහන්න කැමැතියි. PUCSL එකෙන් කියනවා, unit එකක් රුපියල් 72ක් වෙනවා කියලා. මම අහනවා, ඉන්දියාවත් එක්ක ප්‍රදානයක් හරහා කරන්න යන Unique Digital Identity Card - UDI - Project එක කරන වෙලාවේ e-NIC එකත් කරන්න හදලා පොලිකාබනේට් කාඩ් මිලියන 15ක් ගන්න ටෙන්ඩරයක් දාලා තිබෙන්නේ ඇයි කියලා. ඒ එක පොලිකාබනේට් කාඩ් එකක් අඩුම ගානේ ඇමෙරිකානු ඩොලර් 2ක්වත් වෙනවා. ශත 20ත් ශත 50ත් අතර මුදලකට ගන්න පුළුවන් සාමාන්‍ය පී.වී.සී කාඩ් එකක්. අපිත් පිළිගන්නවා, Dr. Hans Wijesuriyaලා කරන්නේ හොඳ වැඩක් කියලා, සද්භාවයෙන් තමයි කටයුතු කරන්නේ කියලා. එහෙම නම්, මම අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට කියනවා, ඒ කාඩ් මිලියන 15 ටෙන්ඩර් එක දමන්න ඕනෑද නැද්ද, අපට පොලිකාබනේට් කාඩ් එකක් ඕනෑද, නැද්ද කියලා එතුමාගේ උපදේශක හාන්ස් විජයසූරිය මහතාගෙන් අහන්න කියලා. දූෂණයේ එක පැත්තක් විතරක් නොවෙයි, හැම පැත්තම බලන්න කියලා අපේ ගරු ජනාධිපතිතුමාට මම කියනවා. එහෙම නම්, නැවතත් පැලවත්තේ ideology එකට එනකොට මේ පටලැවිල්ල හරහා කොහේද යන්නේ කියලා කිසි කෙනෙක් දන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Give me two more minutes, Madam Chair.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
වැඩිපුර දීපු විනාඩි 2ත් එක්ක තමයි විනාඩි 10ක් දීලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට තවත් විනාඩි 2ක් දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමාට තව විනාඩි 2ක් දෙන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ස්තුතියි.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මාලිමාවේ කට්ට වටේට, වටේට, වටේට කරකැවෙනවා.

මා හිතමිත්‍ර අනුර ජනාධිපතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට කියනවා, අපේ ideology එක ගැන ප්‍රශ්න කරන්න කලින් තමන්ගේ ideology එක ගැන හිතලා බලන්න කියලා. අපට අපේ ideology එක බොහොම පැහැදිලියි. ගොඩහේවා ආවා; ගොඩහේවා ගියා. එච්චරයි කථාව.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතුමාට ඉන්න බැහැ අජිත් එක්ක.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒගොල්ලෝ අජිත් එක්ක නැහැ. අපරාදේ. මොකද, ගොඩහේවා හිටියේ නැත්නම් අපේ "The Blueprint" එක ඇත්තවශයෙන්ම සමාජගත කරන්න තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට දැන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, පැලවත්තෙන් ද ගොඩහේවා අපට එව්වේ කියලා. *[බාධා කිරීමක්]* පැලවත්තේ කුමන්ත්‍රණයකින් වාගේ තමයි ගොඩහේවා අපට එව්වේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගෝඨාභයත් එක්ක නේ හිටියේ, හුලංගමුව.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හුලංගමුව හිටියේ ගෝඨාභයත් එක්ක.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
හාන්ස් හිටියේ ගෝඨාභය එක්ක.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඔය තිබෙන්නේ. ඔය තිබෙන්නේ. කථා කරන්න වෙලාව නැති නිසා මට නවත්වන්න සිද්ධවෙලා තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
හුලංගමුව ගෝඨාභයගේ-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න. US tariff එක ගැන මෙතැන කථා නොකර ඉඳිමු. ඉන්දියාවට හිනා වෙන්න එපා හොඳේ. ඒ කට්ටිය වැටිලා ඉන්නකොට හිනා වෙන්න එපා. මොකද, අපි වැටිලා ඉන්නකොට අපට අත දුන්නේ ඒ මිනිස්සු විතරයි. There is one thing that I want to tell you: it ain't over till the fat lady sings. - *[Interruption.]* නැහැ, හිනා වෙනවා නේ. අපි දැක්කා නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඉන්දියාවට හිනා වෙන්න එපා. ඉන්දියාව හිතුවේ 15ට එයි කියලා. අපිත් හිතුවේ 15ට එයි කියලා තමයි. ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමනි, ඔබතුමා බලන්න, "වීරකේසරී" එකේ මගේ podcast එක. ජනාධිපතිතුමා කියනවා, මගේයි, බෲනෝගේයි පැය දෙකක podcast එකේ තප්පර 30ක කෑල්ලක් ගැන කථා කරලා මෙහෙම කිව්වාය කියලා. *[බාධා කිරීමක්]* අපි කැමැතියි ඉතින්, අපි කියන හැමදේම එතුමා අහගෙන ඉන්නවා නම්. ඔබතුමා දෙමළ නිසා වීරකේසරී එකට ගියපු එක කියවලා බලන්න, මම මොකක්ද කිව්වේ කියලා. *[බාධා කිරීමක්]* මම කිව්වේ ලංකාවට සියයට 15ත්, 20ත් අතර එන්න ඉඩ තිබෙනවා කියලා. ඒ නිසා නොදන්න දේවල් ගැන කථා කරන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.39]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මා මිත්‍ර හර්ෂ ද සිල්වා මැතිතුමාගෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලැබීම ඇත්තටම සතුටක්. ජනාධිපතිතුමා කථා කරනකොට අපි ඒ ගෞරවය ලබා දීලා අහගෙන හිටියා. එතුමාගේ කථාවේ මැද හරියේදී බාධා කිරීම සුදුසු නැති නිසා අපි කවුරුත් ඒ ගෞරවය දැක්වූවා. එතුමා ඉතා සුන්දර චිත්‍රයක් ඇන්දා; ආර්ථිකය ගැන ඉතාම සුන්දර චිත්‍රයක්. අන්දන්න ඉතින් හරි දක්ෂයි නේ. ඒක දිගටම කළා නේ. හැබැයි, එතුමා එහෙම කරලා අඳෝනාවක් කළා, ලොකු කුමන්ත්‍රණයක් තිබෙනවා කියලා. ඒ කුමන්ත්‍රණය ගැන විපක්ෂයට ඇඟිල්ල දිගු කළා. හැබැයි, ඒවා මොකුත් ඕනෑ නැහැ. අද newsවල යනවා, චිචීගේ රොකට් එක ගැන ඊයේ අගමැතිතුමිය කියපු දත්ත වැරැදියි කියලා. ඒක කියන්නේ වසන්ත සමරසිංහ. ඒ නිසා ජනාධිපතිතුමාට අපි කියනවා, ඔබතුමාගේ කණ්ඩායම තුළ තමයි කුමන්ත්‍රණය තිබෙන්නේ කියලා. ඔබතුමන්ලාගේ කණ්ඩායමේ ම අය එක එක වැරැදි දත්ත ගෙනැල්ලා එක එක්කෙනාට ගහනවා. අගමැතිනිය ඊයේ ඇවිල්ලා කිව්වා, ඩී.වී. චානක මන්ත්‍රීතුමාගේ කථාව හරි කියලා. එතකොට අද වසන්ත සමරසිංහ කියනවා, අගමැතිනියගේ ප්‍රකාශය වැරැදියි කියලා. බලන්න, ආණ්ඩුව ඇතුළේ තමයි ජනාධිපතිතුමාට තිබෙන ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ. ඒ කුමන්ත්‍රණ ටික විසඳා ගන්න කියලා කියන්න. අපෙන් කුමන්ත්‍රණ නැහැ. අපට හදිසියකුත් නැහැ. කරන්න බැරි වෙනකොට අපි ready, ගන්න. එච්චරයි අපි කියන්නේ.

ඇමෙරිකා එක්සත් ජනපදය පනවපු තීරුබදු ගැන කථා කරනකොට ඒක සියයට 20ට අඩු වීම ගැන අපට ඇත්තටම ලොකු සතුටක් දැනුණා. ඒ ගැන සතුටක් තිබෙනවා. මේ මෙහෙයුමට අපේත් උපරිම සහාය ලබා දුන්නා. මෙහිදී අපි, රජය, ජනාධිපතිතුමා, මුදල් අමාත්‍යාංශය, අනෙක් සියලු රාජ්‍ය නිලධාරින්, විශේෂයෙන්ම අපේ තානාපතිතුමා වන මහින්ද සමරසිංහ මැතිතුමා, ඒ කාර්ය මණ්ඩලය සහ සමාගම් ඇතුළු පෞද්ගලික අංශය විශාල මෙහෙවරක් කළා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
යූඑන්පීකාරයෙක් තමයි උදව් කළේ.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ඔව්, ඒ වාගේම තමයි. එතුමාත් -මහින්ද සමරසිංහ- අපි එක්ක හිටපු එක්කෙනෙක්. ඒ වාගේම පෞද්ගලික අංශය, JAAF එක ඇතුළු ඒ සමාගම් ඔක්කෝමත්, විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ කණ්ඩායමත් එකතුවෙලා රටක් හැටියට කටයුතු කරපු නිසා තමයි ඒ සියයට 20 තීරුබදු ප්‍රතිශතය ලබා දුන්නේ. අපි ඒ ගැන කුහක නැහැ. අපිට සතුටුයි. මේ අපේ රට. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මොන කොන්දේසිවලට යටත් වුණාද කියලා අපි තවම දන්නේ නැහැ. අපි ආණ්ඩුවට කියනවා, කොන්දේසිවලට යටත් වුණාද, නැද්ද කියලා හෙළි කරන්න කියලා. අපි ඇත්තටම ඉන්දියාවේ ස්ථාවරයට ගරු කරනවා. ඉන්දියාව යටත් වුණේ නැහැ, එක එක කොන්දේසිවලට. ඔවුන් බය වුණේත් නැහැ. ඔවුන් කෙළින් කිව්වා, මේ ගැන සාකච්ඡා කරනවා නම් අපේ ස්වෛරීත්වයට අත ගහන්න බැහැ කියලා. ඒක නම් ඇත්තටම අගය කරන්න ඕනෑ දෙයක්. අන්න එහෙම තමයි

සාකච්ඡාවලට යන්න ඕනෑ. You must never fear to negotiate and you must never negotiate out of fear as well. ඒක ඉතාම වැදගත්.

හැබැයි මතක තබා ගන්න, ඊයේ විදුලිබල පනතට සංශෝධනයක් ගෙනාවා. ඒකේ තත්ත්වය මොකක්ද? ඒකාධිකාරී, විනිවිදභාවයක් නැති, දේශපාලනීකරණයට ලක්වෙන ව්‍යුහයක් තමයි ගෙනාවේ. ඇත්තවශයෙන්ම ඒ තුළින් විදුලි මාෆියාව නැවත ස්ථාපනය වුණා කියන එක තමයි අපේ හැඟීම. එතකොට ඒක ප්‍රතිපායන සංශෝධනයක්. අපරාදේ. ජනාධිපතිතුමාට අපි කියනවා, LNG ව්‍යාපෘතිය සඳහා China Harbour Engineering Company එකට දුන් ටෙන්ඩර් එක ප්‍රසම්පාදන නීතිවලට අනුකූල නැහැ කියලා. ඒ ගැන සොයා බලන්න කියලා අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, JICA එක, ADB එක, ලෝක බැංකුව හා IFC එක පැහැදිලිව කිව්වා, ශ්‍රී ලංකා විදුලිබල පනතට සංශෝධන ටික ගෙනෙනවා නම් ඒකට ඒගොල්ලෝ විරුද්ධ වනවා කියලා. ඔවුන් අපට ලබා දෙන ණය, ආධාර සහ තාක්ෂණික උපදෙස් නතර කරනවා කිව්වා. ඒවා නැති වනකොට අපි කොහොමද බලශක්ති අංශය දියුණු කරන්නේ? තීරු බදුවලින් සියයට 20ක සහනය ලැබුණාට, අපේ විදුලි ගාස්තුව ලබන වසර වනකොට අනිවාර්යයෙන්ම වැඩි වනවා, මේ ව්‍යුහය තුළ. එතකොට අපේ වාසිය තරගකාරීත්වය නිසා නැවත අවාසියක් බවට පත් වෙයි කියන එක මේකෙන් අපට පැහැදිලිව පෙනී යනවා. මතක තබා ගන්න, සියයට 20ක තීරු බදු සහනයක් ගත්තා කියලා රට ඉස්සරහට යන්නේ නැහැ. ජනාධිපතිතුමා කිව්වා මාස තුනෙන් ඒකේ වාසිය දැනෙයි කියලා. එක්සත් ජනපදයට ගෙවිය යුතු තීරු බදු අඩු වෙලා තිබුණු කාලයේ, -2014 සිට 2024 දක්වා අවුරුදු 10ක්- ඩොලර් බිලියන 2.7ක අපි කරපු අපනයනය ඩොලර් බිලියන 3.2ට පමණයි වර්ධනය වුණේ. එම අවුරුදු 10ට ලංකාවේ අපනයනවල සියයට 18ක වර්ධනයක් පමණයි සිදු වුණේ. එතකොට තීරු බදු වැඩි වුණෙත් නැහැ. එම ප්‍රතිශතයේ තිබුණේ. හැබැයි බංග්ලාදේශය ගත්තාම, 2014 සිට 2024 දක්වා එක්සත් ජනපදයට ඔවුන් කළ අපනයනය ඩොලර් බිලියන 1.1 සිට ඩොලර් බිලියන 8.4ක් දක්වා වැඩි කළා. ඒ කියන්නේ, සියයට 700කින් වැඩි වීමක් කළා. ඒ නිසා බදුවලින් විතරක් මේක කරන්න බැහැ. ප්‍රශ්නය තීරු බදු නොවෙයි. ආර්ථික පරිවර්තනයක් විය යුතුයි; ආර්ථික ව්‍යුහය තුළ සුසමාදර්ශී වෙනසක් ඇති කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම විශ්වාස කරන්නේ නැහැ ජනතා විමුක්ති පෙරමුණට එහෙම ප්‍රතිපත්තියක්, සුසමාදර්ශී වෙනසක් කරන්න පුළුවන් හැකියාවක් තිබෙනවා කියලා. ආර්ථිකය සුන්දර තැනක තිබෙනවා නම් මම අහන්නේ මෙයයි. මෙම වසරේ ආර්ථික වර්ධන වේගය සියයට 3.9ට අඩු වනවා කියලා ආසියානු සංවර්ධන බැංකුව කියනවා. ආර්ථික වර්ධන වේගය සියයට 3.9ට අඩු වනවා; පසුගිය වසරට වඩා අඩු වනවා. අපේ රටේ ආර්ථික වර්ධන වේගය ඓතිහාසිකව සියයට 4.5ක තිබුණා. පසුගිය කාලය තිස්සේ ආර්ථික වර්ධන වේගය සියයට 4ක, සියයට 5ක පැවතුණා. ඒකට කවුරුවත් අවශ්‍ය නැහැ. ආණ්ඩුවකුත් ඕනෑ නැහැ. හැබැයි, "පොහොසත් රටක්" කරන්න නම්, සියයට 8 ඉක්මවා අපේ ආර්ථිකය වර්ධනය වෙන්න ඕනෑ. පුළුවන් නම් කියන්න, ආර්ථික වර්ධන වේගය සියයට 8 ඉක්මවයිද කියලා. "පොහොසත් රටක්" කරන්න පුළුවන්ද කියන්න. ඔබතුමන්ලාට ඒක කරන්න හයිය නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ණය ආපසු ගෙවන්න නම් ආර්ථික වර්ධන වේගය සියයට 8ට වඩා තිබෙන්න ඕනෑ. ඒ නිසා නිශ්චල, මූර්ත ආර්ථික සංවර්ධනයක් සඳහා ඉතිරි කිරීම් සහ ආයෝජන වැඩි විය යුතුයි. හැබැයි, අය වැයේම කිව්වාට වඩා වෙන් කළ ප්‍රාග්ධන වියදම් අඩු වෙලා තිබෙනවා. දැන් ශ්‍රී ලංකා මහ බැංකුවෙන්ම කියනවා, දැනට, මෙම වර්ෂයේ පළමු භාගයේ ප්‍රාග්ධන වියදම සියයට 8.6කින් අඩු වෙලා තිබෙනවා කියලා. එතකොට කොහොමද ආර්ථික වර්ධන වේගය වැඩි වෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පොදු ජනයාට මේ ඉලක්කම්වලින් වැඩක් නැහැ. මම ජනාධිපතිතුමාට මේ කාරණය මතක් කරනවා. ඔබතුමා පළමුව බලන්න මේක. ඔබතුමා විදුලි ගාස්තුව අඩු කරනවා කිව්වා. ජනතාව ඒක බලාපොරොත්තු වුණා. හැබැයි, ඔබතුමා IMF එකේ ගිවිසුමට යටත් වෙලා රුපියල් කෝටි 18,600ක පරණ ණයක්, ලංකා විදුලිබල මණ්ඩලය ගත්ත ණයක් පොදු ජනයාගේ බිලට එකතු කරලා මාසිකව ගෙවන්නට ඇතුළත් කරලා තිබෙනවා, විදුලි බිලත් එක්ක. ඒක ජනතාවට බරක්. ඒක කොහෙදෝ තිබුණු ණයක්. කලින් කිව්වේ, ඒවා හොරකම් කරපුවා කියලා නේ. එතකොට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් මිලදී ගන්නා පෙට්‍රල්, ඩීසල් හා භූමිතෙල්වලට හැම පාරිභෝගිකයෙකුම රුපියල් 50ක් වැඩිපුර ගෙවනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කාරණය කියලා මම කථාව අවසන් කරනවා.

VAT එක වැඩි කරලා ජනතාව හරහාම මේ වසරේ පළමු භාගයේ සියයට 28කින් එකතු කරන බදු ප්‍රමාණ වැඩි කරලා තිබෙනවා. ආදායම වැඩි වෙලා තිබෙනවා. හැබැයි, ඒ ආදායම අරගෙන තිබෙන්නේ පොඩි මිනිස්සු මිරිකලා. ඒක වැරදියි. ඒක ජනාධිපතිතුමාට අපි මතක් කරන්න ඕනෑ. ජනතාවගේ සාක්කුවෙන් ගන්නා බදු මුදල්වලින් තමයි ඔබතුමා මේ ආණ්ඩුව කරගෙන යන්නේ. විදේශ ආයෝජනවලට තවත් බදු සහන දෙන්න ඕනෑ කියලා ජනාධිපතිතුමා කිව්වා. Barriers විවෘත කරන්න ඕනෑ කිව්වා. හැබැයි, මේ රටේ කුඩා සහ මධ්‍ය පරිමාණ අංශය කඩා වැටිලා තිබෙන අවස්ථාවේ ඒගොල්ලන්ට අවශ්‍ය පහසුකම් තවම දීලා නැහැ.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් විනාඩි දෙකක් මට ගන්න කිව්වා. ඒ කාලයත් එක්ක ගත්තොත් විනාඩි 6යි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථික ලැයිස්තුව අනුව ඔබතුමාට ලබා දී තිබෙන්නේ විනාඩි 4යි, ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 4.47]

**ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රටේ ආර්ථික තත්ත්වයත්, වර්තමාන ආණ්ඩුවේ ප්‍රගතිය සම්බන්ධවත් අද ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා විශේෂ ප්‍රකාශයක් කළා. එතුමා අද කළ ප්‍රකාශයත්, එතුමා ජනාධිපතිවරයා බවට පත් වීමෙන් පස්සේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කළ රාජාසන කථාවත්, ඒ වාගේම එතුමා කළ අය වැය කථාවත් බලනකොට එම කථාවල ලොකු වෙනස්කමක් නැහැ කියලා තමයි මට මේ අවස්ථාවේදී කියන්න තිබෙන්නේ. මොකද, එදා එතුමා මේ විධියේම කථාවක් කරලා මේ රටේ ජනතාවට ආර්ථික වශයෙන් ලබා දෙන සහන ගැන, එතුමන්ලා ඒ කාලයේ වෙච්ච පොරොන්දු ගැන නොයෙකුත් ආකාරයේ අදහස් උදහස් පළ කළාය කියලා අපි දන්නවා. එතුමා මාස 9කට පස්සේ අද මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලාත් ඒ ප්‍රකාශයම කරනවා. ඉතින්, අපට එතුමාගෙන් අහන්න තිබෙන්නේ මේ රටේ ජනතාවට මෙතෙක් කල් එතුමා ලබා දුන් පොරොන්දු ඉෂ්ට කෙරුවාද, අපේ ජනතාවට ආර්ථික වශයෙන් යම්කිසි ප්‍රගතියක්, යම් කිසි වාසියක් අත් කර දුන්නාද කියන එකයි. ජනාධිපතිවරණයට ඉස්සරවෙලා මේ රටේ ජනතාවට ලබා දුන් පොරොන්දු පිළිබඳව අපි දන්නවා. මේ රටේ ආර්ථිකය හදන හැටි, ජනතාවට විදුලි බිල අඩු කරන හැටි, අනෙකුත් සහන දෙන හැටි ගැන නොයෙකුත් ආකාරයේ පොරොන්දු ලබා දුන්නා. නමුත් කියන්න කනගාටුයි, අද ජනාධිපතිතුමා එදා වෙච්ච පොරොන්දු ගැන, ජනතාවට දෙනවාය කියපු සහන ගැන, දෙනවාය කියපු දේවල් ගැන කිසිම අදහසක් මෙතැනදී ප්‍රකාශ කළේ නැහැ.

විශේෂයෙන්ම, ඊයේ පෙරේදා මේ රටේ විශාල කැසිනෝ ව්‍යාපාරයක් ආරම්භ කරලා, ජනාධිපතිතුමා ඒක විවෘත කරන්න ප්‍රධාන ආරාධිත අමුත්තා හැටියට ගිහිල්ලා හිටියා, අපි දැක්කා. එතුමා ජනාධිපති වෙන්න ඉස්සරවෙලා මේ පාර්ලිමේන්තුවේම කථා කරපු දේවල්, කැසිනෝ ව්‍යාපාරය සම්බන්ධව කරපු විවේචන අපට මතකයි. මේ රටේ ආණ්ඩුවට මුදල් සොයාගන්න බැරිවෙනකොට, වෙනත් ආයෝජන එන්නේ නැතිවෙනකොට ජනාධිපතිතුමා කල්පනා කරන්නේ කැසිනෝ ව්‍යාපාරයෙන් රටේ ආර්ථිකය හදන්න කියලා එදා කිව්වා. එහෙම තමයි එවකට හිටපු ජනාධිපතිතුමාවත්, එවකට හිටපු අගමැතිතුමාවත් එදා විවේචනය කළේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කැසිනෝ ව්‍යාපාරය තුළින් මේ රටේ ආර්ථිකය හදන්න, ගමේ ඉන්න අර සූදුකාර මුදලාලිලා, සූදු මෙහෙයවන මුදලාලිලාගේ තත්ත්වයට තමයි ආණ්ඩුව පත් වෙලා තිබෙන්නේ කියලා එදා කිව්වා. ගමේ සූදු කෙළින මුදලාලි, එහෙම නැත්නම් සූදු මෙහෙයවන්නා තෝන් ගන්නවා වාගේ වැඩ පිළිවෙළක් තුළින් තමයි මේ කැසිනෝ ව්‍යාපාර හරහා ආණ්ඩුව රටේ ආර්ථිකයට යම් කිසි දායකත්වයක් ගන්න උත්සාහ කරන්නේ කියලා එදා කිව්වා. එහෙම කියපු ජනාධිපතිවරයා අද කැසිනෝ ව්‍යාපාරයක් විවෘත කරන ප්‍රධාන ආරාධිතයා බවට පත් වෙලා තිබෙනවා. එදා රටේ සදාචාරය නැති වෙනවාය කිව්වා, දුරාචාරය ඇති වෙනවාය කිව්වා, මත් ද්‍රව්‍ය එනවාය කිව්වා. නොයෙකුත් ආකාරයේ දේවල් කියලා තමයි මේ රටේ කැසිනෝ ව්‍යාපාරය විවේචනය කෙරුවේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමා කැසිනෝ ව්‍යාපාරය ගැන එදා එහෙම විවේචනය කරලා අද එතුමා ඒකේ ප්‍රධාන අමුත්තා හැටියට ඒක විවෘත කරන්න ගිහින් තිබෙනවා. ඉතින්, අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ කැසිනෝ ව්‍යාපාරය සම්බන්ධව අද බරපතළ සැකයක් තිබෙනවා, මේ ව්‍යාපාරයට ලැබුණු මුදල් ආයෝජනය කොච්චරද කියලා. ඒ වාගේම කොච්චර බදු ප්‍රතිශතයක් ගෙවලාද මේක ආරම්භ කෙරුවේ කියලා. අද රටේ ලොකු කථාබහකට ලක් වෙලා තිබෙනවා, කුමන ආකාරයෙන් කුමන පදනමක් මතද මේ කැසිනෝ ව්‍යාපාරය ලබා දෙන්න කටයුතු කෙරුවේ කියලා. මේවාට ලැබුණු ආයෝජන කොච්චරද, ලබා ගත් බදු ප්‍රතිශතය කොච්චරද කියන එක සම්බන්ධව විධිමත්ව, විනිවිදභාවයෙන් කථා කරන්න කියලා අපි ජනාධිපතිතුමාට මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, තව එක් කාරණාවක් පමණක් කියලා මගේ කථාව අවසන් කරන්නම්. විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි පවුල් දහස් ගණනකට බලපාන පුංචි ප්‍රශ්නයකුත් මම මේ අවස්ථාවේදී මතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ ප්‍රශ්නය මේකයි. අවිස්සාවේල්ල නගරයට සමීපව කෑගලු දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම සේවා වසම් 7ක්, 8ක් විතර තිබෙනවා. මේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉන්න ජනතාව මෙතෙක් කල් තමන්ගේ පොලීසියේ රාජකාරි කටයුතු, ඒ අවශ්‍යතා හැම එකක්ම ඉෂ්ට කරගත්තේ අවිස්සාවේල්ල මූලස්ථාන පොලීසිය හරහායි. ඊයේ පෙරේදා ආණ්ඩුව ගත්ත තීන්දුවත් එක්ක දෙහිඕවිට ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ අවිස්සාවේල්ලට ආසන්නයේ තිබෙන ග්‍රාම නිලධාරි වසම් 7ක පවුල් දහස් ගණනකට නැවත වරක් ඒ රාජකාරි කරගන්නට දෙහිඕවිට පොලිස් ස්ථානයට යන්න සිද්ධ වෙලා තිබෙනවා. මේක බරපතළ ප්‍රශ්නයක්. මේ නිසා ඒ ජනතාව දැඩි අපහසුතාවට පත් වෙලා ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ නිසා ඔබතුමියත් මැදිහත් වෙලා, රජයේ වගකිවයුතු මැති ඇමතිවරු ඉන්නවා නම් අනිවාර්යයෙන්ම මේක වෙනස් කරන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. නැත්නම් මේකෙන් ජනතාවට ප්‍රශ්නයක් වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා. කථාව අවසන් කරන්න.

**ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මට තව තත්පර 20ක් ලබා දෙන්න, තව එක් කාරණාවක් විතරයි කියන්න තිබෙන්නේ.

අපට දැනගන්න ලැබුණු හැටියට සීතාවක කොට්ඨාසයේ SSP මහත්තයා, ASP මහත්තයා ඔවුන්ගේ කාර්යාල පවත්වාගෙන ගියේත් අවිස්සාවේල්ල මූලස්ථාන පොලීසියේයි. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? දැන් අපට ආරංචි වෙලා තිබෙනවා ඒ කාර්යාලත් දෙහිඕවිටට ගෙනයන්න හදනවා කියලා. දෙහිඕවිටට ගෙනයන්න හැදුවොත්, ඒ සඳහා කුලිය රුපියල් ලක්ෂ 20ක්ද කොහෙද වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ආණ්ඩුව කියන්නේ වියදම් කපනවා, නාස්තිය අඩු කරනවා කියලා නේ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ කරන ක්‍රියාදාමය නිසා පොලීසියේ වියදම දෙගුණයක් වෙලා තිබෙනවා. රුපියල් ලක්ෂ 20ක විතර මුදල් ප්‍රමාණයක් වියදම් කරන්න වෙනවා මේ සඳහා කුලියට ගන්නා ගොඩනැගිල්ලට. ඉතින්, මේක වහාම නතර කරන්න කටයුතු කරන්න කියලායි මම ඉල්ලා සිටින්නේ. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.52]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

நன்றி, வணக்கம். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாட்டின் தற்போதைய பொருளாதார நிலைமை சம்பந்தமான ஒத்திவைப்பு பிரேரணைமீதான விவாதத்திலே கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகிறேன். இன்று காலை இந்த விடயம் தொடர்பில் மிகவும் முக்கியமான கருத்துகளை மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் இந்தச் சபையில் மிகத் தெளிவாகக் கூறியிருந்தார். அவரது உரைக்குப் பிறகு எதிர்க்கட்சியினருடைய கருத்துகளைச் செவிமடுக்கின்றபோது வேடிக்கையாக இருக்கின்றது. அவர்கள் வழமையாகச் சுமத்துகின்ற குற்றச்சாட்டுக் களைத்தவிர, வேறேதும் தர்க்க ரீதியான குற்றச்சாட்டுக்களை முன்வைக்கிறார்களா எனத் தேடிப்பார்த்தால், அப்படி எதுவும் கிடையாது. குறிப்பாக, எங்களுடைய நாடு பொருளாதார ரீதியில் நெருக்கடியான நிலையில் இருந்த நாடு என்பது எங்கள் எல்லோருக்குமே தெரியும். அந்த நெருக்கடியிலிருந்து எல்லா வகையிலும் ஓரளவு நிலையான இடத்துக்கு இன்று நாங்கள் எமது நாட்டைக் கொண்டுவந்து இருக்கின்றோம். இந்த நாடு எங்களுக்குக் கிடைக்கின்றபோது, பொருளாதார ரீதியாக எப்படி இருந்தது, இன்றைக்கு எவ்விடத்துக்கு வந்திருக்கின்றது என்பதை நாங்கள் அவதானிக்க வேண்டும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எமது நாடு எங்களுக்குக் கிடைப்பதற்கு முன்னர் வங்குரோத்தடைந்த நாடென உத்தியோகபூர்வமாக அறிவிக்கப்பட்ட நாடு! சாதாரணமாக LCஐ open பண்ணி எங்களுடைய செயற்பாடுகளை முன்னெடுக்க முடியாதிருந்த நாடு! அனைத்து வங்கிகளும் தளம்பல் நிலையில் இருந்த நாடு! அனைத்து நிதி நிறுவனங்களும் செயலிழந்துபோயிருந்த நாடு! இறக்குமதிகளுக்காக டொலர் இல்லாது தவித்த நாடு! எண்ணெய் இறக்குமதிக்குப் போதுமான நிதியைப் - டொலரைப் - பெற்றுக்கொள்ள முடியாதிருந்த நாடு!

அந்த வகையில், பொருளாதார ரீதீயாக அனைத்து வழிகளிலும் செயலிழந்து போயிருந்த நாடாக இந்த நாடு இருந்தது. மறுபுறம், நாட்டில் நடைபெற்றுவந்த உற்பத்தித்துறைகள், கட்டுமானத்துறைகள் என அனைத்தும் தடைப்பட்டு இருந்தன. கடன் வாங்கி நாட்டில் பல்வேறு கட்டுமானங்களை அல்லது செயற்றிட்டங்களை முன்னெடுக்க முடியாமல் இருந்த ஒரு நாடாகத்தான் எமது நாடு இருந்தது. இந்த நாடு வங்குரோத்து அடைந்த நாடு என்றும் இந்த நாட்டுக்குக் கடன் கொடுக்க முடியாது என்றும் பெற்ற கடனைத் திருப்பிச் செலுத்த முடியாத நிலையில் நாடு இருக்கின்றது என்றும் கூறி தங்களுடைய செயற்றிட்டங்களை இங்கு செயற்படுத்த மாட்டோம் என்று சர்வதேச நாடுகள் எம்மைக் கைவிட்டுச் சென்றன. அத்தகைய ஒரு நாடுதான் எங்களுக்குக் கிடைத்தது கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே!

எதிர்க்கட்சியினர் எதைச் சொன்னாலும்கூட, இன்றைக்கு நாங்கள் இந்த நாட்டைத் திரும்பிப் பார்க்கின்றபோது, நாடு பல வகைகளிலும் முன்னேறி இருப்பதைக் காணலாம். இன்று எதிர்க்கட்சியினர் எங்கள் மீதான விமர்சனங்களை முன்வைப்பதற்கான பிரதான காரணத்தை நாங்கள் தேடிப்பார்க்கின்றபோது அது வேறெதுவுமல்ல, கடந்த 76 வருட வரலாற்றிலே அவர்கள் இந்த நாட்டுக்குச் செய்த அநீதியை நாங்கள் தட்டிக் கேட்பதுதான். அந்த வகையில், இந்த நாட்டைக் கொள்ளை அடித்தவர்கள்மீது, இந்த நாட்டில் இலஞ்ச, ஊழல், மோசடியைக் கொடிகட்டிப் பறக்கச் செய்து அதன்மூலமாக நாட்டைச் சூரையாடியவர்கள்மீது சட்டம் பாய்கின்றது. அவ்வாறு அவர்கள்மீது சட்டம் பாய்கின்றபோது அதிலிருந்து தப்பித்துக் கொள்வதற்காக எங்களுக்கு எதிராகப் பேசுவதைத் தவிர, வேறு எந்தவிதமான வேலைத் திட்டத்தையும் செய்யமுடியாதவர்களாக அவர்கள் இருக்கின்றார்கள்.

நான் யாழ்ப்பாணத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்றவன் என்ற வகையில், இன்று யாழ்ப்பாணத்தை எடுத்துக் கொண்டால், அங்கு பாரிய பொருளாதாரப் பிரச்சினை இருக்கின்றது. அதற்கான முக்கிய காரணம், கடந்த 30 வருடங்களுக்கும் மேலாக நடைபெற்ற யுத்தம் என்பது எங்கள் எல்லோருக்கும் தெரியும். ஆனால், யுத்தம் முடிவடைந்து 17வருடங்களாகி விட்டன. தற்போதுள்ள நிலைமையை நாங்கள் பார்க்கின்றபோது, இன்று எங்களுடைய வட மாகாணம்தான் இலங்கையில் கூடுதலாக வறுமையால் பாதிக்கப்பட்ட மாகாணமாக மாறியிருப்பதைக் காணலாம். அந்த வகையில், வட மாகாணத்தைக் கட்டியெழுப்ப வேண்டிய தேவையிருக்கின்றது.

கடந்த காலங்களில் இந்த நாட்டில் பாரிய போராட்டம் முன்னெடுக்கப்பட்ட ஒரு பிரதேசமாகவும் வட மாகாணம் காணப்பட்டது. அதுமாத்திரமல்ல, கடந்த காலங்களில் இந்த நாட்டிலிருந்த அனைத்து அரசாங்கங்களும் சகல அநீதிகளையும் கட்டவிழ்த்து விட்டது எங்கேயென்றால், வேறு எங்குமல்ல, வடக்கை நோக்கித்தான். அது 1981ஆம் ஆண்டு யாழ்ப்பாண நூலக எரிப்பை எடுத்துக்கொண்டாலும் சரி, 1983ஆம் ஆண்டு யூலைக் கலவரத்தை எடுத்துக்கொண்டாலும் சரி! சகல வழிகளிலும் அந்தப் பிரதேசங்களை முன்னேற்றுவதற்குப் பதிலாக, அங்கு வாழுகின்ற இளைஞர்கள், யுவதிகள்மீது நம்பிக்கையைக் கட்டியெழுப்புவதற்குப் பதிலாக அவர்கள்மீது வன்முறைகள் கட்டவிழ்த்து விடப்பட்டன. அந்த வன்முறைகள் இறுதியாக யுத்தமாக மாறியது. இலட்சக்கணக்கான உயிர்களை, கோடிக்கணக்கான சொத்துக்களை இழந்த மக்களாக இப்போது அவர்கள் அங்கு வாழ்ந்து வருகின்றார்கள். அந்தப் பிரதேசங்களில் உள்ள வீதிகள்கூட புனர்நிர்மாணம் செய்யப்படவில்லை. அதாவது, எந்த விதமான அபிவிருத்திகளும் அங்கு முன்னெடுக்கப்படாமல் சகல செயற்பாடுகளும் செயலிழந்து போயிருக்கின்றன. இந்த நிலையில், வடக்கை நோக்கி அனைத்து விதமான செயற்பாடுகளையும் முன்னெடுப்பதற்கு இன்றைக்கு எங்களுடைய அரசாங்கம் தீர்மானித்துள்ளது. அந்த வகையில், அங்கு அனைத்து வேலைத்திட்டங்களுக்கான அடித்தளங்களை யும் இட்டிருக்கின்றோம்.

விசேடமாக நாங்கள் ஒரு விடயத்தைச் சொல்லிக்கொள்ள வேண்டும். மலையக மக்களை எடுத்துக்கொண்டால், அவர்கள் ஒரு நாள், இரண்டு நாள் அல்ல, 200 வருடங்களுக்கும் மேலாக ஏமாற்றப்பட்ட, வஞ்சிக்கப்பட்ட மக்களாவர். அந்த வஞ்சனையில் இருந்து அவர்களை மீட்டெடுக்க வேண்டிய பொறுப்பு எமக்கிருக்கின்றது. அதன் முதற்கட்டமாக, இந்த நாட்டில் செயலிழந்து போயிருக்கின்ற பொருளாதாரத்தை நிலைநிறுத்திக் கொள்ளவேண்டிய தேவை இருக்கின்றது. அதற்காக எங்களுடைய அரசாங்கம் கடந்த பத்து மாதங்களில் பலவிதமான செயற்பாடுகளை முன்னெடுத்திருக்கின்றது.

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

அரசாங்கத்தின்மீது எங்களுக்குத் திடமான நம்பிக்கை இருக்கின்றது. அந்த நம்பிக்கையின் அடிப்படையில் நாங்கள் செயற்படுவோம். நாட்டு மக்களுக்கு மானியம் வழங்க வேண்டுமா? நிவாரணம் வழங்க வேண்டுமா? மக்களுடைய வாழ்க்கையை மேம்படுத்த வேண்டுமா? இவை அனைத்தையும் செய்வதென்றால், கடந்த காலம் முழுவதும் நாசமாக்கப்பட்ட இந்த நாட்டை நல்வழிப்படுத்த வேண்டும். அந்தச் செயற்பாட்டை தேசிய மக்கள் சக்தி அரசாங்கம் முன்னெடுத்து வருகின்றது. இந்த இடரிலிருந்து நிச்சயமாக நாடு படிப்படியாக முன்நோக்கி நகர்வதற்கான நம்பிக்கைக் கீற்றுக்களே தென்படுகின்றன. அந்த வகையில், நாட்டு மக்கள் எதிர்பார்க்கின்ற - எதிர்க்கட்சிகள் அல்ல - அனைத்துச் செயற்பாடுகளையும் நிச்சயமாக செவ்வனே செய்வதற்கு எங்களுடைய அரசாங்கம் முன்வரும் என்பதைக் கூறிக்கொண்டு விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.00]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! நாட்டினுடைய பொருளாதார நிலை சம்பந்தமாக மாண்புமிகு ஜனாதிபதி அவர்களும் இங்கு உரையாற்றியிருந்தார். ஏதோ மிகவும் கஷ்டப்படுகின்ற நிலையில் காணப்படுகின்ற நாட்டைத் தாங்கள் கட்டியெழுப்புகின்ற அடிப்படையிலேதான் இன்று ஆளும் தரப்பில் இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் பேசிக்கொண்டு இருக்கின்றார்கள். அந்த அடிப்படையில் பார்க்கின்றபொழுது, அவர்கள் எந்தப் பக்கத்தில் இருந்து பேசுகிறார்கள் என்ற கேள்வி எழுகின்றது. குறிப்பாக, இங்கு பேசுகின்ற பாராளுமன்ற உறுப்பினர்கள், அமைச்சர்கள் எல்லோரும் சென்ற ஜனாதிபதித் தேர்தலின்பொழுது அல்லது பாராளுமன்றத் தேர்தலின்பொழுது 24 மணித்தியாலத்துக்குள் இந்த நாட்டிலே ஒரு பாரிய மாற்றத்தை ஏற்படுத்துவதாகச் சொல்லித்தான் ஆட்சிக்கு வந்தவர்கள். இவர்கள் ஆட்சிக்கு வந்து 9 மாதங்கள் கடந்தும், இன்று எதிர்க்கட்சியினரைப் போன்று பேசுகின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது.

இன்று எதிர்க்கட்சியில் இருக்கின்ற உறுப்பினர்கள் அரசாங்கத்தைக் குழப்புகின்ற விடயங்களை முன்வைக்கின்றார்கள் என்று சொல்கின்ற இவர்கள் அன்று எதிர்க்கட்சியில் இருக்கின்றபொழுது என்ன விடயங்களைச் செய்தார்கள் என்பதை நாங்கள் யோசிக்க வேண்டும். அன்று நல்ல அபிவிருத்திச் செயற்பாடுகளை முன்னெடுக்கின்ற பொழுது குழப்பங்களை மேற்கொண்டவர்கள், ஆர்ப்பாட்டம் நடத்தியவர்கள் இன்று சொல்கின்றார்கள், எதிர்க்கட்சியினர் எல்லாவற்றையும் குழப்பிக்கொண்டு இருக்கிறார்களென்று. அன்று தொழிற்சங்கங்களைக்கூட தங்களுடைய இலாபத்துக்காகப் பயன்படுத்தியவர்கள் இன்று சொல்லுகின்றார்கள், எதிர்க்கட்சியினர் தங்களை விமர்சிக்கின்றார்கள் என்று. இன்று நாங்கள் எதிர்கட்சியில் இருந்தாலும், புதிய அரசாங்கம் என்ற அடிப்படையிலே உங்களை மதித்து, உங்களுக்கான கால அவகாசங்களைத் தந்து எங்களுடைய செயற்பாடுகளை முன்னெடுக்கின்றோம். இந்த நிலையில் இன்று நீங்கள் இருந்திருந்தால், வீதிகளில் இறங்கி ஆர்ப்பாட்டம் செய்திருப்பீர்கள்! வீடுகளை உடைத்திருப்பீர்கள்! எத்தனையோ பிரச்சினைகளை ஏற்படுத்தியிருப்பீர்கள்! ஆகையால், இந்த விடயங்களைக் கருத்திற்கொண்டு தயவுசெய்து நீங்கள் எதிர்க்கட்சி போன்று செயற்படாமல் அரசாங்கத்தைப் போன்று செயற்படுங்கள் என்று இந்த இடத்திலே கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.03]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට කථා කරන්න කාලය ප්‍රමාණවත් නොවන නිසා මම දෙමළ භාෂාවෙන් කථා කරන්නම්.

டொனால்ட் டிரம்ப் அவர்கள் இந்த நாட்டுக்கு எதிராக ஒரு வரி விதித்தி ருக்கின்றார். ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ තීරු බද්ද සාමාන්‍ය තීරු බද්දක් නොවෙයි. මේ ලෝකයේ තිබෙන බලවත් රටවල් විසින් ආසියා පැසිෆික් කලාපයේ තිබෙන බලවත් රටවල් යටපත් කර ගැනීම සඳහා ප්‍රකාශ කරන ලද ආර්ථිකමය යුද්ධයක්, මේක. ඒක තමයි ඇත්ත. ඒක නිසා තමයි එතුමා මූල්‍යමය, mathematical formula එකක් හැදුවේ. එතුමා මෙරටට සියයට 44ක තීරු බද්දක් දාලා දැන් එය සියයට 20ට අඩු කරලා තිබෙනවා. එය අඩු කරලා තිබෙන ක්‍රමය මේකයි. "Certain foreign trading partners identified in Annex I.." - ලංකාවත් එතැන තිබෙනවා - "..to this order have agreed to, or are on the verge of concluding, meaningful trade and security agreements with the United States." අනිවාර්යයෙන්ම අපට මේ වෙළෙඳ ගිවිසුම යටතේ ආපහු ලබා දෙන්න දෙයක් නැහැ. අපි ඒගොල්ලන්ගෙන් ඩොලර් බිලියන 3ක් අරන් තිබුණත්, ඒගොල්ලන්ට ලංකාවෙන් ලැබෙන්නේ ඩොලර් මිලියන 386යි. එතකොට මේ ඩොලර් බිලියන 3.6ක පරාසය - පරතරය - අඩු කර ගන්න ඒගොල්ලන්ගේ LNG එක ගත්තත් ප්‍රමාණවත් වන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙතැනදි වෙලා තිබෙන්නේ මෙයයි. අපි, අපගේ ආරක්ෂාව යම් කිසි ආකාරයකින් යටපත් කළා.

அது நிச்சயமாக இந்த நாட்டில் வசிக்கின்ற முஸ்லிம்களுடைய பாதுகாப்பு சம்பந்தமான விடயம்! அமெரிக்காவுடைய proxiesஆக, dummiesஆக, பிரதிநிதிகளாக இருக்கின்ற Israel defence forces இந்நாட்டுக்கு வருவதற்கான சந்தர்ப்பத்தைப் பெற்றுக்கொள்வதற்காக இந்த அரசாங்கம் எங்களைக் காவுகொடுத்து இருக்கின்றது. நீங்கள் முஸ்லிம்களுடைய பாதுகாப்பை அடகுவைத்துத்தான் அமெரிக்கா விதித்த வரியை 20 சதவீதமாகக் குறைத்திருக்கிறீர்கள். அதை நீங்கள் இங்கு சொல்ல வேண்டும்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Madam, please give me half a minute.

அமெரிக்காவுடன் மேற்கொண்டுள்ள பாதுகாப்பு உடன்படிக்கையின்போது, இந்த அரசாங்கம் இலங்கை முஸ்லிம்களுடைய பாதுகாப்புச் சம்பந்தமாக ஏதாவது விட்டுக்கொடுப்பைச் செய்திருக்கிறதா? எனக் கேட்டு அமர்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.06]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டுக்குப் பாரியளவு வருமானத்தைப் பெற்றுத்தருகின்ற உல்லாசப் பிரயாணத்துறை சார்ந்த இடங்களாக இருக்கின்ற அறுகம்பை, சர்வோதயபுரம், கொட்டுக்கல், Whisky Point போன்ற இடங்களுக்குச் சரியான முறையில் மின்சாரம் வழங்கப்படுவதில்லை. அதுமாத்திரமன்றி, இரண்டு மணி நேரம் மாத்திரமே குடிநீர் வழங்கப்படுகின்றது. இவை உள்ளிட்ட பல்வேறு பிரச்சினைகளை அங்குள்ள மக்கள் எதிர்நோக்குகிறார்கள். இதனால் இந்த நாட்டின் வருமானத்தில் பாதிப்பு ஏற்படுகின்றது. அங்கு இஸ்ரேலியர்களின் வருகை அதிகரித்துள்ளதுடன், 'சபாத் ஹவுஸ்' என்ற மதஸ்தாபனமும் அமைக்கப்பட்டு இருக்கின்றது. எந்தவித அனுமதியும் இல்லாமல் அமைக்கப்பட்டு இருக்கின்ற இந்த மதஸ்தாபனத்தின் செயற்பாடுகள் கட்டுப்படுத்தப்பட வேண்டும். இந்த நாட்டுக்கு உல்லாசப் பயணிகளாக வருகின்ற அவர்கள், அங்கு வியாபாரம் உட்பட இன்னோரன்ன வேலைகளையும் செய்துகொண்டு இருக்கின்றார்கள். அங்கு இன ஒற்றுமை சீர்குலைக்கப்படாமல் சுற்றுலாத்துறை மேம்படுத்தப்பட வேண்டுமென்ற திறந்த கொள்கையுடனேயே நாங்கள் இருக்கின்றோம்.

எமது பிரதேசத்தில் 1985ஆம் ஆண்டு உருவாக்கப்பட்ட மின்சார சபை அலுவலகம் இன்றும் வாடகைக் கட்டிடத்திலேயே இயங்கிக்கொண்டு இருக்கின்றது. இன்று 40 ஆண்டுகளைக் கடந்திருந்திருக்கின்ற நிலையில், அதற்குரிய கட்டிடத்தை அரச காணியில் அமைப்பதற்கு அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டும். அங்குள்ள மின்பாவனையாளர்கள் மாதாந்த மின் கட்டணத்தை பொத்துவிலிலுள்ள மின்சார சபைக் காரியாலயத்தில் செலுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும். புதிய மின் இணைப்புக்கான 500க்கும் அதிகமான விண்ணப்பங்கள் தேக்க நிலையில் காணப்படுகின்றன. அந்த மின் இணைப்புக்கள் விரைவாக வழங்கப்பட வேண்டும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எமது பகுதியில் உல்லாசப் பிரயாணத்துறைக்குப் பெயர்போய் இருக்கின்ற காணி உரிமையாளர்களுக்கு அளிப்புப் பத்திரங்களை வழங்குவதற்கு விரைவாக நடவடிக்கை எடுக்கப்பட வேண்டும். அந்தப் பிரதேசத்தில் 300 ஹோட்டல்களும் 3,000 அறைகளும் இருக்கின்றன. எனினும், எந்தவித ஆவணங்களும் இல்லாமையால் அவற்றை Sri Lanka Tourism Development Authorityஇல் பதிவுசெய்ய முடியாமல் அவர்கள் கஷ்டப்படுகின்றார்கள். இந்த நிலைமை நீக்கப்பட வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். அதுமாத்திரமல்ல, எங்களுடைய பிரதேசத்தில் அறுகம்பை, கொட்டுக்கல், Whisky Point போன்ற இடங்களில் போக்குவரத்து செய்வதற்கு ஒழுங்கான பாதைகள் இல்லாமையால் உல்லாசப் பிரயாணிகள் கஷ்டப்படுகின்றார்கள்.

குறிப்பாக, குடாக்கள்ளியில் அமைந்திருக்கின்ற ஒரு வீதியும் light houseக்குச் செல்கின்ற வீதியும் புனரமைக்கப்பட வேண்டும். வீதி அபிவிருத்தி அதிகாரசபையானது வீதிகளை அபிவிருத்தி செய்யும்போது, வீதிகளின் நடுவில் மின்சாரத் தூண்கள் இருக்கும் நிலைமையை இல்லாமல் செய்ய வேண்டுமென நாங்கள் பல தடவை கோரிக்கை விடுத்திருக்கின்றோம். அதன்போது, அதற்கான கட்டணத்தைச் செலுத்துமாறு நாங்கள் பணிக்கப்படுகின்றோம். நாவிதன்வெளியிலுள்ள வீதி, பொத்துவில் அல்-இர்பான் தேசிய பாடசாலைக்கு முன்னாலுள்ள வீதி எனப் பல வீதிகளிலுள்ள இவ்வாறான மின்சாரத் தூண்களை அகற்றவேண்டிய தேவை இருக்கின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எங்களுடைய பிரதேசத்தில் அமைக்கப்பட்டுள்ள 'சபாத் ஹவுஸ்'ஐ மூடவேண்டுமெனவும், அங்கு இன ஒற்றுமையை ஏற்படுத்தி, வருமானத்தை அதிகரிப்பதற்குரிய முயற்சிகளை மேற்கொள்ள வேண்டுமெனவும் கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.09]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු ජනාධිපතිතුමා කණ්ඩායම් රැස්වීමේ කියන්න තිබෙන දේවල් මේ ගරු සභාවට ඇවිල්ලා පැය දෙකක විතර කාලයක් අරගෙන කියලා, අපට කථා කරන්න තිබෙන කාලය සම්පූර්ණයෙන් නැති කරලා තිබෙනවා. ඒකට කමක් නැහැ. දැන් ඒ නිසා ඕපදූප තමයි කථා කරන්න තිබෙන්නේ. විශේෂයෙන්ම කථා කරන්න සිටි මාතෘකාව වෙනුවට වෙනත් කාරණා දෙකක් ගැන කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. දැන් මෙතැනට ඇවිල්ලා කුමන්ත්‍රණ ගැන වාගේම පාතාලය ගැන කථා කරනවා අපි දැක්කා. හරියට නිකම් ආණ්ඩුවේ නොවෙයි වාගේ තමයි කථා කරන්නේ. විපක්ෂයෙන් ආණ්ඩුව ගැන කථා කරන විදියට තමයි කථා කරන්නේ.

ඔබතුමන්ලාට බේරා ගන්න තිබෙන තවත් විශාල ප්‍රශ්නයක් ගැන මම කියන්නම්. සෞඛ්‍ය අමාත්‍යාංශය ගත්තොත්, කෙහෙළිය රඹුක්වැල්ල ප්‍රමුඛ නිලධාරීන් කණ්ඩායමක් අද වෙනකොට

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

හිරේට ගන්න සූදානමින් ඒ වැඩකටයුතු ටික සිද්ධ වෙනවා. හැබැයි, එය එසේ සිද්ධ වෙද්දී තවමත් සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ මේ කාරණා ටික, මේ ජාවාරම් ටික බේරිලා තිබෙනවාද කියන එක අපිට අහන්න සිදු වෙලා තිබෙනවා. දැන් ලංකාවේ ඖෂධ නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවල නිෂ්පාදන ටිකට අවශ්‍ය කරන ලියාපදිංචිය සහ මිල නියාමනය කිරීම සම්බන්ධ වැඩකටයුතු කරන්න NMRA එක දීර්ඝ කාලයක් ගන්නවා. ඒ අයට අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් ඉන්දියාවට අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. ඒ අවස්ථාව පිළිබඳව මම කියන්නම්. විශේෂයෙන්ම Clindamycin කියන injection එක පිළිබඳව NMRA එක දීලා තිබෙන විස්තරය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේකේ තිබෙන details ටික කියන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ. කාලය මදි වීම හේතුවෙන් එය සභාගත කළා. ඉන්දියාවෙන් එවන එකම වර්ගයේ, එකම ප්‍රමාණයේ injection එකට රුපියල් 300ක් ගෙවන්නත්, ලංකාවේ නිෂ්පාදිත ආයතනයකින් ඒ injection එකම නිෂ්පාදනය කරලා එළියට දමනකොට රුපියල් 150ක මිලකුත් නියම කරලා තිබෙනවා. එහෙම නැත්නම් විශේෂයෙන්ම අමාත්‍යාංශයෙන්, NMRA එක මඟින් මිල නියම කරලා තිබෙනවා. ඇයි, මේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදකයාට රුපියල් 150කුත්, ඉන්දියාවට රුපියල් 300කුත් දුන්නේ? කොහේද මේ ජාවාරම සිද්ධ වෙන්නේ? කවුද මේක කරන්නේ? වෛද්‍ය ආනන්ද විජේවික්‍රම කියන සභාපතිවරයා. මේ සභාපතිවරයා කරන්නේ මොකක්ද? මෙතැන සිද්ධ වෙන්නේ ජාවාරමක්ද, නැද්ද? මේ සිද්ධ වෙන්නේ පරණ ජාවාරමේ කොටසක්ද? මොකද, මේ ඉන්නේ මීට පෙර පත් කරපු කණ්ඩායම්. එහෙනම් ඒ අයව තවම තියාගෙන ඉන්නේ ඇයි? මේක විශාල ප්‍රශ්නයක්. ඒ නිසා කරුණාකරලා මේ ආණ්ඩුව වෙනස් කරලා ඉස්සරහට යන්න ඕනෑ නම් මේවා හරියට හදා ගන්න ඕනෑ බව මතක තියා ගන්න. මේවා නිවැරදි කරගෙන යන්න වෙනවා. තවම ඒ සභාපතිවරු තියාගෙන ඔබතුමන්ලා වැඩකටයුතු කරනවා කියන්නේ තවමත් ජාවාරම් සිදු වෙනවාය කියන එක බව විශේෂයෙන් මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කැසිනෝ ව්‍යාපාරය ගැනත් මම කියන්න ඕනෑ. ආණ්ඩුව කැසිනෝ ගැන මොනවාද කිව්වේ? අද ජනාධිපතිතුමාට මේ සභාවේදී City of Dreams සම්බන්ධව කියන්න තිබුණා, එතුමා කරපු වැඩසටහන් පිළිබඳව කථා කරද්දී. මොකද, කැසිනෝ මධ්‍යස්ථාන දෙකක් තිබුණු මේ රටේ අද වනවිට කැසිනෝ මධ්‍යස්ථාන හයක් විතර තිබෙනවා. අල්ලපු රටවල එහෙම නැහැ. විශාල රටක් වන ඉන්දියාවේත් තිබෙන්නේ කැසිනෝ මධ්‍යස්ථාන පහක් විතර, රටටම. හැබැයි, අපේ රටේ හයක් විතර තිබෙනවා. ඇයි, මේ? පසුගිය ආණ්ඩුව Majestic Pride සහ Bluehaven Services (Pvt.) Limited කියන කැසිනෝ මධ්‍යස්ථාන දෙකට අවුරුදු 20කට අවශ්‍ය කරන බලපත්‍ර ලබා දුන්නේ, අවුරුදු 5 බැගින් වන පරිදි අවස්ථා 4කට කඩා අවුරුදු 5කට මිලියන 500 ගණනේ ගෙවන විධියටයි. හැබැයි, දැන් ඒ මුදල මිලියන 30කට අඩු කර තිබෙනවා. මිලියන 30කට අඩු කර තමයි මේ අවස්ථාව ලබා දෙන්නේ. වර්තමාන ජනාධිපති, අනුර කුමාර දිසානායක මැතිතුමා එදා කැසිනෝ ගැන කොහොමද කථා කළේ? එදා හිටපු ආණ්ඩුව ගැන, එදා හිටපු ජනාධිපතිවරයා ගැන කොහොමද කථා කළේ? හැබැයි, ඒ ජනාධිපතිවරයාගේම, ඒ ආණ්ඩුවේම කලිසම ඇඳගෙන අගේට අද ඇවිල්ලා ඒවා අමතක වුණා වාගේ කථා කරනවා. City of Dreams Sri Lanka ගැනත් කථා කරන්න. City of Dreams Sri Lanka තවම සිද්ධ වෙන්නේ කොහොමද, ඒක ක්‍රියාත්මක වෙන්නේ කොහොමද, මේගොල්ලන් - මේ ආණ්ඩුව - කැසිනෝ ගහන්න අලුතින් පටන් ගත්තේ කොහොමද කියන එකත් රටට කියන්න ඕනෑය කියන එක තමයි විශේෂයෙන්ම අපි කියා සිටින්නේ. අද ඒ ගැන කියැවුණේ නැති නිසායි මම ඒ කාරණය මතක් කළේ. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සභාවේ දැනගැනීම පිණිසයි මෙම කාරණය කියන්නේ. අද දින ගරු ජනාධිපතිතුමා කථා කරපු කාලය අඩු වුණේ ආණ්ඩු පක්ෂයේ වෙලාවෙන් පමණයි. අතිරේකව ගත් කාලය පමණයි, මුළු කථිකයන්ට ලබා දී තිබෙන කාලයෙන් අඩු කරන්න සිද්ධ වුණේ.

ගරු නිශාන්ත ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.13]

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම මේ සභාව තුළදී කථා වුණා, නව රජය විසින් බදු පිට බදු ගසා, නැවත නැවතත් ජනතාව මත බදු බර පටවනවා කියලා. නව රජය පත් වෙලා ඉදිරිපත් කරපු පළමු අය වැය තුළින්ම විශේෂයෙන්ම බදු සහන තුනක් ලබා දුන්නා. නමුත්, මෙතුමන්ලා කවුරුවත් ඒ ගැන දන්නේ නැතුවද දන්නේ නැහැ, මෙහෙම කථා කරන්නේ. එයින් එකක් තමයි, පුද්ගල ආදායම් බද්ද. රැකියාවක් කරන කෙනෙකුට, සේවා නියුක්තිකයෙකුට ඒ වනතෙක් පනවා තිබුණු බද්ද මොකක්ද? අවුරුද්දකට රුපියල් ලක්ෂ 12ක ආදායමක් උපයන කෙනෙකුට බදු නිදහසකුත්, එතැනින් එහාට වැඩි වන හැම රුපියල් ලක්ෂ 5කටම සියයට 6 ගණනේ බදු මුදල් අය කිරීමකුත් තමයි සිදු වුණේ. නමුත් නව රජය බලයට පත් වුණාට පසුව සේවා නියුක්තිකයෙකු මත පනවන පුද්ගල ආදායම් බදු නිදහස් සීමාව තවත් වැඩි කළා. ඒ අනුව මාසික ආදායම රුපියල් 150,000ක් - අවුරුද්දකට රුපියල් ලක්ෂ 18ක් - දක්වා බදු නිදහස් සීමාව ලබා දුන්නා. ඒත් එක්කම ඊළඟ slab එක වශයෙන් තිබුණු රුපියල් ලක්ෂ 5 සීමාව රුපියල් ලක්ෂ 10ට වැඩි කර එයට සියයට 6ක් වශයෙන් බදු පනවමින් සහන ලබා දීලා තිබෙනවා. ඒ අනුව බැලුවාම, බදු පිට බදු පැටෙව්වා කියලා මෙතැනදී ප්‍රකාශ කළාට, නව රජය බලයට පත් වුණාට පසුව බදු ආදායම අහිමි කර ගැනීමක් තමයි සිදු වෙලා තිබෙන්නේ.

තවත් විශේෂම කාරණයක් මම සඳහන් කළ යුතුයි. කලින් පැවැති රජය විසින් පුද්ගලයන්ගේ බැංකු තැන්පතුවලට - ලැබුණු පොලී මුදල කීය වුණත් - සියයට 5ක රඳවා ගැනීමේ බද්දක් පනවා තිබුණා. නව රජය බලයට ආවාට පසුව එම ක්‍රමවේදය අහෝසි කරලා රඳවා ගැනීමේ බද්ද සියයට 10ට ගෙනිච්චා. හැබැයි, එසේ සියයට 10ක රඳවා ගැනීමේ බද්ද අය කරන්නේ ආදායම් බද්දට යටත් වෙන පුද්ගලයන්ගෙන් විතරයි. අන්න ඒ වාගේ බදු සහනත් දීලා තිබෙනවා. ඊට අමතරව මෙතුමන්ලා VAT එක ගැන කථා කළා. මම කියන්න කැමැතියි, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන VAT එකෙන් නිදහස් කර තිබෙන බව. විපක්ෂය පැත්තෙන් මතු වුණු තවත් කාරණයක් තමයි, පාසල් උපකරණ මත පනවා තිබෙන

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

VAT එක අයින් කළේ නැහැ කියන කාරණය. රජය විසින් අවස්ථානුකූලව ඒ සඳහාත් කටයුතු කර තිබෙනවා. ඒ අනුව අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් දරුවන්ට රුපියල් 6,000ක දීමනාවක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ තුළින් බදු ක්‍රමය වඩාත් නිරවුල් කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, මේ කාරණයත්. ඇත්තටම ජනාධිපතිතුමා ප්‍රමුඛ ජාතික ජන බලවේගය රජයේ බලාපොරොත්තුව, දැක්ම සහ අවසාන අරමුණ වන්නේ අපේ රට මේ වැටී තිබෙන තත්ත්වයෙන් වඩාත් ඉහළ මට්ටමකට ගෙන යෑමයි. ඒ යන ගමනේදී අපේ ආර්ථිකය ඉතා ශක්තිමත් මට්ටමකට යන ලකුණු පෙනෙන්න තිබෙනවා. ඒ අනුව අපිට විශ්වාසයෙන්ම කියන්න පුළුවන්, ඉතාම කෙටි කලකින් අපේ රට වඩාත් ඉහළ තලයකට ඔසවා තබන්න පුළුවන් වෙයි කියන කාරණය.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.16]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මගේ කථාව ආරම්භ කිරීමට පෙර මට සුබ පැතුමක් එකතු කරන්න තිබෙනවා. With great pride as an old Zahirian, I extend my heartfelt wishes to Zahira College and Hameed Al Husseinie College for the Big Match. As an old Zahirian, it is always a proud moment to see our *alma mater* take to the field, especially in a match like this themed on tradition and brotherhood. This Sunday encounter between two oldest Muslim schools in the country is more than just a game; it is a celebration of history, sportsmanship and unity. I wish both teams the very best! May the match be competitive, respectful and a true showcase of the talent and spirit within our community! All the best for both the teams!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු ජනාධිපතිතුමා අද ඇවිල්ලා ආර්ථිකය ගැන විතරක් නොවෙයි, දේශපාලන විග්‍රහයකුත් කළා. එතුමා නීතියේ ආධිපත්‍යය ගැන කථා කළා. එතුමා කථා කළා, වංචා හා දූෂණ ගැන. ආර්ථිකය විවෘත කරන්න ඕනෑ කියලා එතුමා කිව්වා. මේ barriers කඩන්න ඕනෑ කියලා එතුමා කිව්වා. මට එතුමාගේ කථාව අහගෙන ඉන්න කොට හිතුණා, එදා අපිත් එක්ක වාඩි වෙලා හිටපු අනුර කුමාර දිසානායකද මේ අනෙක් පැත්තට ගිහිල්ලා කථා කරන්නේ කියලා. මොකද, දැන් අපිට හඳුනා ගන්න බැහැ, කොයි අනුරද ඇත්ත අනුර කියලා. එහෙම ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. මොකද, මේ පැත්තේ ඉඳන් කථා කරපු අනුර නොවෙයි, දැන් අර පැත්තේ ඉඳන් කථා කරන්නේ. දැන් ඒ අනුරද, මේ අනුරද කියන එක,-

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Madam Chairperson, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ කථා කරලා කිව්වා, එතුමා මේ පාර්ලිමේන්තුවේ කථා කරන්නේ බොරු, එළියේ කියන්නේ ඇත්ත කියලා. එහෙම කියපු ජනාධිපතිතුමාට අපහාසාත්මක වෙන විධියට ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කථා කරනවා. එහෙම වෙන්නේ කොහොමද? ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ බොරු කියනවා කියලා කිව්වා නම්, ඒක පිළිගන්න ඕනෑ. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ කියන්නේ බොරු.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒක point of Order එකක් නොවෙයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ජනාධිපතිතුමාගේ කථාව තුළින් අපිට පෙනෙන්න තිබෙන දේ තමයි, එදා එතුමා විපක්ෂයේ ඉඳගෙන කරපු කථාවලට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ විධියට තමයි අද කථා කරන්නේ කියන එක. අද අපිට පෙනෙන්න තිබෙන්නේ එක්කෝ එතුමා වෙනස් වෙලා තිබෙනවා. අපි ඊයේ කථා කරනකොට විජේවීර සහෝදරයා දැන් පක්ෂයේ නායකයා නෙවෙයි කියපු එකට ගරු බිමල් රත්නායක ඇමතිතුමාට කේන්ති ගියා නේ. අද ජනාධිපතිතුමා ඇවිල්ලා මොකක්ද කිව්වේ? අනුර කුමාර මහත්මයා අද ඇවිල්ලා කථා කළේ, රෝහණ විජේවීර මැතිතුමාගේ ආර්ථික ප්‍රතිපත්තියද? ඒ ප්‍රතිපත්තිය නොවෙයි. එතුමා කිව්වා, ආර්ථිකය විවෘත කරන්න ඕනෑ, barriers කඩන්න ඕනෑ කියලා. හොඳයි. එතුමා කිව්වා, අපිට වෙනස් වෙන්න කියලා. මම හිතනවා, ආර්ථිකය පැත්තෙන් අද එතුමන්ලා හිටපු තැනින් අපි ඉන්න තැනට ඇවිල්ලා තිබෙනවා කියලා. අපි ගිහිල්ලා නැහැ, එතුමන්ලා අද ඇවිල්ලා තිබෙනවා. සමාජවාදය අතහැරලා, සංවෘත ආර්ථිකය අතහැරලා, එතුමා අද විවෘත ආර්ථිකය පිළිගෙන තිබෙනවා. ඒක හොඳ දෙයක්. එතුමාගෙන් අපි වෙනස් වෙන්න ඕනෑ එක දෙයකිනුයි. අපි ඇත්ත කියන්න ඕනෑ, බොරු නොකියා. මොකද, එතුමා කියන්නේ ඔක්කොම බොරු නේ. බොරු නේ කියන්නේ. අද ඇවිල්ලාත් කොච්චර බොරු කිව්වාද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බොරු කියපු බව පිළිගත්තා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මතක තබා ගන්න. එතුමා කන්ටේනර් 309 ගැනත් කථා කළා. එතුමා ඒ ගැන හිනා වෙලා ලෙහෙසියෙන් කියා ගෙන ගියා. ඇයි, එහෙම නම් ඒ කන්ටේනර් 309 පිළිබඳ වාර්තාව එළියට දමන්නේ නැත්තේ? ඇයි, ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බැරි? ඇයි, ඒ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගැන විනිවිදභාවයකින් දකින්න අපිට ඉඩ දෙන්නේ නැත්තේ? ඒ කන්ටේනර් 309න්, red label ගහපු කන්ටේනර් 150ක් එළියට දැම්මේ ඇයි? එතුමා කිව්වා, කලිනුත් එහෙම ගියා ලු. කලින් ගිය නිසා තමයි එතුමාව බලයට ගෙනාවේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව හැදුවේ කලින් ගිය නිසා තමයි. කලින් කරපු දේවල් කරන්න නොවෙයි, මිනිස්සු ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ. කලින් කරපු දේවල් වෙනස් කරන්න. එහෙම නම්, ඔබතුමන්ලා වෙනස් වෙලා නැහැ. කලින් කරගෙන ආපු ටිකම තමුන්නාන්සේලාත් කරගෙන යනවා. ඒක පිළිගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පසුගිය සතියේ කන්ටේනර් 6ක් එළියට දැම්මා. මෙහිදී මම විශේෂයෙන්ම කියන්න ඕනෑ කරුණක් තිබෙනවා. ජුනි 10වැනි දා ගැසට් එකක් ගහනවා. ජුනි 10වැනි දා ගහපු ගැසට් එක අනුව ලුණු ආනයනය කිරීමේදී නැවට කන්ටේනර් පටවන්න ඕනෑ අවසාන දිනය 2025 ජුනි 10වැනි දා හෝ ඊට කලින්. දැන් කන්ටේනර් 400ක් වරායේ හිර වෙලා තිබෙනවා. ඒ 400 හිර වෙලා තිබෙන්නේ වෙන මොනවත් නිසා නොවෙයි. ඒ කන්ටේනර් 400 නැවට පැටෙව්වේ ජුනි මාසයේ 11, 12 කියලා ඒ නැව් වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. නමුත්, ඒ කන්ටේනර් 400 ඇතුළේ තිබෙන, ජුනි මාසයේ 11වැනි දා නැවට පටවපු කන්ටේනර් 6ක් එළියට දමලා තිබෙනවා. ඇයි ඒ? ජනාධිපතිතුමාගේ යහළුවෙක් නිසාද? නැත්නම් ඇමතිතුමන්ලාගේ යහළුවෙක් නිසාද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
හොඳයි.

ඒ කන්ටේනර් 6 එළියට දැම්මේ කොහොමද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මා ළඟ ඒ කන්ටේනර් 6හි numbers තිබෙනවා. මට ඒ කන්ටේනර් 6හි numbers කියවන්න වෙලාව නැහැ. ඒ කන්ටේනර් 6හි numbers ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා.

අනෙක් වෙළෙඳුන්ගේ කන්ටේනර් ඔක්කොම වරායේ නවත්වාගෙන, මේ මහා පරිමාණ ලුණු ව්‍යාපාරිකයාගේ කන්ටේනර් 6ක් විතරක් එළියට දැම්මා. එයාගේ කන්ටේනර් ආපු නැවේම තමයි අනෙක් අයගේ කන්ටේනර් ආවේ. නමුත් අනෙක් අයගේ ඒවා එළියට දුන්නේ නැහැ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මතක තියාගන්න, ජනාධිපතිතුමා වංචාව, දූෂණය ගැන කථා කළා. දැන් අපි මතු කළා, wind power plants ගැන. ප්‍රතික්ෂේප වෙච්ච මෙගාවොට් 50 සුළං විදුලි බලාගාරයේ ටෙන්ඩර් එක ජනාධිපතිතුමාගේ යාළුවාට දුන්නා. ඒ යාළුවාගේ කොම්පැනියේ අයගෙන් භාගයක් තමයි දැන් මේ රටේ සභාපතිකම් කරන්නේ. ජනාධිපතිතුමා ළඟ ඉන්න යාළුවාගේ කොම්පැනියේ අය තමයි දැන් මේ රටේ එක එක සංස්ථාවල සභාපතිවරු හැටියට පත් වෙලා ඉන්නේ. SriLankan Airlines එකේ ඉඳන් වෙන කවුරුවත් නැහැ. ඒ ගොල්ලන් තමයි අද මේ රට පාලනය කරන්නේ. අර එළියට ගිය කන්ටේනර් 309න් සියයට 70ක් ඒ යාළුවාගේ සමාගමේ කන්ටේනර්. වෙන කාගේවත් නොවෙයි. ඒකයි ලැයිස්තුව එළියට දමන්නේ නැත්තේ. ඒ කන්ටේනර් 309 කාගේ කන්ටේනර්ද කියලා බලන්න පුළුවන් නම් ලැයිස්තුව එළියට දමන්න කියන්න. දමන්න කියන්න. දමන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජනාධිපතිතුමා වංචා, දූෂණ ගැන කථා කළා. මේ රටේ මහ බැංකුවේ සිදු වුණු දූෂණයටත් වැඩිය වංචාවක් වුණා. ඒ තමයි පසුගිය ආණ්ඩුව කාලයේ සිදුවුණු VFS ගනුදෙනුව. මේ ආණ්ඩුව බලයට එනකොට විජිත හේරත් මැතිතුමා කිව්වා, "අපි ආපු ගමන් වෝහාරික විගණනයක් කරනවා" කියලා. දැන් ආණ්ඩුව බලයට ඇවිත් මාස නවයයි. මොකද, VFS ගනුදෙනුව ගැන සොයන්නේ නැද්ද? පාස්පෝට් ගනුදෙනුව ගැන සොයන්නේ නැද්ද? මම තමුන්නාන්සේලාට අභියෝග කරනවා, පුළුවන් නම් VFS ගනුදෙනුවයි, පාස්පෝට් ගනුදෙනුවයි පිළිබඳ සොයලා පෙන්වන්න කියලා. පුළුවන් නම් හොයන්න. හොයන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මම අවසන් කරන්නම්.

මොකද, මීට කලිනුත් අපේ මන්ත්‍රීවරයෙක් අභියෝග කළා. දැනට මාස හයකට කලින් අභියෝග කළා. නමුත් කළේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද විනිවිදභාවය ගැන කථා කළා. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සභාපති තවම පත් කරලා නැහැ. ඒ පනත යටතේ අපි කරුණු කාරණා ඉල්ලුවාම ඒවා දෙන්නේ නැහැ. ඒ හින්දා, ආණ්ඩුව අද වෙනකොට විනිවිදභාවය අතහැරලා තිබෙනවා කියලා අපට පේන්න තිබෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් කුමාර ගමගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද අපි ආර්ථිකය ගැන සාකච්ඡා කරන වෙලාවේ අපේ ජනාධිපතිතුමා රටේ ආර්ථික සංවර්ධනය ගැන ඉතා වැදගත් සහ අපි හැමෝටම දැනෙන කථාවක් කළා. අපේ "විපච්" කණ්ඩායම -විපච් කණ්ඩායම කියන්නේ, විනාශය පමණක් විශ්වාස කරන කණ්ඩායම- දැන් පොඩ්ඩක් කලබල වෙලා තිබෙනවා. එතුමන්ලා වේගයෙන් කථා කරමින්, හිටපු ගමන් points of Order ඉදිරිපත් කරමින්, පොඩි සිහිති ආතල් දෙන ඒවායින් තමයි මේක ඉවර කරන්න බැලුවේ. අපි හැමෝම දන්නවා, ජනාධිපතිතුමාගේ කථාවේ තිබුණු සංඛ්‍යා, දත්ත ගැන. ඒ සියල්ල එකතු කරලා ගත්තාම අපේ රටේ ආර්ථිකය ස්ථාවර කරපු විධිය සහ අපි දැන් ඉන්නේ කොතැනද කියන එක ගැන එතුමා හරි පැහැදිලිව කිව්වා. එහෙම කිව්වාම මේ කට්ටිය බය වෙන්න ඕනෑ නේ. මේ කට්ටිය අවුල් වෙනවා. දැන් කියන්නේ මොකක්ද කියලා තේරෙන්නේ නැහැ. පොඩි අවුලක්

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

හැදෙනවා. ඒක සාමාන්‍ය දෙයක්. ඒ නිසා අපි දැන් ඒක ගැන එච්චර කලබල වෙන්නේ නැහැ. එතුමා කියපු දේවල් බොරුයි කියනවා නම් අපි ඕනෑ තැනක මේ සංඛ්‍යා දත්ත එක්ක කථා කරමු. මේක ඇතුළේ බැරි නම් එළියේ හරි කථා කරමු. ඒකට අපි සූදානම්. මේවා ඇත්ත දත්ත එක්ක තිබෙන්නේ. ඒ නිසා අපි මේ හැසිරීම් ගැන ලොකුවට හිතන්නේ නැහැ. කඩා වැටෙනවා කියලා හිතපු ආර්ථිකය අපි ශක්තිමත් කරපු නිසා දැන් කට්ටිය පොඩ්ඩක් බය වෙලා තිබෙනවා.

අපේ මේ දුප්පත් රට දුප්පත් වුණේ ඇයි කියන කාරණය තමයි අපට වැදගත් වන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. Ragnar Nurkse කියන ආර්ථික විද්‍යාඥයා කියා තිබෙනවා, "A country is poor because it is poor" කියලා. ඒ කියන්නේ දුප්පත් රටවල් දුප්පත් වෙන්නේ මෙන්න මේ දුප්පත්කම හින්දා කියන එකයි. අපේ රට දුප්පත් වුණා නොවෙයි අපේ රට දුප්පත් කෙරුවා, හිටපු පාලකයෝ, මේ කෑගහන කට්ටියත් එක්කම. හැබැයි ඒ දුප්පත් කරපු රට අපි දැන් එක තැනකට ගෙනැවිත් තිබෙනවා. ඒක තමයි අපේ වැඩේ. අපි දන්නවා, අපේ රට අඩු ආදායම් ලබන රටක් වෙලා තිබුණේ කියලා. අඩු ආදායම් ලබන රටක් වෙනකොට අපි හිටියේ කොතැනද? අපේ GDP එක ඩොලර් මිලියන 80යි තිබෙන්නේ. මේ ගණන එහාට මෙහාට යනවා. මේකෙන් ගැලවෙන්න බැහැ. ඒ නිසා අපේ ඒක පුද්ගල ආදායම ඉහළ යන්නෙත් නැහැ. ඒක ඩොලර් 4,000 ඇතුළේ කරකැවෙනවා. අපේ රට මේ විධියට අඩු ආදායම් ලබන රටක් වුණාම අපේ ඉතිරි කිරීම් අඩු වෙනවා. ඒක තමයි Ragnar Nurkse කියන්නේ. අපේ ඉතිරි කිරීම් අඩු වෙනකොට අපේ ආයෝජන අඩු වෙනවා. අපේ ආයෝජන අඩු වෙනකොට අපේ නිෂ්පාදනය - productivity එක - අඩු වෙලා යනවා. එතකොට ආයෙත් අපේ ආදායම අඩු වෙනවා. මෙන්න මේක තමයි අපේ රටේ මේ තාක් කල් වෙච්ච ගැටලුව; ආර්ථික ප්‍රශ්නය. අපි ඒක තේරුම් ගන්න ඕනෑ. මේකට තිබෙන විසඳුම තමයි ආයෝජන වැඩි කිරීම. ඒ තුළ විතරයි අපට මෙය විසඳන්න පුළුවන් වෙන්නේ. අපේ ගරු ජනාධිපතිතුමා ඇතුළු අපේ ආණ්ඩුවේ සියලු දෙනා එකතු වෙලා උත්සාහ ගත්තේ අපේ රටේ ආයෝජන වැඩි කරන මාර්ග නිර්මාණය කරන්නයි. ඒ නිසා තමයි ගරු ජනාධිපතිතුමා අද උදේ නිවැරැදිම සංඛ්‍යා දත්ත එක්ක කිව්වේ, ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ මුල් මාස 6 තුළ අපේ ඍජු විදේශ ආයෝජන සියයට 101කින් වැඩි වෙලා තිබෙනවා කියලා. ඒවා සංඛ්‍යා එක්කයි කිව්වේ. නිකම් කටට එන ඒවා කිව්වා නොවෙයි. ආයෝජන වැඩි කිරීම තුළින් තමයි අපි අපේ රට ඉදිරියට ගෙන යන්න බලාපොරොත්තු වන්නේ. ඒ නිසාම තමයි අපේ ගරු ජනාධිපතිතුමා කොහේ හෝ රටකට ගියාට පසුව, වෙනදා සිටි නායකයන් ගියා වාගේ ගිහිල්ලා "අනේ, අපට කන්න ටිකක් දෙන්න, ණය ගෙවාගන්න කීයක් හරි දෙන්න" කියනවා වෙනුවට ආයෝජන සැලසුම්, ආයෝජන ගිවිසුම් සම්බන්ධයෙන් ඒ ඒ රටවල් එක්ක එකඟතා ඇති කරගෙන තිබෙන්නේ. එම කටයුත්තත් එක්ක තමයි අපි අපේ රට ඉස්සරහට ගෙන යන්න බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි දැනටමත් ආයෝජන වැඩි කරගෙන තිබෙනවා. ගරු ජනාධිපතිතුමා අද උදේ කරුණු කාරණා පැහැදිලිවම කිව්වා. එක්කෝ, විපක්ෂයේ මෙතුමන්ලාට ඒවා තේරෙන්නේ නැහැ. එක්කෝ, එතුමන්ලා ඒවා තේරුම් ගන්න උත්සාහ ගන්නේ නැහැ. එහෙම නම්, තව කොච්චර කිව්වත් තේරෙන්නේ නැහැ නේ. මොකද, මෙතුමන්ලා ඉන්නේ වෙනත් තැනක. මේ මාස 6 ඇතුළත අපි අපේ විදේශ විනිමය ආදායම ඩොලර් මිලියන 1,100කට වඩා වැඩි කරගෙන තිබෙනවා. ඉතින්, ඒක බොරු කියලා කියන්නේ කොහොමද? මොන කටකින් එහෙම කියලා දුවනවාද කියලා අපට තේරෙන්නේ නැහැ. අපේ සංචාරක ව්‍යාපාරයේ ආදායම වැඩි වෙලා තිබෙනවා. අපේ අපනයන වැඩි වෙලා තිබෙනවා. අපේ විදේශ ප්‍රේෂණ වැඩි වෙලා තිබෙනවා. හැබැයි, මෙතුමන්ලා බොරුවට කෑගහනවා, බොරු දත්ත කියනවා කියලා. අපට තේරෙන්නේ නැහැ, මේක බේරන්නේ කොහොමද කියලා. කොහොම වුණත්, අපි දැන් මේ ආර්ථිකය හදලා තිබෙනවා. අප දන්නා ප්‍රමාණයට, අපේ රටට දැනෙන ප්‍රමාණයට අපි පසුගිය මාස 6ට, 8ට ඉතා විශාල ආර්ථික වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒක විශාලයි කියන්නේ, අප හිටපු තැනට සාපේක්ෂවයි. එහෙම නැතුව ඒක අපේ රටට මහා විශාල වර්ධනයක් නොවෙයි.

අපි අපේ විදේශීය ආයෝජන වැඩි කරගෙන තිබෙනවා වාගේම දේශීය ආයෝජනත් වැඩි කරගෙන තිබෙනවා. අපේ ආණ්ඩුවේ වියදම් අඩු කරගෙන, අමාත්‍යාංශවල, ඇමතිවරුන්ගේ, ජනාධිපතිතුමාගේ වියදම් ද අඩු කරගෙන, මිනිසුන්ගෙන් ගන්නා බදු ආදායම -ඒ බදු මුදල්- කාබාසිනියා කරන්නේ නැතිව ඒවා රාජ්‍යය තුළ ඵලදායීව ආයෝජනය කරලා, ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන්, ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් යොදවා තිබෙනවා. එහෙම තමයි අපි දැන් මේ රට මේ තැනට අරගෙන ඇවිල්ලා තිබෙන්නේ. අපේ ආණ්ඩුව බදු අය කර ගන්නවා තමයි. හැබැයි, මිනිසුන්ගෙන් ගන්නා ඒ බදු මුදල් අපි නාස්ති කරන්නේ නැහැ. මිනිසුන්ගෙන් ගන්නා බදු මුදල් අපි හොරා කන්නේ නැහැ. අපි ඒ බදු මුදල් ටෙන්ඩර්වලින් ගහගෙන ගෙදර අරගෙන යන්නේ නැහැ. අපි ඒවා මේ රටේ ආයෝජනය වෙනුවෙන්, අනාගත සංවර්ධනය වෙනුවෙන් යොදවා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ රටේ ආයෝජන පැත්ත ගත්තොත්, මා හිතන විධියට අපි ඉතා ඉහළට ගිහින් තිබෙනවා. අපි ආයෝජන වැඩි කරලා තිබෙනවා. ඒ නිසා අපි ආර්ථික වර්ධනයක්, සංවර්ධනයක් මේ වනකොට අත්පත් කර ගනිමින් යනවා. විනාශය පතන විපක්ෂයට දැන් ප්‍රාර්ථනා කරන්න වෙනත් දෙයක් නැති වෙනකොට, කරන්න දෙයක් නැති වෙනකොට ඒ අය මේ වාගේ කෑ ගහන, බොරු චෝදනා කරන තැනට පත් වෙලා තිබෙනවා. නමුත්, අපට විශ්වාසයි අපි අපේ රට සංවර්ධනය කරන බව; අපි අපේ රටේ ආර්ථිකය ගොඩ නහන බව. මොකද, අපි ජනතාවට පොරොන්දු වෙච්ච දේ තමයි අපි අපේ රටේ සංවර්ධනය නැවත අත්පත් කරගෙන අපේ රට දියුණු රාජ්‍යයක් දක්වා අරගෙන යනවා කියන එක. අපි ඒ වෙනුවෙන් වැඩ කර තිබෙනවා. අපි ඒක සංඛ්‍යා දත්තවලින්, ආර්ථිකයේ ඇත්ත දේවලින් පෙන්වා තිබෙනවා. ඒ නිසා අපේ ආණ්ඩුව ගැන, අපේ පාලනය ගැන අපට සතුටු වෙන්න පුළුවන්. ඒ වාගේම, ජනතාවත් මේ ගැන සතුටු වෙනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව, 2025 අගෝස්තු 19වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2025 ஓகஸ்ட்19, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Tuesday, 19th August, 2025, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.